

# කුරුණෑගල

## නගර සංවර්ධන සැලැස්ම

## 2019 - 2030



- වෙළුම 1

නාගරික සංවර්ධන අධිකාරිය
වයඹ පළාත් කාර්යාලය

# කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම

## වෙළුම 1

නාගරික සංවර්ධන අධිකාරිය
වයඹ පළාත් කාර්යාලය
**2019 - 2030**

# ලේඛන තොරතුරු

සියලුම හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් පූර්ව ලිඛිත අවසරයකින් තොරව, ඕනෑම ආකාරයක ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම හෝ වෙනත් විද්‍යුත් හෝ යාන්ත්‍රික ක්‍රම ඇතුළුව ඕනෑම ආකාරයකින් බෙදා හැරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

- **සැලැස්මේ මාතෘකාව** : කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම
- **සැලසුම් කලාප මායිම්** : කුරුණෑගල නාගරික සංවර්ධන බල ප්‍රදේශය
- **ගැසට් අංකය** : 2129/96 – 2019 /06/08
- **පාර්ශවකරුවන්** : කුරුණෑගල මහ නගර සභාව, කුරුණෑගල ප්‍රාදේශීය සභාව හා අනෙකුත් ආයතන
- **ඉදිරිපත් කරන ලද දිනය** : 2019 ජුනි

## ප්‍රකාශනය

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 , 7 වන සහ 9 වන මහල් සෙත්සිරිපාය,බත්තරමුල්ල.
වෙබ් අඩවිය - www.udagove.lk
විද්‍යුත් තැපෑල - Infoudagov.lk
දුරකථන - +94112873637

කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම 2019-2030 ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමු වෙළුම හා දෙවැනි වෙළුම වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ. මෙහි පළමු වෙළුම අනු කොටස් දෙකකින් සමන්විත වන අතර. මෙහි පළමු වෙළුමෙහි පළමුවන කොටස මඟින් සංවර්ධන සැලැස්ම හැඳින්වීම, පසුබිම් අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පිළිබඳ සඳහන් කරන අතර එහි දෙවන කොටස මඟින් සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණු හා පරමාර්ථ, සංකල්පිත සැලැස්ම, සංවර්ධන සැලසුම් යනාදිය අන්තර්ගත කර ඇත. සංවර්ධන සැලැස්මේ දෙවැනි වෙළුම වෙනම ප්‍රකාශනයක් ලෙස සකස් කර ඇති අතර එහි 2019 - 2030 කාල පරිච්ඡේදය සඳහා බල පවත්වන සැලසුම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ රෙගුලාසි, හා කලාපීකරණ රෙගුලාසි අන්තර්ගත කර ඇත.

## අධීක්ෂණ කටයුතු

ආචාර්ය ජගත් මුණසිංහ , සභාපති - නා.සං.අධි. / ඉංජිනේරු එස්. එස්. පී. රත්නායක, අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි. / නගර නිර්මාණ ශිල්පී කේ. ඒ. ඩී. චන්ද්‍රදාස, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි./ නගර නිර්මාණ ශිල්පී ඩී.එම්. බී රණතුංග - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි./ නගර නිර්මාණ ශිල්පී ලලිත් විජේරත්න, අධ්‍යක්ෂ(සංවර්ධන සැලසුම්) - නා.සං.අධි./ නගර නිර්මාණ ශිල්පී, ජනක් රණවීර, අධ්‍යක්ෂ (සංවර්ධන හා පර්යේෂණ අංශය).

# පෙරවදන

නාගරික ජනගහනය ශ්‍රී ලංකාව තුල ඉතා සීග්‍රයෙන් ඉහල යමින් පවතී. එබැවින් අතීතයේ ගම ලෙස සැලකූ ප්‍රදේශ අද වනවිට විශාල වශයෙන් නාගරික ලක්ෂණ සහිත ප්‍රදේශ බවට පත්වෙමින් විසල් නාගරීකරණයක් දැකගත හැක. මෙම නාගරීකරණය ඉතා විධිමත් ලෙස සිදුවීමට නම්, උපායමාර්ගික නාගරික සංවර්ධන සැලැස්මක් තුලින් මනා මාර්ගෝපදේශයක් ලබාදිය යුතුය. එවැනි නාගරික සංවර්ධන සැලසුම් පිළියෙළ කරමින් තිබෙන අවධියක කුරුණෑගල නගරයට එම සැලසුම සකස් විය යුතු ආකාරය මෙයින් අවධාරණය කරයි.

කුරුණෑගල නගරය ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් නගරයක්ව පැවති බව අතීතයේ රාජධානියක් වී පැවතීම මගින් සනාථ කරයි. එනම් ශ්‍රී ලංකාව තුල ඉතා වැදගත් ස්ථානයක් කුරුණෑගල නගරයට තිබී ඇත. අද වන විටද කුරුණෑගල නගරයට එවැනිම වැදගත් කමක් ඇති නමුදු. එය ඒ ආකාරයෙන්ම ලඟාවී නැති වීමට විවිධ හේතූන් බලපා තිබිය හැක. ඒ අතර විසල් දැක්මක් සහිත මනා නාගරික සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය ද දැඩිව ඇත.

ඒ අනුව කුරුණෑගල නගරය රටෙහි සංවර්ධනයටත්, කුරුණෑගල නගරයෙහි ආර්ථික, භෞතික, සමාජයීය හා පාරිසරික සංවර්ධනයන් ඉතා විශාල වශයෙන් ඉහල නැංවීමට, ඉදිරි වසර 11ක කාලයක් තුල නගරය සකස් විය යුතු ආකාරය පිළිබඳව මාර්ගෝපදේශයක් මෙම සැලැස්ම තුලින් ලබා දෙයි.

# ස්තුතිය

කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය, කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත් මුළු කුරුණෑගල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම 2019 - 2030 සකස් කිරිමේදී මූලික දත්ත රැස්කිරීමේ අදියරේ සිට සැලැස්ම ගැසට් පත්‍රයෙහි පළකිරීමේ අදියර දක්වා සියලුම අදියරයන් වලදී විවිධ අයුරින් සහයෝගය ලබාදුන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතුවලට සම්බන්ධ වන සියලුම දේශපාලන නියෝජිතයන්ට,වයඹ පළාත් සභාවෙහි ප්‍රධාන අමාත්‍යතුමා , ආණ්ඩුකාර තුමා ඇතුළු දේශපාලන අධිකාරියට හා ප්‍රධාන ලේකම් තුමා ඇතුළු සියලුම රාජ්‍ය නිලධාරීන්ට, කුරුණෑගල මහ නගර සභාවෙහි ගරු නගරාධිපතිතුමා, නාගරික කොමසාරිස් තුමා ඇතුළු මහ නගර සභාවේ කාර්ය මණ්ඩලයටද,කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, ලේකම් තුමිය ඇතුළු සියලු කාර්ය මණ්ඩලයට ස්තුතිය මෙයින් පුදකර සිටිමු.

මහජන අදහස් ලබා ගැනීමේදී රැස්වීම්වලට සහභාගිවී ප්‍රයෝජනවත් අදහස් ලබාදෙමින් මෙම සැලැස්ම සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබාදුන් දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්වරුන්, කුරුණෑගල පොලිසිය, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, දුම්රිය දෙපාර්තමේන්තුව, ලංකා විදුලි බල මණ්ඩලය , ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් පරිසර අධිකාරිය. වයඹ සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඇතුලු සියලුම රාජ්‍ය ආයතන , කුරණෑගල වෙළඳ සංගමය , පාසල් වැන් රථ හිමියන්ගේ සංගමය යානාදී ස්වේච්ඡා සංවිධාන ඇතුලු මහජනතාවට අපගේ කෘතඥතාවය මෙයින් පුදකර සිටිමු.

මෙම කර්තව්‍යය සාර්ථක කරගැනීම සඳහා මග පෙන්වූ නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල් තුමා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් , නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) ඇතුළු ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන හා පර්යේෂණ අංශය, සංවර්ධන සැලසුම්, භූගෝලීය තොරතුරු පද්ධති අංශය , පරිසර හා භූ දර්ශන අංශය , බලාත්මක අංශය , නාගරික සංවර්ධන අධිකාරියේ වයඹ පලාත් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ස්තුතිය මෙයින් පුදකර සිටිමු.

# ගරු අමාත්‍යතුමාගේ පෙරවදන



**ගරු පාඨලී චම්පික රණවක**

**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය**

1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර පසුගිය වසර 40 පුරාවටම නාගරික සංවර්ධන අධිකාරිය නාගරික ප්‍රදේශවල සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා දායකත්වය සපයනු ලබයි. මෙම මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය තම ගමන් මගෙහි තවත් එක් සන්ධිස්ථානයක් පසුකරමින් පුළුල් සංවර්ධන සැලසුම් දිවයිනේ ප්‍රධානතම නාගරික සංවර්ධන ප්‍රදේශයන් සඳහා සකස් කිරීමට  කටයුතු කොට ඇත.

මෙම සංවර්ධන  සැලසුම තුලින් අපේක්ෂා කරනු ලබන්නේ කුරුණෑගල නගරය(මහ නගර සභා බල ප්‍රදේශය හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය) සඳහා ඒකාබද්ධ සංවර්ධනයක් ඇති කිරීමටයි. කුරුණෑගල නගරය වාණිජ හා පරිපාලනමය වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රධානම නගරය වන අතර,  එය විශාල ජන සංඛ්‍යාවකට සේවා සපයනු ලබයි.  ස්ථානීය පිහිටීමේ  වටිනාකමද, ජාතික සංවර්ධන ව්‍යාපෘති වල විභවතාවයන්ද එක්කොට ගෙන  වයඹ පළාත තුල කොළඹින් පිටත  බිහිවන මහා නගරය  බවට පත් කිරීම ප්‍රමුඛ අභිප්‍රාය කොට ගෙන ඇත. ඒ සඳහා කුරුණෑගල  දිස්ත්‍රික්කයට  සුදුසු  ලෙස භෞතික සංවර්ධනයකට අවශ්‍ය පහසුකම් සැලසීම අපගේ උත්සාහය වේ.

මාගේ අවබෝධය අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් යොදා ගනිමින්  විශිෂ්ඨ තාක්ෂණික ක්‍රමවේදයන් හා නවෝත්පාදිත ප්‍රවේශයන්ද ලැබී ඇත. ඒ අනුව, සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කණ්ඩායම හා නොයෙක් ආකාරයෙන් මෙම කාර්යය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කරමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය එක සමාන අයුරින් මෙම කාර්ය උදෙසා යෙදවීම තුලින් කුරුණෑගල සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට මග සැලසෙනු ඇත.

# ගරු සභාපතිතුමාගේ පණිවිඩය



**ආචාර්ය ජගත් මුණසිංහ**

**සභාපති**

**නාගරික සංවර්ධන අධිකාරිය**

වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමණාකරනය කිරීමේ වගකීමද එසේම පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුලින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ [I]) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන් හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක් ව ඇත. කුරුණෑගල නා.සං.බල ප්‍රදේශය සඳහා සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා බලාත්මක කිරීම, එම විධිවිධාන යටතේ සිදු කර ඇත. කුරුණෑගල ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය කුරුණෑගල නගරය හා ඒ අවට ප්‍රදේශයන්හි භෞතික, ආර්ථික, සාමාජයීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන කුරුණෑගල සංවර්ධන සැලැස්ම අවසන් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිතයන්ගෙන් සැදි විෂම බලාපොරොත්තුවලින් අපවිත්‍ර වූ කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේ අවශ්‍ය පද්ධති, මෙවලම්, හා ක්‍රමෝපායන් තුලින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණ දීමටත්, අවිනිශ්චිතභාවයට ඔරොත්තු දීම තුලින් කුරුණෑගල නගරය ඇතුගල වටකොට නැගෙන වයඹ මහා නගරය ලෙස සංවර්ධනය කිරීමට අධිෂ්ඨාන කොට ගෙන සිටියි.

මෙම පුළුල් කාර්ය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

# කුරුණෑගල මහ නගර සභාවේ ගරු නගරාධිපති තුමාගේ හා ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය



**ගරු නගරාධිපති**
**කුරුණෑගල මහ නගර සභාව**



**ගරු සභාපති**
**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

අප පළාත් පාලන ආයතන දෙක ඒකාබද්ධව ඇතුලත් කරමින් පොදු සැලසුම් ප්‍රදේශයක් ලෙස සලකා කුරුණෑගල නගරය විසල් නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ දැක්ම පදනම් කරගෙන සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත අපගේ කෘතඥතාවය පළ කරමි. වයඹ පළාතේ පරිපාලන අග නගරය වන මෙම ප්‍රදේශය මුල්කරගෙන සිදුවන අවිධිමත් නාගරීකරණය විධිමත් නාගරීකරණයකට යොමු කිරීමටත් ඒ තුලින් නගරය වඩාත් ඵලදායි සේවා මධ්‍යස්ථානයක් කිරීමටත් මෙම සැලැස්මෙන් අරමුණු කොට ගෙන ඇත. එක්ව හුවමාරු කරගත් දැක්ම අනුව එක් සැලැස්මක් සකස් කිරීමෙන් මෙම පළාත් පාලන ආයතන ප්‍රදේශ දෙකම එක සමාන අයුරින් සංවර්ධනයකට යොමු කිරීමට හැකි බව අපි විශ්වාස කරමු.

අප සහ පොදු මහජනතාවගේ නියෝජිතයින් ඉදිරිපත්කරන ලද විවේචන, යෝජනා හා නිර්දේශ ඇතුලත් කරමින් කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම සහභාගීත්ව සහ සහයෝගී ව්‍යායාමයක් බවට පත්කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය ගත් යථාර්ථ උත්සාහය අගය කරමු. මේ නිසා මෙය අපගේ සැලැස්මක් ලෙස ප්‍රකාශ කරන අතර කුරුණෑගල සංවර්ධන සැලැස්ම අනාගතයේදී අපේක්ෂිත ඉදිරි දශකයක කාලය තුලදී ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අපගේ සහභාගිත්වය හා සහයෝගය සහතික කරමු. එමෙන්ම 2030 වසර දක්වා කුරුණෑගල සංවර්ධන සැලැස්මේ බලාපොරොත්තු ඉදිරියට ගෙන යාම සඳහා සියලු පුරවැසියන්ට හා සක්‍රීය ක්‍රියාකාරී පාර්ශවකරුවනට පුද්ගලික හා ආයතනික මට්ටමින් සහභාගී වන ලෙස ඉල්ලා සිටිමු.

# පටුන

ලේඛන තොරතුරු ..... ii
පෙරවදන ..... iii
ස්තුතිය ..... iv
ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය ..... v
ගරු සභාපතිතුමාගේ පණිවිඩය ..... vi
කුරුණෑගල මහ නගර සභාවේ ගරු නගරාධිපති තුමාගේ හා ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය ..... vii
සිතියම් ලැයිස්තුව ..... xi
වගු ලැයිස්තුව ..... xiii
රූප ලැයිස්තුව ..... xv
ප්‍රස්තාර ලැයිස්තුව ..... xvi

1.0 හැඳින්වීම

1.1 සංවර්ධන සැලැස්මේ පසුබිම ..... 4
1.2 සැලසුම් කණ්ඩායම ..... 5
1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය ..... 7
1.4 සැලසුම් ක්‍රියාවලිය ..... 10

2.0 මූලික සැලසුම් අධ්‍යයන ප්‍රදේශය

2.0 මූලික සැලසුම් අධ්‍යයන ප්‍රදේශය ..... 14
2.1 සැලසුම් අධ්‍යයන බල ප්‍රදේශයේ මූලික තොරතුරු ..... 14
2.2 සැලසුම් සංදර්භය හා තත්ත්ව විශ්ලේෂණය ..... 17
2.3 නගර සංවර්ධන සැලැස්ම සකස් කරන භූමි ප්‍රදේශයේ සීමා නිර්ණය කිරීම. ..... 23

3.0 නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

3.1 මූලික අධ්‍යනයේදී හදුනාගත් නගරයේ ප්‍රධාන ප්‍රශ්ණ ..... 26

**3.2** අධ්‍යයන බල ප්‍රදේශය තුළ යෝජිත හා ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති ........ 29

අමාත්‍යතුමාගේ අනුමැතිය ........ 33

ගැසට් නිවේදනය ........ 34

## 4.0 සංවර්ධන සැලසුම් රාමුව

**4.1** දැක්ම ........ 36

**4.2** දැක්මේ ප්‍රකාශය ........ 37

**4.3** අරමුණු ........ 38

**4.4** පරමාර්ථ ........ 38

## 5.0 ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය හා තත්ත්ව විශ්ලේෂණය

**5.1** ශ.දු.අ.ත විග්‍රහය ........ 42

## 6.0 සැලැස්ම

**6.1** සංකල්පීය සැලැස්ම ........ 70

**6.2** යෝජිත ඉඩම් පරිහරණ සැලසුම ........ 72

**6.3** භෞතික හා සමාජීය අපර ව්‍යුහ පහසුකම් සංවර්ධන උපාය මාර්ග ........ 75

**6.3.1** සේවා සැලසුම් ........ 75

**6.3.2** යෝජිත ප්‍රවාහන සැලැස්ම ........ 87

**6.3.3** ජල සැපයුම් සැලැස්ම ........ 99

**6.3.4** ජලාපවහන සැලැස්ම ........ 104

**6.3.5** අප ජලය බැහැර කිරීම් සැලැස්ම ........ 108

**6.3.6** ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම ........ 111

**6.4** ආර්ථික සංවර්ධන සැලැස්ම ........ 116

**6.5** තිරසර පාරිසරික උපාය මාර්ග ........ 127

**6.5.1** තෙත් බිම් සැලැස්ම ........ 127

**6.5.2** භූදර්ශන කළමනාකරණ සැලැස්ම ........ 130

**6.5.3** ආපදා අවදානම අවම කිරීමේ සැලැස්ම ........ 134

**6.5.4** පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම ........ 137

**6.6 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග** ........................................................................................ 142

**6.6.1 උපායමාර්ගික ව්‍යාපෘති**................................................................................................ 142

**6.2.2 වගකිව යුතු ආයතන රාමුව**........................................................................................... 233

**ඇමුණුම්** ........................................................................................................................................ 240

# සිතියම් ලැයිස්තුව

සිතියම් අංක 1.1 ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය - 2050
සිතියම් අංක 1.2 ශ්‍රී ලංකාවේ වත්මන් මාර්ග පද්ධතිය
සිතියම් අංක 1.3 කුරුණෑගල කලාපීකරණ සැලැස්ම 2015
සිතියම් අංක 2.1 කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටීම
සිතියම් අංක 2.2 සැලසුම් බල ප්‍රදේශයේ ජන ඝනත්වය - 2017
සිතියම් අංක 2.3 කුරුණෑගල නගර වටා ඇති පෝෂක ප්‍රදේශය
සිතියම් අංක 2.4 ඉඩම් පරිහරණ රටාව - කුරුණෑගල ම.න.ස බල ප්‍රදේශය
සිතියම් අංක 2.5 ඉඩම් පරිහරණ රටාව කුරුණෑගල සැලසුම් බල ප්‍රදේශය
සිතියම් අංක 2.6 සංවර්ධන සම්පිණ්ඩන විග්‍රහය - කුරුණෑගල සැලසුම් බල ප්‍රදේශය
සිතියම් අංක 2.7 වත්මන් මලාපවහන පද්ධතිය මගින් ආවරණය වන ප්‍රදේශය
සිතියම් අංක 2.8 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය
සිතියම් අංක 3.1 ගෙබිම් අනුපාතය කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය 2015-2018
සිතියම් අංක 5.1 දෛනික සංසරණ ජනගහනය සේවා අවශ්‍යතා සඳහා පැමිණෙන ප්‍රදේශ
සිතියම් අංක 5.2 නාගරික සම්බන්ධතා විශ්ලේෂණය
සිතියම් අංක 5.3 නගර මධ්‍යයේ වාහන නවත්වන ස්ථාන
සිතියම් අංක 5.4 කුරුණෑගල දිස්ත්‍රික්කයේ උෂ්ණත්ව ව්‍යාප්තිය
සිතියම් අංක 5.5 කුරුණෑගල ප්‍රදේශයේ උන්නතාංශය
සිතියම් අංක 6.1 සංකල්පීය සැලැස්ම
සිතියම් අංක 6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම - 2030
සිතියම් අංක 6.3 යෝජිත ජනාවාස සැලැස්ම - 2030
සිතියම් අංක 6.4 යෝජිත නිවාස සංවර්ධන ව්‍යාපෘති - 2030
සිතියම් අංක 6.5 යෝජිත සේවා සැලැස්ම- අධ්‍යාපන - 2030

සිතියම් අංක 6.6 යෝජිත සෞඛ්‍ය සේවා සැලැස්ම – 2030

සිතියම් අංක 6.7 ප්‍රවාහන සැලැස්ම – 2030

සිතියම් අංක 6.8 පෞද්ගලික රථ නැවතුම් සඳහා යෝජිත ස්ථාන

සිතියම් අංක 6.9 පවතින මාර්ග පද්ධතිය සඳහා කරන ලද Space Syntax විග්‍රහය

සිතියම් අංක 6.10 යෝජිත මාර්ග පද්ධතිය සඳහා කරන ලද Space Syntax විග්‍රහය

සිතියම් අංක 6.11 අධිවේගී මාර්ගය හා විකල්ප මාර්ගය ක්‍රියාත්මක විමත් සමග 2020 වර්ෂයේ මාර්ගවල වාහන ධාරිතාවය

සිතියම් අංක 6.12 අධිවේගී මාර්ගය හා විකල්ප මාර්ගය ක්‍රියාත්මක විමත් සමග 2030 වර්ෂයේ මාර්ගවල වාහන ධාරිතාවය

සිතියම් අංක 6.13 2030 වර්ෂය සඳහා යෝජිත ජල සැපයුම් ව්‍යාපෘති

සිතියම් අංක 6.14 විසල් කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් ආවරණය වන ප්‍රදේශය

සිතියම් අංක 6.15 ස්වභාවික ජලාපවහන රටාව කුරුණෑගල

සිතියම් අංක 6.16 කුරුණෑගල නගරය තුළ ජලාපවහන රටාව

සිතියම් අංක 6.17 යෝජිත ජලාපවහන ව්‍යාපෘති

සිතියම් අංක 6.18 විසල් කුරුණෑගල සනීපාරක්ෂක ව්‍යාපෘතිය මඟින් ආවරණය වන ප්‍රදේශ

සිතියම් අංක 6.19 ආර්ථික සංවර්ධන සැලැස්ම

සිතියම් අංක 6.20 භාණ්ඩ බෙදා හැරීමේ මධ්‍යස්ථානය සංවර්ධනය - නයිලිය

සිතියම් අංක 6.21 තොරතුරු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම - මල්කඩුවාව

සිතියම් අංක 6.22 නෙත් බිම් සැලැස්ම 2018-2030

සිතියම් අංක 6.23 යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම

# වගු ලැයිස්තුව


| | |
|---|---|
| වගු අංක 1.1 | කුරුණෑගල නගරය වටා ඇති මාර්ග පද්ධතිය |
| වගු අංකය 2.1 | නාගරික බල ප්‍රදේශයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| වගු අංකය 2.2 | ආංශික සේවා නියුක්තිය 2011-2016 |
| වගු අංකය 2.3 | සේවා අවශ්‍යතා සඳහා සංසරණ ජනගහනයේ පැමිණීම |
| වගු අංකය 2.4 | ඉඩම් පරිහරණ රටාවේ වෙනස් වීම් - 1985/2017 |
| වගු අංකය 2.5 | විසල් කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතියේ ධාරිතාවය |
| වගු අංකය 2.6 | විසල් කුරුණෑගල මලාපවහන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ධාරිතාවය |
| වගු අංකය 5.1 | ශ.දු.අ.ත විග්‍රහය (අරමුණ 01) |
| වගු අංකය 5.2 | දෛනික සංසරණ ජනගහනය - 2017 |
| වගු අංකය 5.3 | දළ ජාතික නිෂ්පාදනයට පළාත් දායකත්වය – (2009 – 2014 ) |
| වගු අංකය 5.4 | පළාත් අනුව පරිගණක සාක්ෂරතා අනුපාතය |
| වගු අංකය 5.5 | කුරුණෑගල නගර සීමාව තුළ වාණිජ ඉඩම් භාවිතය |
| වගු අංකය 5.6 | කුරුණෑගල නගරය තුල මාර්ගවල වාහන ධාරිතාවය |
| වගු අංකය 5.7 | මාර්ග දෙපස වාහන නවතා තැබීම. (පෙ:ව 10.00-10.30) |
| වගු අංකය 5.8 | මාර්ග සංවර්ධන අධිකාරි මාර්ග පුළුල් කිරිමේ ලේඛණය |
| වගු අංකය 5.9 | ශ.දු.අ.ත විග්‍රහය (අරමුණ 02) |
| වගු අංකය 5.10 | 2030 නේවාසික ඉඩම් අවශ්‍යතාවය |
| වගු අංකය 5.11 | ජනගහන වර්ධන ප්‍රවණතා 2001-2017 |

වගු අංකය 5.12 අඩු ආදායම් නිවාස සංඛ්‍යාව - කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය
වගු අංකය 5.13 යෝජිත ජල සම්පාදන ව්‍යාපෘති - 2030
වගු අංකය 5.14 ශදුඅත විග්‍රහය (අරමුණ 03)
වගු අංකය 6. 1 කලාප අනුව යෝජිත ජනගහන හා නිවාස ඝනත්වය - 2030
වගු අංකය 6. 2 2030 වර්ෂය සඳහා ජනගහනය හා නිවාස පුරෝකථන
වගු අංකය 6. 3 2030 වර්ෂයේදී ලබාදිය යුතු නිවාස සංඛ්‍යාව
වගු අංකය 6. 4 2030 වර්ෂයේදී ලබාදිය යුතු නිවාස යුතු නිවාස ආදායම් මට්ටම අනුව නිවාස වර්ගීකරණය කිරිම.
වගු අංකය 6. 5 හඳුනාගත් නිවාස සංවර්ධන ව්‍යාපෘති - 2030
වගු අංකය 6. 6 2030 වර්ෂය සඳහා පාසල් සඳහා පවතින ඉල්ලුම
වගු අංකය 6. 7 සංවර්ධනය කිරිමට යෝජිත පාසල් - 2030
වගු අංකය 6. 8 2030 වර්ෂය සඳහා දෛනික ජල අවශ්‍යතාවය
වගු අංකය 6. 9 2030 වර්ෂයේ ක්‍රියාත්මක කිරිමට යෝජිත ජල සම්පාදන ව්‍යාපෘති
වගු අංකය 6.10 අප ජලය බැහැර කිරිමේ අවශ්‍යතාවය 2030
වගු අංකය 6.11 කුරුණෑගල නාගරික බල ප්‍රදේශයේ සෘජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන
වගු අංකය 6.12 කුරුණෑගල නාගරික බල ප්‍රදේශය සඳහා 2019 - 2030 වසර සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම
වගු අංකය 6.13 කුරුණෑගල නාගරික බල ප්‍රදේශය සඳහා 2019 -2030 වසර සඳහා සෘජු හා වක්‍ර විනෝද පහසුකම් සැලැස්ම
වගු අංකය 6.14 ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛණය

# රූප ලැයිස්තුව


| | |
|---|---|
| රූපය 2.1 | කුරුණෑගල නගරයේ පැරණි ස්ථාන |
| රූපය 3.1 | පදිකයින් සඳහා පහසු ප්‍රවේශකත්වයක් නොමැතිවීම |
| රූපය 3.2 | ගැට්ටුවාන හා දම්බොක්ක අන්තර් හුවමාරු මධ්‍යස්ථානවල පිහිටීම. |
| රූපය 5.1 | නගර මධ්‍යයේ වාහන තදබදයට ලක්ව ඇති අයුරු |
| රූපය 5.2 | මාර්ග නිර්මාණය කල වාහන ධාරිතාවය |
| රූපය 5.3 | මාර්ග වල පවතින වාහන ධාරිතාවය – 2017 |
| රූපය 5.4 | මාර්ග දෙපස වාහන නවතා තැබීම- කුරුණෑගල නගරයේ නුවර, පුත්තලම, කොළඹ මාර්ගවල වාහන නවතා තැබිම. |
| රූපය 5.5 | පටු මාර්ග හා මාර්ග එකිනෙක සම්බන්ධ නොවීම - පුත්තලම ප්‍රධාන මාර්ගයේ සිට සම්බන්ධවන පටු මාර්ගයක් |
| රූපය 5.6 | විල්ගොඩ නගර සහා කම්කරු නිවාස |
| රූපය 5.7 | පුත්තලම ප්‍රධාන මාර්ගයේ සිට ආරම්භ වන මාර්ගයක ආරම්භය සහ අවසානය |
| රූපය 5.8 | ඇතුගලෙහි දර්ශනය ආවරණය කරමින් ගොඩනැගිලි හා දැන්වීම් පුවරු ඉදිකර තිබීම. |
| රූපය 5.9 | රජපිහිල්ල උද්‍යානය හා ඔරලෝසු කණුව හුදෙකලා විම. |
| රූපය 5.10 | රජ මාලිගාව පිහිටි ස්ථානය හුදෙකලා වීම. |
| රූපය 6.1 | ඇතුගල සිට පුත්තලම දෙසට නාගරීකරණය විහිදී යන ආකාරය |
| රූපය 6.2 | නගර මධ්‍යයේ සිට කොළඹ දෙසට හා දඹුල්ල දෙසට නාගරීකරණය |
| රූපය 6.3 | ඇතුගල ආශ්‍රිත යෝජිත උද්‍යානය |
| රූපය 6.4 | රජපිහිල්ල උද්‍යානය |
| රූපය 6.5 | රජපිහිල්ල උද්‍යානය ආශ්‍රිත ඇවිදීමේ මංතීරු සංවර්ධනය |
| රූපය 6.6 | සාරගම වැව අවට භූමි අලංකරණය |
| රූපය 6.7 | කුරුණෑගල රෝහලට යාබඳ සිරිසර කුඹුරු යායෙහි ඇවිදින මංතීරු සංවර්ධනය |
| රූපය 6.8 | වැල්ලව හා මුත්තෙට්ටුගල දුම්රිය ස්ථානයන්හි භූමි අලංකරණ ව්‍යාපෘතිය |

# ප්‍රස්තාර ලැයිස්තුව

ප්‍රස්තාර 2.1 මහ නගර සභා බල ප්‍රදේශය තුල දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය සංයුතිය

ප්‍රස්තාර 2.2 ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය සංයුතිය

ප්‍රස්තාර 5.1 මහා නගර සභාව තුළ වාණිජ ගොඩනැගිලි අයදුම්පත් සංඛ්‍යාව

ප්‍රස්තාර 5.2 ඉඩම් අනුබෙදුම් වීමේ ප්‍රවණතාවය 1990-2017



# පළමුවන කොටස

# 1

# 1

# හැඳින්වීම

1.1 සංවර්ධන සැලැස්මේ පසුබිම

1.2 සැලසුම් කණ්ඩායම

1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය

1.4 සැලසුම් ක්‍රියාවලිය

# 1.0 හැඳින්වීම

## 1.1 සංවර්ධන සැලැස්මේ පසුබිම

කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය 1979 ජූනි මස 01 වන දින අංක 38/16 දරණ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. එම ප්‍රදේශය සඳහා 2006.09.19 දිනැති අංක 1467/33 දරණ ගැසට් පත්‍රය මගින් 2006-2015 කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇති නමුත් එම සංවර්ධන සැලැස්මේ කාලය මේ වන විට ඉකුත් වී ඇත.

කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය වටා විහිදුනු කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් ග්‍රාම නිලධාරි කොට්ඨාශ 54 කින් යුත් වර්ග කි.මී. 96 කින් සමන්විත ප්‍රදේශය 2015.08.04 වන දින අංක 1926/20 දරණ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත. මධ්‍යම අධිවේගී මාර්ග සංවර්ධනයත් සමගම 2018.04.28 වන දින අංක 2068 /47 දරණ ගැසට් පත්‍රය මඟින් මුළු කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 1982 අංක 04 දරණ සංශෝධිත පනතෙහි II (අ) කොටසේ 8 අ වගන්තිය සැලසුම් කිරීමේ කාර්යය පටිපාටිය දැක්වෙන 8ට අනුව නාගරික සංවර්ධන අධිකාරි පනත 03 වන වගන්තිය යටතේ නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ සඳහා නගර සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ බලතල ඇත.

රාජ්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික ක්‍රියා මාර්ග හරහා ශ්‍රී ලංකාව සීඝ්‍රයෙන් නාගරීකරණය වීමත් සමඟ කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය වටා වූ මුළු සමස්ථ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම සීඝ්‍රයෙන් ජනාවාස වෙමින් නාගරිකරණයට ලක්වී ඇත. එමෙන්ම ජාතික සංවර්ධන ව්‍යාපෘතියක් වන මධ්‍යම අධිවේගී මාර්ගය කුරුණෑගල නගරය හරහා ගමන් කිරීමත් සමඟ කුරුණෑගල නගරය ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය වීමේ බලපෑම මුළු ප්‍රදේශයටම හිමිවන බැවින්, නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය (වර්ග කි.මී. 10.53) සහ මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම ඇතුලත් (වර්ග.කි.මී 245) මුළු ප්‍රදේශයම නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී සැලසුම් ප්‍රදේශය ලෙස තෝරා ගන්නා ලදී. එහිදී හඳුනා ගන්නා ලද උපායමාර්ගික ප්‍රදේශය සඳහා සවිස්තරාත්මක සැලැස්මක් සහ අනෙකුත් ප්‍රදේශය සඳහා පොදු සැලසුම් සහ ගොඩනැගිලි රෙගුලාසි හඳුන්වා දීමට කටයුතු කර ඇත.

# 1.2 සැලසුම් කණ්ඩායම

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරිමේදී පහත සඳහන් ආයතන වල මහ පෙන්වීම අදහස් හා යෝජනා ලබා ගන්නා ලදී .

## ප්‍රධාන පාර්ශවකරුවන්

- කුරුණෑගල මහ නගර සභාව
- කුරුණෑගල ප්‍රාදේශීය සභාව

## උපදේශන ආයතන

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කුරුණෑගල
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මාස්පොත
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- මල්ලවපිටිය
- මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කුරුණෑගල
- කලාප අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කුරුණෑගල
- පොලිස් දෙපාර්තමේන්තුව- කුරුණෑගල
- පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව- කුරුණෑගල
- වයඹ පළාත් සංවර්ධන අධිකාරිය- කුරුණෑගල
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව - හෙට්ටිපොල
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - කුරුණෑගල
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - කුරුණෑගල
- පොල් සංවර්ධන මණ්ඩලය - කුරණෑගල
- මධ්‍යම පරිසර අධිකාරිය- කුරුණෑගල
- පළාත් පරිසර අධිකාරිය - කුරුණෑගල
- දුම්රිය දෙපාර්තමේන්තුව - කුරුණෑගල
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කුරණෑගල
- ජාතික ගමනා ගමන මණ්ඩලය - කුරුණෑගල
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය- කුරණෑගල
- විදුලිබල මණ්ඩලය - කුලියාපිටිය
- ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය - කුරුණෑගල
- පාසල් වෑන් රථ හිමියන්ගේ සංගමය - කුරුණෑගල
- වෙළඳ සංගමය - කුරුණෑගල

## නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම

නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති තුමාගේ මඟ පෙන්වීම යටතේ වයඹ පළාත් අධ්‍යක්‍ෂතුමාගේ මෙහෙයවීම යටතේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය මඟින් සැලසුම් කරන ලද කුරුණෑගල නාගරික බල ප්‍රදේශය සඳහා වන මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරිමේදී සැලසුම් කණ්ඩායම පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| 01. ඩබ්.ජේ. සෙනෙවිරත්න මහතා | - | අධ්‍යක්ෂ (වයඹ පළාත) |
| 02. කේ.එම්. සේනාරත්න මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) |
| 03. අයි.එම්.පී. ජයතිලක මිය | - | සැලසුම් නිලධාරි (වරලත් නගර නිර්මාණ ශිල්පි කණ්ඩායම් නායක) |
| 04. වයි.එම්.එම්. ජීවාංගනී මිය | - | සැලසුම් නිලධාරි (වරලත් නගරනිර්මාණ ශිල්පි) |
| 05. ඩී.එම්.ටී.ඩී. දිසානායක මෙනවිය | - | සැලසුම් නිලධාරි (වාණිජ විද්‍යාවේදී විශේෂ) |
| 06. ඊ.එම්.පී.කේ. ඒකනායක මයා | - | සහකාර සැලසුම් නිලධාරි (නගර සැලසුම්කරණය පිළිබඳ උපාධිධාරි) |
| 07. එන්.පී.ඒ. කුමාරිහාමි මිය | - | සැලසුම් ශිල්පි |
| 08. එම්.ටී.යු. ප්‍රේමතිලක මිය | - | පරිගණක ක්‍රියකාරිණි |

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ

01. සංවර්ධන සැලසුම් අංශය
02. පර්යේෂණ හා සංවර්ධන අංශය
03. භූගෝලීය හා තොරතුරු පද්ධති අංශය
04. පාරිසරික හා භූ දර්ශන අංශය සහාය ලබා දෙන ලදී.

# 1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය

ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය - 2030 අනුව කුරුණෑගල නගරයට හිමිවි ඇති ස්ථානය, ජාතික හා ප්‍රාදේශීය වශයෙන් නගරයේ සම්බන්ධතාවය, ප්‍රදේශය තුල ක්‍රියාත්මක වෙමින් පවතින සහ යෝජිත සංවර්ධන ව්‍යාපෘති, මේ දක්වා නගරයට සකස් කර ඇති සැලසුම්වල දායකත්වය හා බලපානු ලබන විශේෂ අන පනත් පිළිබඳව මෙහිදී අවධානයට ලක් කෙරේ.

සංවර්ධන සැලැස්මක් යනු පුළුල් අරමුණු ඇතුලත් ප්‍රදේශයක් නිසි සැලසුම්කරණය, තිරසාර සංවර්ධනය සඳහා මඟ පෙන්වන උපාය මාර්ග විස්තර කරන ලියවිල්ලකි. එම ප්‍රදේශයට අදාළ අරමුණු වලට භෞතිකව ලඟාවීම සඳහා මඟ පෙන්වීමත්, නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශ ආර්ථික , සමාජයීය, පාරිසරික හා භෞතික වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ වූ සැලසුම් සකස් කිරීම, භෞතික වශයෙන් සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ බලතල නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇත. ඒ අනුව කුරුණෑගල නගරය සඳහා සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේදී නගරය භෞතික සංවර්ධනය කරා ලඟා කරවීමට ප්‍රමුඛත්වය දෙන ලදී.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් සකස් කර ඇති නව ජාතික භෞතික සැලැස්ම තුළින් කොළඹ , ත්‍රිකුණාමලය යා කරන ආර්ථික කොරිඩෝවෙහි ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස කුරුණෑගල නගරය හඳුනාගෙන තිබීම මඟින් 2030 වර්ෂය වන විට කුරුණෑගල නගරයට ජාතික වශයෙන් ඉහල වැදගත්කමක් ලබාදී ඇත. (ඇමුණුම සිතියම් අංක 1.1 හා වගු අංක 1.1) එම අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් කුරුණෑගල නගරය **"ඈතුගල වටකොට නැගෙන වයඹ මහා නගරය" (The Emergine Wayamba Metropolis encircling Ethugala)** යන දැක්ම වෙත ලඟාවීම සඳහා මෙම සැලැස්ම සකස් කර ඇත. කුරුණෑගල නගරය දිදුලන ආර්ථික මධ්‍යස්ථානයක්ලෙස සංවර්ධනය කිරීම සඳහා නගරයේ ආර්ථික මට්ටම වර්ධනයට අදාල ආර්ථික සංවර්ධන උපාය මාර්ග වෙත ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදී ඇත. ඒ සඳහා නාගරික ප්‍රදේශය පුළුල් කිරීම, භාණ්ඩ බෙදාහැරීමේ මධ්‍යස්ථානය හා තොරතුරු තාක්ෂණ ගම්මානය හඳුන්වා දීම, කර්මාන්ත පුරය පුළුල් කිරීම වැනි ආර්ථික සංවර්ධන උපාය මාර්ග හඳුන්වා දී ඇත.

දිවයිනේ උතුර-දකුණ යා කරන මාර්ග 05ක් කේන්ද්‍රිය වන ස්ථානයක පිහිටීම, උතුරු නැගෙනහිර දුම්රිය මාර්ගය කුරුණෑගල නගරය හරහා ගමන් කිරීම හේතුවෙන් කොළඹ, මහනුවර , පොළොන්නරුව,අනුරාධපුර, පුත්තලම, හලාවත, කෑගල්ල, මීගමුව, මාතලේ, සහ ත්‍රිකුණාමලය වැනි දිවයිනේ ප්‍රධාන නගර සමඟ සෘජු මාර්ග හා ප්‍රවාහන සම්බන්ධතාවයක් කුරුණෑගල නගරය හිමිකරගෙන ඇත. (ඇමුණුම් සිතියම් අංක 1.2 හා වගු අංක 1.1)

එමෙන්ම දැනටමත් ක්‍රියාත්මක මධ්‍යම අධිවේගී මාර්ගය කුරුණෑගල නගරය හරහා ගමන් කිරීමත් , යෝජිත කුරුණෑගල - දඹුල්ල දුම්රිය මාර්ගය යනාදි ව්‍යාපෘති ක්‍රියාත්මක වීමත් සමඟ කුරුණෑගල

නගරය ලංකාවේ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස තවදුරටත් කාර්යක්ෂම වේ. ඒ අනුව මෙම සියලුම ගමනාගමන මාධ්‍ය ඒකාබද්ධ කරමින් ප්‍රවාහනය මුල්කරගත් සංවර්ධන මධ්‍යස්ථානයක් (Transit Oriented Development ) ලෙස සංවර්ධන කිරීම සඳහා ආර්ථික සංවර්ධන උපායමාර්ගයක් හඳුන්වාදී ඇති අතර, නගර මධ්‍යයට පැමිණීම අනවශ්‍ය වාහන නගර මධ්‍යය මගහැර යාම සඳහා ප්‍රධාන මාර්ග සම්බන්ධ කරමින් විකල්ප මාර්ගයක් හඳුන්වා දී නගරය තුල ගමනාගමන කාලය අවම වන ලෙස ඒකාබද්ධ ගමනාගමන සැලැස්මක් මෙම සැලැස්ම මඟින් හඳුන්වා දී ඇත.

ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය - 2030 මඟින් කුරුණෑගල ප්‍රදේශය නේවාසික සංවර්ධනය සඳහා සුදුසුම ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති අතර, 2030 වන විට විසල් කුරුණෑගල ප්‍රදේශය සඳහා ලක්ෂ 10ක (මිලියනයක) නේවාසික ජනගහනයක් පුරෝකථනය කර ඇත. එම අරමුණ වෙත ළඟාවීමට මෙම සැලසුම් ප්‍රදේශය තුල 250,000ක නේවාසික ජනගහයක් සඳහා භෞතික හා සමාජයීය අපරව්‍යුහ පහසුකම් සැපයීමට අදාළ ව්‍යාපෘති හා නේවාසික කලාප මෙම සැලැස්ම මඟින් ඉදිරිපත් කර ඇත.


නාගරික සංවර්ධන අධිකාරිය විසින් කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය සඳහා නගර සංවර්ධන සැලස්මක් (2006-2015) සකස් කර තිබූ අතර, ප්‍රධාන පරිපාලන හා වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරිම එහි අරමුණ වී ඇත. නමුත් එම සැලැස්මේ කලාප සැලැස්ම , ගෙබිම් අනුපාත සැලැස්ම, බිම් කට්ටි පිරිවිතර සැලැස්ම මඟින් වාණිජ කටයුතු සඳහා නගරය වෙත පවතින ඉල්ලුම සපුරාලීමට අපොහොසත් වීමත්, නගරය වෙත ආයෝජිකයින්ගේ ආකර්ෂණය අඩු කිරීමටත් හේතුවී ඇත. (ඇමුණුම සිතියම් අංක 1.3) කුරුණෑගල නගරය වෙත පැමිණෙන ආයෝජකයින් වෙනත් නගර කරා යොමුවීම, ප්‍රධාන මාර්ග දිගේ රේඛිය සංවර්ධනය සඳහා යොමුවීම යනාදිය මෙහි ප්‍රතිඵල වේ. නමුත් ඒ වන විට මහ නගර සභා බල ප්‍රදේශය පමණක් නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් වූ බැවින් එහි බලපෑමට ලක්ව අවිධිමත් ලෙස සීඝ්‍ර සංවර්ධනයට ලක්වී ඇති ප්‍රාදේශීය සභා සීමාව (සැබෑ නාගරික සීමාව) සැලකිල්ලට ගෙන නැත.

වයඹ පලාතේ ප්‍රධාන පරිපාලන හා වාණිජ නගරය වීම හේතුවෙන් දෛනිකව ලක්ෂ 03කට ආසන්න ජනගහනයක් නගරය තුලට පැමිණේ. 2030 නගර සංවර්ධන සැලැස්ම මඟින් නගරය වෙත ආයෝජකයින් වැඩි වශයෙන් ආකර්ෂණය වන, නගරය සඳහා පවතින ඉල්ලුම සපුරාලිය හැකිවන පරිදි නගරයට බාහිරින් ප්‍රධාන මාර්ග 04 සම්බන්ධ කරමින් යෝජිත විකල්ප මාර්ගය උපාය මාර්ගික ව්‍යාපෘතියක් ලෙස ප්‍රයෝජයට ගනිමින් නගරය පුළුල් කිරීම මෙම සැලැස්ම මඟින් හඳුන්වාදී ඇත.

නමුත් කුරුණෑගල අනන්‍යතාවය "ඇතුගල" යන්න නොසලකමින් වර්තමානයේ සිදුවන සංවර්ධනය පාලනය කිරිම සඳහා නගර මධ්‍යයට හා දැනට ඇතුගල හොඳින් දර්ශනය වන බවට හඳුනාගත් ස්ථාන වෙත ඇතුගලින් 1/3 ක් දර්ශනය වන පරිදි උස සීමා කිරිමේ සැලැස්මක්ද හඳුන්වාදී ඇත.

ඉහත සඳහන් උපායමාර්ග ක්‍රියාත්මක කිරිම සඳහා කෙටි කාලීන , මධ්‍ය කාලීන හා දිගු කාලීන වශයෙන් ක්‍රියාත්මක කල යුතු ව්‍යාපෘති හඳුන්වාදී තිබේ.

සිතියම් අංක **1.1** ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය – **2050**




*මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව*

# 1.4 සැලසුම් ක්‍රියාවලිය

| | |
|---|---|
| පියවර 01 | මූලික අධ්‍යයනය |
| පියවර 02 | විෂය පථය |
| පියවර 03 | ප්‍රශ්න සහ සංවර්ධන විභවතා හඳුනා ගැනීම |
| පියවර 04 | දැක්ම , අරමුණු හා පරමාර්ථ හඳුනා ගැනීම |
| පියවර 05 | සවිස්තරාත්මක විග්‍රය |
| පියවර 06 | සංවර්ධන සැලැස්ම හා උපාය මාර්ග හඳුනා ගැනීම |
| පියවර 07 | නීති හා රෙගුලාසි සකස් කිරිම. |
| පියවර 08 | පළාත් පාලන ආයතනයේ එකඟතාවය |
| පියවර 09 | ලේඛණගත සැලැස්ම නා.සං.අ සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරිම හා අනුමැතිය ලබා ගැනීම. |
| පියවර 10 | ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරිම |

**මෙම සංවර්ධන සැලැස්ම පහත පියවරයන් යටතේ සිදුකරන ලදී.**

## මූලික අධ්‍යයනය.

කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය හා කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත් ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මූලිකව භෞතික, ආර්ථික හා සමාජයීය අංශ යටතේ ප්‍රාථමික හා ද්විතීය දත්ත විශ්ලේෂණය කරන ලදී. මෙහිදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව , මාර්ග සංවර්ධන අධිකාරිය , මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන මඟින් හා සෞඛ්‍ය, අධ්‍යාපනය, ජල සම්පාදන හා විදුලි බලය යනාදී අපරව්‍යුහ පහසුකම් වලට අදාළ ආයතන මඟින් දත්ත ලබාගනිමින් නාගරික ප්‍රදේශයේ ඉඩම් භාවිතය , අපරව්‍යුහ පහසුකම් ව්‍යාප්තිය, ජනගහනය, නිවාස ව්‍යාප්තිය හා පාරිසරික තත්ත්වය පිළිබඳව සිතියම් ආශ්‍රයෙන් විශ්ලේෂණය කරන ලදී.

## විෂය පථය හඳුනා ගැනීම.

මෙහිදී ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය - 2030 අනුව කුරුණෑගල නගරයේ අනාගත දැක්ම , නගරයේ ජාතික හා කලාපීය සම්බන්ධතාවය, නගරය ආශ්‍රිත ප්‍රදේශය තුළ යෝජිත හා ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සවිස්තරාත්මකව අධ්‍යයනය කරන ලදී.

## ප්‍රශ්න හා සංවර්ධන විභවතා හඳුනාගැනීම.

මෙහිදී නගරය තුළ පවතින එක් එක් ආයතනයන් නගරයේ ඇති සංවර්ධන විභවතාවයන් වැඩි දියුණු කිරීම සඳහා දායක වී ඇති ආකාරය පැන නැගී ඇති ගැටළුකාරී තත්ත්වයන් හා ඒවා මඟ හරවා ගත හැකි ආකාරය පිළිබඳව සම්පත්දායකයින් , පාර්ශවකරුවන්,රාජ්‍ය හා පෞද්ගලික අංශයන් හා සමිති සමාගම් හා එක් එක් අංශයන්හි පාර්ශවකරුවන් නගරය දියුණු කිරීමේ ඇති හැකියාව පිළිබඳ දක්වන ලද අදහස් සැලකිල්ලට ගනිමින් ඒවා විශ්ලේෂණය කිරීම මඟින් නගරය තුළ පවතින සංවර්ධන විභවතාවයන් හා ගැටළුකාරි තත්ත්වයන් හඳුනාගන්නා ලදී. ඒ සඳහා 2017.06.27 දින කුරුණෑගල මහ නගර සභා රැස්වීම් ශාලාවේදී මහජන නියෝජිතයින්ගේ අදහස් ලබා ගැනීමේ පළමු රැස්වීම පවත්වන ලදී. දෙවන රැස්වීම වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් 2017.11.01 දින වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලිච්ඡවී ශාලාවේදී පවත්වන ලදී. එමෙන්ම 2017.08.18 හා 2018.08.19 යන දිනයන්හි ප්‍රශ්ණාවලියක් මඟින් හා කොග්නිටිව් සමීක්ෂණය මඟින් නගරයේ ගැටළු හා නගරය සම්බන්ධයෙන් ඔවුන්ගේ මූලික මතයන් පිළිබඳව එදිනෙදා නගරයට පැමිණෙන හා නගරයේ පදිංචි ජනතාවගේ අදහස් ලබා ගන්නා ලදී.

## දැක්ම, අරමුණු හා පරමාර්ථ හඳුනා ගැනීම.

මෙහිදී ප්‍රදේශය තුළ පවතින සංවර්ධන විභවතාවයන් මනා ලෙස ප්‍රයෝජනයට ගනිමින් ප්‍රදේශය තුල පවතින ගැටළු මඟහරවා ගනිමින් පාරිසරික, ආර්ථික, සමාජයීය හා භෞතික අංශයන්ගේ සමබර සංවර්ධනය තුලින් නගරය දියුණුව කරා රැගෙන යාම සඳහා අවශ්‍ය දැක්ම හා ඉලක්ක සකස් කරනු ලැබීය.

## සවිස්තරාත්මක විශ්ලේෂණය.

මෙහිදී ප්‍රදේශය සඳහා දැක්ම ලඟාකර ගැනීම සඳහා අරමුණු සකස් කර ගැනීමෙන් අනතුරුව අරමුණු ඉටු කර ගැනීම සඳහා තිබෙන ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය කරන ලදී. එහිදී එම කරුණු විශ්ලේෂණය සඳහා අවශ්‍ය නගර මධ්‍යයේ නාගරික කටයුතු සමීක්ෂණය (Activity Survey) , වාහන නැවතුම් සමීක්ෂණය වැනි කටයුතු සිදුකරන ලදී.

## සංවර්ධන සැලැස්ම හා උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම.

මෙහිදී අරමුණු ළඟාකර ගැනීම සඳහා භෞතික , පාරිසරික, ආර්ථික, සමාජයීය යන ආකාරයට යෝජිත භූමි පරිහරණ සැලැස්ම, භෞතික හා සමාජයීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපාය මාර්ග , ආර්ථික සංවර්ධන සැලැස්ම , තිරසාර පාරිසරික උපාය මාර්ග ඇතුළත් උපාය මාර්ගික සැලසුම් සකස් කරන ලදී.

## නීති රෙගුලාසි සකස් කිරිම.

සංවර්ධන සැලැස්ම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධ නීති හා රෙගුලාසි, ඉඩම් පරිහරණයන් සම්බන්ධයෙන් වන නීති හා රෙගුලාසි ද සංවර්ධන සැලැස්මේ දැක්ම කරා ළඟා වීම සඳහා දැනට හඳුනාගත් ගැටළු හා ඉදිරියේදී උද්ගත වේ යැයි විශ්ලේෂණය මඟින් අපේක්ෂා කරනු ලබන ගැටළු ද අවම කර ගැනීම සඳහා නීත්‍යානුකූල රාමුවක් ඇති කිරීමට මෙහිදී කටයුතු කරන ලදී.

## පළාත් පාලන ආයතනයේ එකඟතාවය.

සංවර්ධන සැලැස්ම සකස් කිරීමෙන් පසු එම සැලැස්මට අනුගත වන කුරුණෑගල මහ නගර සභාව සහ කුරුණෑගල ප්‍රාදේශීය සභාවෙහි අදහස්, යෝජනා හා එකඟතාවය ලබා ගැනීම සඳහා යොමු කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ. සම්පත් දායකයින් , පාර්ශවකරුවන්ගේ හා මහජන නියෝජිතයින්ගේ එකඟතාවය ලබා ගැනීම සඳහා 2018.11.28 දින කුරුණෑගල මහ නගර සභාවට හා 2019-01-22 දින කුරුණෑගල ප්‍රාදේශීය සභාවට කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම යොමුකර එකඟතාවය ලබා ගන්නා ලදී.

## ලේඛනගත සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරිම හා අනුමැතිය ලබාගැනීම.

ලේඛනගත කරන සංවර්ධන සැලැස්ම තව දුරටත් නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා යෝජනා ලබා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කර අනුමත කිරීම සහ ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම.

## ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම.

සංශෝධිත සැලැස්මේ කෙටුම්පත නීත්‍යානුකූල සැලැස්මක් බවට පත් කිරිම.

# 2

# මූලික සැලසුම් අධ්‍යයන ප්‍රදේශය

2.1 සැලසුම් අධ්‍යයන බල ප්‍රදේශයේ මූලික තොරතුරු

2.2 සැලසුම් සංදර්භය හා තත්ත්ව විශ්ලේෂණය

2.3 නගර සංවර්ධන සැලැස්ම සකස් කරන භූමි ප්‍රදේශයේ සීමා නිර්ණය කිරීම

# 2.0 මූලික සැලසුම් අධ්‍යයන ප්‍රදේශය

## 2.1. සැලසුම් අධ්‍යයන බල ප්‍රදේශයේ මූලික තොරතුරු



### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර යා කරන මංසන්ධි නගරයක් වශයෙන් කුරුණෑගල නගරය උපාය මාර්ගික ස්ථානයක පිහිටා ඇති අතර, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය - 2030 අනුව බටහිර-නැගෙනහිර ආර්ථික කොරිඩෝවෙහි පිහිටි ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30කින් සමන්විත අතර, එයින් කුරුණෑගල , මල්ලවපිටිය හා මාස්පොත යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 03කින් සමන්විත ප්‍රදේශය මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී අධ්‍යයන බල ප්‍රදේශය වශයෙන් අධ්‍යයනය කරන ලදී. (සිතියම් අංක 2.1)


*වගු අංකය 2.1 නාගරික බල ප්‍රදේශයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ*

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නම | භූමි ප්‍රමාණය (වර්ග කි.මි) | ග්‍රාම නිලධාරි කොට්ඨාශ සංඛ්‍යාව |
|---|---|---|
| කුරුණෑගල | 95.21 | 54 |
| මල්ලවපිටිය | 84.34 | 45 |
| මාස්පොත | 65.53 | 33 |
| එකතුව | 245.08 | 132 |

කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ව.කි.මී. 10.53කින් යුත් ග්‍රාම නිලධාරි වසම් 12කින් සමන්විත ප්‍රදේශය ලංකාවේ කුඩාම මහ නගර සභාව වන කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශයට අයත් වේ. කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහ නගර සභාවට අයත් නොවන ඉතිරි ග්‍රාම නිලධාරි කොට්ඨාශ 42 සහ මාස්පොත හා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ට අයත් ග්‍රාම සේවා වසම් 78කින් යුතු ප්‍රදේශය කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වේ.

කුරුණෑගල නගරය ශ්‍රී ලංකාවේ 05 වන රාජධානිය වේ. III වන බුවනෙකබාහු රජතුමා ක්‍රි.ව 1293දී කුරුණෑගල තම රාජධානිය බවට පත් කර ගෙන ඇති අතර වසර 48ක් රාජධානිය පැවතී ඇත. දළදා සිරිත, උමන්දාව, ජාතක කථා පොත, සඳකිඳුරුවත වැනි සාහිත්‍යමය කෘති ලියවුණු සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වශයෙන් කුරුණෑගල රාජධානියේ III වන පරාක්‍රමබාහු රජ සමය සඳහන්වී ඇත.

**සිතියම් අංක 2.1 කුරුණෑගල ප්‍රාදේශීය සහා බල ප්‍රදේශය**



16 හා 17 වන ශත වර්ෂ වලදී පෘතුග්‍රීසින් විසින් කුරුඳු, ගම්මිරිස් වැනි ද්‍රව්‍ය එකතු කරන මධ්‍යස්ථානයක් වශයෙන්ද 17 හා 18 වන ශත වර්ෂ වලදී ඉංග්‍රීසින් විසින් සත් කෝරළයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වශයෙන්ද කුරුණෑගල නගරය ප්‍රයෝජනයට ගෙන ඇත.

රූපය 2.1 කුරුණෑගල නගරයේ පැරණි ස්ථාන




*රජපිහිල්ල තානායම*



*බිෂොප් නිවාසය*



*දුම්රිය ස්ථානය විවෘත කිරීම*

පසු කාලයේදී කුරුණෑගල නගරය පරිපාලනමය වශයෙන් පළාත් මණ්ඩලයක (වර්ෂ 1800) සිට මහ නගර සභා (වර්ෂ 1952) තත්ත්වයට විකාශනය වී ඇත. ඓතිහාසික යුගයේ කුරුණෑගල නගරය සැලසුම් සහගත නගරයක් වශයෙන් තිබූ බවට "කුරුණෑගල පුරාවෘත්ති" යන ග්‍රන්ථයේ සඳහන් වේ. පුරාණ නගරය පිහිටි ස්ථානයේම නගරය පිහිටා ඇති නමුත් රාජධානි යුගයේ නිර්මාණය වූ විශාල වැව අද වනවිට ශේෂ වී එම ප්‍රදේශ නාගරික කටයුතු සඳහා යොමු වී ඇති අතර, කඳු වළල්ලකින් වටවූ පොකුණක් වැනි පහත් බිමක නගරය ඉදිවී ඇති බව නිරීක්ෂණය කල හැක.

කුරුණෑගල නගරය දේශගුණික වශයෙන් අන්තර් මධ්‍යය කලාපයට අයත් වන අතර, උත්තාංශය මීටර් 300ට වඩා අඩු පහතරට කලාපයට අයත් වේ. නැගෙනහිර දේශාංශ අංශක 80 රේඛාවට මායිම්ව පිහිටීම හේතුවෙන් තරමක උෂ්ණසුම් දේශගුණයක් පවතින අතර, මෙම ප්‍රදේශයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක $27^0$ ක් වුවද නගරය ගල් පර්වත පද්ධතියකින් වටවීම හේතුවෙන් හා නොවැම්බර් මස සිට මාර්තු දක්වා හමන ඊශාන දිග මෝසම් සුළං නගරයට ඇතුල්වීමට ඇතුගල බාධාවක් ලෙස ක්‍රියාකිරීම හේතුවෙන් මෙම කාලයේදී සාමාන්‍ය නගර උෂ්ණත්වය සෙල්සියස් අංශක 30 ද ඉක්මවනු ලබයි. මෙම ප්‍රදේශයේ සාමාන්‍ය වර්ෂාපතනය මි.මි 1750-2500ක් වේ.

# 2.2. සැලසුම් සංදර්භය හා තත්ත්ව විශ්ලේෂණය

## ජනගහන තොරතුරු

2017 වර්ෂයේදී අධ්‍යයන බල ප්‍රදේශය තුල මුළු ජනගහනය පුද්ගලයින් 180,399කි. කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ පුද්ගලයින් 26,205 ක්ද, කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පුද්ගලයින් 154,194 ක් ද ජීවත් වේ. මුළු ජනගහනයෙන් 85%ක් සිංහල වන අතර, 48%ක් පුරුෂ පක්ෂයට අයත් වේ. 2001-2011 ජන හා සංඛ්‍යා ලේඛන තොරතුරු වලට අනුව මෙම ප්‍රදේශය තුල ජනගහන වර්ධන වේගය ලංකාවේ හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනගහන වර්ධන වේගයට වඩා වැඩි අගයක් ගැනීම මගින් මෙම ප්‍රදේශයට අභ්‍යන්තර සංක්‍රමණයක් පවතින බව පැහැදිලි වේ. (ලංකාවේ 0.76, කුරුණෑගල 0.97 සැලසුම්මය කලාපය 0.98) එමෙන්ම මහ නගර සභා සීමාවට අයත් ග්‍රාම නිලධාරි වසම් වලට වඩා නගරය ආසන්නයේ තෝරයාය, හෙට්ටිගෙදර, තිත්තවැල්ල වැනි ප්‍රාදේශීය සභාවෙහි ග්‍රාම නිලධාරි වසම් වල ඉහළ ජනගහන වර්ධන වේගයක් පෙන්නුම් කරයි.

අධ්‍යයන ප්‍රදේශය තුළ ජන ඝනත්වය අධ්‍යයනයේදී කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුල ඉහල ජන ඝනත්වයක් පෙන්නුම් කරන අතර, මල්කඩුවාව - උතුර, මල්කඩුවාව - දකුණ, විල්ගොඩ වැනි නගරයට ආසන්නම, නගරයේ පහසුකම් ඉක්මණින් ලබා ගැනීමේ හැකියාව ඇති ප්‍රදේශයේ ඉහල ජන ඝනත්වයක් පෙන්නුම් කරයි. (ඇමුණුම සිතියම් අංක 2.2)

එසේම අධ්‍යයන ප්‍රදේශය තුළ මුළු ජනගහනයෙන් 78%ක් ශ්‍රම බලකායට අයත්වන අතර, එයින් සේවා නියුක්තිය 77% වේ. එයින් 55% ක් වැනි ඉහළ ප්‍රතිශතයක් රාජ්‍ය හා පෞද්ගලික සේවා අංශයේ රැකියාවල නියුක්ත වේ. තවද සැලසුම්මය ප්‍රදේශය තුල මුළු ජනගහනයෙන් 45%ක් අ:පො:ස (උසස් පෙළ) සහ ඉහළ අධ්‍යාපනයක් ලද ජනගහනයක් බව නිරීක්ෂණය වන අතර එමගින් යෝජිත ආර්ථික සංවර්ධනයන් සඳහා පුහුණු ශ්‍රමය යොදා ගැනීමේ හැකියාව පවතී. (ඇමුණුම වගු අංක 2.2)

## ආර්ථික මට්ටම

ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනය සඳහා පළාත් දායකත්වය අධ්‍යයනයේදී වයඹ පළාත 03 වන ස්ථානය ගෙන ඇත. ( මුළු නිෂ්පාදනයෙන් 10.7%ක) එයින් 5.6%ක් වැනි ඉහළ දායකත්වයක් සේවා අංශය මඟින් ලබාදී ඇති අතර, කුරුණෑගල නගරය වයඹ පළාතේ හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන හා වාණිජ නගරය වීම මත කුරුණෑගලින් ඒ සඳහා ඉහළ දායකත්වයක් ලබාදී ඇතැයි නිගමනය කළ හැක.පළාතේ ප්‍රධාන පරිපාලන හා සේවා නගරය වීම මත කුරුණෑගල නගරයේ දෛනික සංසරණ ජනගහනය ලක්ෂ 03කට ආසන්න වන අතර, කුරුණෑගල නගරය වෙත කි.මී 25ක පමණ අරයකින් යුතු ආසන්නතම පෝෂක ප්‍රදේශයෙන් රැකියා, පාසල් අධ්‍යාපනය, වාණිජ සේවා වැනි සේවා අවශ්‍යතා සඳහා සැලකිය යුතු ජනගහනයක් දෛනිකව පැමිණේ. කි.මී 50ක අරයකින් යුතු පෝෂක ප්‍රදේශයෙන් සෞඛ්‍ය (රෝහල් හා විශේෂඥ

සේවා) ,විදේශ රැකියා ආයතන, උපකාරක පන්ති , පරිපාලන සේවා අවශ්‍යතා සඳහා පැමිණීම නිරීක්ෂණය කළ හැක. (ඇමුණුම සිතියම් අංක 2.3)

නගරයේ පවතින පාසල් වල, පාසල් ජනගහනයෙන් 5/6ක් නගරයෙන් පිටත ප්‍රදේශයෙන් පැමිණෙන්නන් වන අතර, උපකාරක පංති සඳහා සති අන්ත දිනවල 100,000ක පමණ ජනගහනයක් නගරයට පැමිණේ. එමෙන්ම විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් 2016 වර්ෂයේ තෝරාගන්නා ලද ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම විදේශ රැකියා ආයතන 10න් 07ක්ම (ශ්‍රීන්වේ. අස්ලිය, අල්අකීම්...) කුරුණෑගල නගරයේ ස්ථානගත වී තිබීම මත එම ආයතන වල පවතින කීර්ති නාමය හේතුකොට ගෙන විදේශ රැකියා අවශ්‍යතා සඳහා කොළඹ, ගාල්ල , යාපනය වැනි ලංකාවේ සියලු ප්‍රදේශවල ජනතාව කුරුණෑගල නගරය වෙත පැමිණීමක් දැකිය හැක. (ඇමුණුම වගු අංක 2.3 හා 2.4) තවද පළාතේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වීම නිසා රැකියා අවශ්‍යතා සඳහා දෛනිකව 30,000ක පමණ ජනගහනයක් නගරයට පැමිණීම නිරීක්ෂණය වේ. (වැඩි විස්තර සඳහා 05 වන පරිච්ඡේදය බලන්න)

## ඉඩම් පරිහරණ රටාව

*වගු අංකය 2.4 ඉඩම් පරිහරණ රටාවේ වෙනස් වීම - 1985/2017*

| භාවිතය | 1985 % | 1997 % | 2002 % | 2017 % |
|---|---|---|---|---|
| නේවාසික | 29.80 | 34.13 | 36.57 | 38.5 |
| වාණිජ | 1.46 | 4.65 | 4.97 | 7.3 |
| කර්මාන්ත | 0.78 | 1.00 | 1.18 | 0.15 |
| විනෝද පහසුකම් | 0.71 | 0.89 | 0.98 | 1.04 |
| මාර්ග සහ ප්‍රවාහනය | 4.23 | 6.94 | 7.64 | 8.69 |
| රාජ්‍ය හා අර්ධ රාජ්‍ය | 5.96 | 10.53 | 10.78 | 11.78 |
| ආගමික | 1.67 | 1.70 | 1.95 | 2.0 |
| වී වගාව | 15.77 | 13.94 | 13.19 | 11 |
| පොල් වගාව | 18.51 | 6.17 | 4.35 | 1.49 |
| හිස් ඉඩම් | 1.93 | 0.76 | 1.73 | 2.5 |
| සුසාන භූමි | 0.60 | 0.69 | 0.69 | 0.55 |
| ගල්තලා සහ වනාන්තර | 13.50 | 13.20 | 10.9 | 10.14 |
| ජලාශ | 5.00 | 5.00 | 5.01 | 4.3 |
| එකතුව | **100.00** | **100.00** | **100.00** | **100.00** |

මුලාශ්‍රය : දළ නගර සංවර්ධන සැලැස්ම 1985-1997, කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම 2006 2015, නාගරික සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර සමීක්ෂණය-2017

ඉහත වගුවෙන් දැක්වෙන පරිදි ප්‍රධාන මාර්ග ජාලය සංකේන්ද්‍රණය වී මංසන්ධි නගරයක් වශයෙන් කුරුණෑගල නගරය සංවර්ධනය වීම හේතුවෙන් නගර මධ්‍යයේ ඉහල වාණිජ සංවර්ධනයක් දක්නට ලැබෙන අතර, නගරයෙන් පිටත ප්‍රධාන මාර්ග දිගේ රේඛීය වාණිජ සංවර්ධනයක් දක්නට ඇත. නමුත් නගර මධ්‍යයේ පවා ප්‍රධාන මාර්ග ආශ්‍රිතව පිහිටි අභ්‍යන්තර මාර්ග වලින් ප්‍රවේශය ලබන ඇතැම් මාර්ග වල මාර්ග පටු බව,මාර්ග එකිනෙකට සම්බන්ධ නොවීම යනාදි හේතු මත වාණිජ සංවර්ධනය සඳහා යොමු වී නොමැති බවද නිරීක්ෂණය කල හැක. (ඇමුණුම් සිතියම් අංක2.4,2.5 සහ 2.6)

නේවාසික සංවර්ධනය අධ්‍යයනයේදී කුරුණෑගල මහ නගර සභා සීමාව සහ එයට ආසන්නතම ප්‍රදේශය තුල පර්. 6-15 දක්වා වූ කුඩා ඉඩම් කොටස් වල නේවාසික සංවර්ධනයක් දක්නට ලැබුණද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි අභ්‍යන්තර ප්‍රදේශ වල අක්කර 2,3 ආදී ගෙවතුවල නේවාසික සංවර්ධනයක් දැකිය හැක. කුරුණෑගල මහ නගර සභා සීමාව තුල 2001-2017 ඉඩම් පරිහරණ වෙනස් වීම් අධ්‍යයනයේදී වාණිජ භාවිතාවන්හි සැලකිය යුතු වර්ධනයක්ද නේවාසික සංවර්ධනයේ සුළු වැඩිවීමක් ද දැකිය හැක. තවද නගරයේ ඉඩම් භාවිතය අධ්‍යයනයේදී පාසල් ,රජයේ කාර්යාල යනාදිය සඳහා ඉඩම් ප්‍රමාණයෙන් 10%ක් වැනි ඉහල ප්‍රතිශතයක් වෙන්වී ඇති බවද නිරීක්ෂණය කල හැක.

සැලසුම්මය බල ප්‍රදේශයේ ඉඩම් පරිහරණ සැලැස්ම අධ්‍යයනයේදී වී වගාව සඳහා 18%, පොල් වගාව සඳහා 21.6% යෙදවී ඇති නමුත් මෙම කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 16.6% ජල පහසුකම් නොමැති වීම හේතුවෙන් වගා කටයුතු සඳහා භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්වී ඇත. පොල් වගාව සඳහා භූමි ප්‍රමාණයෙන් 21.6%ක් වෙන් වී තිබුණද මෙම ප්‍රදේශයේ පොල් ඉඩම්වල ඵලදායිතාවය අඩුවීම හේතුවෙන් ප්‍රදේශය පුරා පොල් ඉඩම් නේවාසික සංවර්ධනය සඳහා යොමු වීමේ ගැටළුවක් ද පවතී. ඉහත පරිදි කෘෂිකාර්මික ඉඩම් භාවිතය සමස්ථ ඉඩම් පරිහරණයට අනුව ඉහළ අගයක් ගනු ලැබුවද එමගින් ආර්ථිකයට දක්වන දායකත්වය සැලකිය යුතු මට්ටමක නොමැත.(ඇමුණුම සිතියම් අංක 2.5)

කාර්මික කටයුතු සඳහා වෙන්වී ඇති භූමි ප්‍රමාණය අධ්‍යයනයේදී නගර සභා සීමාව තුළ කාර්මික ඉඩම් භාවිතය ක්‍රමයෙන් අඩු වීමක් ද ප්‍රාදේශීය සභා සීමාව තුළ මහා පරිමාණ කර්මාන්තවල සිට ගෘහස්ථ කර්මාන්ත දක්වා කර්මාන්ත 3694ක් ස්ථානගත වීමත්, සේවකයින් 11,618ක් සේවය කරන බවත් දත්ත මඟින් පැහැදිලි වේ. මීට අමතරව පළාත් සභාව මඟින් පාලනය වන හෙරළියාවල හා දංගස්පිටිය යන කර්මාන්තපුර මෙම ප්‍රදේශය තුළ ස්ථානගත වීමත් ඒවායෙහි මෙම ප්‍රදේශයේ අමුද්‍රව්‍ය වූ කොහු ආශ්‍රිත නිෂ්පාදන වැනි කර්මාන්ත ස්ථානගත වීමත් තව දුරටත් කර්මාන්ත සඳහා ආයෝජකයින් වෙතින් පවතින ඉල්ලුමත් අනුව කර්මාන්ත අංශය පුළුල් කිරීමේ විභවතාවයක් පවතින බව පැහැදිලි වේ.

තවද, මාර්ග පද්ධතිය ප්‍රධාන මාර්ග 05ක් කේන්ද්‍රිය වීම හා දුම්රිය මාර්ග පිහිටීම හේතුවෙන් මහ නගර සභා සීමාවේ ඉඩම් භාවිතයෙන් 10% කට ආසන්න ඉහළ ප්‍රතිශතයක් මාර්ග සඳහා වෙන්වී තිබුණද මුළු ප්‍රදේශය සැලකීමේදී භූමි භාවිතයෙන් 2%ක් වැනි අඩු ප්‍රතිශතයක් මාර්ග සඳහා යෙද වී ඇත. එමෙන්ම මාර්ග ව්‍යාප්තිය අධ්‍යයනයේදී ප්‍රධාන මාර්ග ඍජුවම නේවාසික මාර්ග (පටු මාර්ග) හා සම්බන්ධ වීම, මාර්ග එකිනෙක හා සම්බන්ධ නොවී කෙළවර වීම, නගරය මඟහැර යාම සඳහා විකල්ප මාර්ග නොතිබීම වැනි ගැටලු හඳුනාගත හැකිය. (සිතියම් අංක 2.6 )

ප්‍රධාන මාර්ග 05ක් නගරයට සම්බන්ධ වීම මත සැලකිය යුතු වාහන සංඛ්‍යාවක් දෛනිකව කුරුණෑගල නගරයට පැමිණෙන අතර, නගරය මගහැර යාමේ විකල්ප මාර්ග නොමැතිවීම හේතුවෙන් නගර මධ්‍යයට නොපැමිණිය යුතු විශාල වාහන සංඛ්‍යාවක් නගරයට පැමිණීම දැකිය හැකිය. තවද රජයේ ප්‍රධාන පාසල්, කාර්යාල වැනි වාහන තදබදයක් ඇති වන අත්‍යාවශ්‍ය සේවා ස්ථාන නගර මධ්‍යයේ පිහිටීම, වාහන නැවතුම් ස්ථාන ප්‍රමාණවත් නොවීම නිසා මාර්ග දෙපස වාහන නවතා තැබීම යනාදි හේතු මතද දවසේ කාර්යය බහුල අවස්ථාවලදී (පාසල් පටන් ගැනීම් හා අවසන් වීම, කාර්යාල ආරම්භ වීම හා අවසාන

වීම) නගර මධ්‍යය පසු කර කි.මී 02ක දුර ගමන් කිරීම සඳහා විනාඩි 35ක පමණ කාලය ගත වන අවස්ථා පවතී.

තවද, දුරකථන හා අන්තර්ජාල පහසුකම් අධ්‍යයනයේදී Cyber Optic රැහැන් කුරුණෑගල නගරය ආසන්නයෙන් ගමන් කිරීම හේතුවෙන් තොරතුරු තාක්ෂණයට අදාළ රැකියා අවස්ථා බිහිකිරීමේ හැකියාව කුරුණෑගල නගරය තුල පවතී.

## ජල සම්පාදනය

නගරයේ නල ජල සැපයුම සඳහා ජල මූලාශ්‍රය ලෙස දැදුරු ඔය යොදා ගන්නා අතර, වියළි කාලයට නල ජලය පැය 24 පුරා ලබා ගැනීමේ අපහසුතාවයකට නගර වාසීන් මුහුණපානු ලබයි. ඒ අනුව වර්තමානයේ ජල අවශ්‍යතාවය දිනකට ඝන මීටර් 7000ක් වන අතර, දැනටමත් ක්‍රියාත්මක විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂ ව්‍යාපෘතිය මඟින් දැදුරු ඔයෙහි ජලය රැස්කිරීම සඳහා බරන්දන "රන්තැටි උයන" වත්ත නැමති ස්ථානයේ ජලාශයක් (රැස්කුරු ජලාශය) ඉදිකර ජල සැපයුම දිනකට ඝන මීටර් 14000 දක්වා වැඩි කිරීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව මහ නගර සභා සීමාව හා එයට මායිම්ව පිහිටි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 11ක් ආවරණය කරමින් ප්‍රතිලාභීන් 106000කට නල ජලය සැපයීමට කටයුතු කර ඇත. (ඇමුණුම වගු අංකය 2.5)

## ජලාපවහන පද්ධතිය හා අප ජලය බැහැර කිරීම

කුරුණෑගල නගරයෙහි ජලාපවහනය සඳහා බූ ඇළ හා වාන් ඇළ යන නමින් හඳුන්වන ප්‍රධාන ඇළ මාර්ග ද්විත්වය නේවාසික, වාණිජ හා වගා ඉඩම් හරහා කි.මී 06ක් දුර ගමන් කරමින් කුරුණෑගල නගරයේ 78% පමණ වැසි ජලය ගලා බැසීම සඳහා දායකත්වය ලබා දෙයි. එමෙන්ම මෙම ඇළ මාර්ග විල්ගොඩ හොරොව්ව හරහා කුඹුරු අක්කර 230ක් පෝෂණය කරයි. මෙම ඇළ මාර්ග වෙත අප ජලය නීති විරෝධි ලෙස බැහැර කිරීම් වාර්තා වන අතර, ජල සම්පාදන මණ්ඩලය විසින් ක්‍රියාත්මක සනීපාරක්ෂක ව්‍යාපෘතිය මුළු නාගරික සීමාව ආවරණය කරමින් මලාපවහන හා අප ජලය බැහැර කිරීම ක්‍රියාත්මක වීම නිසා මෙම ගැටළුවට පිළියමක් ලැබී ඇත. (ඇමුණුම සිතියම් අංක 2.7 හා වගු අංක 2.6)

මෙම ඇළ මාර්ග නගර සීමාව තුල විල්ගොඩ ප්‍රදේශයේදී එකිනෙක සම්බන්ධ වී ගලා බැස යටිවැහැර වතුයායේදී මඟුරු ඔයට එකතුවේ. (මහ නගර සභාවෙහි බස්නාහිර මායිමේදි) නමුත් අධික වර්ෂාපතන අවස්ථාවලදී මෙම ඇළ මාර්ග එකිනෙක සම්බන්ධ වන විල්ගොඩ ප්‍රදේශයේදී ජලය ගලාබැසීමේ සීඝ්‍රතාවය අඩුවීම හේතුවෙන් (ඇල මාර්ග පටුවීම, ඇළ මාර්ග දඟරාකාරව පිහිටීම වැනි හේතු මත ) එම ප්‍රදේශවාසීන්ට වර්ෂයකට වරක් හෝ තාවකාලිකව ගංවතුර ආපදාවට මුහුණ පෑමට සිදුවේ. එමඟින් එය ආශ්‍රිතව ජීවත් වන කම්කරු නිවාස 70ක් පමණ දින 2-3ක් යටවීමේ අවදානමට ලක් වේ. ඇළ මාර්ග පුළුල් කිරීම මඟින් එම තාවකාලික ගංවතුර තත්ත්වයද වලක්වා ගැනීමේ හැකියාව පවතී. මීට අමතරව මෙම සියලු ඇළ මාර්ග කුරුණෑගල මහ නගර සභා සීමාව තුල සිමෙන්තියෙන් බඳින ලද නිර්මිත ඇළ මාර්ග වන අතර, නගර සභා මායිමෙන් පිටත එම ඇළ මාර්ග ස්වභාවික ඇළ මාර්ග ලෙස (පස්) පැවතීම හේතුවෙන් නගර සභා සීමාව තුළදී පවත්නා ජල බැස්මේ සීඝ්‍රතාවය, ප්‍රාදේශීය සභා සීමාව තුළදී අඩු වේ. ඒ හේතුවෙන් විවිධ ස්ථානවලදී මාර්ග යටවීම වැනි සුළු ආපදා තත්ත්වයන්ට මුහුණපාන අවස්ථාද පවතී. (NWSDB 2005 ECL 2000)


## ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම

කුරුණෑගල මහ නගර සභාව සහ ප්‍රාදේශීය සභාව විසින් සපයන ලද දත්තයන්ට අනුව දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය දළ වශයෙන් ටොන් 53 පමණ වේ.එය මහ නගර සභා බල ප්‍රදේශය තුළ ටොන් 44 සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ටොන් 09 පමණ වේ. ප්‍රධාන මාර්ග දිගේ සහ නගර මධ්‍යයේ වාණිජ ප්‍රදේශ තුල දිනකට දෙවරක් කසල රැස්කිරීම සිදු කරන අතර, නේවාසික ප්‍රදේශවල සතියේ සැම දිනකම දිනක් හැර දිනක් කාබනික ද්‍රව්‍යයත්, අකාබනික ද්‍රව්‍යයත් වෙන්කර ලබා ගැනීම නගර සභාව විසින් සිදුකරනු ලබයි.

නගර මධ්‍යයේ ඝන අපද්‍රව්‍ය පමණක් අත් කරත්ත මගින් එකතු කර ට්‍රැක්ටර් වලට පැටවීම සිදු කරන අතර, අනෙකුත් සැම ප්‍රදේශයකම නිවසින් නිවසට ට්‍රැක්ටර් මගින් ගොස් ඝන අපද්‍රව්‍ය එකතු කිරීම සිදු කරයි. කුරුණෑගල මහ නගර සභා සීමාවේ වෙන් කරන ලද ඝන අපද්‍රව්‍ය පමණක් ට්‍රැක්ටර් මගින් එකතු කරන අතර ජෛව හායනය වන අපද්‍රව්‍ය දිනක් හැර දිනක් එකතු කිරීම සිදු කරයි. කාබනික අපද්‍රව්‍ය සුන්දරාපොල රක්ෂිතය තුල පිහිටි අක්කර 12කින් යුතු නගර සභාව සතු ඉඩමට බැහැර කෙරේ. අකාබනික ද්‍රව්‍යය වන පොලිතින්, කාඩ්බෝඩ්, ප්ලාස්ටික් ලෙස වෙන්කර පිරිසිදු කිරීම සිදුකර මිල දී ගන්නන් වෙත ලබාදීම නගර සභාව විසින් සිදුකරයි.

කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුළ දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය සංයුතිය පහත පරිදි වේ.

*ප්‍රස්ථාර 2.1 මහ නගර සභා බල ප්‍රදේශය තුළ දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය සංයුතිය- 2017*





මූලාශ්‍රය- මහ නගර සභාව, කුරුණෑගල.

කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුළ නිවෙස් සඳහා ප්ලාස්ටික් බැරල් 300 ක් සහ කොන්ක්‍රීට් බැරල් 1500 ක් වශයෙන් කොම්පෝස්ට් බඳුන් 1800 ක් ලබාදී ඇත. නගර සභාව මගින් සුන්දරාපොළ කසල අංගනය තුල ක්‍රියාත්මක කරනු ලබන කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියේ දළ මාසික නිෂ්පාදනය ටොන් 210 පමණ වන අතර එහි දළ මාසික ආදායම රු. 11,933.00 කි.

එමෙන්ම කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභාව තුල ප්‍රධාන මාර්ග 05 දිගේ මීටර් 100ක් පමණ අභ්‍යන්තරයට වාණිජ ප්‍රදේශවල පමණක් දෛනිකව කසළ රැස් කරනු ලබන අතර, දෛනිකව එකතුවෙන මෙට්‍රික් ටොන් 09 සුන්දරාපොල කසළ බැහැර කිරීමේ ස්ථානය වෙත ලබාදීම සිදු කරයි. (ඇමුණුම සිතියම් අංක 2.8) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ එකතු වන දිරන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 07 ක් සහ නොදිරන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 02 ක් පමණ වේ.

කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය සංයුතිය පහත පරිදි වේ.

*ප්‍රස්තාර 2.2 ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය සංයුතිය - 2017*




මූලාශ්‍රය - ප්‍රාදේශීය සභාව, කුරුණෑගල.

## 2.3. නගර සංවර්ධන සැලැස්ම සකස් කරන භූමි ප්‍රදේශයේ සීමා නිර්ණය කිරිම.

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මූලික අධ්‍යයන බල ප්‍රදේශය ලෙස කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය හා කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත් මුළු ප්‍රදේශයම අධ්‍යයනය කරන ලදී. එයින් ජනගහන වර්ධන වේගය, ජනගහන ඝනත්වය, වාණිජ භාවිතය, අපරව්‍යූහ පහසුකම් ව්‍යාප්තිය, යනාදි කරුණු යටතේ ලකුණු තැබීමෙන් පසු සංවර්ධන සම්පීඩනය ඉහළ අගයක් ගන්නා, නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශය නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා සුදුසු භූමි ප්‍රදේශය ලෙස නිර්ණය කර ගන්නා ලදී.

නමුත් ප්‍රාදේශීය සභා මුළු බල ප්‍රදේශයම නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට දැනටමත් කටයුතු කර ඇති බැවින්ද, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා ජාතික සංවර්ධන ව්‍යාපෘතිවල බලපෑමට මුළු ප්‍රදේශයම ලක්වන බැවින්ද කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය සහ මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම සැලසුම් ප්‍රදේශය ලෙස තෝරාගන්නා ලදී.

# 3

# නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

3.1 මුලික අධ්‍යපනයේදී හදුනාගත් නගරයේ ප්‍රධාන ප්‍රශ්ණ

3.2 අධ්‍යයන බල ප්‍රදේශය තුළ යෝජිත හා ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘත

# 3.0 නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය



මූලික අධ්‍යනයේ දී හඳුනාගත් කරුණු මත නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පහත පරිදි ගොනුකර දැක්විය හැකිය.

2006 වර්ෂයේ ගැසට් කරන ලද සංවර්ධන සැලැස්ම 2015 වර්ෂයෙන් අවසන් වීමත් එම සැලසුම මහ නගර සීමාව පමණක් කේන්ද්‍රගත කොට තිබීමත් එනම් සැබෑ නාගරික සීමාව පදනම් වී නොතිබීමත් හේතුවෙන් අක්‍රමවත් හා අවිධිමත් සංවර්ධනයේ මූලික ලක්ෂණ නගරය තුලින් පිළිබිඹු වන බැවින්, විධිමත් සංවර්ධනයක් කරා යොමු කිරීමට නව සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය ඇත.

මූලික අධ්‍යනයේදී සිදු කල සමීක්ෂණ අනුව නගරයේ ප්‍රධාන ගැටලු වශයෙන් පහත විස්තර කරනු ලබන ප්‍රශ්න හඳුනාගත් අතර, එම ගැටලු අවම වන ආකාරයට විධිමත් සංවර්ධනයක් කරා යොමු කොට නගරයේ කාර්යක්ෂමතාවය ඉහළ දමා ඵලදායිතාවය වැඩි කිරීමට නිසි දායකත්වයක් ලබා දීමට නව සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය දැඩිව ඇත.

## 3.1 මූලික අධ්‍යනයේ දී හඳුනාගත් නගරයේ ප්‍රධාන ප්‍රශ්න

### (අ) නගරය තුල වාහන හා පදික සංසරණයට අදාළ ගැටළු (Mobility)

#### I. නගරය පසුකර යාම සඳහා විශාල කාලයක් ගතවීම

මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරන ලද මාර්ග ධාරිතා විග්‍රහයන් අනුව මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් නඩත්තු වන ප්‍රධාන මාර්ග වල උපරිම වාහන ධාවන ධාරිතාවය ඉක්මවා ගොස් ඇති බව තහවුරු වී ඇත. ඒ අනුව කදුරුගස් හන්දියේ සිට ඔරලෝසු කණුව දක්වා, පුවක් ගස් හන්දියේ සිට නගර මධ්‍යය දක්වා, නගර මධ්‍යයේ සිට මල්ලවපිටිය දක්වා, බෞද්ධාලෝක මාවත යන ස්ථානවල නිරන්තර වාහන තදබදයක් දැකිය හැක.

ඒ අනුව කාර්ය බහුල අවස්ථාවලදී (පාසල් පටන් ගැනීම , අවසන්වීම) කි.මී 02ක් නගරය තුළ ගමන් කිරීමට විනාඩි 40ක් පමණ ගතවන අවස්ථා පවතී. එමඟින් නගරයේ කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය අඩු වන අතර ජනතාවට නගරය අප්‍රියජනක ස්ථානයක් වේ. (වැඩි විස්තර සඳහා 05 වන පරිච්ඡේදය බලන්න.)

### II. පදිකයින් සඳහා පහසු ප්‍රවේශකත්වයක් නොමැති වීම.

නගර මධ්‍යයේ මාර්ග පළල ප්‍රමාණවත් නොවීම (පල්ලිය පාර, දොස්තර සිල්වා මාවත, මලියදේව වීදිය), මාර්ග දෙපස වාහන නතර කර තිබීම, පදික වේදිකා වෙනත් කාර්යයන් සඳහා (භාණ්ඩ ගබඩා කිරිම, වෙළදාම) යොදා ගැනීම වැනි හේතු මත නගර මධ්‍ය ප්‍රදේශයේ පදිකයින් සඳහා පහසු ප්‍රවේශ පහසුකම් නොමැති බව නිරීක්ෂණය වේ. එමඟින් සංසරණ ජනගහනයට නගරය අප්‍රිය ජනක ස්ථානයක් බවට පත්වී ඇත.

*රූපය 3.1 පදිකයන් සඳහා පහසු ප්‍රවේශකත්වයක් නොමැති වීම.*



පල්ලිය පාර



මලියදේව වීදිය

## (ආ) සංවර්ධන රටාවේ ගැටලු

### I. නගරයේ ඉඩම් භාවිතයේ සහ අයිතියේ ගැටලු

බ්‍රිතාන්‍ය පාලන සමයේ සිට ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වශයෙන් කුරුණෑගල නගරය නිර්මාණය වී තිබීම හේතුවෙන් නගරයේ වාණිජමය වශයෙන් ක්‍රියාකාරි ප්‍රදේශයේ මුළු භූමියෙන් 10%ක් පමණ පාසැල්, රජයේ කාර්යාල වැනි භාවිතයන්ට යොදාගෙන තිබීම නිරීක්ෂණය කළ හැක. (ඇමුණුම් සිතියම් අංක 2.4)

ඒ අනුව රජයේ කාර්යාල විශාල ප්‍රමාණයක් නගර මධ්‍යයේ පිහිටා ඇති අතර, බ්‍රිතාන්‍ය සමයේ සිට පැවති තනි තට්ටුවේ ගොඩනැගිලි හේතුවෙන් ඉහල වාණිජ වටිනාකමක් සහිත ඉඩම් ප්‍රශස්ථ භාවිතයට ලක්වී නොතිබීම ගැටළුවක් ලෙස හඳුනාගත හැක.

නගර මධ්‍යයේ සිට මීටර් 500ක් වැනි දුරක් තුල නගරයේ සියලුම පාසැල් ස්ථාන ගත වී ඇති අතර, එම ඉඩම් භාවිත නගර මධ්‍යයේ අධික වාහන තදබදයට ද හේතු වී ඇත. නමුත් මිෂනාරි පාසැල් වන ශාන්ත ආනා පාසල, ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය වැනි පාසල් වෙනත් ස්ථානයක ප්‍රතිස්ථාපනය කිරීමේ පරිපාලනමය ගැටලු ද පවතී.

### II. නගරයේ පවතින අවසංවර්ධනය (Low Development )

ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර යා කරන මංසන්ධි නගරයක් වශයෙන් කුරුණෑගල නගරය උපාය මාර්ගික ස්ථානයක පිහිටිය ද එම ස්ථානීය පිහිටීමේ වාසිය කුරුණෑගල නගරය වෙත ලබාගෙන නොමැති බව ගොඩනැගිලි ගෙබිම් අනුපාත සැලැස්ම මගින් පැහැදිලි වේ. (ඇමුණුම් සිතියම් අංක 3.1) මෙම සැලැස්මට අනුව නගරයේ මීටර් 100ක පමණ ප්‍රදේශයක 2-5 දක්වා වූ ගෙබිම් අනුපාතයක් පෙන්වනු ලැබුව ද 90%ක ප්‍රදේශයකට 0.25ක පමණ ගෙබිම් අනුපාතයක් පෙන්වනු ලබයි. අනෙකුත් නගරයන්ට සාපේක්ෂව ඉහල සංසරණ ජනගහනයක් කුරුණෑගල නගරයෙහි දක්නට ලැබුණ ද ඊට සාපේක්‍ෂව සංවර්ධනය ඉහල මට්ටමක නොමැති බව පැහැදිලි වේ.

### III. නගර මධ්‍යයේ ඉඩම් අවභාවිතයට ලක් වී තිබීම.

නගරයේ ප්‍රධානතම වාණිජ කලාපය වන මහවීදිය, පැරකුම්බා වීදිය, බෝධිරාජ මාවත ඇතුලත ත්‍රිකෝණාකාර තීරුවෙහි පිහිටි බිම් කොටස් වලින් 90%ක් පමණ පර්. 02,03 වශයෙන් පර්. 06ට වඩා අඩු බිම් කොටස් පවතී. ඒවායේ 03,04 වාණිජ ගොඩනැගිලි පැවතියද, බිම් මහල පමණක් වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා බවත් අනෙකුත් මහල් භාණ්ඩ ගබඩා කිරීම, සේවකයින්ගේ නවාතැන් යනාදියට යොදා ගැනිම නිරීක්ෂණය වේ. ඒ අනුව නගර මධ්‍යයේ පවතින ඉඩම් උපරිම භාවිතයට යොමු වී නොමැති බව පැහැදිලි වේ.

### (ඇ) නගරයේ අනන්‍යතාවය අහිමි වීම.

අතීතයේ සිට ඇතුගල්පුර ලෙස විරුදාවලිය ලත් කුරුණෑගල නගරයේ පිහිටි ඇතුගල හා දෙවන ලෝක යුද්ධයෙන් මියගිය රණවිරුවන්ගේ ස්මාරකය වන නගර මධ්‍යයේ පිහිටි ඔරලෝසු කණුව නගරයේ අනන්‍යතාවය ලෙස සැලකේ. අතීතයේ නගරයට පැමිණෙන්නන්ට ආකර්ෂණීය දර්ශනයක් වූ ඇතුගල විශාල ප්‍රදේශයකට දර්ශනය වන ලෙස සැලසුම් නිර්මාණය කිරීම බොහෝ දෙනාගේ මතය (Cognitive Survey ) වන බැවින්, ඇතුගලෙහි අනන්‍යතාවය (හස්ති ශෛලපුර ) රැක ගනිමින් සැලසුම් නිර්මාණය කිරීම අවශ්‍ය කරුණක් බව පැහැදිලි වේ.

තවද නගරයේ ස්වභාවික සම්පත් වන ඉබ්බාගල, ආඳාගල , කුරුම්ණියාගල යනාදි ගල් 06කින් යුතු නගරය වටා පිහිටි ගල්තලා පවුර, කුරුණෑගල වැව , බඩගමුව වැනි වන රක්‍ෂිත මෙම නගරයේ සංවර්ධනය සඳහා යොදා නොගැනීම ද ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනාගෙන ඇත.

එමෙන්ම නගර මධ්‍යයේ පිහිටි නාගරික චතුරස්‍රය ලෙස සැලකෙන රජපිහිල්ල උද්‍යානය පවා හුදකලා ස්ථානයක් වශයෙන් පවතින අතර, නගරයේ සංවර්ධනය සඳහා යොදා ගෙන නොතිබීම ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය.

ඒ අනුව කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම සකස් කිරිමේදී මෙම හුදකලාවූ අංග, නගරයේ අනන්‍යතාවය වූ ඇතුගල යනාදිය පිළිබඳව සැලකිලිමත් නොවීම, කුරුණෑගල නගරය වෙනත් සාමාන්‍ය නගරක් බවට පත් කරනු ඇත. ඒ අනුව ඉහත සඳහන් නගරයේ ප්‍රධාන ගැටළු විසඳා ගැනීමටද නව නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පවතී.

එලෙසම ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇති නව ජාතික සැලැස්ම හරහා කොළඹ ත්‍රිකුණාමලය යා කරන ආර්ථික කොරිඩෝවෙහි ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස කුරුණෑගල නගරය හඳුනාගෙන තිබීමත් යන කාරණා හේතුකොටගෙන එම ජාතික සැලසුමට අනුගත වීම සඳහා නව සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය පවතී.

එලෙසම නගරය ආශ්‍රිතව පහත දැක්වෙන යෝජිත හා ක්‍රියාත්මක ව්‍යාපෘති මඟින් නගරයේ සංවර්ධනය විශාල වෙනසක් වීමට ඉඩකඩ ඇති බැවින් එම සංවර්ධනය නිසි මාවතකට යොමු කිරීම සඳහා නව සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය පවති.

## 3.2 අධ්‍යයන බල ප්‍රදේශය තුළ යෝජිත හා ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

### (අ) මධ්‍යම අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය.

2007-2017 ජාතික සැලැස්ම මගින් මධ්‍යම අධිවේගී මාර්ග සංවර්ධනය හඳුනාගෙන ඇති අතර, දැනටමත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර, 2025 වර්ෂය වන විට නිම කිරීමට නියමිතය. එම මාර්ගය ගම්පහ, මීරිගම, කුරුණෑගල යන නගර හරහා යමින් පහත සඳහන් අදියර කිහිපයක් යටතේ දඹුල්ල දක්වා ගමන් කිරිමට නියමිත වේ.

අදියර I - කඩවත (කි.මී 0.0) සිට මීරිගම (කි.මී 37.1)

අදියර II - මීරිගම (කි.මී 37.1) සිට කුරුණෑගල (76.8) දක්වා

අදියර III - පොතුහැර (කි.මී 0.0) සිට ගලගෙදර නුවර (කි.මී 76.8)

අදියර IV - කුරුණෑගල (කි.මී 76.8) සිට දඹුල්ල දක්වා (කි.මී 137.1)

මෙම අධිවේග මාර්ගයෙහි ගැට්ටුවාන අන්තර් හුවමාරු මධ්‍යස්ථානය හා කුරුණෑගල දුම්රිය ස්ථානය එකිනෙකට ආසන්නයේ පිහිටීම අනාගත නගර සංවර්ධනය සඳහා උපයා මාර්ගික පිහිටීමක් ලෙස හඳුනාගත හැක. එබැවින් කුරුණෑගල නගර සංවර්ධනය මෙම උපායමාර්ගික පිහිටීම මත නිසි මගකට යොමු කළ යුතුයි. එමෙන්ම ගැට්ටුවාන, දම්බොක්ක යන අන්තර් හුවමාරු මධ්‍යස්ථාන දෙකෙහි ම බලපෑම මෙම සැලසුම් බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යොමු කරගත යුතුය.

*රූපය **3.2** ගැට්ටුවාන හා දම්බොක්ක අන්තර් හුවමාරු මධ්‍යස්ථාන*



ගැට්ටුවාන



දම්බොක්ක

## (ආ) දුම්රිය මාර්ගය දීර්ඝ කිරීම.

කුරුණෑගල සිට දඹුල්ල දක්වා දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ සංවර්ධන ව්‍යාපෘතියක් සහ කුරුණෑගල සිට පොල්ගහවෙල දක්වා පවතින දුම්රිය මාර්ගය ද්විත්ව දුම්රිය මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

## (ඇ) මාර්ග සංවර්ධන ව්‍යාපෘති

මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් නඩත්තු වන ඒ 6 මාර්ගයේ දම්බොක්ක සිට බඩගමුව දක්වා තීරු හතරක මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතී.

ඉහත සඳහන් සියලුම ව්‍යාපෘති මඟින් කුරුණෑගල නගරය ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස පවතින කාර්යක්ෂමතාවය තව දුරටත් වැඩි වේ. එබැවින්, මෙම සියලුම ගමනා ගමන මාධ්‍යයන් ඒකාබද්ධ කරමින් නගරයේ සංවර්ධනය නිසි මාවතකට යොමු කිරීමට නව සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පවතී.

## (ඈ) ඉදිකරමින් පවතින ජාතික පාසල

කොළඹ , මීගමුව හා සම්බන්ධවන හාල් පාර ප්‍රදේශයේ වයඹ පළාත්සභාව සතු අක්කර 05ක ඉඩමෙහි පිහිනුම් තටාක ඇතුළු ක්‍රීඩා පහසුකම් සහිත ජාතික පාසලක් ඉදිකිරීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුව ක්‍රියා කරමින් පවතී.



# දෙවන කොටස

2

## අමාත්‍යතුමාගේ අනුමැතිය

**කුරුණෑගල මහා නගර බල ප්‍රදේශය සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම (2019 - 2030)**

මහා නගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍ය ..........................................................වන මම 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 …………..මස……. දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 ඌ වගන්තිය ප්‍රකාර කුරුණෑගල මහ නගර හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම (2019-2030) මෙයින් අනුමත කරමි.

………………………………………………………………

**ගරු මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය**

මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

17 හා 18 මහල,

"සුහුරුපාය" ,

සුභූතිපුර පාර,

බත්තරමුල්ල.

2019……………………..දින

# ගැසට් නිවේදනය

# 4

# සංවර්ධන සැලසුම් රාමුව

4.1. දැක්ම

4.2 දැක්මේ ප්‍රකාශය

4.3 අරමුණු

4.4 පරමාර්ථ

# 4.0 සංවර්ධන සැලසුම් රාමුව

## 4.1. දැක්ම

"ඇතුගල වටකොට නැගෙන වයඹ
මහා නගරය"

# 4.2. දැක්මේ ප්‍රකාශය

## 'ඇතුගල වට කොට නැගෙන"

නිදාසිටින ඇතකුගේ ස්වරූපයෙන් යුත් විශාල ගල්තලාව නිසා කුරුණෑගල නගරය අතීතයේ සිට හස්තිශෛල පුර , ඇතුගල සහ වර්තමානයේ කුරුණෑගල ලෙස ව්‍යවහාර කෙරේ. දේශීය හා ප්‍රාදේශීය වශයෙන් මෙම භෞතික පිහිටීම මත නගරයේ අනන්‍යතාවය රැඳී පවතින අතර, එම තත්ත්වය ආරක්ෂා කරගනිමින් ජාතික වශයෙන් නැගෙනහිර - බටහිර ආර්ථික කොරිඩෝවෙහි පිහිටි ඉතා ඉහල සංවර්ධනයකින් යුක්ත වූ ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් වශයෙන් කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමයි.

## "වයඹ මහා නගරය"

ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය 2030ට අනුව නැගෙනහිර - බටහිර දක්වා දිවෙන ආර්ථික සංවර්ධන ද්වාරයෙහි පිහිටි ප්‍රධාන ආර්ථික කේන්ද්‍රස්ථානය ලෙස කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමට හඳුනාගෙන තිබීමත් මධ්‍යම අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන හා දුම්රිය මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘති වල විභවතාවය හා උපාය මාර්ගික පිහිටීම මත සේවා හා ප්‍රවාහනය මූලික කරගත් සංවර්ධන මධ්‍යස්ථානයක් (Transit Oriented Development) ලෙස සංවර්ධනය මෙම සැලැස්මේ අරමුණයි. ඉහත සඳහන් විභවතාවයන් උපයෝගී කරමින් කුරුණෑගල නගරය ප්‍රධාන ආර්ථික අභිසාරි, කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව පවතී.

වසර 2030 වන විට විසල් කුරුණෑගල බල ප්‍රදේශයේ මිලියනයකට ආසන්න ජනගහනයක් පවතී යැයි ජාතික භෞතික සැලැස්ම මඟින් හඳුනාගෙන ඇත. කුරුණෑගල ප්‍රදේශයේ පවතින භෞතික හා පාරිසරික පිහිටීම අනුව ස්වභාවික ආපදා අවම තැනිතලා ප්‍රදේශයකි. මෙම විභවතාවය නිසා නේවාසික සංවර්ධනයට නැමියාවක් දක්වයි. එමෙන්ම අධිවේගී මාර්ගය, දුම්රිය මාර්ග සහ ප්‍රධාන මාර්ග නිසා නගරය කරා විධිමත් ප්‍රවේශකත්වයක් ද ඇත. මෙයද නේවාසික හා වාණිජ සංවර්ධනයේ විභවතාවයකි.

නගරයේ පවතින ඉහළ සේවා විභවතාවය හා ගමනාගමන ප්‍රභවයන් ප්‍රයෝජනයට ගනිමින් ඉහල ගුණාත්මක සේවාවන් හරහා පෝෂිත ප්‍රදේශයේ ජනතාවට හා සංසරණ ජනගහනයට ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක සේවාවක් සපයමින් ආර්ථික වශයෙන් ශක්තිමත් වයඹ පළාතේ ප්‍රධාන නගරය වශයෙන් සංවර්ධනය කිරීම මෙම සැලැස්මේ දැක්ම වේ.

## 4.3 අරමුණු

01. නැගෙනහිර බටහිර ආර්ථික කොරිඩෝවෙහි දිදුලන ආර්ථික මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.
02. වයඹ පළාත තුළ ජනගහනයෙන් පරිපූර්ණ ආකර්ශණීය නේවාසික කලාපය බවට පත්කිරීම.
03. හස්ති ශෛල පුරවරයේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම.

## 4.4 පරමාර්ථ

### අරමුණ 01

නැගෙනහිර බටහිර ආර්ථික ද්වාරයෙහි දිදුලන ආර්ථික කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම.

### පරමාර්ථ

01. 2030 වර්ෂය වන විට ආර්ථික වශයෙන් විශේෂීකරණය වූ මධ්‍යස්ථාන බිහි කිරීම.

- වර්තමාන නගර මධ්‍යය ප්‍රදේශය සේවා ආර්ථික මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කිරීම.
- දුම්රිය ස්ථානය හා අධිවේගී මාර්ගයේ ගැටවුවාන අන්තර් හුවමාරුව ආශ්‍රිතව ප්‍රවාහනය මුල්කරගත් ආර්ථික මධ්‍යස්ථානය (Transit Oriented Development Hub) ස්ථාපිත කිරීම.

02. ඒකාබද්ධ ගමනාගමන සැලැස්මක් තුළින් 2030 වර්ෂය වන විට නගරයේ කාර්ය බහුල අවස්ථාවන් වලදී කි.මී 02ක් දුර නගරය පසුකර ගමන් කිරීමට ගතවන කාලය විනාඩි 15ක් දක්වා අවම කිරීම.

## අරමුණ 02

**වයඹ පළාත තුළ ජනගහනයෙන් පරිපූර්ණ ආකර්ශණීය නේවාසික කලාපය බවට පත්කිරීම.**

### පරමාර්ථ

1. සාමාජයීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් සපයමින් 2030 වර්ෂය වනවිට නේවාසික ජනගහනය 250,000 දක්වා වැඩි කිරීම.
2. 2030 වර්ෂය වන විට අත්‍යාවශ්‍ය තෙත් බිම් ආරක්ෂා කර ගනිමින් පරිපූර්ණ නේවාසික කලාප ප්‍රවර්ධනය කිරීම.

## අරමුණ 03

**හස්ති ශෛල පුරවරයේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම.**

### පරමාර්ථ

**01.** 2030 වර්ෂය වන විට නගර මධ්‍යයට හා හඳුනාගත් ස්ථාන සඳහා ඇතුගලින් 1/3 ක් දර්ශනය වන පරිදි නගරයේ නිර්මිත පරිසරය සකස් කිරීම.

02. 2030 වර්ෂය වන විට නගරයේ සැඟවුණු අංග (රජපිහිල්ල උද්‍යානය, රජපිහිල්ල තානායම , ඔරලෝසු කණුව හා රජ මාලිගය ආශ්‍රිත ඓතිහාසික නටඹුන්) නගර මධ්‍ය වෙත විවෘත කිරීම.

# 5

# ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය හා තත්ත්ව විශ්ලේෂණය

5.1 ශ • දු • අ • ත විග්‍රහය

# 5.0 ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන

## විශ්ලේෂණය හා තත්ත්ව විශ්ලේෂණය



## 5.1 ශදුඅත විග්‍රහය

### 5.1.1 අරමුණ 01

**නැගෙනහිර බටහිර ආර්ථික කොරිඩෝවෙහි දිදුලන ආර්ථික මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.**

*වගු අංක 5.1 ශදුඅත විග්‍රහය*

**ශක්තීන්**

1. අනෙකුත් ජාතික මට්ටමේ නගරවලට සාපේක්ෂව දෛනික සංසරණ ජනගහනය ඉහළ අගයක් ගැනීම. ලක්ෂ 03 (මහනුවර ලක්ෂ 3.5, අනුරාධපුරය ලක්ෂ 1.5)
2. ලංකාවේ මධ්‍යයේ මංසන්ධි නගරය වීම - උතුර දකුණ යා කරන මාර්ග 05ක් සම්බන්ධ කරන උපාය මාර්ගික ස්ථානගත වීම.
3. ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 03 වන ස්ථානය වයඹ පළාත හිමිකර ගැනීම.
4. ජාතික මට්ටමට සමාන ඉහල පරිගණක සාක්ෂරතා අනුපාතයක් තිබීම
5. වාණිජ සංවර්ධන ප්‍රවනතාවය වාර්ෂිකව ඉහළ යාම - කුරුණෑගල නගරයේ වාණිජ ඉඩම් භාවිතය ඉහල යාම හා වාණිජ භාවිත ගොඩනැගිලි අයදුම්පත් සංඛ්‍යාව වාර්ෂිකව ඉහළ යාම.

**දුර්වලතා**

1. නගර මධ්‍යයේ පවතින වාහන තදබදය - මාර්ගවල වාහන ධාවන ධාරිතාවය ඉක්මවා යාම.
2. දුම්රිය ස්ථානය හා බස් නැවතුම්පල අතර ඒකාබද්ධතාවයක් නොමැති වීම.
3. නගර මධ්‍යයේ පවතින ඉඩම් වලින් 10%ක් පාසැල් හා රජයේ ආයතන විසින් භාවිතා කිරීම.
4. නගර මධ්‍යයේ වාහන නැවතුම් ස්ථාන ප්‍රමාණවත් නොවීම නිසා මාර්ග දෙපස වාහන නවතා තැබීම.
5. ප්‍රධාන මාර්ග ඍජුවම නේවාසික මාර්ග හා සම්බන්ධ වීම. (පටු මාර්ග, මාර්ග එකිනෙක සම්බන්ධ නොවීම.)

**අවස්තා**

1. ජාතික භෞතික සංවර්ධන සැලැස්ම මඟින් හඳුනාගත් බස්නාහිර සිට නැගෙනහිර දක්වා දිවෙන (කොළඹ සිට- ත්‍රිකුණාමලය) ආර්ථික කොරිඩෝවෙහි ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස කුරුණෑගල හඳුනාගෙන තිබීම.
2. යෝජිත හා ක්‍රියාත්මක ජාතික සංවර්ධන ව්‍යාපෘති.
   - මධ්‍යම අධිවේගී මාර්ගය හා අන්තර් හුවමාරු මධ්‍යස්ථාන
   - කුරුණෑගල සිට දඹුල්ල දක්වා යෝජිත දුම්රිය මාර්ගය.
   - පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය
3. යෝජිත හා ක්‍රියාත්මක අපරව්‍යුහ පහසුකම් ව්‍යාපෘති
   - මාර්ග සංවර්ධන අධිකාරි මාර්ග පුළුල් වීම.
   - විසල් කුරුණෑගල ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය

**තර්ජන**

1. කලාපය ආශ්‍රිතව දේශගුණික විපර්යාස නිසා ඇතිවන උෂ්ණත්ව වැඩිවීම.

## 5.1.1 අ. ශක්තීන්

### 01. දෛනික සංසරණ ජනගහනය ඉහළ අගයක් ගැනීම.

*වගු අංක 5.2 දෛනික සංසරණ ජනගහනය - 2017*

| අංශය | ජනගහනය | ප්‍රතිශතය |
|---|---|---|
| නගරයේ ජනගහනය | 18120 | 6% |
| මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවය (සාමාන්‍ය) | 129341 | 45% |
| (සුඛෝපභෝගී ) | 20120 | 7% |
| ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල ප්‍රවාහන සේවය | 57485 | 20% |
| නගරය හරහා යන ජනතා සන්තක හා මාර්ගස්ථ මගී ප්‍රවාහන බස් රථ( සුඛෝපභෝගි හා සාමාන්‍ය ) | 7473 | 2.6% |
| දුම්රිය ප්‍රවාහන සේවය | 1437 | 0.5% |
| පුද්ගලික වාහන | 54323 | 18.9% |
| **එකතුව** | **287425** | **100%** |

*මූලාශ්‍රය - සමීක්ෂණය නාගරික සංවර්ධන අධිකාරිය , වයඹ පළාත් කාර්යාලය , මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය - කුරුණෑගල*


මෙම නගරයට සමාන්තර පළාත් අග නගර වන ගාල්ල, අනුරාධපුර හා මහනුවර යන නගර සමඟ සන්සන්දනය කිරීමේද කුරුණෑගල නගරයේ දෛනික සංසරණ ජනගහනය ඉහල අගයක් ගන්නා බව පැහැදිලි වේ.(අනුරාධපුර 150,000 නුවර 350000, ගාල්ල 150000)

මෙම සංසරණ ජනගහනය සම්බන්ධ වැඩිදුර විශ්ලේෂණයේදී පහත පරිදි සේවා අවශ්‍යතා සඳහා පැමිණෙන බව පැහැදිලිවේ.

කුරුණෑගල නගරය ප්‍රධාන පරිපාලන හා වාණිජමය නගරය වීම මත ප්‍රධාන රැකියා මධ්‍යස්ථානය ලෙස රජයේ රැකියා සඳහා 28,000ක පමණ රැකියා නියුක්තිකයන් සංඛ්‍යාවක් විවිධ දිශාවන්ගෙන් කුරුණෑගල නගරයට පැමිණෙන අතර, වාණිජ ආයතන 2080ක් පමණ ස්ථානගත වීම හේතුවෙන් ඒවායේ රැකියා සඳහාද දිනකට 26,421 පමණ ජනගහනයක් පැමිණේ.

මීට අමතරව කුරුණෑගල රජයේ ශික්ෂණ රෝහලෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා දිනකට 6000 ක් පමණ රෝගීන් සංඛ්‍යාවක් ද ඒ ආශ්‍රිත කටයුතු සඳහා (රෝගීන් බැලීම) රෝහල වෙත 20,000ක් පමණද, පෞද්ගලික රෝහල්වල විශේෂඥ වෛද්‍ය සේවා සඳහා සැලකිය යුතු ජනගහයක්ද කි.මී 50 – 100 දුර ගල්ගමුව , පුත්තලම , කැකිරාව,කෑගල්ල වැනි ප්‍රදේශවලින් පැමිණේ.

***සිතියම් අංක 5.1 දෛනික සංසරණ ජනගහනය පැමිණෙන ප්‍රදේශ***




මුලාශ්‍රය - සමීක්ෂණය නාගරික සංවර්ධන අධිකාරිය -2018

තවද මලියදේව පිරිමි , මලියදේව බාලිකා වැනි ජනප්‍රිය පාසල් ස්ථානගත වී තිබීම හේතුවෙන් 32,400 ක පමණ පාසල් ජනගහනයක් පැමිණේ. එය නගරයේ පදිංචි පාසැල් ජනගහනය මෙන් 06 ගුණයකි.

මීට අමතරව උපකාරක පංති සඳහා දෛනිකව සතියේ දිනවල සිසුන් 25,000කට ආසන්න ජනගහනයක් පැමිණෙන අතර, මෙම ප්‍රමාණය සති අන්ත දිනවල දී ලක්ෂ 01ට ආසන්න වේ. නගරයේ මධ්‍යගත පිහිටීම, පහසු ප්‍රවේශකත්වය මත ජනප්‍රිය ගුරුවරුන්ගේ ( විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ඇතුළු) උපකාරක පංති බිහි වීමත් සමඟ විද්‍යා, ගණිත උසස් පෙළ පන්ති සඳහා ඉහළ පෝෂක ප්‍රදේශයක (ත්‍රිකුණාමලය, පොළොන්නරුව , කැකිරාව, පුත්තලම , අනුරාධපුර වැනි විශාල දුර බැහැර ප්‍රදේශ) ජනගහනය පැමිණීම නිරීක්ෂණය වේ.

මීට අමතරව කුරුණෑගල නගරය තුළ ජපන් වාහන අලෙවිය , වාහන අමතර කොටස් අලෙවිය වැනි ව්‍යාපාරික කටයුතු සඳහා ලංකාවේ විශේෂ වෙළඳපලක් නිර්මාණය කරගෙන තිබීම හේතුවෙන් දිවයිනේ විවිධ පළාත් වලින් මෙම සේවා අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා කුරුණෑගල නගරයට පැමිණේ.

තවද විදේශ රැකියා ආයතන 178ක් නගරය තුල ස්ථානගතවී ඇති අතර එම ආයතනවල විශ්වාසවන්ත භාවය හා ආකර්ශණීය සේවාව හේතු කොටගෙන දෛනිකව 4000-5000 අතර ජනගහනයක් කුරුණෑගල නගරයට පැමිණෙන බව සමීක්ෂණ දත්ත මඟින් පැහැදිලි වේ.

මීට අමතරව විවෘත විශ්වවිද්‍යාලය, ජාතික උසස් අධ්‍යාපන ආයතනය, ජාතික ආධුනිකත්ව මණ්ඩලය හා කාර්මික විද්‍යාලය වැනි වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ස්ථානගත වීම හේතුවෙන් සැලකිය යුතු ජනගහනයක්

නගරය කරා පැමිණියද ප්‍රමාණවත් තෘතියීක අධ්‍යාපන ආයතන කුරුණෑගල නගරය තුල ස්ථානගත නොවීම හේතුවෙන් එම අවශ්‍යතා සඳහා මෙම ප්‍රදේශයෙන් සැලකිය යුතු ජනගහනයක් කොළඹ ප්‍රදේශය වෙත සංක්‍රමණය වීමක් දක්නට ඇත.

මීට අමතරව අනෙකුත් ජනගහනය එදිනෙදා පරිපාලන හා වාණිජ අවශ්‍යතා සඳහා කුරුණෑගල නගරය වෙත පැමිණේ. මෙම ප්‍රදේශය තුළ රජයේ බැංකු 15ක් , පෞද්ගලික බැංකු 11ක් ඇතුළු මූල්‍ය හා රක්ෂණ සමාගම් 74ක් ස්ථානගත වීම මඟින් විශාල මුදල් සංසරණයක් නගරය තුළ සිදුවන බව නිගමනය කළ හැක.


මෙම සංසරණ ජනගහනය පැමිණෙන පෝෂක ප්‍රදේශය අධ්‍යයනය කිරීමේදී කි.මී 25ක පමණ අරයකින් යුතු සාමාන්‍ය පෝෂක ප්‍රදේශයක් හා කි.මී 50ක පමණ අරයකින් යුතු විශේෂ පෝෂක ප්‍රදේශයක් ද (සෞඛ්‍ය පහසුකම්, උපකාරක පංති, වාහන මිලදී ගැනීම්, විදේශ රැකියා) හඳුනාගත හැක. ඉහත දත්ත අනුව ඉහළ පෝෂක ප්‍රදේශයක් මෙන්ම අනෙකුත් සමාන නගරවලට සාපේක්ෂව ඉහළ දෛනික සංසරණ ජනගහනයක් සිටීම ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණු සඳහා ලඟා වීමේ විභවතාවයක් වේ. (සිතියම් අංක 5.1)

## 02. ලංකාවේ ප්‍රධාන මංසන්ධි නගරයක් වීම.

උතුර දකුණ යා කරන මාර්ග පහක් කේන්ද්‍රිය වන ස්ථානයක පිහිටීම නිසා කුරුණෑගල නගරය දිවයිනේ ප්‍රධාන නගරයන් වන කොළඹ, මහනුවර, පොළොන්නරුව, අනුරාධපුරය, පුත්තලම, හලාවත, කෑගල්ල, මීගමුව , මාතලේ සහ ත්‍රිකුණාමලය ආදී නගර සමඟ ඍජු මාර්ග සහ ප්‍රවාහන සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි.

නාගරික සම්බන්ධතා විග්‍රහය (Connectivity analisis) මඟින් ද එය පැහැදිලි කරයි. ඒ අනුව කුරුණෑගල නගරය කොළඹ,ගම්පහ වැනි ප්‍රධාන නගර හා සමාන මට්ටමේ සම්බන්ධතාවයක් පෙන්නුම් කරනු ලබයි. මෙම ඉහළ සම්බන්ධතාවය ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා විභවතාවයක් වේ. (සිතියම්අංක 5.2)

සිතියම්අංක 5.2 : නාගරික සම්බන්ධතා විග්‍රහය



## 03. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් තුන්වන ස්ථානය වයඹ පළාත හිමිකර ගැනීම.

### පළාත් වශයෙන් දළ ජාතික නිෂ්පාදනයට දායකත්වය (2009-2014)

*වගු අංක 5.3 දළ ජාතික නිශ්පාදනයට පළාත් දායකත්වය*

| පළාත අනුව දායකත්වයේ ප්‍රතිශතය | | | | | | |
|---|---|---|---|---|---|---|
| පළාත | වර්ෂය | | | | | |
| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
| බස්නාහිර | 45.8 | 44.8 | 44.2 | 42.8 | 42.5 | 41.6 |
| මධ්‍යම | 9.8 | 10 | 9.8 | 10.2 | 10.5 | 10.4 |
| දකුණ | 10.5 | 10.7 | 11 | 11 | 10.4 | 10.9 |
| උතුර | 3.2 | 3.4 | 3.7 | 3.7 | 3.5 | 3.6 |
| නැගෙනහිර | 5.8 | 6 | 5.8 | 6.3 | 5.9 | 6 |
| වයඹ | 9.6 | 9.5 | 10 | 10 | 10.5 | 10.7 |
| උතුරු මැද | 4.6 | 4.8 | 4.7 | 5 | 5 | 5.1 |
| ඌව | 4.5 | 4.5 | 4.5 | 4.8 | 4.9 | 5 |
| සබරගමුව | 6.1 | 6.3 | 6.2 | 6.2 | 6.8 | 6.7 |

මූලාශ්‍රය : මහබැංකුවාර්තාව 2009-2014

වයඹ පළාත මගින් දළ ජාතික දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය අධ්‍යයනයේ දී වයඹ පළාත 03 වන ස්ථානය හිමි කරගෙන ඇති බව ඉහත වගුව මගින් පැහැදිලි වේ. දළ ජාතික නිෂ්පාදිතයෙන් 10.7%ක් හිමිකර ගන්නා වයඹ පළාත කෘෂිකාර්මික අංශයෙන් 1.5%ක් ද කාර්මික අංශයෙන් 3.2%ක්ද සේවා අංශයෙන් 5.6%ක ඉහළ දායකත්වයක්ද ලබාදේ. මේ අනුව වයඹ පළාතේ ප්‍රධානම පරිපාලන හා වාණිජ මධ්‍යස්ථානය වීම මත සේවා ආර්ථිකයක් හිමි කුරුණෑගල නගරය මේ සඳහා ඉහළ දායකත්වයක් ලබා දෙන බව නිගමනය කළ හැක.

## 04. ඉහළ පරිගණක සාක්ෂරතා අනුපාතයක් කුරුණෑගල දිස්ත්‍රික්කය හිමිකර ගැනීම.

*වගු අංක 5.4 පළාත් අනුව පරිගණක සාක්ෂරතා අනුපාතය*

| පළාත | පරිගණක සාක්ෂරතාව 2016 |
|---|---|
| ශ්‍රී ලංකාව | 27.5 |
| බස්නාහිර | 38.5 |
| මධ්‍යම | 26 |
| දකුණ | 27.2 |
| උතුර | 19.9 |
| නැගෙනහිර | 13.4 |
| වයඹ | 27.3 |
| උතුරුමැද | 21.6 |
| ඌව | 18.5 |
| සබරගමුව | 23.4 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව

වයඹ පළාතේ පරිගණක සාක්ෂරතා මට්ටම ජාතික මට්ටමට සමාන අගයක් ගැනීම මඟින් තොරතුරු තාක්ෂණයට අදාළ රැකියා සඳහා යොමුවීමේ හැකියාව පවතින බව පැහැදිලි වේ.


## 05. කුරුණෑගල නගරයේ වාණිජ ඉඩම් භාවිතය ඉහළ යාම හා කුරුණෑගල මහ නගර සභාවට ඉදිරිපත්වන වාණිජ භාවිත ගොඩනැගිලි අයදුම්පත් සංඛ්‍යාව වාර්ෂිකව ඉහළ යාම.

*වගු අංක 5.5 කුරුණෑගල නගර සීමාව තුළ වාණිජ ඉඩම් භාවිතය*

| වර්ෂය | ඉඩම් භාවිතය (මුළු භූමියෙන් ) % |
|---|---|
| **1998** | 1.47 |
| **2001** | 4.97 |
| **2017** | 7.3 |

මූලාශ්‍රය : කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම - 2015

*ප්‍රස්ථාර අංක 5.1 කුරුණෑගල මහා නගර සභාව තුල වාණිජ ගොඩනැගිලි අයදුම්පත් සංඛ්‍යාව*




මූලාශ්‍රය : කුරුණෑගල මහ නගර සභාව

කුරුණෑගල මහ නගර සභා සීමාව තුල පසුගිය ඉඩම් පරිහරණ වෙනස්වීම් අධ්‍යයනයේදී 1997,2001,2017 වර්ෂවල වාණිජ ඉඩම් භාවිතය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. (1998- 1.47%, 2001- 4.97%, 2017-7.3%) එමෙන්ම මහ නගර සභාව වෙත ඉදිරිපත් වන වාණිජ ගොඩනැගිලි අයදුම්පත් සංඛ්‍යාව වාර්ෂිකව වැඩි වීම මගින්ද මෙය පැහැදිලි වේ. එමගින් ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස කුරුණෑගල නගරය සංවර්ධනය කිරීම සඳහා විභවතාවයන් පවතින බව පැහැදිලි වේ.

## 5.1.1 ආ. දුර්වලතා

### 01. නගරයේ පවතින වාහන තදබදය හා මාර්ගවල වාහන ධාවන ධාරිතාවය ඉක්මවා යාම.

මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරන ලද මාර්ග ධාරිතා විග්‍රහයන් අනුව මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් නඩත්තු වන ප්‍රධාන මාර්ග වල උපරිම වාහන ධාවන ධාරිතාවය ඉක්මවා ගොස් ඇති බව පහත වගුවෙන් තහවුරු වී ඇත. ඒ අනුව කඳුරුගස් හන්දියේ සිට ඔරලෝසු කණුව දක්වා, පුවක් ගස් හන්දියේ සිට නගර මධ්‍ය දක්වා, නගර මධ්‍යයේ සිට මල්ලවපිටිය දක්වා, බෞද්ධාලෝක මාවත යන ස්ථානවල නිරන්තර වාහන තදබදයක් දැකිය හැක. ඒ අනුව නගර මධ්‍යය පසු කර කි.මී 02ක් ගමන් කිරීමට කාර්ය බහුල අවස්ථාවලදී විනාඩි 40ක් පමණ ගත වේ. ප්‍රධාන වශයෙන් සේවා මත පදනම් වූ නගරයක් බැවින් මෙම කාර්ය බහුල අවස්ථාවලදී සිදුවන වාහන තද බදය නගරයේ ඵලදායිතාවය අඩු කිරීමට බලපානු ලබයි.

*වගු අංක 5.6 කුරුණෑගල නගරය තුල මාර්ගවල වාහන ධාරිතාවය - 2017*

| මාර්ගයේ නම | පවතින වාහන ධාරිතාවය | වර්තමාන වාහන ගමනා ගමනය |
|---|---|---|
| පුත්තලම් පාර | 160000 | 226000 |
| නුවර පාර | 160000 | 392000 |
| දඹුල්ල පාර | 160000 | 290000 |
| මීගමුව පාර | 180000 | 299000 |
| කොළඹ පාර | 180000 | 339000 |

මූලාශ්‍ර : මාර්ග සංවර්ධන අධිකාරිය


- මෙය මූලික අධ්‍යයනයේදී ප්‍රධාන ගැටළුවක් ලෙසද හඳුනාගෙන ඇති අතර, වාහන තද බදය නගරයේ කාර්යක්ෂමතාවය පහළ යාමට හේතුවක් වේ.

*රූපය 5.1*



නගර මධ්‍යයේ වාහන තදබදයට ලක්ව ඇති අයුරු

*රූපය 5.2 මාර්ග නිර්මාණය කල වාහන ධාරිතාවය -*




*රූපය 5.3 මාර්ගවල පවතින වාහන ධාරිතාවය - 2017*




මුලාශ්‍රය : මාර්ග සංවර්ධන අධිකාරිය 2017 සමීක්ෂණය

## 02. දුම්රිය ස්ථානය හා බස් නැවතුම්පොල අතර එකාබද්ධතාවයක් නොමැතිකම.

කුරුණෑගල නගරය මාර්ග 05ක් කේන්ද්‍ර වූ මංසන්ධියකි. මෙම ප්‍රදේශය තුළ දුම්රිය ස්ථාන 03ක් (ගැට්ටුවාන, මුත්තෙට්ටුගල,නයිලිය) ස්ථානගත වී ඇති නමුත්, කුරුණෑගල බස් නැවතුම්පොල හා දුම්රිය ස්ථානය කි.මී 02 දුරකින් ස්ථානගත වීම නිසා මෙම ප්‍රවාහන මාධ්‍ය 02ක අතර (මහා මාර්ග හා දුම්රිය මාර්ග) එකාබද්ධතාවයක් නොමැතිකම හේතුවෙන් කුරුණෑගල නගරය තුළට දුම්රිය මඟින් දෛනිකව ප්‍රවේශය ලබන මගීන් ගණන 1500ක් වැනි සුළු අගයකි. එයින්ද 80%ක් පමණ රැකියා සඳහා දෛනිකව කොළඹ යන මගීන් වේ. ඒ අනුව දුම්රිය ප්‍රවාහන මාධ්‍යයේ වාසිය කුරුණෑගලට නගරයට ලැබී නොමැති බව පැහැදිලි වේ. එනම්, දෛනික සංසරණ ජනගහනයෙන් දුම්රිය මඟින් ප්‍රවේශය ලබන්නේ 0.5 %කි.

## 03. නගර මධ්‍යයේ පවතින ඉඩම් වලින් 10% කට වැඩි ප්‍රමාණයක් පාසල් හා රජයේ ආයතන හිමිකර ගැනීම.

- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය භාවිත - 4.8%, රජයේ පාසල් - 4%

බ්‍රිතාන්‍ය යුගයේ සිට පරිපාලන මධ්‍යස්ථානයක් වීම හේතුවෙන් නගර මධ්‍යයේ වාණිජ වටිනාකමක් සහිත ඉඩම් (මුළු ඉඩම් වලින් 10%) රජයේ අයිතියක් යටතේ පාසල්, රජයේ කාර්යාල සඳහා වෙන්වීම මත එම ඉඩම් තනි තට්ටුවේ ගොඩනැගිලි සහිතව ප්‍රශස්ත භාවිතයන්ට යොමුවී නොමැත. නගර මධ්‍යයේ සිට මීටර් 500ක් වැනි දුරක් තුළ නගරයේ සියලු පාසල් ස්ථාන ගත වී තිබෙන අතර, ශාන්ත ආනා , ශුද්ධවූ පවුලේ බාලිකාව වැනි මිෂනාරි පාසල් විකල්ප ස්ථානයක ප්‍රතිස්ථාපනය කිරීමේ පරිපාලනමය ගැටළු ද පවතී. තවද මෙම භාවිත නගර මධ්‍යයේ පිහිටීම හේතුවෙන් කාර්යබහුල වේලාවන්හි දී අධික වාහන තදබදයක් දැකිය හැකිය. ඉහල ප්‍රවේශක්තවය සහිත නගර මධ්‍යය වෙත ආයෝජකයන්ගේ ආකර්ෂණය යොමු වුවද එම ස්ථාන රජයේ අයිතිය යටතේ පැවතීම හේතුවෙන් ආයෝජකයින් නගරය තුල ආයෝජනය සඳහා අධෛර්යමත් වන අතර, ඒ අනුව ඉහල ප්‍රවේශකත්වයක් සහිත ප්‍රධාන මාර්ග දිගේ ආයෝජනය කිරීමට ආයෝජකයින් පෙළඹේ.

## 04. වාහන නැවතුම් ස්ථාන ප්‍රමාණවත් නොවීම.

වාහන නැවතුම් ස්ථාන ප්‍රමාණවත් නොවීම නිසා පහත පරිදි මාර්ග දෙපස වාහන නවතා තැබීම නිරීක්ෂණය වේ. මාර්ග දෙපස වාහන නවතා තැබීම නිසා ජනතාවට පහසුවෙන් සංසරණය වීම අපහසුවීමේ ගැටළුවට මුහුණ දීමට සිදුවීම නිසා නගරයේ ප්‍රියජනක බව අඩු කරනු ලබයි. තවද එය වාහන තදබදයට හේතුවී නගරයේ කාර්යක්ෂමතාවය අඩු වීමටද බලපානු ලැබේ. මගී ජනතාවගේ පහසුවෙන් සංසරණය වීමේ ගැටළු හා වාහන තදබදයටද මෙය හේතුවක් ලෙස මූලික අධ්‍යයනයේදී හඳුනා ගන්නා ලදී.

***සිතියම් අංක 5.3 නගර මධ්‍යයේ වාහන නවත්වන ස්ථානය***




***රූපය 5.4 කුරුණෑගල නගරයේ නුවර, පුත්තලම, කොළඹ මාර්ග වල වාහන නැවත තැබීම්***



*වගු අංක 5.7 මාර්ග දෙපස වාහන නවතා තැබීම. (පෙ:ව 10.00-10.30)*

| ස්ථානය | වාහන සංඛ්‍යාව |
|---|---|
| නගර මධ්‍ය | 1023 |
| කොළඹ පාර | 612 |
| මීගමුව පාර | 437 |
| නුවර පාර | 199 |
| දඹුලු පාර | 203 |
| පුත්තලම් පාර | 285 |
| එකතුව | **2759** |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර සමීක්ෂණය 2018.03.26

## 05. ප්‍රධාන මාර්ග සෘජුවම නේවාසික මාර්ග හා සම්බන්ධ වීම. ( පටු මාර්ග හා මාර්ග එකිනෙක සම්බන්ධ නොවීම. )

*රූපය 5.5 පුත්තලම ප්‍රධාන මාර්ගයේ සිට සම්බන්ධ වන පටු මාර්ගයක්*




නගර මධ්‍යයේදී කේන්ද්‍රිය වන නමුත් ප්‍රධාන මාර්ග හා සම්බන්ධ වන ප්‍රාදේශීය මාර්ග වැඩි ප්‍රමාණයක් නේවාසික මාර්ග ගනයට වැටේ. ඒ අනුව එම මාර්ග වල පටු බව හේතුවෙන් පොදු ප්‍රවේශය සඳහා ප්‍රමාණවත් නොවීම නිසා ව්‍යාපාර වැනි නාගරික භාවිතයන් සඳහා යොමුවී නොමැති බව නිරීක්ෂණය කල හැක. එම හේතුන් මත නගර මධ්‍ය අභ්‍යන්තර ප්‍රදේශ වාණිජ සංවර්ධනය සඳහා යොමු නොවී ප්‍රධාන මාර්ගය දිගේ රේඛීය සංවර්ධනය සඳහා යොමු වීම දැකිය හැක. එය සංවර්ධන සම්පිණ්ඩන විග්‍රහය මඟින්ද පැහැදිලි වේ.

## 5.1.1. ඇ. අවස්ථා

### 01. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය අනුව 2030 දී කුරුණෑගල නගරයේ අනාගත දැක්ම.

ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය - 2030 මඟින් හඳුනාගත් බස්නාහිර සිට නැගෙනහිර දක්වා දිවෙන (කොළඹ සිට ත්‍රිකුණාමලය) ආර්ථික කොරිඩෝවෙහි ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයක් ලෙස කුරුණෑගල හඳුනාගෙන තිබීම හේතුවෙන් කුරුණෑගල නගරය දිදුළන ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ අවස්ථාව හිමිවී ඇත.

### 02. යෝජිත හා ක්‍රියාත්මක ජාතික සංවර්ධන ව්‍යාපෘති

- මධ්‍යම අධිවේගී මාර්ගය හා අන්තර් හුවමාරු මධ්‍යස්ථාන
- කුරුණෑගල - දඹුල්ල දක්වා යෝජිත දුම්රිය මාර්ගය.
- පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය

මෙම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමත් සමඟ ගැට්ටුවාන , දම්බොක්ක ප්‍රදේශය තුළ අධිවේගී මාර්ගයේ අන්තර් හුමවමාරු ස්ථානගත වීම හා ගැට්ටුවාන අන්තර් හුවමාරු මධ්‍යස්ථානය හා ගැට්ටුවාන දුම්රිය ස්ථානය ආසන්නයේ ස්ථානගත වීමේ වාසිය ප්‍රයෝජනයට ගනිමින් ගමනාගමනය මුලික කරගත් මධ්‍යස්ථානයක් ලෙස (Transit Oriented Development) කුරුණෑගල නගරය දියුණු කිරීමේ හැකියාව පවතී. මෙම කාර්යක්ෂම ප්‍රවේශකත්වය මත කර්මාන්ත , තොරතුරු තාක්ෂණ ගම්මාන , භාණ්ඩ බෙදාහැරීමේ මධ්‍යස්ථාන (Logistic Hub) යනාදී ආර්ථික කටයුතු සඳහා යොමු වීමේ අවස්ථා පවතී.

### 03. යෝජිත හා ක්‍රියාත්මක අපරව්‍යුහ පහසුකම් ව්‍යාපෘති

- **විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය මඟින් කුරුණෑගල මහ නගර සභා ප්‍රදේශයම ආවරණය කරමින් නල ජලය සැපයීම, මල අපද්‍රව්‍ය හා අප ජලය බැහැර කිරීම සිදුකරන බැවින්, ඉඩම් අනුබෙදුම් වීම හා මහල් සංඛ්‍යාව වැඩි කිරීමේ ක්‍රියාවලිය මගින් මෙම ප්‍රදේශය තුළ අධි ඝණත්වයෙන් යුත් වාණිජ සංවර්ධනයන් සඳහා යොමු වීමේ විභවතාවය පවතී.

❖ **මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග පුළුල් වීම.**

ඒ6 අඹේපුස්ස කුරුණෑගල මාර්ගය වැහැර සිට පොල්අත්තාපිටිය දක්වා දැනටමත් මංතීරු 04ක් වන පරිදි මාර්ගය පුළුල් කර ඇති අතර පහත සඳහන් පරිදි මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග පුළුල් කිරීමට යෝජිතය.

*වගු අංක 5.8 මාර්ග සංවර්ධන අධිකාරි මාර්ග පුළුල් කිරීමේ ලේඛණය*

| මාර්ගයේ නම | යෝජිත පුළුල් කළ යුතු පළල (මීටර්) | ආරම්භය හා අවසාන ස්ථානය | පුළුල් කළ යුතු දුර කි.මී. |
|---|---|---|---|
| **කුරුණෑගල / මීගමු මාර්ගය (බී 247)** | 24 (මංතීරු 04) | කුරුණෑගල සිට නාරම්මල | 19 |
| **අඹේපුස්ස - කුරුණෑගල ත්‍රිකුණාමල මාර්ගය ඒ 006** | 24 (මංතීරු 04) | රෙග්ලන්ඩ් වත්ත සිට වැහැර | 3.5 |
| **කටුගස්තොට කුරුණෑගල පුත්තලම් මාර්ගය ඒ 010** | 24 (මංතීරු 04) | මල්ලවපිටිය හන්දිය සිට තිත්තවැල්ල දක්වා | 07 |


*මූලාශ්‍රය : මාර්ග සංවර්ධන අධිකාරිය*

## 5.1.1 ඈ. තර්ජන

### 01. කලාපය ආශ්‍රිතව දේශගුණික විපර්යාස නිසා ඇතිවන උෂ්ණත්ව වැඩිවීම.

මහජන අදහස් දැන ගැනීමේ සමික්ෂණයේදී අධික උෂ්ණත්වය ගැටළුවක්ව පවතින බව 80% ක ජනතාවගෙන් දැන ගන්නට ලැබුණි. නගරයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 27ක් වුවද නගරයේ උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ගල් පර්වත පිහිටීම හේතුවෙන් නොවැම්බර් සිට මාර්තු දක්වා හමන ඊසාන දිග මෝසම් සුළං නගරයට ඇතුල් වීමට බාධාවක් ලෙස ක්‍රියාකර නගර මධ්‍යයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 30ද ඉක්මවනු ලබයි. නගර මධ්‍යයේ සෙල්සියස් අංශක 36 පැවති අවස්ථාද තිබී ඇත.ඒ අනුව නගරය ජනතාවට ප්‍රියජනක තැනක් නොවනු ඇත. එබැවින් නගරයේ ස්වභාවික සුළං කපොලු ලෙස ක්‍රියාකරන කුඹුරු, වගුරු බිම් ජලාශ ආරක්ෂා කරමින් ආර්ථික සංවර්ධනය සඳහා යොමු කළ යුතුය. (සිතියම් අංක 5.4)

සිතියම් අංක 5.4 කුරුණෑගල දිස්ත්‍රික්කයේ උෂ්ණත්ව ව්‍යාප්තිය



# 5.1.2 අරමුණ 02

## 5.1.2 අරමුණ 02

### වයඹ පළාත තුළ ජනගහනයෙන් පරිපූර්ණ ආකර්ශණීය නේවාසික කලාපය බවට පත්කිරීම

*වගු අංකය 5.9 ශදුඅත විග්‍රහය*

**ශක්තීන්**

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල නේවාසික සංවර්ධනය සඳහා සුදුසු සංවර්ධනය කල හැකි ඉඩම් පැවතීම. (පොල්, ඉඩම්,අඩු ජනඝණත්ව ප්‍රදේශ, විශාල නේවාසික ඉඩම් කට්ටි)
2. ජාතික හා දිස්ත්‍රික් ජනගහන වර්ධන අනුපාතයට වඩා කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉහල ජනගහන වර්ධන අනුපාතයක් පැවතීම. (ලංකාවේ 0.76, කුරුණෑගල 0.96, සැලසුම් ප්‍රදේශයේ 0.98)
   - ප්‍රධාන සේවා නගරය හා පරිපාලන නගරය වීම නිසා රැකියා සඳහා කුරුණෑගල නගරයට පැමිණෙන්නන් නගරය වටා ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල පදිංචි වීමේ ප්‍රවනතාවයක් පැවතීම. (වාර්ෂිකව අක්කර 50කට වැඩි භූමි ප්‍රමාණයක් නේවාසික සංවර්ධනය සඳහා ඉඩම් අනුබෙදුම් වීම.)
3. නේවාසික සංවර්ධනය සඳහා ඉඩම් අනුබෙදුම් වීමේ ප්‍රවණතාවය වාර්ෂිකව ඉහළයාම.
4. තැනිතලා ප්‍රදේශයක් වීම හා ආපදා රහිත ප්‍රදේශයක් වීම.

**දුර්වලතා**

1. කුරුණෑගල මහ නගර සභා සීමාව තුල පවුල් 500ක් පමණ අඩු ආදායම් නිවාස වල ජීවත් වීම (විල්ගොඩ, පොල්අත්තාපිටිය , වැව් ගල)
2. දුම්රිය ස්ථානය හා බස් නැවතුම්පල අතර ඒකාබද්ධතාවයක් නොමැති වීම.
3. මාර්ග පටුබව හා එකිනෙක සම්බන්ධ නොවීම.
4. නගර මධ්‍යයේ වාහන නැවතුම් ස්ථාන ප්‍රමාණවත් නොවීම නිසා මාර්ග දෙපස වාහන නවතා තැබීම.
5. කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ ජල සම්පාදන මණ්ඩලය විසින් ක්‍රියාත්මක නළ ජල සැපයුම නොමැතිවීම. (නල ජල සැපයුම මහ නගර සභා සීමාවට පමණක් සීමා වීම.)

**අවස්තා**

1. ජාතික භෞතික සංවර්ධන සැලසුම මඟින් කුරුණෑගල නේවාසික සංවර්ධනය සඳහා සුදුසු ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන තිබීම - 2030 වර්ෂය වන විට කුරුණෑගල මෙට්‍රෝ රීජන් කලාපය තුළ ලක්‍ෂ 10ක නේවාසික ජනගහනයක් අපේක්ෂා කිරීම.
2. දැනටමත් ක්‍රියාත්මක හා යෝජිත අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.
   - විසල් කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතිය.
   - 2030 වර්ෂය වන විට මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම ආවරණය වන ලෙස ජල සම්පාදන මණ්ඩලය විසින් හඳුනාගත් ජල සම්පාදන ව්‍යාපෘති තිබීම.
   - මාර්ග පුළුල් කිරීම.
3. යෝජිත හා ක්‍රියාත්මක ජාතික සංවර්ධන ව්‍යාපෘති

- අධිවේගී මාර්ගය, දුම්රිය ද්විත්ව මාර්ගය හා දුම්රිය මාර්ග දීර්ඝ කිරීම.

**තර්ජන**

## 01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල නේවාසික සංවර්ධනය සඳහා සුදුසු සංවර්ධනය කළ හැකි ඉඩම් පැවතීම.

ඉහත අරමුණු අනුව 2030 වර්ෂය සඳහා මුළු ජනගහනයේ වැඩි වීම 50,000ක් වන අතර, නිවාස වැඩි වීම 12,500ක් වේ. ඒ අනුව එක් නිවාසයකට පර්. 15 බැගින් අවශ්‍යවේ යැයි උපකල්පනය කල විට නිවාස සඳහා අනාගත ඉඩම් අවශ්‍යතාවය හෙක්. 475කි.

ඉඩම් පරිහරණ සැලැස්ම අධ්‍යයනයේදී පහත පරිදි නිවාස සංවර්ධනය සඳහා යොදාගත හැකි ඉඩම් පවතින බව පැහැදිලි වේ.

- පොල් ඉඩම් — හෙක්. 5748.11- මුළු භූමියෙන් 23%
- ගෙවතු (අක්කර 01-02) — හෙක්. 3322.30 – මුළු භූමියෙන් 13%

නගරයේ උතුරු අර්ධයේ පිහිටි පොල් ඉඩම් (මාස්පොත, වැල්ලව) නිසරු තත්ත්වයෙන් පවතින අතර, නේවාසික සංවර්ධනය සඳහා අනුබෙදුම් වීමේ ඉහළ ප්‍රවනතාවයක් පවතී. එමෙන්ම අක්කර 2-3 ප්‍රමාණවලින් යුත් ගෙවතු අනුබෙදුම් කිරීමේ හැකියාව පවතී.

එමෙන්ම වර්තමාන නිවාස ඝනත්වය සහ ඒක නේවාසික භූමි පරිභෝජනය අධ්‍යයනයේදී 2030 වර්ෂය සඳහා සැලසුම් බල ප්‍රදේශය තුළ අපේක්ෂිත ජනගහනයට නිවාස සඳහා අවශ්‍ය ඉඩම් නේවාසික හා ගෙවතු ඉඩම් අනුබෙදුම්වීම තුළින් සපයා ගත හැකි බව පහත පරිදි අධ්‍යයනය කල හැක.

*වගු අංක 5.10 2030 නේවාසික ඉඩම් අවශ්‍යතාවය*

| ප්‍රදේශය | මුළු නේවාසික භූමි ප්‍රමාණය 2017 (හෙක්:) | නිවාස සංඛ්‍යාව 2017 | ඒක නේවාසික භූමි ප්‍රමාණය (පර්.) | 2030 ජනගහනය වැඩිවීම | 2030 සඳහා නිවාස වැඩි වීම | අවශ්‍යතාවය |
|---|---|---|---|---|---|---|
| කුරුණෑගල මහ නගර සභාව | 434 | 6023 | 28 | 7693 | 1768 | පවතින ඉඩම් කැබලි 1/3 අනුබෙදුම්වීම |
| ප්‍රාදේශීය සභාව සතු නාගරික බල ප්‍රදේශය | 3816.6 | 23,545 | 64 | 26235 | 6913 | පවතින ඉඩම් කැබලි 1/3 අනුබෙදුම්වීම |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික නොවන | 4507.4 | 16,739 | 107 | 13,015 | 3425 | පවතින ඉඩම් කැබලි 1/5 අනුබෙදුම්වීම |

ඉහත වගුව අනුව පවතින නේවාසික ඉඩම් කැබලි වලින් 1/3 අනුබෙදුම් වීම 2030 වර්ෂයේ නිවාස අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් බව පැහැදිලි වේ.

## 02. කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉහල ජනගහන වර්ධන අනුපාතයක් පෙන්වීම.


*වගු අංකය 5.11 ජනගහන වර්ධන ප්‍රවණතා 2001-2017*

| ප්‍රදේශය | ජනගහනය | | | | ජනගහන වර්ධන වේගය | | |
|---|---|---|---|---|---|---|---|
| | 1981 | 2001 | 2011 | 2017 | 1981-2001 | 2001-2011 | 2011-2017 |
| **ශ්‍රී ලංකාව** | 14,846,274 | 18,797,257 | 20,359,439 | | 1.16 | 0.76 | |
| **කුරුණෑගල** | 1,198,795 | 1,458,385 | 1,618,465 | | 0.96 | 0.97 | |
| **සැලසුම් කලාපය** | | 163,602 | 167,651 | 180,399 | | 0.98 | 1.23 |

ඉහත වගුව අනුව ශ්‍රී ලංකාවේ හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනගහන වර්ධන අනුපාතය සමඟ සැසඳීමේදී සැලසුම් ප්‍රදේශය තුළ ඉහළ ජනගහන වර්ධන වේගයක් පෙන්නුම් කරයි. රැකියා අවශ්‍යතා හා නාගරික සේවා පහසුකම් (දිස්ත්‍රික්කයේ ජනප්‍රිය පාසල්, රෝහල්,වාණිජ සේවා ) සඳහා බාහිර ග්‍රාමීය ප්‍රදේශවලින් සැලසුම් ප්‍රදේශය තුළට අභ්‍යන්තර සංක්‍රමණයක් පවතින බව මෙයින් පැහැදිලි වේ. එමෙන්ම ජනගහන වර්ධන අනුපාතය 2001-2011 ට වඩා 2011-2017 ඉහළ අගයක් ගැනීම ජනගහන වර්ධනය සඳහා ධනාත්මක ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක.

## 03. නේවාසික සංවර්ධනය සඳහා ඉඩම් අනුබෙදුම් වීමේ ප්‍රවණතාවය වාර්ෂිකව ඉහළ යාම.

*ප්‍රස්ථාර අංක 5.2 ඉඩම් අනුබෙදුම් වීමේ ප්‍රවණතාවය 1990-2017*




මූලාශ්‍රය : කුරුණෑගල ප්‍රාදේශීය සභාව

ඉහත වගුව අනුව කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ නේවාසික සංවර්ධනය සඳහා ඉඩම් අනුබෙදුම් වීමේ ප්‍රවණතාවය වාර්ෂිකව ඉහළ ගොස් ඇති බව පැහැදිලි වේ. එමෙන්ම ප්‍රධාන වාණිජ හා පරිපාලන නගරය වීම හේතුවෙන් රැකියා සහ අනෙකුත් නාගරික සේවා සඳහා කුරුණෑගල නගරයට පැමිණෙන්නන් නගරය වටා ප්‍රාදේශීය සභා සීමාව තුල පදිංචි වීම හේතුවෙන් වාර්ෂිකව අක්කර 50ට වැඩි ඉඩම් ප්‍රමාණයක් නේවාසික සංවර්ධනය සඳහා යොමු වීම නිරීක්ෂණය කළ හැක. එමෙන්ම කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුල මහල් නිවාස සංකීර්ණ ඉදිකිරීම සඳහා ඉල්ලුමක් පවතින බව 2017 මැයි සිට 2018 මැයි දක්වා මහල් නිවාස ඒකක 326ක් සඳහා නා. ස.අධි මූලික සැලසුම් නිරාකරණ ලබාදීම මඟින් පැහැදිලි වේ. (නාගරික සංවර්ධන අධිකාරියේ දත්ත)

## 04. තැනිතලා ප්‍රදේශයක් වීම හා ආපදා රහිත ප්‍රදේශයක් වීම.

සිතියම් අංක 5.5 කුරුණෑගල ප්‍රදේශයේ උන්නතාංශය




*මූලාශ්‍රය : වයඹ පළාත් ආපදා ඒකකය*

කුරුණෑගල නගරය දේශගුණික වශයෙන් අන්තර් මධ්‍යම කලාපයට අයත් වන අතර, උන්නතාංශය මීටර් 300ට වඩා අඩු පහත රට කලාපයට අයත් වේ. මෙම භූගෝලීය පිහිටීම අනුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ස්වභාවික ආපදා අවම කලාපයක් ලෙස කුරුණෑගල හඳුනා ගෙන ඇත.

එමෙන්ම බූ ඇළ හා වාන් ඇළ යන නමින් හඳුන්වන ප්‍රධාන ඇළ මාර්ග දෙක (02) නේවාසික, වාණිජ හා වගා ඉඩම් හරහා කි.මී 06ක දුර ගමන් කරමින් කුරුණෑගල නගරයේ වැසි ජලයෙන් 78%ක් පමණ මහුරු ඔයට ගලා බැසීම සඳහා දායකත්වය ලබාදීම මඟින් ස්වභාවික ජලාපවහන රටාවක් පවතින නගරයක් ලෙසද හඳුනාගත හැක. ඒ අනුව කුරුණෑගල නගරය වටා පිහිටි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ස්වභාවික ආපදා අවම ප්‍රදේශයක් නිසා නේවාසික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමේ අවස්ථාව පවතී.

## 5.1.2. (ආ) දුර්වලතා

### 01. කුරුණෑගල මහ නගර සීමාව තුළ පවුල් 500ක් පමණ අඩු ආදායම් නිවාස වල ජීවත් වීම.

*වගු අංක 5.12 කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුල අඩු ආදායම් නිවාස සංඛ්‍යාව*

| ස්ථානය | පදිංචි පවුල් සංඛ්‍යාව |
|---|---|
| ගැට්ටුවාන | 125 |
| වැව්ගල | 25 |
| දඹුල්ල පාර | 90 |
| විල්ගොඩ | 270 |
| **එකතුව** | **510** |

*මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය නාගරික සංවර්ධන අධිකාරිය*

*රූපය 5.6 විල්ගොඩ කම්කරු නිවාස*





ඉහත රූපයේ දැක්වෙන ස්ථානවල අඩු පහසුකම් නිවාස පවතින අතර, එම පදිංචිකරුවන් 99% නගර සභා කම්කරුවන් බැවින්, කුරුණෑගල මහා නගර සභාව මහල් නිවාස ව්‍යාපෘතියක් ඉදිකර එම ගැටළුව විසඳීමට යෝජිතව ඇත.

### 02. මාර්ග පටු බව හා එකිනෙක සම්බන්ධ නොවීම.

මාර්ග පටු බව , මාර්ග එකිනෙකට සම්බන්ධ නොවී අවසන් වීම හේතුවෙන් අභ්‍යන්තර ප්‍රදේශ අපරව්‍යුහ පහසුකම් සහිත පූර්ණ නේවාසික සංවර්ධන ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමේ ගැටලු පවතී.

*රූපය 5.7 පුත්තලම ප්‍රධාන මාර්ගයේ සිට පටන් ගන්න මාර්ගයක පටන්ගැන්ම හා අවසානය*



*ආරම්භය* *අවසානය*

## 5.1.2. (ඇ) අවස්ථා

### 1. ජාතික භෞතික සංවර්ධන සැලැස්ම මඟින් 2030 වර්ෂය වන විට ඉහළ නේවාසික සංවර්ධනයක් අපේක්ෂා කිරීම.

ජාතික භෞතික සැලැස්ම මඟින් ගම්පහ හා කුරුණෑගල ආපදා රහිත , නේවාසික කටයුතු සඳහා සුදුසු දේශගුණික පරිසරයක් සහිත ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබීමත් , 2030 වර්ෂය වන විට කුරුණෑගල මෙට්‍රෝ රීජන් කලාපය තුළ ලක්ෂ 10ක ජනගහනයක් අපේක්ෂා කිරීමත් නිසා කුරුණෑගල සැලසුම් බල ප්‍රදේශය නේවාසික ජනගහනයෙන් පරිපූර්ණ කලාපයක් ලෙස 2030 වන විට 250,000ක ජනගහනයක් දක්වා වර්ධනය කිරීමේ අවස්ථාව පවතී.

### 2. ක්‍රියාත්මක හා යෝජිත ව්‍යාපෘති

- ❖ විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය හා 2030 වර්ෂය සඳහා යෝජිත ජල ව්‍යාපෘති.

*වගු අංකය 5.13 යෝජිත ජල සම්පාදන ව්‍යාපෘති - 2030*

| | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත මුළු මුදල (රු . මි .) | නිර්මාණය කල ධාරිතාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභී ( ජනගහනය) | මූලාශ්‍රය | සටහන් |
|---|---|---|---|---|---|---|---|
| 1 | පොල්ගහවෙල අලව්ව ජ.සැ.වි ( අදියර 01 ) | 16,282.16 | මුළු සැපයුම - 29,000m³/d | පොල්ගහවෙල , අලව්ව, ගලිගමුව, රඹුක්කන, වරකාපොල, කුරුණෑගල, වීරඹුගෙදර. | 180,000 (2030) | මා ඔය | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිය |
| 2 | වදුරුපිනු ඇල්ල (ජ.සැ.වි ) | 31,246 | මුළු සැපයුම - 39,500m³/d | මල්ලවපිටිය, මාස්පොත, රිදීගම, ඉබ්බාගමුව, මාවතගම, කුරුණෑගල | 219,400 (2035) | යෝජිත වදුරුපිනු ඇල්ල ජලාශය ( දැදුරු ඔය ) | N.P.D අනුමත කිරීම සහ අරමුදල් ලැබීමෙන් පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකිය |
| 3 | කටුපොත-බමුණාකොටුව ඒකාබද්ද (ජ.සැ.වි) | 18,906.00 | මුළු සැපයුම - 18,000m³/d | කුලියාපිටිය නැගෙනහිර, වීරඹුගෙදර, මාස්පොත, බමුණාකොටුව, පඩුවස්නුවර නැගෙනහිර සහ බටහිර, කොබෙයිගනේ, වාරියපොළ. | 134,000 (2030) | දැදුරු ඔය ජලාශය | N.P.D අනුමත කර ඇත. අරමුදල් ලැබීමෙන් පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකිය |
| 4 | තෝරයාය | 366 | මුළු සැපයුම - 850m³/d | ඉබ්බාගමුව ප්‍ර.ලේ.කො | 1500 (පවුල්) | නල ළිං | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිය |

මූලාශ්‍රය : ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දැනටමත් ක්‍රියාත්මක කර ඇති විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය මඟින් මුළු මහ නගර සහා බල ප්‍රදේශයම ආවරණය කරන අතර, කුරුණෑගල නගර සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය මත සනීපාරක්ෂක ව්‍යාපෘතිය (මලාපවහනය හා අප ජලය බැහැර කිරීම) තව දුරටත් පුළුල් කිරීමේ අවකාශය පවතින බැවින් ඒ සඳහා මලඅපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මල්කඩුවාව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ අක්කර 09ක භූමි ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට දැනටමත් කටයුතු කර ඇත.

ඉහත සඳහන් ජල සම්පාදන මණ්ඩලයේ යෝජිත ව්‍යාපෘති මඟින් මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම ආවරණය වන බව ඉහත වගුව මඟින් පැහැදිලි වේ. මෙම ව්‍යාපෘති මා ඔය, දැදුරුඔය , භූගත ළිං යන ජල මූලාශ්‍ර මඟින් සපුරා ගැනීමට යෝජිතව ඇත. මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි නල ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජිත බැවින්, පරිපූර්ණ නේවාසික කලාපයක් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව පවතී. (**සිතියම් අංක**6.13)

❖ අධිවේගී මාර්ගය හා දුම්රිය මාර්ග දීර්ඝ කිරීම.

ඉහත ව්‍යාපෘති තුළින් අධිවේගී මාර්ගයේ ගැට්ටුවාන අන්තර් හුවමාරු මධ්‍යස්ථානය සහ කුරුණෑගල ප්‍රධාන දුම්රිය ස්ථානය එකිනෙකට ආසන්නයේ ස්ථානගත වීමේ උපායමාර්ගික පිහිටීම මත ගමනා ගමනය මූලික කරගත් සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස කුරුණෑගල නගරයේ පවතින ප්‍රවේශකත්වය තව දුරටත් කාර්යක්ෂම වනු ඇත. එමඟින් ලංකාවේ ප්‍රධාන නගර වන කොළඹ , කෑගල්ල , දඹුල්ල , මහනුවර , අනුරාධපුර වැනි ස්ථානවල රැකියා කරන්නන් පවා පහසු ප්‍රවේශකත්වය හේතුවෙන් කුරුණෑගල නගරය තුළ පදිංචි වීමේ අවස්ථාව උදාවේ. එනම් පැය 1- 1½ ක් වැනි සුළු කාලයක් තුල එවැනි නගර වෙත ලඟා වීමේ හැකියාව ලැබේ.

## 5.1.3. අරමුණ 03
### හස්ති ශෛලපුරවරයේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම.

*වග අංකය 5.14 ශදඅත විගහය*

| | |
|---|---|
| ශක්තීන් | ඈත අතීතයේ සිට කුරුණෑගල නගරයේ අනන්‍යතාවය ඇතුගල මත රඳාපැවතීම |
| දුර්වලතා | කුරුණෑගල අනන්‍යතාවය සැලකිල්ලට නොගෙන වර්තමානයේ සංවර්ධනයන් සිදුවීම. (දැන්වීම්පුවරු, අනවසර ගොඩනැගිලි) |
| අවස්තා | කුරුණෑගල නගරයේ අනන්‍යතාවය සම්බන්ධයෙන් මහජනතාවගෙන් 80%කගේ මූලික මතකය කුරුණෑගල නගරයේ "ඇතුගල" බව සමීක්ෂණයට අනුව ආනාවරණය වීම. |
| තර්ජන | |

## 5.1.3. (ආ) ශක්තීන්

### 01. ඇත අතීතයේ සිට කුරුණෑගල නගරයේ අනන්‍යතාවය ඇතුගල මත රඳා පැවතීම.

ඇතුගල නගර මධ්‍යයේ පිහිටීම හේතුවෙන් රජ සමයේ සිට “ඇතුගල්පුර, හස්ති ශෛලපුර” යන නම් වලින් කුරුණෑගල හැඳින්වූ අතර, කුරුණෑගල යන නාමය පවා ඇති වීමට ඇතුගල හේතුවී ඇති බව ජනප්‍රවාදයේ කියවේ. එබැවින්, ඇතුගලෙහි දර්ශනය කුරුණෑගල නගරයට ලබාගත යුතුය.

## 5.1.3. (ආ) දුර්වලතා

### 01. කුරුණෑගල නගරයේ අනන්‍යතාවය සැලකිල්ලට නොගනිමින් වර්තමාන සංවර්ධනයන් සිදුවී තිබීම.

*රූපය5.8*
*ඇතුගලෙහි දර්ශනය ආවරණය කරමින් ගොඩනැගිලි හා දැන්වීම් පුවරු ඉදිකර තිබීම.*




*රූපය 5.9 රජපීල්ල උද්‍යානය හා ඔරලෝසු කනුව හුදකලා වීම*



*රූපය 5.10 රජ මාලිගාව පිහිටි ස්ථාන හුදකලා වීම*



ඇතුගලෙහි දර්ශනය පිළිබඳ සැලකිලිමත් නොවී සිදුවන ගොඩනැගිලි හා දැන්වීම් පුවරු ඉදිකිරීම් ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනාගත හැක. එම නිසා නගර මධ්‍යයේ සිදුවන සිරස් සංවර්ධනය සඳහා මහ පෙන්වීම් සැලැස්මක් මඟින් ගොඩනැගිලි උස පාලනය කළ යුතුවේ.

## 5.1.3.(ඇ) අවස්ථා

### 01. කොග්නිටිව් සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව ජනතාවගෙන් 80%ක මූලික මතකය ඇතුගල වීම.

රාජධානි යුගයේ සිට පැවති රජපිහිල්ල උද්‍යානය, දෙවන ලෝක යුද්ධයේ සිහිවටනයක් සේ ඉදිවුණ ඔරලෝසු කණුව කුරුණෑගල නගරයේ අනන්‍යතාවය විදහාපාන අංග ලෙස පැවතියද ලංකාවේ පස්වන රාජධානිය වීම හේතුවෙන් මාලිගාව, මඟුල්මඩුව වැනි ඓතිහාසික වැදගත් ස්ථාන නගරය තුල පැවතියද බ්‍රිතාන්‍ය යුගයත් සමග උසාවිය , පොලිසිය, පල්ලිය වැනි ඓතිහාසික ගොඩනැගිලි අද දක්වා පැවතියද මහජනතාවගෙන් 80%කගේ මතකය ඇතුගල ලෙස කොග්නිටිව් සමීක්ෂණයේදී දැනගන්නට ලැබුණි. ඒ අනුව නගරයේ අන්‍යතාවය රැකගනිමින් ආර්ථික මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කිරීමේ අභියෝගය මෙම සැලැස්ම සතුවේ.

# 6

# සැලැස්ම

6.1 සංකල්පීය සැලැස්ම

6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලසුම

6.3 භෞතික හා සමාජීය අපර ව්‍යුහ පහසුකම් සංවර්ධන උපාය මාර්ග

6.4 ආර්ථික සංවර්ධන සැලැස්ම

6.5 තිරසර පාරිසරික උපාය මාර්ග

6.6 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග

# 6.0 සැලැස්ම

## 6.1 සංකල්පීය සැලැස්ම

මෙම සංකල්පිත සැලැස්ම මගින් කුරුණෑගල නගරයේ අනාගත සංවර්ධන සැලසුමේ සංකල්පය දිශානතිය විදාමාන කරන අතර නගරය තුළ හඳුනාගත් සැලසුම් ගැටළු මගහරවා ගනිමින් යෝජිත ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති වල විභවතාවයන් ප්‍රයෝජනයට ගනිමින් ඒ සඳහා සැළසුම් කණ්ඩායම විසින් හඳුනාගත් අනාගත නගර ආකෘතිය මෙය තුළින් විදහා දැක්වේ. (සිතියම 6.1)


කුරුණෑගල නගරය ඓතිහාසිකව විකාශනය වූ ඒක කේන්ද්‍රික නගරයක් ලෙස පවතින අතර, එය ප්‍රධාන මාර්ග හමුවන සන්ධිය නගරයක් වශයෙන් නිර්මාණය වී ඇත. නගරයේ ස්වභාවය අධ්‍යනයේදී හඳුනාගත් සැලසුම්මය ගැටලුවලට හේතුවක් ලෙස ද මෙම ඒක කේන්ද්‍රික පිහිටීම දැක්විය හැකිය. මෙම සංවර්ධන සැලැස්ම මගින් නගරය ද්විත්ව කේන්ද්‍රික නගරයක් ලෙස සංවර්ධනය කිරීම අරමුණු වේ. එනම් වර්තමාන ප්‍රධාන මංසන්ධිය ආශ්‍රිත නගරය සේවා පදනම් වූ ආර්ථික මධ්‍යස්ථානයක් ලෙසත් ගැට්ටුවාන අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථානය හා දුම්රිය ස්ථානය පදනම් කරගත් ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙසත් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

සේවා ආර්ථිකය පදනම්ව පවතින නගර මධ්‍යය ආශ්‍රිත කලාපය තවදුරටත් පරිපාලනමය ආයතන ඇතුලත් වෙනත් සේවා සපයන ආයතන ස්ථාපිත කරමින් හා දැනට අව භාවිත තත්ත්වයේ ඇති ඉඩම් උපරිම භාවිතයට පරිවර්තනය කරමින් ජනගහනය ආකර්ශණය කර ගැනීමටත් ඒ හා සමගාමීව ගැට්ටුවාන ආශ්‍රිතව දුම්රිය ස්ථානය, මධ්‍යම අධිවේගී මාර්ගය හුවමාරු මධ්‍යස්ථානය මූලික කරගත් ගමනාගමන මධ්‍යස්ථානයක් බිහිකරන අතර, එම විභවතාවය පදනම්කොට විශාල නේවාසික සංවර්ධනයක් මෙම ගැට්ටුවාන මධ්‍යස්ථානය ආසන්න කලාපයේ බිහිකිරීමට නියමිත වේ.

මෙම ද්විත්ව කේන්ද්‍රික නගරය පදනම් කර ගෙන පළමුව අධි නාගරික ලක්ෂණ සහිත කලාපයකුත් , දෙවනුව අර්ධ නාගරික ලක්ෂණ සහිත කලාපයකුත්, තෙවනුව පිළිවෙලින් නාගරික ලක්ෂණ අඩු වන පරිදි කලාප පිහිටුවීම පෙන්නුම් කරයි.

මෙම යෝජිත සංකල්පීය සැලැස්ම මඟින් ආර්ථික, සාමාජයීය, භෞතික හා පාරිසරික යන සැලසුම් සාධක ඉස්මතු කරවන තිරසාර සංවර්ධනයක් මගින් ගුණාත්මක සේවා සපයන දිවයිනේ ප්‍රධාන නගරයක් වශයෙන් ඇතුගල්පුරය 2030 වන විට සංවර්ධනය කිරීමට අපේක්ෂිතයි.

**සිතියම් අංක 6.1 සංකල්පීය සැලැස්ම**



# 6.2. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම


යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම මගින් 2030 වර්ෂය වනවිට කුරුණෑගල නගරයේ ඉඩම් භාවිතය නිරූපණය කරයි. සංකල්පීය සැලැස්මෙන් හඳුනාගත් පරිදි දැනට ඒක කේන්ද්‍රියව පවතින කුරුණෑගල නාගරික බල ප්‍රදේශය ද්වි කේන්ද්‍රීය නගරයක් ලෙස සංවර්ධනය කිරීමත් (සිතියම් අංක 6.2) ඊට අනුශාංගික වශයෙන් උප නාගරික මධ්‍යස්ථාන 07ක් නාගරික බල ප්‍රදේශය තුළ සංවර්ධනය කිරීමත්, මීට අමතරව සැලසුම් කලාපය තුළ පිහිටි වැල්ලව, මාස්පොත, මතව, කිරිවව්ල නාගරික සේවා මධ්‍යස්ථාන වශයෙන් සංවර්ධනය කිරීමද මෙම සංවර්ධන සැලැස්මේ අරමුණ වේ.

නගරය තුල හඳුනාගත් සැලසුමය ගැටළු අවම වන පරිදි හා නගරය තුල සංවෘත අවකාශ වැඩිවන ආකාරයෙන්, ඉහල ඝනත්වයකින් යුතු පරිසරයක් නිර්මාණය කිරීම හා සන්ධිය නගරයක් ලෙස සංවර්ධනය වන නගරය නිසි සංවර්ධන මාවතකට යොමුකිරීමේ අපේක්ෂාවෙන්,කේන්ද්‍ර දෙකකින් සමන්විත වූ වඩාත් පුළුල් වූ මහා නගරයක් නිර්මාණය මෙම සැලැස්මෙන් නිරූපණය කරයි. රට තුල ඇති ඕනෑම නගරයකට පහසුවෙන් ලඟා වීමේ හැකියාවක් ඇති නගරක් නිසාම විධිමත් ප්‍රවාහන සැලැස්මක් තුලින් මාර්ග පද්ධතියට අදාලව ඇතිවිය හැකි ගැටලු අවමවන ආකාරයෙන් සැලැස්ම සකස් කොට ඇත.

ප්‍රවාහන සැලැස්මට අනුගත වන ආකාරයට නගර මධ්‍යයෙන් පරිබාහිරව විසල් ව්‍යාපෘති හඳුන්වා දී ඇති අතර, ඒ හා සමගාමීව කලාප සැලසුම තුලින් සංවර්ධනයන් නගරයට ඇදී එන ආකාරයට සැලසුම සකස් කොට ඇත. යෝජිත විකල්ප මාර්ග පද්ධතිය මඟින් සංවර්ධනය කරා යොමු වී නොමැති අභ්‍යන්තර කලාපයේ ඉඩම් තරඟකාරී සංවර්ධනයකට යොමු කිරීමට සැලසුම් සකස් කොට ඇත. එමගින් පවතින ඉඩම් පහත පරිදි පරිවර්තනය කිරීමට අපේක්ෂා කෙරේ.


ජලාපවහන පද්ධතිය ඇතුළු සියලු යටිතල පහසුකම් වලින් සමන්විත නගර මධ්‍ය කලාප සිරස්ව සංවර්ධනය වීමට විශාල අනුග්‍රහයක් ලබාදෙමින් වැඩි ඝනත්වයක් සහිත කලාපයක් ලෙසත් පිළිවෙලින් ඝනත්වය අඩු වන පරිදි කලාප 05ක් යටතේ ඉඩම් පරිහරණ රටාව සංවර්ධනය කිරීමටත් මෙම සැලැස්මෙන් අපේක්ෂා කෙරේ.

ඒ අනුව පහත හරස් කඩවල් මගින් නගරය තුල නාගරික ලක්ෂණ විහිදී යන අයුරු නිරූපණය කරයි.




*රූපය6.1. ඇතුගල සිට පුත්තලම දෙසට නාගරීකරණය විහිදී යන ආකාරය*


ඉහත හරස්කඩ (6.1) තුලින් ඇතුගල හා ඒ ආශ්‍රිතව නුවර පාරෙහි ගොඩනැගිලි ඝනත්වය හා ඉදිවිය යුතු ආකාරයද, නගර මධ්‍යයේ සිට නාගරික කලාප වල නාගරික ලක්ෂණ තිබිය යුතු ආකාරයද නිරූපනය කරයි.




*රූපය6.2. නගර මධ්‍යයේ සිට කොළඹ දෙසට සහ දඹුල්ල දෙසට නාගරීකරණය*

ඉහත හරස්කඩ 6.2 තුලින් යෝජිත නාගරීකරණය නගර මධ්‍යයේ සිට දඹුල්ල දෙසට සහ කොළඹ දෙසට විහිදෙන ආකාරය නිරූපනය කරයි. නගර මධ්‍ය ආශ්‍රිතව අධිඝනත්වයේ සිට ක්‍රමයෙන් ඝනත්වය අඩුවන ආකාරයට ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කර ඇත.

**සිතියම් අංක 6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම - 2030**



# 6.3. භෞතික හා සමාජයීය අපර ව්‍යුහ පහසුකම් සංවර්ධන උපාය මාර්ග

## 6.3.1. සේවා සැලසුම්

### 6.3.1.1 යෝජිත ජනාවාස සැලැස්ම

#### හැඳින්වීම

කුරුණෑගල දිස්ත්‍රික්කය දිවයිනේ අනෙකුත් දිස්ත්‍රික්ක සමඟ සංසන්දනය කිරිමේදී ස්වභාවික ආපදා අවම තැනිතලා භූමියකි. ජාතික භෞතික සැලැස්මේ සුසැදි , සුරැකි , සොදුරු බිමක් යන දැක්ම පදනම් කරගෙන ආපදා අවම නේවාසික කටයුතු සඳහා සුදුසු දේශගුණික පරිසරයක් සහිත ප්‍රදේශයක් ලෙස කුරුණෑගල හඳුනාගෙන ඇත. 2030 වර්ෂය වන විට කුරුණෑගල මෙට්‍රො කලාපය තුල ලක්ෂ 10කට ආසන්න ජනගහනක් අපේක්ෂා කරන අතර, කුරුණෑගල නාගරික සැලසුම් බල ප්‍රදේශය තුළ 2030 වන විට 250,000ක නේවාසික ජනගහන වර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත.

මෙහිදී අනාගත ජනගහනයට අවශ්‍ය ඉඩම් සපයා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය තෙත් බිම් හැර අනෙකුත් ඉඩම් හැකිතාක් නේවාසික සංවර්ධනයට යෙදවීම ජනවාස සැලැස්මේ අරමුණයි.


*වගු අංකය 6.1 කලාප අනුව යෝජිත නිවාස ඝනත්වය - 2030*

| කලාපය | 2030 ඇස්තමේන්තු ජනගහනය | 2030 ඇස්තමේන්තු නිවාස සංඛ්‍යාව | 2030 ඇස්තමේන්තු නේවාසික භූමි ප්‍රමාණය (හෙක්.) | 2030 ජනඝනත්වය (හෙක්.1පුද්ගලයන්) | 2030 නිවාස ඝනත්වය (හෙක්. 01 නිවාස) |
|---|---|---|---|---|---|
| අධි නාගරික කලාපය | 42275 | 10952 | 447 | 94 | 25 |
| අර්ධ නාගරික කලාපය | 76653 | 19858 | 1850 | 41 | 11 |
| අඩු නාගරික කලාපය | 86445 | 22395 | 6474 | 24 | 03 |
| පර්යන්ත නාගරික කලාප | 8719 | 2259 | 562 | 15 | 04 |
| අඩු ඝනත්ව බාහිර කලාපය | 33336 | 8636 | 6304 | 5 | 02 |
| එකතුව | 247428 | 64104 | | | |

පදිංචිය සඳහා සුදුසු නේවාසික භූමි හඳුනා ගැනීමට සිදුකළ තාක්ෂණික විග්‍රහ (Livability Analysis, Potential analysis, Sensitivity Analysis) මඟින් හඳුනාගන්නා ලද පරිදි සැලසුම් කලාපය ඝනත්ව කලාප 05ක් යටතේ සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. ඉහත වගු අංක 6.1මඟින් 2030 නගර සංවර්ධන සැලැස්මෙන් අධි නාගරික කලාපය සඳහා හෙක්. 01ට නිවාස 25ක් හා අර්ධ නාගරික කලාපය සඳහා හෙක්. 01ට නිවාස 11 ලෙසද ගණනය කර ඇත. ඒ අනුව මහා නගර සභාව ඇතුළත් අධි නාගරික කලාපය හා මහා නගර සභාව වටා පිහිටි එයට ආසන්නතම කලාපය වන අර්ධ නාගරික කලාපය සඳහා අවශ්‍ය සියලු අපරව්‍යූහ පහසුකම් ලබාදීම තුලින් එම කලාප අධි ජනඝනත්ව සහිත ප්‍රදේශ බවට පත් කිරීමට අපේක්ෂිතය.

පර්යන්ත නාගරික කලාපයට ඇතුලත් ප්‍රදේශය (Hinterland Urban cluster ) ලෙස සැලැස්මෙන් හඳුනාගෙන ඇති සේවා සපයන කුඩා නාගරික මධ්‍යස්ථාන වන මතව , මාස්පොත , කිරිවවුල හා වැල්ලව යන උප මධ්‍යස්ථාන වල පවතින සමාජ අපරව්‍යූහ පහසුකම්වල ගුණාත්මක හා ප්‍රමාණාත්මක භාවය වැඩි කරමින් එම ප්‍රදේශ මධ්‍ය ජන ඝනත්ව කලාප ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත. එමෙන්ම අඩු ඝනත්ව බාහිර කලාපයෙහි පිහිටි කෘෂිකාර්මික ඉඩම් (පොල්වතු) ඒ ආකාරයටම ආරක්ෂා කර ගනිමින් ගෙවතු ලෙස තවදුරටත් පවතින අතර, නේවාසික භාවිතය සඳහා යොමු කිරීමට සැලසුම් කරනු ලැබේ. (සිතියම් අංක 6.3)

**සිතියම් අංක 6.3 යෝජිත ජනාවාස සැලැස්ම - 2030**



## නිවාස අවශ්‍යතාවය - 2030

*වගු අංකය 6.2 2030 වර්ෂය සඳහා ජනගහනය හා නිවාස පුරෝකථන*

| කලාපය | 2017ජනගහනය | 2030 පුරෝකතන ජනගහනය | යෝජිත ජනගහන වර්ධන වේගය 2017-2030 | නිවාස 2017 | අපේක්ෂිත නිවාස සංඛ්‍යාව 2030 | ජනගහනයේ වැඩිවීම 2030 | නිවාස වැඩිවීම 2030ට |
|---|---|---|---|---|---|---|---|
| අධි නාගරික කලාපය | 32658 | 42275 | 2 | 8466 | 10952 | 9595 | 2486 |
| අර්ධ නාගරික කලාපය | 53872 | 76653 | 2.75 | 13596 | 19858 | 22781 | 6252 |
| අඩු නාගරික කලාපය | 60754 | 86445 | 2.75 | 15739 | 22395 | 25691 | 6656 |
| පර්යන්ත නාගරික කලාපය | 6740 | 8719 | 2.0 | 1740 | 2259 | 1979 | 513 |
| අඩු ඝනත්ව බාහිර කලාපය | 27470 | 33336 | 1.5 | 7117 | 8636 | 5866 | 1519 |
| එකතුව | 181516 | 247428 | | 47024 | 64104 | | 17436 |

### උපකල්පන

පවතින ජනගහන වර්ධන වේගය, නේවාසික සංවර්ධනය සඳහා ඇති විභවතා, අපරවව්‍යුහ පහසුකම් සඳහා යන වියදම, භෞතික සාධක හා පාරිසරික තත්ත්වය, අනාගත සංවර්ධන නැමියාව යනාදිය මත බර තැබීමක් සිදුකර අනාගත ජනගහන වර්ධන අනුපාතය උපකල්පනය කරන ලදී. කුටුම්භයක සිටින පුද්ගලයන් සංඛ්‍යාව 3.86ක් ලෙස උපකල්පනය කර ඇත.

යෝජිත ජනගහන ව්‍යාප්ති සැලැස්ම මඟින් 2030 වන විට 250,000ක ජනගහනයක් මෙම කලාපය තුලට අපේක්ෂා කරයි. එම ජනගහන වර්ධනයට සාපේක්ෂව නිවාස අවශ්‍යතාවය පහත සටහනේ දක්වා ඇත.

*වගු අංකය 6.3 - 2030 වර්ෂයේදී ලබාදිය යුතු නිවාස සංඛ්‍යාව*

| | |
|---|---|
| **2030 වන විට වැඩි වන නිවාස සංඛ්‍යාව (2017-2030 අතර වෙනස)** | 17436 |
| **නිවාස නොමැති පවුල් සංඛ්‍යාව** | 1350 |
| **රක්ෂිතයන් තුළ අනවසර පදිංචි පවුල් සංඛ්‍යාව** | 786 |
| **එකතුව - මුළු නිවාස අවශ්‍යතාවය - 2030** | 19572 |
| **අඩු කලා - සාමාන්‍ය වාර්ෂික නිවාස වර්ධන වේගය අනුව 2030 සඳහා නිවාස වැඩිවීම.** | 12397 |
| **2030 වර්ෂයේදී ඉදිකළ යුතු නිවාස සංඛ්‍යාව** | 7175 |

**උපකල්පන**

2012-2017 නිවාස වර්ධන වේගය අනුව වාර්ෂික නිවාස වර්ධන වේගය 1.77ක් ලෙස උපකල්පනය කරන ලදී.

2016 ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව, නිවාස ඒකකයක මාසික සාමාන්‍ය ආදායම් මට්ටම සැලකිල්ලට ගනිමින් 2030 වර්ෂය වන විට අවශ්‍ය කරන නිවාස සංඛ්‍යාව (7175) ආදායම් මට්ටම් අනුව කාණ්ඩ 04ක් යටතේ පහත වගුවෙන් දක්වා ඇත.

*වගු අංක 6.4 - 2030 වර්ෂයේදී ලබාදියයුතු නිවාස සංඛ්‍යාව ආදායම් මට්ටම අනුව වර්ගීකරණය කිරීම.*

| ආදායම (රුපියල්) | නිවාස කාණ්ඩය | නිවාස අවශ්‍ය ප්‍රමාණය | ප්‍රතිශයක් ලෙස |
|---|---|---|---|
| **23000ට අඩු** | අඩු ආදායම් නිවාස | 718 | 10% |
| **23000-63700** | මධ්‍ය ආදායම නිවාස (පහළ) | 2655 | 37% |
| **63700-115,000** | මධ්‍ය ආදායම නිවාස (ඉහළ ) | 2510 | 35% |
| **115000 වැඩි** | සුඛෝපභෝගි | 1292 | 18% |
| **එකතුව** | **නිවාස** | **7175** | **100%** |

ඉහත වගුව අනුව අඩු ආදායම් ලාභීන් සඳහා (අනවසර පදිංචිකරුවන් හා නිවාස නොමැති) නිවාස 718ක් ද , මධ්‍ය ආදායම් ලාභීන් (පහල) සඳහා නිවාස 2655ක් ද මධ්‍ය ආදායම් ලාභින් (ඉහල) සඳහා නිවාස 2510ක් හා සුඛෝපභෝගී නිවාස 1292 ක් ලබාදිය යුතු අතර, ඒ සඳහා හඳුනාගන්නා ලද නිවාස සංවර්ධන ව්‍යාපෘති වගු අංක 6.2 මඟින් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මෙම කලාප වල නිවාස අවශ්‍යතාවය මහල් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් සැපයීමට අවශ්‍ය ඉඩම් හඳුනාගෙන නිවාස සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යෝජනා කර ඇත.

*වගු අංකය 6.5 හඳුනාගත් නිවාස සංවර්ධන ව්‍යාපෘති - 2030*


| ස්ථානය | භූමියේ ප්‍රමාණය (අක්කර ) | අවශ්‍ය නිවාස සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | අඩු ආදායම් | මධ්‍ය ආදායම (පහළ) | මධ්‍ය ආදායම (ඉහළ) | සුඛෝපභෝගී |
| පැල්ලන්දෙණිය ගෝනගම හන්දිය අසල නිවාස ව්‍යාපෘතිය | 03 | | | 375 | 250 |
| දොරටියාව නිවාස ව්‍යාපෘතිය | 05 | | | 450 | 250 |
| දඹුල්ල පාර නිවාස ව්‍යාපෘතිය | 02 | | 90 | 90 | |
| වැව රවුම නිවාස ව්‍යාපෘතිය | 12 | | | 650 | 500 |
| ගැටවුවාන නිවාස ව්‍යාපෘතිය | 05 | | 150 | 150 | 50 |
| සත්‍යවාදි නිවාස ව්‍යාපෘතිය | 0.5 | | | | 200 |
| හෙරලියාවල නිවාස ව්‍යාපෘතිය | 02 | | 600 | | |
| හාල්පාර නිවාස ව්‍යාපෘතිය | 15 | | 950 | 500 | |
| විල්ගොඩ නිවාස ව්‍යාපෘතිය | 02 | 700 | | | |
| කවුඩාවත්ත (ඇස්වැද්දුම) නිවාස ව්‍යාපෘතිය | 04 | | 300 | 300 | |
| වඳුරාගල නිවාස ව්‍යාපෘතිය | 02 | | 450 | | |
| වැහැර නගරසභා නිලනිවාස භූමිය | 1.5 | | 200 | | |
| නගර සභා ඉඩම ( සුසාන භූමිය අසල) | 0.5 | | 50 | | |
| මලියදේව පිරිමි විද්‍යාල ඉදිරිපිට | 0.5 | | | 30 | |
| එකතුව | **55.75** | **700** | **2790** | **2545** | **1300** |

ක්‍රියාත්මක ක්‍රමවේදය :

- රජයේ නිල නිවාස පිහිටි ඌන භාවිතයෙන් යුත් ඉඩම්වල මහල් නිවාස සංකීර්ණ ඉදිකිරීම.
- හඳුනාගත් පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසු පෞද්ගලික ආයෝජකයින් හරහා නිවාස සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

# යෝජිත නිවාස සංවර්ධන ව්‍යාපෘති

*සිතියම් අංක 6.4 යෝජිත නිවාස සංවර්ධන ව්‍යාපෘති*



### 6.3.1.2 අධ්‍යාපන පහසුකම් සංවර්ධන සැලැස්ම

2030 වර්ෂය වන විට අපේක්ෂිත 250,000ක වූ නේවාසික ජනගහනයට අවශ්‍ය ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපන පහසුකම් ඇති කිරිම මෙම සැලැස්මෙන් අපේක්ෂා කෙරේ.

*වගු අංකය 6.6 2030 වර්ෂයට පාසැල් වල සිසුන් සඳහා පවතින ඉල්ලුම.*

| | 2017 | 2017 නේවාසික පාසල් ජනගහනය | 2017 සංසරණ පාසල් ජනගහනය | 2030 නේවාසික පාසල් ජනගහනය | 2030 සංසරණ පාසල් ජනගහනය | 2030 මුළු පාසල් ජනගහනය |
|---|---|---|---|---|---|---|
| මහ නගර සභා බල ප්‍රදේශයේ පාසල් වල සිසුන් සංඛ්‍යාව | 31929 | 5534 | 26395 | 7169 | 26395 | 33564 |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාසල්වල සිසුන් සංඛ්‍යාව | 19040 | 30793 | -13753 | 41717 | -13753 | 27964 |
| මුළු සැලසුම් බල ප්‍රදේශයේ වර්තමාන පාසල්වල ධාරිතාවය | | | * සිසුන් 13753 මහ නගර සභාවේ පාසල්වලට සංක්‍රමණය වේ. | * 2030 වර්ෂයේදී සිසුන් 13753 මහ නගර සභාවේ පාසල් වලට සංක්‍රමණය වේයැයි උපකල්පනය කර ඇත. | | |
| පාසල් සඳහා අනාගත ඉල්ලුම. | | | | | | |
| මහ නගර සභාවෙහි වෙනස | 1635 | | | | | |
| ප්‍රාදේශීය සභාවෙහි වෙනස | 8924 | | | | | |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 10559 | | | | | |
| මහ නගර සභාවේ පාසල් සංඛ්‍යාව | 13 | | | | | |
| මහ නගර සභා පාසල් වැඩි දියුණු කල යුතු අවශ්‍යතාවය (ශිෂ්‍ය සංඛ්‍යාව) | 1635 | | | | | |
| ප්‍රාදේශීය සභාවෙහි පාසල් සංඛ්‍යාව | 46 | | | | | |
| වැඩි දියුණු කළ යුතු අවශ්‍යතාවය (ශිෂ්‍ය සංඛ්‍යාව) | 8924 | | | | | |

ඉහත වගුව අනුව 2030 වර්ෂය වන විට කුරුණෑගල සැලසුම් බල ප්‍රදේශය තුළ පාසල් යන වයසේ ළමුන් 10600ක් පමණ වැඩි වෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, එම ළමුන් සඳහා විධිමත් අධ්‍යාපනයක් ලබාදීමට

පාසල්වල පහසුකම් ගුණාත්මක හා ප්‍රමාණාත්මක සැපයිය යුතුය. ඒ සඳහා පහත සඳහන් පාසල් පද්ධතිය වැඩි දියුණු කිරිමට අවශ්‍ය සැලසුම් සකස් කළ යුතුය.

කුරුණෑගල නගරය තුල ප්‍රදේශයේ ප්‍රධාන පාසල් 13ක් ස්ථානගතවී ඇති අතර, නගර සභා බල ප්‍රදේශය තුල පදිංචි පාසල් යන වයසේ ළමුන් මෙන් 06 ගුණයක සිසුන් ප්‍රමාණයක් මෙම පාසල් වල අධ්‍යාපනය ලබයි. නගර මධ්‍යයේ ඇති පාසල් තව දුරටත් ප්‍රවර්ධනය නොකර නගරය ආසන්නයේ ප්‍රධාන මාර්ග ආශ්‍රිතව නව පාසල් පද්ධතියක් හඳුන්වා දීම අත්‍යාවශ්‍ය කාරණයක් වේ. එම හඳුනාගත් ස්ථාන පහත වගු අංක 6.7 හා සිතියම් අංක 6.5 මගින් දක්වා ඇත.


*වගු අංකය 6.7 සංවර්ධනය කිරීමට යෝජිත පාසල් - 2030*

| පාසලේ නම | නව ඉදිකිරීම් | පවතින තත්ත්වය වැඩිදියුණු කිරීම. |
|---|---|---|
| රත්ගල්ල ජාතික පාසල | ✓ | |
| තිරගම මධ්‍ය මහා විද්‍යාලය - මතව | | ✓ |
| මහින්ද විද්‍යාලය - ගැට්ටුවාන | | ✓ |
| සුදර්ශන මහා විද්‍යාලය - උඩබද්දලව | | ✓ |
| විශ්වලෝක විද්‍යාලය | | ✓ |
| ඇතුගල්පුර කුමර විද්‍යලය | | ✓ |
| වැල්ලව මහා විද්‍යාලය | | ✓ |
| මහා විද්‍යාලය - බෝයගනේ | | ✓ |
| මාස්පොත මහා විද්‍යාලය | | ✓ |

මෙම සැලැස්ම තුලින් නගරය තුල පාසල්වල ගුණාත්මක භාවයේ වර්ධනයක් පමණක් අපේක්ෂා කරන අතර, පවතින ප්‍රමාණාත්මක භාවය එලෙසම පවතින විට ඒ සමාන ආකාරයෙන් නගරයෙන් පරිබාහිරව පිහිටි (ප්‍රාදේශීය සභා සීමාවේ පිහිටි) සේවා නගරයේ පාසල්වල ගුණාත්මක හා ප්‍රමාණාත්මක භාවය වැඩි දියුණු කිරීම තුලින් දැනට නගරයේ පාසල්වලට පවතින දැඩි ඉල්ලුම වලක්වා ගැනීම තුළින් නගර මධ්‍යයේ වාහන තදබදයට විසඳුමක් ලබා දෙනු ලැබේ.

මෙම සැලැස්ම මඟින් නේවාසික ජනගහනයට අවශ්‍ය පරිදි අධ්‍යාපන පහසුකම් ලබාදීම ප්‍රධාන අරමුණ වේ. එම අරමුණ 2030 සැලැස්ම මඟින් පරිපූර්ණ කර ගැනීමට බලාපොරොත්තු වේ.

**සිතියම් අංක 6.5 යෝජිත සේවා සැලැස්ම- අධ්‍යාපන**




| සේවා සැලැස්ම - අධ්‍යාපන (2030) - කුරුණෑගල ප්‍රා.ස. | වයඹ පළාත<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>2019 |
|---|---|

| | | |
|---|---|---|
| ව . ප - සැළසුම් අංශය | කුරුණෑගල සංවර්ධන සැලැස්ම ( 2019-2030 ) | සකස් කළේ : ඊ .එම් .පී .කේ . ඒකනායක |

### 6.3.1.3 සෞඛ්‍ය පහසුකම් සංවර්ධන සැලැස්ම

2030 වර්ෂයේ අපේක්ෂිත 250,000කින් යුතු නේවාසික ජනගහනයට සහ 2030 සංසරණය ජනගහනයට ප්‍රමාණවත් පරිදි සෞඛ්‍ය පහසුකම් ලබාදීම මෙම සැලැස්මෙන් අපේක්ෂා කෙරේ.

දැනට සෞඛ්‍ය පහසුකම් සඳහා රෝහල් කරා දෛනිකව 26,000න් පමණ ජනතාවක් නගරය කරා පැමිණෙන අතර,එය සංසරණ ජනගහනය වන 300,000 න් 8.6% ප්‍රතිශතයකි.


2030 වර්ෂය වන විට සෞඛ්‍ය පහසුකම් සඳහා පැමිණෙන ජනගහනය වැඩි වන සංසරණ ජනගහනයට සාපේක්ෂව වැඩිවන බව උපකල්පනය කෙරේ. ඒ අනුව, 2030 වන විට අපේක්ෂිත දෛනික සංසරණ ජනගහනය වන 500,000න් සෞඛ්‍ය පහසුකම් සඳහා පැමිණෙන ජනගහනය 43,000ක් ලෙස ගනනය කර ඇත.

ඒ අනුව 2030 වර්ෂය වන විට සෞඛ්‍ය පහසුකම් සඳහා දෛනිකව පැමිණෙන ජනගහනය 43,000ක් ලෙස උපකල්පනය කර ඒ සඳහා අවශ්‍ය පරිදි කුරුණෑගල ශික්ෂණ රෝහලේ මානව හා භෞතික පහසුකම් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. දැනට කුරුණෑගල ශික්ෂණ රෝහල් භූමියෙන් වැඩි ප්‍රතිශතයක් තනි මහල් ගොඩනැගිලි වලින් ආවරණය වී ඇත. රෝහල් භූමිය තුළ සිරස් සංවර්ධනයක් ඇති කරමින් භූමියේ උපරිම ඵලදායකත්වයක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

සංවර්ධන සැලැස්මෙන් උප සේවා නගර ලෙස හඳුනාගන්නා ලද මතව, වැල්ලව යන ප්‍රදේශයන්ගේ පවතින රෝහල් වල පහසුකම් ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වැඩි දියුණු කිරීමට හා මාස්පොත, කිරිවවුල යන මධ්‍යස්ථානවල නව ප්‍රාදේශීය රෝහල් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය මෙම සැලැස්මෙන් පෙන්වාදී ඇත.

ඒ අනුව මතව හා වැල්ලව අවට ප්‍රදේශයට, සේවාව ලබාදෙන මතව හා වැල්ලව රෝහල් වල වෛද්‍යවරු, ගොඩනැගිලි හා උපකරණ ප්‍රමාණාත්මකව හා ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම මෙම සැලැස්මෙන් අපේක්ෂිතය. තවද, මාස්පොත හා මල්ලවපිටියේ පවතින සෞඛ්‍ය සායන මධ්‍යස්ථානද වැඩි දියුණු කිරීමට ද සැලසුම් කර ඇත. (සිතියම් අංක 6.6)

**සිතියම් අංකය6.6 යෝජිත සෞඛ්‍ය සේවා සැලැස්ම**




සේවා සැලැස්ම - සෞඛ්‍ය (2030) - කුරුණෑගල ප්‍රා.ස.

වයඹ පළාත
නාගරික සංවර්ධන අධිකාරිය
2019

ව . ප - සැළසුම් අංශය | කුරුණෑගල සංවර්ධන සැලැස්ම ( 2019-2030 ) | සකස් කළේ : ඊ .එම් .පී .කේ . ඒකනායක

## 6.3.2 යෝජිත ප්‍රවාහන සැලැස්ම

### හැඳින්වීම

ප්‍රධාන මාර්ග 05ක් සම්බන්ධ වන මංසන්ධි නගරයක් වශයෙන් කුරුණෑගල නගරය ඓතිහාසිකව විකාශනය වී ඇත. එනම් .අඹේපුස්ස - ත්‍රිකුණාමලය මාර්ගය, කටුගස්තොට- පුත්තලම් මාර්ගය, මීගමුව මාර්ගය යන ප්‍රධාන මාර්ග වේ. මේ නිසා දිවයිනේ උතුරු නැගෙනහිර, මධ්‍යම, බටහිර යන සියලුම පළාත්වලට ඉතා පහසුවෙන් ප්‍රවේශකත්වය ලබා ගත හැකි නගරයක් වශයෙන් කුරුණෑගල නගරය ප්‍රසිද්ධියට පත්වී ඇත. ප්‍රධාන මාර්ග ජාලය එකිනෙකට සම්බන්ධ වුවත් නගරය හා නගර අවට ප්‍රදේශයේ අභ්‍යන්තරික මාර්ගවල අන්තර් සම්බන්ධතාවය ඉතා දුර්වල මට්ටමක පවතී. මේ නිසා සියලුම ගමනාගමන කටයුතු නගර මධ්‍ය හරහා සිදු කිරීම නිසා කාර්ය බහුල අවස්ථාවන්හි දී අධික ගමනාගමන තදබදයක් දක්නට ඇත.

තවද මංසන්ධිය මූලික කරගත් ඓතිහාසික විකාශනයක් ඇති කුරුණෑගල නගරය රාජධානි සමයෙහි හා බ්‍රිතාන්‍ය සමයේ සිට පරිපාලන මධ්‍යස්ථානයක් වීම නිසා රාජ්‍ය ආයතන බහුතරයක් නගර මධ්‍යයේ ස්ථානගතවී ඇත. මේ නිසා පරිපාලන සේවා ලබා ගැනීමට එන සේවාලාභීන් නිසාද මාර්ග තදබදයක් ඇති වේ. (උදා : උසාවි සංකීර්ණය, පළාත් සභාව, කච්චේරිය, පොලිසිය, මාර්ග සංවර්ධන අධිකාරිය, නගර සභාව)


අභ්‍යන්තර මාර්ග පද්ධතියේ ප්‍රවේශකත්ව දුර්වලකම නිසා ප්‍රධාන මාර්ග දෙපස රේඛීය සංවර්ධනයක් දක්නට ලැබේ. මෙමගින් ද වාහන ගමනාගමනයට බාධා සිදුව ඇත. මේ සඳහා උපායමාර්ගික සැලැස්ම මඟින් විකල්ප මාර්ග ජාලයක් හා අභ්‍යන්තර මාර්ග සංවර්ධනය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ඇත.

අධික ගමනාගමන තදබදය නිසා නාගරික ජන ජීවිතය අසහනකාරී වීම , නාගරික පරිසරය දූෂණය මෙන්ම නාගරික ආර්ථික කටයුතු ප්‍රවර්ධනයටද බාධා එල්ල වී ඇත. එමෙන්ම නාගරික ජන ජීවිතය නොයෙකුත් සෞඛ්‍ය ගැටලු වලට මුහුණ දීමට සිදුව තිබේ. විශේෂයෙන් පාසල් යන කුඩා ළමුන් පාසල තුළ පැය 08 කාලයක් දූෂණය වන වායුව ආඝ්‍රාහණය කිරීම නිසා ස්වසන අබාධයන්ට ගොදුරු වන බව සෞඛ්‍ය අංශය මඟින් කරන ලද සමීක්ෂණ මඟින් තහවුරු වී ඇත. එමෙන්ම වෙළඳ ප්‍රජාව තම ව්‍යාපාරික කටයුතු සඳහාද ගැටලුවක් ඇති වී ඇති බව ප්‍රකාශ කරයි.

එමෙන්ම ජාතික සංවර්ධන ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක මධ්‍යම අධිවේගී මාර්ගය කුරුණෑගල නගරය හරහා ගමන් කිරීම, පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ග සංවර්ධනය, කුරුණෑගල සිට දඹුල්ල දක්වා දුම්රිය මාර්ග දීර්ඝ කිරීම යන ව්‍යාපෘතීන් වල ප්‍රතිලාභ නගරය වෙත ලබාගනිමින් කාර්යක්ෂම ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස කුරුණෑගල නගරය සංවර්ධනය කිරීම නූතන ප්‍රවාහන සැලැස්මේ ප්‍රධාන අරමුණකි. යෝජිත ගමනාගමන සැලැස්ම ක්‍රියාත්මක වීම තුළින් වර්තමානයේ මෙන්ම අනාගත සංවර්ධනයෙන්ද ජනිත වන ගමනාගමන කටයුතු ඉතා කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම සැලැස්ම හඳුන්වාදී ඇත.

# ප්‍රවාහන සැලැස්ම

**සිතියම්අංක 6.7 ප්‍රවාහන සැලැස්ම**



## උපාය මාර්ග

ඉහත සිතියම මගින් ප්‍රවාහන සැලැස්ම නිරූපනය කරන අතර, පහත සඳහන් උපාය මාර්ග එහි අන්තර්ගතකොට ඇත.

### උපාය මාර්ග 01

**බාහිර වට රවුම් මාර්ගය සංවර්ධනය කිරීම.**

(සාරගම සිට වඳුරාගල හරහා ගැට්ටුවාන සහ විල්බාව සිට මල්ලව පිටිය දක්වා විකල්ප මාර්ග )
(මල්ලවපිටිය සිට උයන්දන හරහා යග්ගපිටිය සහ යග්ගපිටිය සිට සාරගම දක්වා විකල්ප මාර්ග )

| මාර්ගයේ නම ( ආරම්භය හා අවසානය ) | මාර්ග දුර | නව ඉදිකිරීම් දුර | මාර්ග පළල |
|---|---|---|---|
| සාරගම සිට වඳුරාගල | 6.94 | 2.62 | 12 |
| වඳුරාගල සිට ගැට්ටුවාන | 3.33 | 2.15 | 24 |
| විල්බාව සිට මල්ලවපිටිය | 4.81 | 1.05 | 12 |
| මල්ලවපිටිය සිට යග්ගපිටිය | 4.68 | 0 | 15 |
| යග්ගපිටිය සිට සාරගම | 7.76 | 0 | 12 |

**සිතියම්අංක 6.7 ප්‍රවාහන සැලැස්ම හි නිරූපනය වන ආකාරයට** බාහිර වට රවුම් මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති අතර එහි ප්‍රධානතම හා අත්‍යවශ්‍ය මාර්ගයක් ලෙස වඳුරාගල සිට ගැට්ටුවාන දක්වා කොටස පළමු අධියර ලෙස සංවර්ධනය කල යුතුය.

### උපාය මාර්ග 02

- ❖ වර්තමාන දුම්රිය ස්ථානය පිහිටි භූමිය බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම.

වර්තමාන දුම්රිය ස්ථානය, මධ්‍යම අධිවේගී මාර්ගය හා පවතින මාර්ග පද්දතිය මනාව සම්බන්ද කරමින් දුම්රිය ස්ථානය අසල භූමි පරිශ්‍රය පදනම්ව බහු කාර්ය ප්‍රවාහන මධ්‍යස්ථානයක් ගොඩ නැගීමේ අවශ්‍යතාවය සැලසුමෙන් පෙන්වාදෙන අතර, ඒ සමග රටෙහි මධ්‍යගත පිහිටීමද සැලකිල්ලට ගෙන වඩාත් පුළුල් සේවා මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවාහනය මුල්කරගත් නව සංවර්ධනයක් ඇති කිරීම මෙම උපාය මාර්ගයෙන් අදහස් කෙරේ.

- ❖ ගැට්ටුවාන සිට නගර මධ්‍ය දක්වා නුවර මාර්ගය මංතිරු 06 දක්වා සංවර්ධනය කිරීම. (ප්‍රවාහන ද්වාරය)

මධ්‍යම අධිවේගී අන්තර් හුවමාරුව හා ප්‍රධාන බස්නැවතුම්පල අතර, කි.මී 01ක පමණ දුරක් පවතී. අධිවේගී මාර්ගය තුලින් වාහන ඇතුල් කිරීම පිටකිරීමත් සමඟ ඒ10 මාර්ගයේ දැඩි වාහන තදබදයක් ඇති වේ. ඒ සඳහා අන්තර් හුවමාරුව හා නගර මධ්‍ය අතර, කාර්යක්‍ෂ ගමනාගමනයක් ඇති කිරීම සඳහා එම මාර්ගය

මංතිරු 06ක මාර්ගයක් ලෙස පුළුල් කිරිම අත්‍යාවශ්‍ය වේ. වර්තමාන නගරය හා ගැට්ටුවාන ආශ්‍රිතව ඇතිවන ප්‍රධානම ප්‍රවේශය වන බැවින් ඉතා විශාල සේවා මට්ටමක් මෙම මාර්ගය තුලින් ලබා දිය යුතුය.

## උපාය මාර්ග 03

**ප්‍රාදේශීය අභ්‍යන්තර මාර්ග පුළුල් කිරිම.**

නගරයේ අභන්තර ප්‍රදේශවල පටුමාර්ග, භෞතිකව සංවර්ධනය නොවූ මාර්ග, එකිනෙක සම්බන්ධ නොවූ මාර්ග පුළුල් කර සංවර්ධනය කිරිම තුළින් එම මාර්ග අතර ඇතිවන ගමන් වර ගණන ඉහල දැමිය හැකිය. ඒ තුලින් මාර්ග දෙපස සිදුවන සංවර්ධනය අභ්‍යන්තර ප්‍රදේශවලට ව්‍යාප්ත කර නාගරික ප්‍රදේශය පුළුල් කිරීම මෙම උපාය මාර්ගයේ අරමුණයි (සිතියම් අංක 6.7). රැකියා කරන ජනතාවට නගර මධ්‍යයෙන් පරිභාහිරව නේවාසික ඉඩම් වලට මනා ප්‍රවෙශකත්වයක් ඇති කිරීම තුලින් නේවාසික ජනගහනය ඉහල නැංවිය හැකිය. ඒ අනුව පහත දැක්වෙන මාර්ග පද්දතිය වඩා කාර්යක්ෂම මාර්ග ජාලයක් ලෙස පුළුල් විය යුතුය. පළල් විය යුතු ප්‍රමාණයන් ව්‍යපෘති විසතරයන්හි සදහන් වේ.

i. කවුඩාවත්ත - අලකොළදෙණිය මාර්ගය
ii. විල්ගොඩ වත්ත මාර්ගය
iii. සුමංගල මාවත
iv. හෙරලියාවල පාර
v. බණ්ඩාරනායක මාවත
vi. පුබුදු මාවත
vii. මල්කඩුවාව වටරවුම් මාර්ගය
viii. කවුඩවත්ත මාවත
ix. ජයන්තිපුර - විල්බාව මර්ගය
x. සර්වෝදය මාවත
xi. සුමනදාස මාවත
xii. හේනමුල්ල පාර
xiii. අලකොලදෙනිය පාර
xiv. වැවරවුම් පාර
xv. සුන්දරාපොල පාර
xvi. කුඩා ගල්ගමුව පාර

## උපාය මාර්ග 04

මාර්ග සංවර්ධන අධිකාරි මාර්ග පුළුල් කිරීම් - (මංතීරු 04 දක්වා)

කුරුණෑගල නගරය ජාතික වශයෙන් මංසන්දියක් ලෙස ක්‍රියාකරන අතර, එවැනි නගරයක මාර්ග පද්දතිය මනා ලෙස පුළුල් වී තිබිය යුතුය. වර්තමානය වන විට මාර්ගවල නිර්මාණය කරන ලද වාහන ධාරිතාවය (Design Capacity) ඉක්මවා යාම නිසා මාර්ග වල සේවා මට්ටම ඉක්මවා යමින් පවතී (Exceed the level of service ). එබැවින් මහා මාර්ග, අවශ්‍යතාවය අනුව පුළුල් කළ යුතුය.

A6 අඹේපුස්ස- කුරුණෑගල ත්‍රිකුණාමල මාර්ගය

- රෙග්ලන්ඩ් වත්ත සිට වැහැර දක්වා
- පොල්අත්තාපිටිය සිට බඩගමුව දක්වා

A10 කටුගස්තොට - පුත්තලම් මාර්ගය

- මල්ලවපිටිය හන්දියේ සිට තිත්තවැල්ල දක්වා

B247 කුරුණෑගල - මීගමුව මාර්ගය

- කුරුණෑගල සිට ගෙපල්ලව දක්වා

B 084 අභ්‍යන්තර වට රවුම් මාර්ගය

- යන්තම්පලාව සිට පුවක්ගස් හන්දිය- කඳුරුගස් හන්දිය හරහා ගැට්ටුවාන දක්වා

## උපාය මාර්ග 05

**මුත්තෙට්ටුගල ගුවන් පාලම ඉදිකිරිම.**

දුම්රිය මාර්ගය , අඹේපුස්ස ත්‍රිකුණාමලය මාර්ගය (A006) හරහා මුත්තෙට්ටුගල ප්‍රදේශයේදී ගමන් කිරීම නිසා දිනකට මෙම දුම්රිය හරස් මාර්ගය හැට වරක් පමණ වැසිමට සිදුවීම මත මෙම මාර්ගයේ සුමට ප්‍රවාහනය සඳහා බාධාවක් වී ඇත. එමෙන්ම අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරුව සංවර්ධනයත් සමඟ ගැට්ටුවාන මුත්තෙට්ටුගල ප්‍රදේශයේ සංවර්ධන නැම්යාව ඉහළ යනු ලබයි. තවද මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යයනයන් මඟින් 2020 වර්ෂය වන විට මෙම මාර්ගයේ වාහන ධාරිතාවය ඉහළ ගොස් උග්‍ර වාහන තදබදයක් ඇති වන මට්ටමට පත්වන බව පැහැදිලිවී ඇත. ඒ අනුව එම ගැටළුව විසඳීම සඳහා මුත්තේට්ටුගල දුම්රිය හරස්මාර්ගය හරහා ගුවන් පාලම ඉදිකල යුතු ය.

## උපාය මාර්ග 06

- වාහන නැවතුම් ස්ථාන ලබාදීම.


අධි ඝනත්ව වාණිජ සංවර්ධනයට අවශ්‍ය වාහන නැවතුම් ස්ථාන ලබාදීම තුලින් නගර මධ්‍යයේ මාර්ග දෙපස වාහන නවතා තැබීම නිසා ඇතිවන මාර්ග තදබදය අවම කර කාර්යක්ෂම නගරයක් බවට පත් කිරීම.

- නගරය තුලට ඇදී එන පුද්ගලික බස් රථ ගාල් කිරීම සඳහාත් පොදු රථ නැවතුම් සඳහාත් වෙන් වෙන් වශයෙන් වාහන නැවතුම් ස්ථාන හඳුනාගෙන ඇත . (සිතියම් අංක 6.8 )

## පෞද්ගලික රථ නැවතුම් සඳහා යෝජිත ස්ථාන

01. නගර මධ්‍යය වාහන නැවතුම් සංකීර්ණය
02. මධ්‍යයම පොදු වෙළඳපොල
03. බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය ආශ්‍රිත නැවතුම් ස්ථාන
04. උඩවල්පොල
05. කදුරුගස්හන්දිය
06. නාවින්න රෝහල ඉදිරිපිට
07. මහා රෝහල ඉදිරිපිට
08. පුවක්ගස්හන්දිය ප්‍රා.ලේ.කා ඉදිරිපිට (ඇත්කඳ විහාරය සතු ඉඩම)
09. චතුරස්‍ර මාවත යෝජිත වාහන වතුම්පල
10. දකුණු ඩිපෝවට අයත් ඉඩම ( නුවර පාර )
11. යන්තම්පලාව ඉඩම
12. කොළඹ පාරේ මලියදේව බාලිකාව ඉදිරිපිට පුරන් වූ කුඹුර

*සිතියම් අංක 6.8 රථ නැවතුම් සඳහා යෝජිත ස්ථාන*



## ප්‍රවාහන සැලැස්මේ අපේක්ෂිත අරමුණු

ප්‍රවේශකත්වයේ ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මක භාවය අනාගත සංවර්ධනයේ ප්‍රධානම විභවතාවයයි.. ප්‍රවේශකත්වයේ ගුණාත්මක භාවය සංවර්ධනයේ සීග්‍රතාවය ඇති කරයි. ජාතික භෞතික සැලැස්ම මගින් යෝජිත බස්නාහිර - නැගෙනහිර සංවර්ධන ද්වාරයෙහි පිහිටි ප්‍රධාන නාගරික මධ්‍යස්ථානය ලෙස කුරුණෑගල නගරය හඳුනාගෙන ඇත. අනාගත සංවර්ධනයට සාපේක්ෂව ප්‍රවාහන පහසුකම් ප්‍රවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය සාධකයකි.

2020 වර්ෂයේ විවෘත කිරීමට අපේක්ෂිත මධ්‍යම අධිවේගී මාර්ගය හා එහි අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 02ක් කුරුණෑගල නගරය ආසන්නයේ ස්ථානගත වීම මගින් සංසරණය වන රථවාහන සඳහා පහසු ප්‍රවේශකත්වය ලබාදීම ගමනාගමන සැලැස්මේ ප්‍රධාන අරමුණකි.

ගැටිටුවාන අන්තර් හුවමාරු මධ්‍යස්ථානය මූලික කරගනිමින් යෝජිත ගමනාගමනය මුල්කරගත් සංවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත වීමත් සමඟ වර්තමාන නගරයේ ව්‍යුහය මෙන්ම ආර්ථිකමය වශයෙන් ප්‍රවර්ධනය සිදුවන බවට අපේක්ෂා කෙරේ. එමගින් සැලැස්මේ දැක්ම වන ඇතුගල වටකොට නැගෙන වයඹ මහා නගරය කරා ලගාවීමට මෙම සැලැස්ම ඉවහල් වනු ඇත.

යෝජිත විකල්ප මාර්ග පද්ධතිය නිසා නාගරික බල ප්‍රදේශය අවට ඌන සංවර්ධනයක් පවතින ප්‍රදේශ සීග්‍ර සංවර්ධනයක් කරා මෙහෙය වීමේ හැකියාව ලැබේ. මෙම විකල්ප මාර්ග පද්ධතිය නගරයේ ආර්ථික ප්‍රවර්ධනයට මෙන්ම නේවාසික සංවර්ධනයටද ඵලදායි ව්‍යාපෘතියක් බවට හඳුනාගත හැකිය. එසේම නගරයේ පිහිටි වට රවුම් මාර්ගය හා නගරාසන්න ප්‍රධාන අභ්‍යන්තර මාර්ග පද්ධතිය පුළුල් කිරීම මගින් එම ප්‍රදේශවල ඉඩම් භාවිතය වෙනස් කරමින් වාණිජමය වටිනාකමක් ලබා දීමේ හැකියාවද ලබාගත හැකිය.


මහනුවර ප්‍රධාන මාර්ගය ගැටිටුවානේ සිට නගර මධ්‍ය දක්වා මංතීරු 06කින් සංවර්ධනය කිරීම මගින් (Transit Corridor ) ගැටිටුවාන හා නගර මධ්‍ය අතර අන්තර් සම්බන්ධතාවය ඇති කර එමගින් නගරයට ආර්ථිකමය ප්‍රතිලාභ ලබා දීමට හැකියාව ලැබේ. තවද ගැටිටුවාන මුත්තෙට්ටුගල ප්‍රදේශයේ ඇති වන සංවර්ධනයත් සමඟ මුත්තෙට්ටුගල දුම්රිය හරස් මාර්ගය හේතුවෙන් ඇති වන වාහන තදබදය තව දුරටත් ආර්ථික සංවර්ධනයට බාධාවක් වන බැවින්, මුත්තෙට්ටුගල ගුවන් පාලම ඉදිකිරීමට යෝජනා කෙරේ.

ප්‍රවාහන සැලැස්මේ ඉහත සියලු ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වීමත් සමඟ නගරයේ කාර්ය බහුල අවස්ථාවලදී නගරය පසුකර ගමන් කිරීම සඳහා ගතවන කාලය විනාඩි 45 සිට විනාඩි 15 දක්වා අවම කිරීම යන පරමාර්ථය සඳහා ලගාවිය හැක.

මෙම අධිවේගී මාර්ගයේ සහ බාහිර විකල්ප මාර්ගය සංවර්ධනයත් සමඟ ලංකාවේ උතුරු කලාපයේ භාණ්ඩ බෙදාහැරීමේ මධ්‍යස්ථානය ලෙසත්, තෘතික අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙසත් හා ඉහළ ප්‍රවේශකත්වය හේතුවෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීමේ හා නිෂ්පාදන බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය ඉහළ යාම තුලින් කර්මාන්තපුරය පුළුල් කර සංවර්ධනය කිරීමේ හැකියාව ලැබේ. එමගින් ආර්ථික විවිධාංගිකරණය තුලින් ආර්ථික කොරිඩෝවෙහි ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානය බවට පත්කළ හැක.

නගරය තුල වර්තමාන ක්‍රියාකාරකම් වල සංකලනය වීම සහ නගර සංවර්ධන සැලැස්මේ සංකල්පය තුලින් අනාගතයේ බලාපොරොත්තු වන නගර ආකෘතිය ලඟාකර ගැනීමට වඩාත් සුදුසු මාර්ග පද්ධතිය විකල්ප මාර්ග කිහිපයක් භාවිතා කර Space Syntax විග්‍රහය තුලින් විශ්ලේෂනය කරන ලදී. ඒ අනුව සාරගම සිට මල්කඩුවාව, වදුරාගල, ගැට්ටුවාන දක්වාත්, විල්බාව සිට මල්ලවපිටිය දක්වාත් මාර්ගය වඩාත් සුදුසු විකල්ප මාර්ගය ලෙස හඳුනා ගන්නා ලදී. (සිතියම් අංක 6.9 සහ 6.10)

**සිතියම් අංක 6.9 පවතින මාර්ග පද්ධතිය සඳහා කරන ලද Space Syntax විග්‍රහය**




Space Syntax විග්‍රහය තුලින් විශ්ලේෂණය කරන ලද වර්තමාන මාර්ග පද්ධතිය තුල ක්‍රියාකාරකම් වල ස්වභාවය

**සිතියම් අංක 6.10 යෝජිත මාර්ග පද්ධතිය සඳහා කරන ලද Space Syntax විග්‍රහය**




Space Syntax විග්‍රහය තුලින් සාරගම සිට මල්කඩුවාව, වදුරාගල, ගැට්ටුවාන දක්වාත්, විල්බාව සිට මල්ලවපිටිය දක්වාත් යන විකල්ප මාර්ග සමග විශ්ලේෂණය කරන ලද මාර්ග පද්ධතිය තුල ක්‍රියාකාරකම් වල ස්වභාවය


2020 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත අධිවේගී මාර්ගය හා විකල්ප මාර්ගය ක්‍රියාත්මක වීමත් සමඟ 2020 වර්ෂයේ හා 2030 වර්ෂයේ මාර්ගවල වාහන ධාරිතාවය ඉහල යාම පහත පරිදි හඳුනාගෙන ඇත. ඒ අනුව රතු වර්ණයෙන් පහතින් දැක්වෙන මාර්ගවල වාහන තදබදය ඇති වන බව පැහැදිලි වේ. ඒ අනුව මෙම මාර්ග පුළුල් කර වාහන ධාරිතාවය ඉහළ නැංවීම තුලින් අධිවේගී මාර්ග සංවර්ධනයත් සමඟ ඇති වන වාහන තදබදය වලක්වා එමඟින් ඇතිවන ඉහළ ප්‍රවේශකත්වය සංවර්ධනය කරා යොමු කරගත හැක. (සිතියම් අංක 6.11 සහ 6.12)

- A006 අඹේපුස්ස-කුරුණෑගල මාර්ගය - දංබොක්ක සිට කඳුරුගස්හන්දිය දක්වා, මුත්තෙට්ටුගල සිට ප්‍රාදේශීය සභා සීමාව දක්වා


- A010 කටුගස්තොට - පුත්තලම මාර්ගය- ගැට්ටුවාන මංසන්ධියේ සිට මල්ලවපිටිය මංසන්ධිය දක්වා යන්තම්පලාව හන්දියේ සිට තිත්තවැල්ල දක්වා

- B 264 මල්ලවපිටිය - කැප්පිටිගල මාර්ගය -මල්ලවපිටිය සිට උයන්දන දක්වා

**සිතියම් අංක 6.11 අධිවේගී මාර්ගය හා විකල්ප මාර්ගය ක්‍රියාත්මක වීමත් සමඟ 2020 වර්ෂයේ මාර්ගවල වාහන ධාරිතාවය**



**සිතියම් අංක 6.12 අධිවේගී මාර්ගය හා විකල්ප මාර්ගය ක්‍රියාත්මක විමත් සමඟ 2030 වර්ෂයේ මාර්ගවල වාහන ධාරිතාවය**



## 6.3.3 ජල සැපයුම් සැලැස්ම

### හැඳින්වීම

2030 වර්ෂය වන විට 250,000ක් පමණ වූ නේවාසික ජනගහනයටත්, අධ්‍යාපන, සෞඛ්‍ය , වාණිජ හා පරිපාලන යන සේවා අවශ්‍යතා සඳහා පැමිණෙන ලක්ෂ 05ක් පමණ වූ දෛනික සංසරණ ජනගහනයටත් සහ ආර්ථික සංවර්ධන සැලැස්ම සමඟ ස්ථාපිත කරනු ලබන උපාය මාර්ගික ව්‍යාපෘති සඳහා නල ජල සැපයුම ලබාදීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් 2030 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති අධ්‍යයනයෙන් පසු මෙම ප්‍රදේශය සඳහා නල ජල පහසුකම ලබාදීමට අත්‍යාවශ්‍ය ව්‍යාපෘති මෙම සැලැස්ම මගින් ඉදිරිපත් කර ඇත.

### දෛනික ජල සැපයුම් අවශ්‍යතාවය - 2030

*වගු අංකය 6.8 2030 වර්ෂය සඳහා දෛනික ජල අවශ්‍යතාවය*

| කලාපය | නේවාසික ජනගහනය | නේවාසික ජල අවශ්‍යතාවය (ඝන මීටර්) | වාණිජ ජල අවශ්‍යතාවය (ඝන මීටර්) | ආයතන ජල අවශ්‍යතාවය (ඝන මීටර්) | කර්මාන්ත ජල අවශ්‍යතාවය (ඝන මීටර්) | විශේෂ ව්‍යාපෘති සඳහා ජල අවශ්‍යතාවය (ඝන මීටර්) | මුළු ජල අවශ්‍යතාවය (ඝන මීටර්) |
|---|---|---|---|---|---|---|---|
| අධි නාගරික කලාපය | 42275 | 5073 | 50%-1522 | 30%-2537 | 20%-1015 | 5000 | 15147 |
| අර්ධ නාගරික කලාපය | 76653 | 9198 | 20%-1840 | 10%-920 | 10%-920 | 1000 | 13878 |
| පර්යන්ත නාගරික කලාපය | 8719 | 1046 | 25%-261 | 10%105 | 10%-105 | - | 1517 |
| අඩු නාගරික කලාපය | 86445 | 10373 | 5%-518 | 5%-518 | 5%-518 | - | 11927 |
| අඩු ඝනත්ව බාහිර කලාප | 33336 | 3334 | 5%-167 | - | - | - | 3501 |
| මුළු සැලසුම් බල ප්‍රදේශය | | | | | | | **45970** |

❖ **උපකල්පනය :** ඉහළ ජනගහන ඝනත්වය සහිත වර්ග කිලෝමීටර් 01ට පුද්ගලයින් 1500 වැඩි ප්‍රදේශ සඳහා එක් පුද්ගලයෙකුට ලීටර් 120ක් සහ ජන ඝනත්වය අඩු වර්ග කිලෝමීටර් 01ට පුද්ගලයින් 1500ට අඩු ප්‍රදේශ සඳහා පුද්ගලයෙකුට ලීටර් 100ක් ලෙස උපකල්පනය කරන ලදී. නගර සංවර්ධන සැලැස්මේ යෝජිත විශේෂ ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුගත නලජල අවශ්‍යතාවය ඇස්තමේන්තුවට ඇතුළත් කර ඇත

ඉහත ජල අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම සඳහා ජල සම්පාදන හා ජලාපවහනය මණ්ඩලය මගින් පහත ව්‍යාපෘතීන් 2030 වර්ෂය වන විට ක්‍රියාත්මක කිරීමට යෝජිතය. මෙම ව්‍යාපෘති මගින් මුළු සැලසුම් බල ප්‍රදේශයම ආවරණය වන ආකාරය පහත පරිදි වේ. (වගු අංක 6.9 හා සිතියම් අංක 6.14 )

*වගු අංකය 6.9 2030 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ජල සම්පාදන ව්‍යාපෘති*

| යෝජනා ක්‍රමය | 2030 වර්ෂයට සැපයුම ඝ.මී | ආවරණය වන ප්‍රදේශ |
|---|---|---|
| අලව්ව , පොල්ගහවෙල ජල යෝජනා ක්‍රමය | 4639 | කුරුණෑගල ග්‍රාම නිලධාරි වසම් 10, මල්ලවපිටිය ග්‍රාම නිලධාරි වසම් 16 |
| වදුරුපීනු ඇල්ල ජල යෝජනා ක්‍රමය | 5024 | කුරුණෑගල ග්‍රාම නිලධාරි වසම් 16 මල්ලවපිටිය ග්‍රාම නිලධාරි වසම් 21 |
| කටුපොත, බමුණාකොටුව ජල යෝජනා ක්‍රමය | 4500 | මාස්පොත ග්‍රාම නිලධාරි වසම් 30, |
| විසල් කුරුණෑගල ජල යෝජනා ක්‍රමය (දැනටමත් ක්‍රියාත්මක ව්‍යාපෘතියකි.) | 14000 | කුරුණෑගල ග්‍රාම නිලධාරි වසම් 26 මල්ලවපිටිය ග්‍රාම නිලධාරි වසම් 10 මාස්පොත ග්‍රාම නිලධාරි වසම් 04 |
| මුළු එකතුව | **28163** | |

කුරුණෑගල සැලසුම් බල ප්‍රදේශයේ 2030 වර්ෂය සඳහා ජල අවශ්‍යතාව ඝන මීටර් 45970ක් වන අතර, ජල සම්පාදන මණ්ඩලය 2030 වර්ෂය වන විට ඝන මීටර් 28163ක් සැපයීමට අපේක්ෂා කරයි. ඒ අනුව ඝන මීටර් 17807ක ජල හිඟයක් පවතින අතර, යෝජිත වදුරු පිනුඇල්ල ජල ව්‍යාපෘතිය මගින් ජල සැපයුම් ධාරිතාවය තවදුරටත් ඉහළ නැංවීමේ හැකියාව පවතින බැවින්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බව මෙම සැලැස්ම මගින් නිර්දේශ කරයි.

ඒ අනුව 2030 වර්ෂය වන විට ඉහත ව්‍යාපෘතීන් ක්‍රියාත්මකවීම අත්‍යාවශ්‍ය වන අතර දැදුරු ඔය කාලීන ජල මූලාශ්‍රයක් බැවින්, වැසි අධික කාලයට ජලය රඳවා තබා ගැනීම සඳහා බරන්දන ප්‍රදේශයේ යෝජිත ජල රැඳවුම් තටාකය, රැස්කුරු ජලාශය සහ වදුරුපීනුඇල්ල ජලාශ ඉදිකිරීම අත්‍යාවශ්‍ය වේ.

## යෝජිත ජල සැපයුම් උපාය මාර්ග

### උපාය මාර්ග 01


විසල් කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ දැදුරු ඔයේ ජලය රැස්කිරීම සඳහා බරන්දන රැස්කුරු ජලාශය ඉදිකර ජල සැපයුම් ධාරිතාවය ඉහළ නැංවීම.

### උපාය මාර්ග 02

වඳුරුපීනු ඇල්ල ජලාශය ඉදිකිරීම - මෙම යෝජනා ක්‍රමය මගින් කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් 50%ක් පමණ ආවරණය වන අතර, ඉහල ජල ධාරිතාවයක් රැස්කර ගතහැකි ව්‍යාපෘතියක් බැවින්, 2030 වර්ෂය සඳහා නලජල සැපයුම ලබාදීමට මෙම ජලාශය ඉදිකර ජල සැපයුම් ප්‍රදේශය පුළුල් කිරිම අත්‍යාවශ්‍ය කරුණකි.

## යෝජිත ජල සැපයුම් ව්‍යාපෘති

**සිතියම් අංක 6.13 - 2030 වර්ෂය සඳහා යෝජිත ජල සැපයුම් ව්‍යාපෘති**





යෝජිත ජල සැපයුම් ව්‍යාපෘති කලාප (2030) - කුරුණෑගල ප්‍රා.ස.

වයඹ පළාත
නාගරික සංවර්ධන අධිකාරිය
2018

ව . ප - සැළසුම් අංශය | කුරුණෑගල සංවර්ධන සැලැස්ම ( 2018-2030 ) | සකස් කළේ : එන්.පී.ජී . කුමාරි

**සිතියම් අංක 6.14- විසල් කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් ආවරණය වන ප්‍රදේශය**




| | |
|---|---|
| විසල් කුරුණෑගල ජාල සැපයුම් කලාපය | වයඹ පළාත<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>2018 |

ව . ප - සැළසුම් අංශය | කුරුණෑගල සංවර්ධන සැලැස්ම ( 2018-2030 ) | සකස් කළේ : ටී .එම් .පී .කේ . ඒකනායක

## 6.3.4 ජලාපවහන සැලැස්ම

### හැඳින්වීම.


කුරුණෑගල නගරය තුළ ස්වභාවික ජලාපවහන රටාවක් පැවතුනද, ස්වභාවික ජලාපවහන රටාවෙහි ස්වභාවික ක්‍රියාකාරකම් (පාංශු ඛාදනය හා කැලැ කැපීම) මෙන්ම කුඹුරු, වගුරු ගොඩකිරීම වැනි විනාශකාරී මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ජලාපවහන රටාවට සිදුව ඇති බාධාවන් අවම කර ගැනීම සඳහා මෙම සැලැස්ම හඳුන්වා දී ඇත.

කුරුණෑගල නගරයෙහි සහ අවට ප්‍රදේශයේ වැසි ජලය හා අප ජලය බැහැර වන්නේ හූ ඇළ සහ වාන් ඇළ යන ප්‍රධාන ඇළ මාර්ග සඳහා සම්බන්ධිත අභ්‍යන්තර කාණු පද්ධතිය මඟිනි. එමෙන්ම මෙම ඇළ මාර්ග මඟින් ගෙන යනු ලබන ජලය විල්ගොඩ සොරොව්වෙහි රඳවන අතර, ඉන් පහල කොටසේ අක්කර 230 ක පමණ කුඹුරු අස්වද්දනු ලැබේ. එමෙන්ම ඇතුගල , ආඳාගල, ඉබ්බාගල, එළුගල , ඉඳුල්ගොඩ කන්ද වැනි ජල පෝෂක කලාපයෙන් ගලාබස්නා ජලය වෙන්ඩරු වැව, ටැංපාන ජලාශය, කුරුණෑගල වැව වැනි ජල රැඳවුම් මධ්‍යස්ථාන වල රැඳෙන අතර, අතිරේක ජලය පහලට ගලා බසී. එම ගලාබසින ජලය නගරයේ පිහිටි කුඹුරු යාය මැදින් ගලාබස්නා අතර, මෙමගින් නගරයේ සංවර්ධනයට බාධාවක් වී නොමැත.

අධික වර්ෂාපතන අවස්ථාවලදී වාන් ඇළ හා හූ ඇළ සම්බන්ධ වන විල්ගොඩ ප්‍රදේශයේදී ඇළ මාර්ගවල පටුබව හා අවිධිමත් පිහිටීම වැනි හේතූන් මත ජලය ගලායාමේ සීඝ්‍රතාවය අඩුවීම හේතුවෙන් එම ප්‍රදේශවාසීන් තාවකාලිකව ගංවතුර ආපදාවට ලක්වේ. තවද, ජනතාව විසින් සිදුකරන අවිධිමත් සංවර්ධනයන් හේතුවෙන් ජලාපවහනය සඳහා පවතින කාණු පද්ධතය අවහිරවීම නිසා අධික වර්ෂාපතන කාලවලදී ප්‍රාදේශීය සභා සීමාව තුළ මල්ලවපිටිය , තෙලියගොන්න ආදි ප්‍රදේශ තාවකාලික ගංවතුර ආපදාවට ලක්වේ. එමෙන්ම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය වෙඩරු වැවෙහි පිටාර ජලය පහලට ගලා බස්නා පහත් බිම් හරහා ඉදිවන බැවින්, අනාගතයේදී නගරයට ජල ගැලීම්වලට මුහුණදීමට සිදුවිය හැක. ඒ නිසා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරිමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් සකස් කරන ලද විධිමත් ජලාපවහන සැලැස්මක අවශ්‍යතාවය මෙම සැලැස්ම මඟින් යෝජනා කර ඇත. තවද අනවසර කුඹුරු ගොඩකිරීම් හා මාර්ග හරහා පවතින බෝක්කු ප්‍රමාණවත් නොවීම මත අධික වර්ෂාපතන අවස්ථාවලදී මාර්ග යටවීම දැකිය හැක.


1996 දී වර්ෂයේදී සංවර්ධනය කරන ලද හූ ඇළ, වාන් ඇළ වැනි ඇළ මාර්ග පද්ධතිය මේ වන විට ඉවුරු ඛාදනය නිසා ගොඩවී ස්වභාවික ජල බස්නාවට බාධාවක් වී ඇත. එමෙන්ම ඇළ මාර්ග දෙපස සේවා මාර්ග නිසි නඩත්තුවක් නොකිරීම නිසා ඇළ මාර්ග පවිත්‍ර කිරීමට අපහසුවී ඇත. එමෙන්ම විල්ගොඩ අමුණ ද නිසි ප්‍රතිසංස්කරණයකට භාජනය නොකිරීම නිසා මේ වන විට අබලන් තත්ත්වයේ පවතී. එමෙන්ම එහි දොරටුව කැඩී බිඳී ගොස් ඇති අතර, එමගින් ජලය ලබාගෙන අස්වද්දන කුඹුරු අක්කර 230 අස්වැද්දීමට නොහැකි වී ඇත

**සිතියම් අංක 6.15 - ස්වභාවික ජලාපවහන රටාව කුරුණෑගල**




*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - වයඹ පළාත් කාර්යාලය*

**සිතියම් අංක 6.16 - කුරුණෑගල නගරය තුළ ජලාපවහන රටාව**




*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - වයඹ පළාත් කාර්යාලය*

## යෝජිත ජලාපවහන උපායමාර්ග

### ප්‍රධාන උපාය මාර්ගය

1. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් හෝ ජලාපවහනය සම්බන්ධ විශේෂඥ වෘත්තිකයන් ලවා ජලාපවහන සැලැස්මක් සකස් කර බලාත්මක කිරීම.
2. එයට අමතරව ස්වභාවික ජලාපවාහන රටාව ආරක්ෂා කිරීම සඳහා පහත උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමයෝජනා කෙරේ.
3. වාන් ඇළ හා භූ ඇළ එකිනෙකට සම්බන්ධ වන විල්ගොඩ ප්‍රදේශයේදී ජලය නිසියාකාරව බැස යා හැකි පරිදි ඇළ පළල් කර දඟරාකාර බව අවම කර ඇළ මාර්ගය සකස් කිරීම.
4. විල්ගොඩ සොරොව්ව වැසි අධික අවස්ථාවලදී විවෘත කළ හැකි පරිදි ගේට්ටු දමා සකස් කිරීම.
5. ජල රැඳවුම් ලෙස ක්‍රියාකරන කුඹුරු හා වගුරු ගොඩකිරීම් වැලැක්වීම.
6. ඇළ මාර්ග සඳහා පවතින සේවා මාර්ග නිසි පරිදි නඩත්තු කරමින් ඇළ මාර්ග ආරක්ෂා කිරීම.

**සිතියම් අංක 6.18 යෝජිත ජලාපවහන ව්‍යාපෘති**



## 6.3.5 අප ජලය බැහැර කිරීම් සැලැස්ම

### හැඳින්වීම

කුරුණෑගල නගරය දිදුලන ආර්ථික මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ අරමුණ කරා ලඟාවීම සඳහා අධි ඝණත්ව වාණිජ ප්‍රදේශ , නේවාසික ප්‍රදේශ සංවර්ධනය කිරීමට යෝජිත වේ. ඒ අනුව අධි ඝනත්ව සංවර්ධන ප්‍රදේශ සඳහා අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ අනුව කුරුණෑගල සැලසුම් බල ප්‍රදේශයේ අධි නාගරික කලාපය සහ අර්ධ නාගරික කලාපය ආවරණය වන පරිදි අප ජල බැහැර කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම සැලැස්ම හඳුන්වා දී ඇත.

*වගු අංක 6.10 අප ජලය බැහැර කිරීමේ අවශ්‍යතාවය - 2030*

| ප්‍රදේශය | අප ජලය ඝන මීටර් |
|---|---|
| **අධි නාගරික කලාපය (මුළු ජල පරිභෝජනයෙන් 80%)** | 12118 |
| **අර්ධ නාගරික කලාපය (මුළු ජල පරිභෝජනයෙන් 80%)** | 11102 |
| **මුළු අවශ්‍යතාවය** | **23220** |

2017 වර්ෂය වන විට ක්‍රියාත්මක විසල් කුරුණෑගල ජල සම්පාදන හා ජලාපවහන පද්ධතිය මඟින් මුළු කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි ප්‍රතිලාභීන් 43000කට අවශ්‍ය මලාපවහන හා අප ජලය බැහැර කිරීමේ පහසුකම් ලබාදෙනු ලබයි. ඒ අනුව වර්තමානයේ පිරිපහදු මධ්‍යස්ථානයේ ධාරිතාවය ඝන මීටර් 4500ක් වන අතර, ඝන මීටර් 18000 දක්වා වැඩි කිරීමේ හැකියාව පවතී.

ඒ අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් මල අපද්‍රව්‍ය පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා මල්කඩුවාව ග්‍රාම නිලධාරි වසම තුල පිහිටි අක්කර 13ක ඉඩමක් අත්පත් කර ගැනීමට දැනටමත් කටයුතු කර ඇති අතර, 2030 වර්ෂය වන විට එම ව්‍යාපෘතිය පුළුල් කිරීමේ හැකියාව පවතී. අනෙකුත් ප්‍රදේශ වල තම ඉඩම තුළම අප ජල ටැංකිය හා පූතික වල ඉදිකිරීම සඳහා ඉඩමේ ප්‍රමාණය ප්‍රමාණවත් බැවින්, ඒ සඳහා තම බිම් කට්ටිය තුළින් ධෛර්යමත් කරනු ලැබේ.

# යෝජිත අප ජලය බැහැර කිරීමේ උපායමාර්ග

## උපාය මාර්ග 01


මල්කඩුවාව ප්‍රදේශයේ අප ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම හා අධි නාගරික කලාපය, අර්ධ නාගරික කලාපය ආවරණය වන පරිදි අප ජලය රැස්කිරීමේ නල පද්ධතිය පුළුල් කිරිම.

- ප්‍රතිලාභින්
  නාගරික කලාප 01 හා 02හි පදිංකරුවන්, ව්‍යාපාරිකයින් හා සේවා ලබා ගන්නන්

- ක්‍රියාත්මක කරන ආයතනය
  ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**සිතියම් අංක 6.18 - විසල් කුරුණෑගල සනීපාරක්ෂක ව්‍යාපෘතිය මඟින් ආවරණය වන ප්‍රදේශය**

යෝජිත පරිපහදු මධ්‍යස්ථානය හෙරලියාවල (අක්කර 13)



## අප ජලය බැහැර කිරීමේ අවශ්‍යතාවය

### 6.3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

### හැඳින්වීම

මෙම සැලැස්ම තුලින් කුරුණෑගල නාගරික බල ප්‍රදේශය තුලට වසර 2030 වනවිට 50,000ක විශාල නේවාසික ජනගහනයක් ආකර්ෂණය කරගැනීමට බලාපොරොත්තු වන බැවින් සහ එයට සමාන්තරව අධි නාගරික කලාපය තුල 600,000 පමණ සංසරණ ජනගහනයක් බලාපොරොත්තු වන බැවින් එම ජනගහනට සාපේක්ෂව මනා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම වේදයක් තිබිය යුතුය.

### යෝජිත සැලසුම

කුරුණෑගල නාගරික බල ප්‍රදේශය තුළ 2030 වසර සඳහා පුරෝකතන නේවාසික ජනගහනයට අනුව ඝන අපද්‍රව්‍ය ටොන් 80 පමණද පුරෝකථන සංක්‍රමනික ජනගහනයට අනුව ටොන් 100 පමණ ද ජනනය වන අතර ජනනය වන සම්පූර්ණ ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 180 පමණ වන බව පුරෝකථනය කළ හැකිය.

කුරුණෑගල මහ නගර සභාව සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් අයිතිවන අධි නාගරික ප්‍රදේශයට දැනට ක්‍රියාත්මක වන කසල කළමනාකරණය පුළුල් කල යුතුය. ඒ සඳහා 2030 වර්ෂය වනවිට වැඩිවන නේවාසික හා සංසරණ ජනගහනයට සාපේක්ෂව ගණනය කල වැඩිවන කසල ප්‍රමාණය, නගර සභාව විසින් වඩාත් කාර්යක්ෂම හා පුළුල් සේවාවක් සපයමින් එකතුකොට සුන්දරපොල කසල කළමනාකරණ මධ්‍යස්ථානයට බාරදිය යුතුය.

ඊට අමතරව නගරයෙන් පිටත ඇති බාහිර ප්‍රදේශයේ හා පර්යන්ත නාගරික ප්‍රදේශය තුළ ජනනය වේ යැයි අපේක්ෂා කරන ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන හතරක් යෝජනා කෙරේ. ඒවා නම් මතව, මාස්පොත, තෝරයාය සහ වැල්ලව වේ. එම මධ්‍යස්ථාන වලින් එක්රැස් වන ඝන අපද්‍රව්‍ය ඒවා තුළදී ම තෝරා වෙන්කර සුන්දරාපොළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ගෙන ඒමට යෝජිතව ඇත.

කුරුණෑගල නාගරික බල ප්‍රදේශය තුළ ජනනය වන ඝන අපද්‍රව්‍ය තුලින් 64% පමණ කාබනික හෙවත් දිරාපත්වන අපද්‍රව්‍ය බැවින් කාබනික පොහොර නිෂ්පාදනය 20% පමණ වැඩි දියුණු කිරීමට යෝජිතව ඇත. ඒ සඳහා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ජපානයේ නිෂ්පාදිත කාබනික පොහොර යන්ත්‍රයක් ස්ථාපනය කරමින් පවතී.

අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතීන් ලෙස නගර මධ්‍ය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය, යෝජිත බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය, යෝජිත හෙරළියාවල කර්මාන්තපුරය පුළුල් කිරීම, යෝජිත තොරතුරු තාක්ෂණ ගම්මානය, යෝජිත කර්මාන්ත හා භාණ්ඩ ප්‍රවර්ධන මධ්‍යස්ථානය, පොදු වෙළඳපොළ

ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය, යෝජිත තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බඩගමුව ප්‍රදේශයේ තරු පහ පන්ති හෝටලයක් ලෙස සංවර්ධනය වැනි ව්‍යාපෘති හඳුනාගත හැකිය.
එම ව්‍යාපෘතීන් මඟින් ජනනය වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය, 2030 වසරේදී නේවාසික සහ සංක්‍රමණික ජනගහනයට අනුව ගණනය කරන ලද ටොන් 180 තුළ අන්තර්ගත වේ.

එසේ ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කරමින් සමස්ථ බැහැර කිරීම අවම කිරීමට ඒ සඳහා වගකිව යුතු ආයතන වන කුරුණෑගල මහ නගර සභාව, ප්‍රාදේශීය සභාව සහ ප්‍රදේශයේ ජනතාව සමඟ එක්ව සිදුකල හැකි සැලසුම් සහගත ක්‍රමෝපායන් පහත දැක්වේ.

## ක්‍රමෝපාය 01 - ඝන අපද්‍රව්‍ය ජනනය අවම කිරීම.

ගෘහස්ථ, වෙළඳ, කාර්මික, ක්ෂේත්‍රයෙහි ඝනඅපද්‍රව්‍ය උත්පාදනය අවමකිරීම, දිරිමත් කිරීම සඳහා විධික්‍රමය හඳුන්වාදීම.

I. පොදු ස්ථාන හා පාසල් තුළ දැනුවත් කිරීමේ හා අධ්‍යාපනික වැඩසටහන් සංවිධනය කර ඒ හරහා මහජනයාට කසළ කළමනාකරණය පිළිබඳ පවතින 10 වැනි සංකල්පය හඳුන්වා දී ඒ තුළින් ඝන අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම

## ක්‍රමෝපාය 02 - ඝන අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේ දීම වෙන් කිරීම.

උදා - ගෘහස්ථ, අයතනික, වෙළඳ, කාර්මික ලෙස සහ කසල වල ස්වභාවය අනුව වර්ගීකරණය කර වෙන්වෙන්ව හඳුනාගත හැකි බඳුන්තැබීම. එනම්

(අ) කාබනික - කොළපාට

(ආ) කඩදාසි - නිල්පාට

(ඇ) ප්ලාස්ටික් - තැඹිලිපාට

(ඈ) ලෝහ - දුඹුරුපාට

(ඉ) වීදුරු - රතුපාට

I. පළාත් පාලන ආයතන මඟින් නිවාස හා වෙළඳ ආයතනය සඳහා කසල කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ජෛව හායනය වන ඝන අපද්රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර නොකිරීම.
- අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩසටහන් නිරතුරුව සංවිධානය කිරීම සහ එමඟින් වෙන් නොකරන කසල එකතු නොකිරීමේ ක්‍රමවේදය (No Separation – No Collection) පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ ඒ අනුව ක්‍රියාත්මක වීම.

**ක්‍රමෝපාය 03 - කෙටි කාලීන ජෛව හායනය වන සියලුම ඝන අපද්‍රව්‍ය කාබනික පොහොර (කොම්පෝස්ට් ) බවට පත් කිරීම ප්‍රවර්ධනය කිරීම. ජනතාව ඒ සඳහා යොමු කිරීම සහ කාබනික පොහොර සඳහා ලාබදායි වෙළඳපොළවල් හඳුන්වා දීම.**

- නිවාස හා ආයතන වල ජනනය වන ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය ඒවා ජනනය වන ස්ථානයේදීම කාබනික පොහොර බවට පත් කිරීම.

  උදා - කොම්පෝස්ට් බඳුන්, වළ ක්‍රමය, ජීවකොටු ආදී ක්‍රම හඳුන්වාදීම.

- විශාල ප්‍රමාණයෙන් ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය උත්පාදනය වන ස්ථාන

  උදා - හෝටල්, රෝහල් ආදී ස්ථාන සහ කොම්පෝස්ට් කිරීම සිදු නොකරන නිවාස ආදිය සඳහා පළාත් පාලන ආයතන මඟින් පාලනය වන ස්ථානයක සරල තාක්ෂණික ක්‍රම භාවිතයෙන් කොම්පෝස්ට් නිපදවීම

- සෑම නිවසකම කොම්පොස්ට් බඳුනක් භාවිතා කිරීම හෝ පහසු තාක්ෂණයක් භාවිතය මඟින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා දිරි ගැන්වීම සහ එමඟින් ගෘහස්ථ කාබනික එලවළු, පළතුරු වගාව වැඩි කිරීම සහ කාබනික එළවළු වෙළඳපොළ දිරිමත් කිරීම.

**ක්‍රමෝපාය 04 - රෝහල් සහ රජයේ ආයතන තුළ ජීව වායු නිෂ්පාදනයක් ස්ථාපනය කිරීම.**

- ජෛව හායනය වන ආහාරමය අපද්‍රව්‍ය කෘෂි කාර්මික අපද්‍රව්‍ය ජීවවායු නිෂ්පාදනය කිරීම සඳහා යොදාගත හැකි අතර නිෂ්පාදනය වන ජීව වායුව ආහාර පිසීම ආලෝකකරණය වැනි දේ සඳහා යොදා ගැනීම.

**ක්‍රමෝපාය 05 - ජෛව හායනය වන ආහාරමය අපද්‍රව්‍ය ඌරු කොටු වලට ලබාදීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම**

**ක්‍රමෝපාය 06 - ජෛව හායනය නොවන (ප්‍රතිචක්‍රීකරණය කල හැකි )ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම.**

- සෑම මට්ටමකම ජනතාව තුල භාණ්ඩ නැවත භාවිතය (reuse)වැනි සංකල්ප ප්‍රවර්ධනය සඳහා ආකල්පමය වෙනසක් කිරීමේ වැඩ මුළු සංවිධානය කිරීම. (පාසල් සහ ආයතනික මට්ටමින්)
- ප්‍රතිචක්‍රීකරණය කල හැකි ඝන අපද්‍රව්‍ය (වීදුරු, කඩදාසි, ලෝහ) මිලදී ගනු ලබන ස්ථාන පිහිටුවීම, ප්‍රචලිත කිරීම සහ දිරි ගැන්වීම, වෙළඳපොළ සහ ව්‍යවසායකයින් වර්ධනය කිරීම.
- පළාත් පාලන ආයතන මඟින් ප්‍රතිචක්‍රීකරණය කල හැකි ඝන අපද්‍රව්‍ය මිලදී ගනු ලබන ගැනුම් කරුවන් ලියාපදිංචි කිරීම, ඔවුන් සමඟ නිරතුරු සම්බන්ධතා පවත්වා ගැනීම සහ ඒ පිළිබඳව තොරතුරු ජනතාව වෙත ලබාදීම.

- එකතු වන කසල අතර ඇති පොල්කටු, යකඩ, ප්ලාස්ටික්, විදුලි උපකරණ වැනි දේ සඳහා කසල පොළ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

## ක්‍රමෝපාය 07 - නාගරික ඝන අපද්‍රව්‍ය වෙත රෝහල් මගින් නිකුත් කරන සායනික ඝන අපද්‍රව්‍ය එකතුවීම වැලැක්වීම සඳහා ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කිරීම.

- සායනික ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම අනිවාර්ය කිරීම.
- සායනික ඝන අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීමට පෙර ඒවා ආසාදනය නොවන ද්‍රව්‍ය බවට පත් කිරීම අනිවාර්ය කිරීම.
- සායනික ඝන අපද්‍රව්‍ය සෞඛ්‍යාරක්ෂිත ව බැහැර කිරීම සඳහා රෝහල් තුලම ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

## ක්‍රමෝපාය 08 - ඝන අපද්‍රව්‍ය එකතු කිරීම සහ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම.

- දොරින් දොර එකතු කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- ඝන අපද්‍රව්‍ය එකතු කරන දින සහ එම දිනවල එකතු කරන ඝන අපද්‍රව්‍ය වර්ග (ප්ලාස්ටික්, පොල් කටු, වීදුරු ආදී ලෙස) පිළිබඳව කාලසටහන් නිවෙස් සඳහා ලබා දීම. (පළාත් පාලන ආයතන මඟින්)
- ඝන අපද්‍රව්‍ය එකතු කරනු ලබන වාහනය පැමිනීමේදී “සීනුවක් ” නාද කිරීම.
- පළාත් පාලන ආයතන වලට කොම්පෝස්ට් අංගනය සඳහා අවශ්‍ය උපකරණ සහ පහසුකම් ලබාදීම.
- ඝන අපද්‍රව්‍ය වර්ග සඳහා එකතු කරන වාහනයේ වෙන් කල කොටස් තැබීම.
- බර වාහන ලගා විය නොහැකි ස්ථාන වල අත් කරත්ත මඟින් ඝන අපද්‍රව්‍ය එකතු කිරීම.

## ක්‍රමෝපාය 09 - සනීපාරක්ෂක බිම් පිරවුම් ස්ථාපනය කිරීම.

- ජෛවීය ක්‍රියාවලියට සහ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට භාවිතා කල නොහැකි ජීර්ණය නොවන අක්‍රිය සහ අනෙකුත් කසල බිම් පිරවීම සඳහා යොදා ගැනීම සුදුසු වන අතර තනි පළාත් ආයතනයක් මගින් සනීපාරක්ෂක බිම් පිරවුමක් ස්ථාපනය කිරීම මුල්‍යමය වශයෙන් ප්‍රායෝගික නොවන අතර පළාත් පාලන ආයතන කීපයක් එකතුවී එය සිදු කිරීම ප්‍රායෝගික වේ.

## ක්‍රමෝපාය 10– විද්‍යුත් ඝන අපද්‍රව්‍ය ( E – Waste)කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම.

- ඉවතලන පරිගණක, යතුරු පුවරු,රූපවාහිනී, ජංගම දූරකථන, වැනි උපාංග නාගරික ඝන අපද්‍රව්‍ය සමග බැහැර නොකල යුතු අතර එම අපද්‍රව්‍ය වෙන් කොට එක් රැස් කර ඒවා මිලදී ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි ගැනුම්කරුවන් වෙත ලබාදිය යුතුය.

## ක්‍රමෝපාය 11 –පසුවිපරම් කමිටුවක් පිහිටුවීම.

- අදාල ආයතනවල නිලධාරී මණ්ඩලයකින් සමන්විත පසු විපරම් කමිටුවක් පිහිටුවීම මගින් පසු විපරම් කටයුතු සිදු කිරීම.

# ක්‍රියාත්මක කල යුතු ව්‍යපෘති

**1**.සුන්දර පොල කසල කළමනාකරණ මධ්‍යස්ථානය තුල ඇතිවන පාරිසරික ගැටළු අවම කරගැනීම සඳහා ක්‍රමවත් ලෙස සකස් කිරීම.

- කසල බැහැර කරන භූමිය වටා භූදර්ශන උපක්‍රම මගින් නේවාසික කලාපය වෙන් කිරීම. - භූමිය වටා ගස් වවා බාධක කලාපයක් ඇති කිරිම.
- කසල හෙලන මධස්ථානයේ ව්‍යුහය පාරිසරික ගැටළු අවම වන ආකාරයට සකස් කොට වඩාත් ඵලදායි ස්ථානයක් බවටපත් කිරීම.

**2**.ඝණ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන 4 පහත සඳහන් ස්ථාන වල පිහිටුවීම.

1.මතව
2. මාස්පොත
3. තෝරයාය
4. වැල්ලව

# 6.4. ආර්ථික සංවර්ධන සැලැස්ම

## හැඳින්වීම

කුරුණෑගල නගර සංවර්ධන සැලැස්මේ දැක්ම "ඇතුගල වටකොට නැගෙන වයඹ මහා නගරය" යන්නයි. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියට අනුව 2030 වන විට බස්නාහිර-නැගෙනහිර ආර්ථික සංවර්ධන ද්වාරයේ පිහිටි ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයක්/ උපාය මාර්ගික නගරයක් වශයෙන් සංවර්ධනය කිරීමට අපේක්ෂිතයි. එමෙන්ම ජාතික සංවර්ධන ව්‍යාපෘතීන් වන මධ්‍යම අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 02ක් (ගැට්ටුවාන, දම්බොක්ක) නගරය ආසන්නයේ ස්ථානගතවීම නිසා එහි විභවතාවය නගරයේ ආර්ථික සංවර්ධනයට මෙන්ම භෞතික සංවර්ධනයටද සෘජුව බලපානු ලැබේ. එමෙන්ම යෝජිත කුරුණෑගල - දඹුල්ල දුම්රිය මාර්ගය හා පොල්ගහවෙල - කුරුණෑගල ද්විත්ව දුම්රිය මාර්ගය ද කුරුණෑගල සංවර්ධනයේ වැදගත් විභවතාවයකි.

මෙම විභවතාවයන් ප්‍රයෝජනයට ගෙන නගර මධ්‍යයේ අව භාවිතයේ ඇති ඉඩම් ප්‍රශස්ථ භාවිතයට පත් කිරීම හා යෝජිත විකල්ප මාර්ග පද්ධතිය මඟින් නගරාසන්න අභ්‍යන්තර ප්‍රදේශවල පිහිටි ඉඩම් වල වාණිජ වටිනාකම ඉහළ නැංවීම හා සැලසුම් ප්‍රදේශයේ ආර්ථිකය ප්‍රවර්ධනය කිරිම මෙම සැලැස්මේ මුලික අරමුණකි.

එමෙන්ම වයඹ පළාත ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් 10.7% ක් සඳහා දායකත්වය ලබා දෙන අතර, දිවයිනේ පළාත් අතර, 03 වන ස්ථානයට පත් වී ඇත. එනම්, කෘෂි කාර්මික අංශයෙන් 1.5%ක් , කාර්මික අංශයෙන් 3.2%ක් ද සේවා අංශයෙන් 5.6%ක් ද වශයෙන් දල දේශීය නිෂ්පාදනයට දායක වේ. මෙම දළ දේශිය නිෂ්පාදන දායකත්ව අගය කුරුණෑගල නගරයේ ආර්ථිකය විවිධාංගීකරණයට ලක් කිරීම තුලින් (සේවා හා කර්මාන්ත ) සැලකිය යුතු මට්ටමකින් වර්ධනය කිරිම යෝජිත සංවර්ධන සැලැස්ම මඟින් අපේක්ෂා කෙරේ.

වයඹ පළාතේ ප්‍රධාන පරිපාලන හා වාණිජ සේවා නගරය වශයෙන් කුරුණෑගල නගරය පත් වී ඇති අතර, දෛනිකව සේවා හා පහසුකම් ලබා ගැනීම සඳහා ලක්ෂ 03කට ආසන්න ජනගහනයක් නගරය කරා ඇදී එයි. මෙයද ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගත හැකි විභවතාවයකි. මෙම සැලැස්ම මඟින් ක්‍රියාත්මක අපරව්‍යුහ පහසුකම් හා අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති මගින්, දෛනික සංසරණ ජනගහනය ලක්ෂ 05 දක්වා වැඩි කර කලාපයේ ප්‍රධානම ආර්ථික මර්මස්ථානය බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ.


කුරුණෑගල නගරයට ඇති විධිමත් ප්‍රවාහන පහසුකම් නිසා උතුරු මැද , උතුරු, නැගෙනහිර , මධ්‍යම යන පළාත්වල සිට උපකාරක පංති සඳහා සති අන්ත දිනවල ලක්ෂ 01ක පමණ තරුණ ජනගහනයක් පැමිණේ. සාමාන්‍ය දිනවලදී 20000 කට ආසන්න තරුණ පිරිසක් උපකාරක පංති සඳහා නගරය කරා පැමිණේ. මෙම විභවතාවය නාගරික ආර්ථිකය ශක්තිමත් කිරිමට යොදාගත හැකි වැදගත් සාධකයකී. තෘතීක අධ්‍යාපනය කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් නගරය තුල ස්ථාපිත කර ඒ ආශ්‍රිතව රැකියා ජනනය කිරිම තුලින් නාගරික ආර්ථිකය තව දුරටත් ශක්තිමත් කිරීම මෙහි අරමුණු වේ.

යෝජිත ගමනාගමන සැලැස්ම , සේවා සැලැස්ම, අපරව්‍යුහ පහසුකම් සැලැස්ම, පාරිසරික සැලැස්ම යන සැලසුම් මඟින් දැනට පවතින නාගරික , භෞතික, පාරිසරික සමාජ තත්ත්වය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව සවංර්ධනය කිරිම තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කර ගැනිමට රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ ඍජු දායකත්වය අපේක්ෂා කරන අතර, නගරය තුල මෙන්ම නගරය අවට, ජනතාවට රැකියා අවශ්‍යතා සැපයිමෙන් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරිම ප්‍රධාන අරමුණකී.

## උපාය මාර්ග

1. නගර මධ්‍යය ප්‍රතිසංවර්ධනය කිරීම. - නගර මධ්‍යය ප්‍රතිව්‍යුහගත කිරිම තුලින් අවභාවිතයේ හා අව සංවර්ධනයේ පවතින නාගරික ඉඩම් ප්‍රශස්ථ භාවිතය සඳහා යොදා ගැනිම.
2. ගැට්ටුවාන අධිවේගි මාර්ග අන්තර් හුවමාරුව හා දුම්රිය ස්ථානයෙහි උපාය මාර්ගික පිහිටිම ප්‍රයෝජනයට ගනිමින් ගමනාගමනය මුල් කරගත් සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ගැට්ටුවාන ප්‍රදේශය සංවර්ධනය කිරිම.
3. ඉහල ප්‍රවේශකත්වය උපයෝගි කරගෙන රැකියා වියුක්තියේ පුහුණු ශ්‍රමය නාගරික ආර්ථිකයට යොදා ගැනිම සඳහා භාණ්ඩ ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරිම හා කර්මාන්ත පුරය පුළුල් කිරිම.
4. කලාපයේ ඉහළ පරිගනක ශාක්ෂරතා මට්ටම , රැකියා වියුක්තිකයන්ගේ ඉහළ අධ්‍යාපන මට්ටම ,ද්විතික හා තෘතික අධ්‍යාපනය සඳහා කුරුණෑගල නගරයට පවතින ඉහල ඉල්ලුම නාගරික ආර්ථිකයට යොදා ගැනිම සඳහා තොරතුරු තාක්ෂණ ගම්මානයක්,තෘතික අධ්‍යාපන මධ්‍යස්ථානයක් හා උපකාරක පංති ස්ථාපිත කිරිම

**සිතියම් අංක 6.19 - ආර්ථික සංවර්ධන සැලැස්ම**



## උපාය මාර්ග 01

### නගර මධ්‍ය ප්‍රතිසංවර්ධනය කිරීම.

නගර මධ්‍ය යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රධාන මාර්ග 05 ඒකාබද්ධ වන මධ්‍යස්ථානය හා ඒ ආශ්‍රිතව පිහිටි බස්නැවතුම්පල මූලික කරගත් අරය මීටර් 500කට ඇතුලත් කලාපයයි. මෙම කලාපය තුළ ඉඩම් වටිනාකම ඉතා ඉහල අගයක් ගන්නා අතර, (පර්චසය. මිලියන 10) එම ඉඩම් වලින් 10%ක් පමණ රාජ්‍ය ආයතන ස්ථානගත කොට ඇත. මෙම ස්ථානවල තනි මහලේ ගොඩනැගිලි පමණක් දක්නට ලැබෙන අතර, නගර මධ්‍යයේ ඇති සෝෂාකාරී පරිසරයට නොගැලපෙන උසාවිය, බන්ධනාගාරය වැනි රාජ්‍ය ආයතනද මෙම කලාපය තුල පිහිටා ඇත. මෙම නිසා මෙම කලාපයේ අධික රථවාහන තදබදයක් නිතරම දක්නට ලැබෙන අතර, විධිමත් සැලැස්මකට අනුව ඌන භාවිතයේ ඇති ඉඩම් ප්‍රතිසංවර්ධනය කොට නගරයේ මුහුණුවර වෙනස් කොට ආර්ථික වශයෙන් ඵලදායි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නගර මධ්‍ය සැලැස්මේ අරමුණයි. කුරුණෑගල නගරයේ විකාශනය සිදුවූ න්‍යෂ්ඨිය මෙම කලාපය වන අතර, මෙහි ඉඩම්වල ප්‍රමාණය බහුතරයක් පර්. 06ට අඩුය. එමෙන්ම විටින් විට සිදුවූ මාර්ග සංවර්ධනයේදී ඉඩම් අත්පත් කර ගැනීම නිසා ඉඩම් වල ප්‍රමාණය අඩුවී එහි ඉදිවන සංවර්ධනයන්ද අවිධිමත් වී ඇත. තව දුරටත් මෙම කලාපයේ සංවර්ධනය පාලනයකට යටත් කොට විධිමත් සංවර්ධනය ඇති කිරීම මෙහි ප්‍රධාන අරමුණයි.

- ❖ නගර මධ්‍යයේ පවතින නොගැළපෙන හා ඌන භාවිතයෙන් යුතු ඉඩම් ප්‍රශස්ථ භාවිතය සඳහා යොදා ගැනීම.
- ❖ නගරයේ අනන්‍යතාවය , නගරයේ ඓතිහාසික වටිනාකම නගරයට විවෘත කිරීම.
- ❖ නගරයේ පවතින සේවා මට්ටම ඉහළ නැංවීම.

මෙම උපාය මාර්ග යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.

### ව්‍යාපෘති

i. උසාවි සංකීර්ණය එම භාවිතයට සුදුසු ගැට්ටුවාන ප්‍රදේශයේ ප්‍රතිස්ථාපනය කර එයට අනුශාංගික කටයුතු වන බන්ධනාගාරය, විනිසුරු නිල නිවාස, නීතිඥ කාර්යාල එයට අනුබද්ධිතව ලබාදීම හා පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත උසාවි ගොඩනැගිල්ලෙහි ඓතිහාසික උරුමය රැක ගනිමින් සාප්පු සංකීර්ණයක් ලෙස සංවර්ධනය කිරීම හා ධර්මපාල උද්‍යානය පිහිටි පරිශ්‍රය මහජනතාවට ආකර්ශණීය ස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීම.

ii. නගර මධ්‍යය මිහිඳු මාවත පිහිටි මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, නිවාස සංවර්ධනය අධිකාරිය, පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව යන රාජ්‍ය ආයතන ස්ථානගත වී ඇති ඌන භාවිතයෙන් යුත් අක්කර 07ක ඉඩම පරිපාලන, වාණිජ හා නේවාසික කටයුතු සඳහා සංවර්ධනය කිරීම. මෙම ව්‍යාපෘතිය අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

- පොලිසිය හා පොලිස් නිල නිවාස, ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය පිහිටි ඉඩම තුළ ප්‍රතිස්ථාපනය කිරීම.
- බන්ධනාගාරය, නඩුකාර නිල නිවාස, නීතිඥ සංකීර්ණය, ප්‍රතිස්ථාපනය කිරීම (ගැට්වුවාන ප්‍රදේශයේ වර්තමාන රජයේ නිල නිවාස පිහිටි භූමිය උසාවි සංකිර්ණය ප්‍රතිස්ථාපනය කිරීමට යෝජිතය. )
- මිහිඳු මාවත ඉඩමෙහි ඉඩමෙහි පරිපාලන සංකීරණයක් වාණිජ හා නේවාසික සංකීර්ණයක් සහිතව සංවර්ධනය කිරීම.

iii. නගර සභාව සතු නගර මධ්‍යයේ පිහිටි පොදු වෙළඳපොල වාණිජ කුළුණු වලින් යුක්ත මිශ්‍ර සංවර්ධනයක් සඳහා යොදවා ගැනීම - වර්තමාන පොදු වෙලදපල පැරණි ගොඩනැගිලි සහිතව අවසංවර්ධන තත්ත්වයේ පවතී.

iv. නගර සභා සනීපාරක්ෂක කම්කරුවන් පදිංචි අඩු ආදායම් නිවාස පිහිටි නගර සභා ඉඩමෙහි සතිපොල ප්‍රතිස්ථාපනය කර, ගැට්වුවාන ගමනා ගමන මධ්‍යස්ථානය ආසන්නයේ පිහිටි වර්තමාන පොල භූමිය, සිනමා ශාලා, ආපන ශාලා, සාප්පු සංකීර්ණ , උද්‍යාන සහිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියට යොදා ගැනීම මගින් එම ඉඩම ප්‍රශස්ථ භාවිතයට යොදා ගැනීම.

v. වෙළගෙදර ජාත්‍යන්තර ක්‍රීඩාංගනය ප්‍රතිසංවර්ධනය

මෙම ක්‍රීඩාංගනය ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයක් වශයෙන් නවීකරණය කිරීම තුලින් කුරුණෑගල නගරයේ ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා ගැනීමට හැකි වේ. අධිවේගී මාර්ග ව්‍යාපෘතියත් සමඟ කොළඹ සිට පැයක් වැනි කාලයකින් කුරුණෑගල නගරයට ලගා වීමේ හැකියාව මෙම ව්‍යාපෘතිය සාර්ථක වීමට පිටිවහලක් වේ.

vi. පැරණි රජපිහිල්ල තානායම් පරිශ්‍රයෙහි කාමර 50 කින් යුත් සුඛෝපබෝගී හෝටලයක් ඉදිකිරීම හා බඩගමුව රක්ෂිතය ආසන්නයේ කාමර 50කින් යුතු හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම.
(ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය නවීකරණයට සමගාමීව නවාතැන් පහසුකම් සඳහා හෝටල් සංකීර්ණයක් සංවර්ධනය කිරීමට යෝජිතය. එමගින් කුරුණෑගල නගරය හරහා ගමන් කරන සංචාරකයින් සඳහා අවශ්‍ය ආහාර, නවාතැන් පහසුකම් සැපයීම මගින්ද නාගරික ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට අවස්ථාව උදාවේ.)

## උපායමාර්ග 02

### ගමනාගමනය මුල් කරගත් සංවර්ධන මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම.

මහා මාර්ග, දුම්රිය මාර්ග, අධිවේගී මාර්ග යන බහුවිධ ප්‍රවාහන මාධ්‍යය හරහා නගරයට පවතින සම්බන්ධතාවය හා කාර්යක්ෂම ප්‍රවේශකත්වය යන විභවතාවයන් ප්‍රයෝජනයට ගනිමින් කුරුණෑගල නගරය ගමනාගමනය මූලික කරගත් සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම මෙහි අරමුණ වේ. එමගින් නගරයේ මූලික දැක්ම වන "වයඹ මහා නගරය"බවට පත් කිරීමේ මූලික අරමුණ කරා ලගා වීමේ අවස්ථාව උදාවේ. අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථානය හා දුම්රිය ස්ථානය එකිනෙක ආසන්නයේ ස්ථානගත වීමේ වාසිය ප්‍රයෝජනයට ගනිමින් ගමනාගමනය මූලික කරගත් ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස ගැට්ටුවාන ප්‍රදේශය සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

මෙම ප්‍රදේශය ආශ්‍රිතව දුම්රිය ස්ථානය පිහිටි භූමියෙහි බස් නැවතුම්පලක් ඉදිකර දුම්රිය ස්ථානය , අධිවේගී බස් නැවතුම ඇතුලත් බහු මාධ්‍ය ගමනාගමන මධ්‍යස්ථානය ස්ථාපිත කර ගමනාගමන මාධ්‍ය අතර, එකාබද්ධතාවයක් ඇති කර ඒ හා ආනුශංගිකව සේවා පහසුකම්, කාර්යාල හා නිවාස පහසුකම් යනාදිය ඇතුලත් මධ්‍යස්ථානයක් ලෙස මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.


## උපායමාර්ග 03

### 01. භාණ්ඩ ප්‍රවර්ධන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම. (logistic hub )

ගඩොල් , උළු , සිමෙන්ති වැනි ගොඩනැඟිලි අමුද්‍රව්‍ය බහුල පෝෂක ප්‍රදේශයක කුරුණෑගල නගරය පිහිටීමත් , වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ වාහන හා අමතර කොටස් වෙළඳාම සඳහා හිමිකරගෙන ඇති ස්ථානයත් සමඟ අධිවේගී මාර්ගය සහ දුම්රිය මාර්ගය දිර්ඝ කිරීමේ ව්‍යාපෘතිය ප්‍රයෝජනයට ගනිමින් ලංකාව පුරා භාණ්ඩ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව පවතී. ඒ සඳහා අධිවේගී මාර්ගයේ ගැට්ටුවාන හා දම්බොක්ක අන්තර් හුවමාරු මධ්‍යස්ථානයට සහ නයිලිය දුම්රිය ස්ථානයට ආසන්නයේ පිහිටි අක්කර 50ක පමණ විශාලත්වයකින් යුතු භූමියක් මේ සඳහා හඳුනාගෙන ඇත. මෙම භාණ්ඩ බෙදාහැරීමේ මධ්‍යස්ථානයෙහි භාණ්ඩ ගබඩා කිරීම, ඇසිරීම හා කන්ටේනර් අංගන ඇතුලත් වේ.

අධිවේගී මාර්ගය, දුම්රිය මාර්ග, මහා මාර්ග හරහා කුරුණෑගල නගරය හිමිකරගෙන තිබෙන කාර්යක්ෂම ප්‍රවේශ පහසුකම නාගරික ආර්ථිකයට යොදා ගැනීම, මුළු ශ්‍රම බලකායෙන් 17%ක් (19,000) වන හා රැකියා වියුක්තියෙන් 25%ක් සඳහා රැකියා අවස්ථාවන් බිහි කිරීම, කුරුණෑගල නගරය තුල ගබඩා පහසුකම් සඳහා පවතින වාර්තමාන ඉල්ලුමත් සමඟ අවිධිමත් හා අනෙකුත් භාවිතයන්ට ගැටලුවක් වන ලෙස විසිරී පවතින ගබඩා විධිමත් පරිදි ස්ථානගත කිරීම, නගරය තුළ පවතින සේවා ආර්ථිකය තව දුරටත් පුළුල් කිරීම තුලින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම යන අරමුණු කරා ලගා වීම සඳහා මෙම උපාය මාර්ගය ක්‍රියාත්මක කරනු ලැබේ. (සිතියම්අංක6.20)

***සිතියම් අංක 6.20 - භාණ්ඩ බෙදා හැරීමේ මධ්‍යස්ථානය හා හෙරලියාවල කර්මාන්තපුරය පුළුල් කිරීම.***



## 02. හෙරලියාවල කාර්මාන්තපුරය පුළුල් කිරීම

යෝජිත මංතීරු 02කින් යුතු විකල්ප මාර්ගයට ආසන්නයේ හෙරලියාවල කර්මාන්තපුරය පිහිටා ඇත. එහි දැනටමත් කර්මාන්ත 45ත් ස්ථාපිතව ඇති අතර, සේවකයින් 4000 රැකියාවන්හි නියුක්තව සිටී. ක්‍රියාත්මක අධිවේගි මාර්ගයේ ගැට්ටුවාන හා දම්බොක්ක අන්තර් හුවමාරු මධ්‍යස්ථාන හා යෝජිත විකල්ප මාර්ගය ආසන්නයේ මෙම කර්මාන්ත පුරය පිහිටා ඇති බැවින්, අමුද්‍රව්‍ය ආනයනය කිරීම . නිෂ්පාදන අපනයන කිරීම යනාදී කටයුතු කාර්යක්‍ෂමව කර ගැනීමේ හැකියාව ඇත. එමෙන්ම කොළඹට හා තදාසන්න ප්‍රදේශයන්ට සාපේක්ෂව අඩු මිලකට කුරුණෑගල ප්‍රදේශයෙන් ඉඩම් මිලදී ගැනීමේ හැකියාවක් පවතින හෙයින් ආයෝජකයින්ගේ ආකර්ෂණය කුරුණෑගල නගරය වෙත ලබා ගැනීමේ අවස්ථාව පවතී.

ශ්‍රම බලකායෙන් 17%ක් වන රැකියා වියුක්තිකයන්ගෙන් පුහුණු ශ්‍රමිකයන් සඳහා රැකියා අවස්ථාවන් බිහිකිරීම , හෙරලියාවල කර්මාන්ත පුරය ආසන්නයේ යෝජිත මංතිරු 02ක විකල්ප මාර්ගයක් ගමන් කරන අතර, එමඟින් කර්මාන්තපුරය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම, නිෂ්පාදන බෙදා හැරීම යනාදිය සඳහා දුම්රිය ස්ථානය , අධිවේගී මාර්ගය උපයෝගී කරගෙන කර්මාන්ත පුරයෙහි උපරිම ඵලදායිතාවය ලබා ගැනීම, හෙරලියාවල කර්මාන්ත පුරය සඳහා පවතින ඉඩම් ඉල්ලුම සපුරාලීම, මුළු සේවා නියුක්තියෙන් 11% ක් වන (10,000) කාර්මික රැකියා නියුක්තිය ඉහල නංවා ආර්ථිකය විවිධාංගීකරණයට ලක් කිරීම යන අරමුණු ඉටුකර ගැනීම මෙම උපක්‍රමය තුළින් අපේක්ෂා කෙරේ.

## උපායමාර්ග 04

### 01. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සංවර්ධනය

ක්‍රියාත්මක අධිවේගී මාර්ගයත් සමඟ කොළඹ සිට කුරුණෑගල නගරයට පැයක් වැනි කාලයක් තුල ලගාවීමේ හැකියාව පවතී. එමෙන්ම 06 වන පරිච්ඡේදයේ ශදුඅත විග්‍රහයෙන් පැහැදිලි කළ පරිදි කුරුණෑගල නගරය වෙත පවතින තෘතියික අධ්‍යාපන සඳහා පවතින ඉල්ලුම, පෝෂක ප්‍රදේශය ජනතාවගේ ඉහල අධ්‍යාපන මට්ටම යනාදිය මත තොරතුරු තාක්ෂණයට අදාල අධ්‍යාපනය, රැකියා සඳහා ඉහල ඉල්ලුමක් පවතින බව පැහැදිලි වේ. කොළඹට සාපේක්ෂව අඩු ඉඩම් මිල, අපරව්‍යුහ පහසුකම් ලබා ගැනීමේ හැකියාව, ශ්‍රම බහුලකම යනාදිය මත වෘත්තිකයන් සහ ආයෝජකයින් මෙම ක්ෂේත්‍රය වෙත ආකර්ශණය කර ගැනීමේ හැකියාව පවතී. ඒ සඳහා කොළඹ පාර, සහ මීගමුව පාර අතර ප්‍රදේශයේ අධිවේගී මාර්ගය, යෝජිත විකල්ප මාර්ගය, දුම්රිය ස්ථානයට ආසන්නයේ පිහිටි අක්කර 25ක පමණ භූමිය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම මෙම උපාය මාර්ගය වේ. මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීමේන් පසු තොරතුරු තාක්ෂණයට අදාල අනෙකුත් වාණිජ සේවා , නවාතැන්, හෝටල්, වාහන නැවතුම් ස්ථාන, විවේක හා විනෝද පහසුකම් ස්ථාන ගතවී එම ප්‍රදේශය ආර්ථික වර්ධන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම මෙමඟින් සිදු කරනු ලැබේ.

කලාපයේ ඉහල පරිගණක සාක්ෂරතා මට්ටම, ඉහළ අධ්‍යාපන මට්ටම හා රැකියා වියුක්තිය යන අංග සලකා රැකියා අවස්ථාවන් සහ තෘතීය අධ්‍යාපනය සඳහා අවස්ථාවන් ලබාදීම, ඉහළ ප්‍රවේශකත්වය පදනම් කරගෙන ලංකාවේ උතුරු කලාපයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය බවට පත්කිරීම තුළින් කොළඹ වෙත සිදුවන බුද්ධිගලනය රඳවාගෙන නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම යන අරමුණු ඉටුකර ගැනීම මෙ මඟින් අපේක්ෂා කෙරේ. (සිතියම්අංක6.22)

### 02. උපකාරක පංති පහසුකම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

කුරුණෑගල හා අවට නගරවලින් උපකාරක පංති සඳහා දැනට විශාල ඉල්ලුමක් පවතින හෙයින් නගරයේ මෙන්ම අවට ප්‍රදේශවලින් පැමිණෙන සිසුන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහල නැංවීම, සිසුන්ට ඉහල ගුණාත්මක තත්ත්වයේ උපකාරක පංති සැපයීම හා එම උපකාරක පංති පැවැත්වෙන ශාලා බඳුදීම තුලින් ප්‍රතිලාභ ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.


වර්තමානයේ පෞද්ගික බස්රථ ගාල්කර පවතින නගර සභාව සතු මහ නුවර මාර්ගයෙන් ප්‍රවේශකත්වය ලබා ගන්නා අක්කර 02 ක පමණ භූමියක් මේ සඳහා හඳුනාගෙන ඇත.

### 03.යෝජිත තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

කලාපයේ ඉහල අධ්‍යාපන මට්ටම අනුව තෘතියික අධ්‍යාපනය සඳහා පවතින ඉල්ලුම සඳහා පහසුකම් සහිත මධ්‍යස්ථානයක් ලබා දීම මඟින් විධිමත් සේවාවක් ලබාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වන අතර, මේ සඳහා අවශ්‍ය ඉඩම් පවරාගෙන අපරව්‍යුහ පහසුකම් සහිතව සංවර්ධනය කොට විශ්ව විද්‍යාල , කාර්මික විද්‍යාල , වෘත්තීය පුහුණු ආයතන සඳහා බදු දීමට යෝජිතය.

කටුපිටිය මාර්ගයේ ගැට්ටුවාන ගමනාගමන මධ්‍යස්ථානයට ආසන්නයේ මල්ලවපිටිය ප්‍රදේශයේ පිහිටි අක්කර 13ක පමණ වු ලඳුකැලෑ සහිත ඉඩමක් අත්පත් කර ගැනීමට හඳුනා ගෙන ඇත.

**සිතියම් අංක 6.21 - තොරතුරු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම**



# 6.5. තිරසර පාරිසරික උපාය මාර්ග

කුරුණෑගල නාගරික බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්මට අන්තර්ග්‍රහනය කර ගැනීම සඳහා මෙම පරිසර සැලැස්ම ඉදිරිපත් කරන ලද අතර, එය පහත සඳහන් සංඝටකවලින් සමන්විත වේ.

6.5.1 තෙත් බිම් සැලැස්ම
6.5.2 භූ දර්ශන කලමණාකරන සැලැස්ම
6.5.3 ආපදා අවම කිරීමේ සැලැස්ම
6.5.4 යෝජිත පොදු එළිමහන් විවෘත භූමි සැලැස්ම

## 6.5.1 තෙත් බිම් සැලැස්ම

### සංරක්ෂිත ප්‍රදේශ

**තෙත් බිම්**

වසර පුරා හෝ වසරේ කිසියම් කාල සීමාවක් පුරා තෙත බරිතව පවතින බිම් ප්‍රදේශ "තෙත් බිමක් " ලෙස සරලව හැඳින්විය හැකිය. අන්තර්ජාතික රැම්සා සම්මුතියට අනුව, බාදිය මට්ටමේ සිට මීටර් 06ට අඩු මුහුදු පෙදෙස් ඇතුළුව ගලායන හෝ නිශ්චලව පවතින්නා වූ මිරිදිය, කිවුල්දිය හෝ කරදියෙන් තාවකාලික හෝ ස්ථිරව යටවී පවතින කෘතීම හෝ ස්වභාවික වගුරු බිම් , විල්ලු , ජලාශ, ජල මාර්ග , හැල ඉඩම් හා පීට් බිම් ආදිය තෙත් බිම් ලෙස හැඳින්වේ.

කුරුණෑගල නාගරික බල ප්‍රදේශය තුළ පාරිසරික වශයෙන් වැදගත් වන තෙත් බිම් රාශියක් පවතින අතර, ඒවා ප්‍රධාන වශයෙන් කුඹුරු වගා බිම් , වැව් සහ ඇළ මාර්ග සිතියම් අංක 01 මඟින් දක්වා ඇත.
ජල රැඳවුම් හා ජල බැසයාම් ප්‍රදේශ ලෙස ක්‍රියා කරන නිසා කුඹුරු වගා බිම් එලෙසම පවත්වාගැනීම මඟින් ප්‍රදේශයට බලපාන ජල ගැලීම් අවම කර ගත හැකිය.

**විශේෂ කුඹුරු කලාපය - අනුමත භාවිතයන්**

- ❖ කුඹුරු වගාකිරීම
- ❖ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද අනෙකුත් භාවිතයන්

## උපායමාර්ග

01.ගොවිජන සංවර්ධන පනතට අනුව කටයුතු කිරීම තුලින් පාරිසරික ආපදා අවම කර ගැනීමට කටයුතු කිරීම.

02.වැව් වටා රක්ෂිතයක් පවත්වාගෙන යමින්, වැව් වටා අක්‍රමවත් ගොඩනැගිලි ඉදිකිරීම් හා අනවසර ඉදිකිරීම් වලක්වා ගැනීමට කටයුතු කල යුතුය.

03.කුරුණෑගල වැව , සාරගම වැව වෙන්ඩරු වැව වටා තීරු උද්‍යාන සංවර්ධනය කිරිම.


## දර්ශනීය ස්ථාන (Scenic view points)

දර්ශනිය ස්ථාන කිහිපයක් කුරුණෑගල නාගරික බල ප්‍රදේශය ආශ්‍රිතව පිහිටා ඇත.

- ඇතුගල
- කුරුණෑගල වැව
- සාරගම වැව
- වෙඩරු වැව
- ඔරලෝසු කණුව

සංවර්ධන කටයුතු සිදු කිරීමේදී මෙම දර්ශනීය ස්ථාන සුරැකෙන අයුරින් සංවර්ධන කටයුතු සිදුකිරීම තුලින් මෙම සුන්දර පරිසරය ආරක්ෂා කරගත හැකි අතර ඇතුගල දර්ශනය වන ස්ථාන අවහිර වන ලෙස ගොඩනැගිලි ඉදි කිරීම අනුමත නොකල යුතුය. ඒ සඳහා ඇතුගල දර්ශනය විම සඳහා උස සීමා කිරිමේ සැලැස්ම බලාත්මක කළ යුතුය.

**සිතියම් අංක 6.20 - තෙත් බිම් සැලැස්ම 2019 -2030**



### 6.5.2. භූදර්ශන කළමනාකරණ සැලැස්ම

කුරුණෑගල නාගරික බල ප්‍රදේශයේ භූදර්ශන සැලැස්ම සැකසීමේදී පහත සඳහන් ප්‍රදේශ විධිමත් භූදර්ශන සැලසුම් අනුව ප්‍රතිනිර්මාණය කල යුතු බව හඳුනාගන්නා ලදී.

1. ඇතුගල ආශ්‍රිත යෝජිත උද්‍යානය - මාලිගාව ආශ්‍රිත භූමිය
2. රජපිහිල්ල උද්‍යානය
3. රජපිහිල්ල උද්‍යානය අශ්‍රිත ඇවිදීමේ මංතීරු සංවර්ධනය
4. සාරගම වැව අවට භූමි අලංකරණය
5. කුරුණෑගල රෝහලට යාබද සිරිසර කුඹුරු යායෙහි ඇවිදින මංතීරු සංවර්ධනය
6. වැල්ලව සහ මුත්තෙට්ටුගල දුම්රිය ස්ථානයන්හි භූමි අලංකරණ ව්‍යාපෘතිය

එම එක් එක් ස්ථාන වලට අදාල දැනට පවතින තත්ත්වය දැක්වෙන ඡායාරූපය සහ එම ස්ථාන භූදර්ශන සැලසුම් කල යුතු ආකාරය පිලිබඳ දළ සටහන රූප අංක 6.3 සිට 6.8 දක්වා සහ ඇමුණුම් වගු අංක 6.13 යටතේ දක්වා ඇත.

## රූප අංක 6.3 - ඇතුගල ආශ්‍රිත යෝජිත උද්‍යානය (Adventure park)

වර්තමාන තත්ත්වය



යෝජිත තත්ත්වය



## රූප අංක 6.4 - රජපිහිල්ල උද්‍යානය

වර්තමාන තත්ත්වය



යෝජිත තත්ත්වය



**රූප අංක 6.5 - රජපිහිල්ල උද්‍යානය අශ්‍රිත ඇවිදීමේ මංතීරු සංවර්ධනය**

වර්තමාන තත්ත්වය



යෝජිත තත්ත්වය



**රූප අංක 6.6 - සාරගම වැව අවට භූමි අලංකරණය**

වර්තමාන තත්ත්වය





යෝජිත තත්ත්වය



## රූප අංක 6.7 - කුරුණෑගල රෝහලට යාබද සිරිසර කුඹුරු යායෙහි ඇවිදින මංතීරු සංවර්ධනය

වර්තමාන තත්ත්වය







යෝජිත සැලැස්ම




## රූප අංක 6.8 - වැල්ලව සහ මුත්තෙට්ටුගල දුම්රිය ස්ථානයන්හි භූමි අලංකරණ ව්‍යාපෘතිය

වැල්ලව දුම්රිය ස්ථානයේ වර්තමාන තත්ත්වය



වැල්ලව දුම්රිය ස්ථානයේ යෝජිත තත්ත්වය



# 6.5.3. ආපදා අවදානම අවම කිරීමේ සැලැස්ම

### පවතින ආපදා තත්ත්වය

කුරුණෑගල නාගරික බල ප්‍රදේශය සඳහා කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත්ව වර්ග කිලෝමීටර් 245 ක බිම් ප්‍රමාණයක් අයත් වේ. එම නාගරික බල ප්‍රදේශය තුළ හඳුනාගත් ආපදා තත්ත්වයන් පහත පරිදි වේ .

1. ගංවතුර
2. පස් කඳු කඩා වැටීම්
3. තද සුළඟ
4. නියඟය
5. සුලි සුළඟ

## 6.5.3.1. කුරුණෑගල නාගරික බල ප්‍රදේශයෙහි ආපදා පිහිටි ප්‍රදේශ සඳහා මාර්ගෝපදේශයන්

### 1. ගංවතුර

**ගංවතුර ආපදාවට ලක්විය හැකි ප්‍රදේශ වල ඉදිකිරීම් කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු උපායමාර්ග**

අ. පහත්බිම් ප්‍රදේශ වල ඉදි කිරීම් කටයුතු අවම කල යුතු අතර වැසි ජලය බැසයාමේ ක්‍රමවේදයන් සකස් කල යුතුය.

ඇ. අඩු ඝනත්වය සහිත ජනාවාස ප්‍රදේශ පවත්වාගෙන යාම.

ඉ. ගංවතුර බාධක බැමි ඉදිකිරීම.

උ. ජල පෝෂක ප්‍රදේශයන්හි වන වගා කිරීම.

### 2. නියඟය

**නියඟය ආපදාවට ලක්විය හැකි ප්‍රදේශ වල ඉදිකිරීම් කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු උපායමාර්ග**

ආ. වැසි ජල එක්රැස් කිරීමේ ටැංකි පිහිටු විය යුතුය.

ඇ. වියලි කාලගුණය සඳහා අනුවර්තනය වන බෝග වගා කිරීම කල යුතුය.

ඇ. වැඩ බිම් සංවර්ධන කටයුතු වලදී

(අ). පාරිසරික වටිනාකම් ඇති ශාක විශේෂ ආරක්ෂා කල යුතුය.

(ආ). පවත්නා ජලාශ ගොඩ කිරීම තහනම් කල යුතුය.

(ඇ). වන රක්ෂිත ආශ්‍රිතව පිහිටි ජලාශ මෙන්ම වැව් ප්‍රතිසංස්කරණය කල යුතුය.

ඉ. භූදර්ශන කටයුතු වලදී වියලි කාලගුණයට අනුවර්තනය වන ශාක වගා කල යුතුය

## 3. සුලිසුලං සහ තද සුළං

**සුළිසුලං සහ තද සුළං ආපදාවට ලක්විය හැකි ප්‍රදේශ වල ඉදිකිරීම් කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු උපායමාර්ග**

අ. ඉඩමේ විවෘතභාවය පිළිබද සැලකිලිමත් විය යුතුය.එනම් කඳු මුදුන්වල, කුඹුරු යායවල් හා වෙනත් විවෘත ප්‍රදේශ ආසන්නයේ ගොඩනැගිලි ඉදිකිරීම මගින් සුළි සුලගකදී ඊට වන හානිය වැඩි වේ.

ආ. කඳු බෑවුම් වල ගොඩනැගිලි ඉදිකිරීම මගින් සුළි සුළගින් වන හානිය අවම වේ.

ඇ. වෘක්ෂලතා අධික ප්‍රදේශයක ගොඩනැගිලි සෑදීම මගින් සුළිසුලං අවස්ථාවකදී සුළගේ වේගය අවම කර ගත හැක. මෙය සුළං බාධක ලෙස ක්‍රියා කරයි.

## 4. පස් කඳු කඩා වැටීම

**පස් කඳු කඩා වැටීම ආපදාවට ලක්විය හැකි ප්‍රදේශ වල ඉදිකිරීම් කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු උපායමාර්ග**

අ. ඉඩම් අවධිමත් ලෙස පරිහරණය කිරීම වලක්වා ගැනීම.

ආ. හෙල්මළු ක්‍රමයට බිම සකස්කොට වගා කිරීම.

ඇ. කෘෂිකාර්මික ඉඩම් කෘෂිකාර්මික නොවන වෙනත් කටයුතු සඳහා යොදා ගැනීම පාලනය කිරීම.

ඉ. ඉඩම් වල නුසුදුසු භෝග ව්‍යාප්තිය පාලනය කිරීම.

එ. සංරක්ෂණය සඳහා ගල් වැටි හා ශාක ආවරණ යොදා ගැනීම.

**මූලාශ්‍රය :- 1. නාගරික සහ ස්වභාවික අපදා අවම කිරීම සඳහා වන සැලසුම් රෙගුලාසි**

නා.සං.අ.,ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය සහ ආපදා කළමණාකරණ අමාත්‍යාංශය - 2013 මාර්තු

**2. සුරක්ෂිත නිවසක් ඉදිකිරීම සඳහා උපදෙස්**

2016 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

## 6.5.3.2 කලාපීකරණය

කුරුණෑගල නාගරික බල ප්‍රදේශයෙහි පවතින ආපදා තත්තවයන් අනුව ප්‍රධාන වශයෙන් කලාප දෙකකට වර්ගීකරණය කළ හැකිය.

i. හරිත තීර කලාපය
ii. අඩු ජන ඝනත්ව නේවාසික කලාපය

i. **හරිත තීර කලාපය**

දැදුරු ඔය, මඟුරු ඔය, ගැට්ටුවාන ඇල, වාන් ඇල සහ බූ ඇල රක්ෂිතය ගංවතුර රඳවා තැබීමේ ධාරිතාවය සපුරාලීමට සහ පොදු විවෘත අවකාශ පහසුකම් සැපයීම සඳහා හරිත තීරයක් ලෙස තබා ගත යුතුය. එහිදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශය පරිදි දැදුරු ඔය සහ මගුරුඔය සඳහා ගොඩනැගිලි සීමා තබා හරිත තීරයක් ලෙස පවත්වාගෙන යා යුතුය. ගැට්ටුවාන ඇළ, වාන් ඇළ සහ බූ ඇළ සඳහා මීටර් 4 ගොඩනැගිලි සීමා නඩත්තු කල යුතුය.

ii. **අඩු ජන ඝනත්ව නේවාසික කලාපය**

පස්කදු කඩාවැටීම, සුළි සුළං සහ නියඟ අවදානම් ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ

## 6.5.3.3. කලාප සඳහා අනුමත භාවිතයන්

**i. හරිත තීර කලාපය**

අ. උද්‍යාන සහ වියළි කාලගුණ ක්‍රීඩා පිටි

ආ. අවිධිමත් විනෝද පහසුකම්

ඇ. රේඛීය උද්‍යාන ආදිය

ඈ. ජල රැඳවුම්/ බැසයාම් ප්‍රදේශ ලෙස පවත්වා ගැනීම

ඉ. කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම

ඊ. පරිසර සංචාරක කටයුතු

උ. තෙත්බිම් සංරක්ෂිත ප්‍රදේශ

**ii. අඩු ජන ඝනත්ව නේවාසික කලාපය**

අ. හෙල්මළු ක්‍රමයට බෝග වගා කිරීම

ආ. සීමිත නගර සංවර්ධන වැඩසටහන්

ඇ. වැසි ජල අස්වනු ක්‍රමය භාවිතා කිරීම

ඉ. බෑවුම් සහිත ප්‍රදේශ වන වගා සඳහා යොදා ගැනීම.

## 6.5.4 පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම

සෑම පුද්ගලයෙකුගේම කායික , මානසික වර්ධනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා පොදු එළිමහන් විනෝද කටයුතු බෙහෙවින් වැදගත් වේ. එම නිසා නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන සැලැසුම් සකස් කිරිමේදී පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම සංවර්ධන සැලැසුම්වලට අන්තර්ගහනය කරනු ලැබේ.

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රමිති මට්ටම් වලට අනුව ජනගහනය 1000 කට හෙක්ටයාර් 1 ක් අවම වශයෙන් සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස සංවර්ධන සැලැස්ම සැකසීමේදී වෙන්කළ යුතුය. කුරුණෑගල නාගරික බල ප්‍රදේශයේ 2017 වසර වන විට ජනගහනය 180,339 ලෙස සංගණන වාර්තාවේ දක්වා ඇත. සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2030 වන විට ජනගහනය 247,428 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ඉඩම් හෙක්ටයාර් 247 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය.

### කුරුණෑගල නාගරික බල ප්‍රදේශයේ වර්තමානයේ පවතින සෘජු සහ වක්‍ර විනෝද පහසුකම්

සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන සංඝටක දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලනු ලැබේ. සෘජු විනෝද කටයුතු පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී විය හැකි ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍යය. එනම්

i. ක්‍රීඩා කිරීම
ii. පිහිනීම
iii. දිවීම
iv. ඇවිදීම
v. බෝට්ටු පැදීම
vi. සාම්ප්‍රදායික මසුන් ඇල්ලීම

නිදසුන් ලෙස දැක්විය හැක.

කුරුණෑගල නාගරික බල ප්‍රදේශයේ ඉහත අවශ්‍යතාවයන් සපුරාගත හැකි ස්ථාන ඉතා සීමිත අතර එම ස්ථාන පිළිබඳව විස්තර වගු අංක 6.11,6.12 සහ ඇමුණුම වගු අංක 6.13 යටතේ දක්වා ඇත.

වගු අංක 6.11 - කුරුණෑගල නාගරික බල ප්‍රදේශයේ සෘජු විනෝද පහසුකම්සපුරාගත හැකි ස්ථාන

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය :හෙක්.* |
|---|---|---|
| **1.** | ඉතා කුඩා උද්‍යාන<br>Pocket Parks(EPP) | 0.49 |
| **2.** | කුඩා උද්‍යාන<br>Mini Park (EMP) | 11 |
| **3.** | ප්‍රාදේශීය උද්‍යාන<br>Local Parks (ELP) | 5.92 |
| **4.** | රේඛීය උද්‍යාන<br>Linear Park (ELiP) | 2.12 |
| | **එකතුව** | **19.84** |

වගු අංක 01සඳහන් තොරතුරු වලට අනුව කුරුණෑගල නාගරික බල ප්‍රදේශය තුළ දැනට හෙක්ටයාර් 19.84 ක් විවෘත භූමි ලෙස ඇත. වර්තමාන ජනගහනය අනුව 180,399 සඳහා සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස හෙක්ටයාර් 180 ක් වෙන්ව තිබිය යුතුය. නමුත් වගු අංක 01 අනුව වර්තමාන ජනගහනයට ප්‍රමාණවත් පොදු එළිමහන් විවෘත භූමි කුරුණෑගල නාගරික බල ප්‍රදේශය තුළ නොමැති අතර දැනට පවතින ස්ථානවල ද පහසුකම් ප්‍රමාණවත් නොවේ.

වක්‍ර විනෝද පහසුකම් සලසාගත හැකි ස්ථාන පහත පරිදි වේ.

i. මහජන පුස්තකාල - 01
ii. සිනමා ශාලා - 03
iii. රැස්වීම් ශාලා - 03

| නම | ආසන සංඛ්‍යාව |
|---|---|
| අ.) නගර ශාලාව | 500 |
| ආ.) පළාත් සභා ශ්‍රවනාගාරය | 535 |
| ඇ.) තරුණ බෞද්ධ සංගම් ශාලාව | 400 |

## යෝජිත පොදු එළිමහන් විවෘත භූමි සැලැස්ම - 2030

2030 වන විට ජනගහනය 247,428 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ඉඩම් හෙක්ටයාර් 247 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය. කුරුණෑගල නාගරික බල ප්‍රදේශය සඳහා 2018 – 2030 වසර සඳහා සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් සැලැස්ම සඳහා වන විස්තර සිතියම් අංක 6.25 යටතේද වගු අංක 6.12 සහ ඇමුණුම් වගු අංක 6.13 මගින් ද දක්වා ඇත.

වගු අංක 6.12 - කුරුණෑගල නාගරික බල ප්‍රදේශය සඳහා 2018 – 2030 වසර සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබද අවකාශිය සැලැස්ම

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය :හෙක්.* |
|---|---|---|
| 01. | යෝජිත ඉතා කුඩා උද්‍යාන<br>Proposed Pocket Park (PPP) | 0.07 |
| 02. | යෝජිත ප්‍රජා උද්‍යාන<br>Proposed Community Park (PCP) | 4.5 |
| 03. | යෝජිත රේඛීය උද්‍යාන<br>Proposed Linear Park (PLiP) | 28.39 |
| 04. | යෝජිත වන උද්‍යාන<br>Proposed Forest Park | 415.11 |
| | එකතුව | 448.07 |
| 05. | පවතින පොදු එළිමහන් විවෘත භූමි ප්‍රමාණය | 19.84 |
| | සමස්ත එකතුව | 467.91 |

### 1. යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබද අවකාශිය සැලැස්ම සඳහා උපාය මාර්ග

- දැනට පවතින සියළුම ක්‍රීඩා බිම් සහ ක්‍රීඩා කලහැකි සහ පොදු විවෘත භූමි ලෙස පවතින හිස් ඉඩම් හැකිතාක් දුරට සෘජු විනෝද පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනිම, වර්ගීකරණය කිරීම හා ප්‍රතිසංවර්ධනය කිරීම.
- ප්‍රදේශයේ පවතින සියළු ක්‍රීඩාංගන පහසුකම් සහිතව ප්‍රතිසංවර්ධනය කිරීම.
- පවතින විවෘත භූමි සහ හිස් ඉඩම් පරිසර හිතකාමී ආකාරයට උද්‍යාන සහ ක්‍රීඩා පිටි ලෙස සංවර්ධනය කිරීම.
- විවෘත භූමි සම්බන්ධ නීති රෙගුලාසි බලාත්මක කිරීම මගින් අනවසර ඉදි කිරීම් පාලනය කිරීම.
- පවතින ක්‍රීඩාපිටි සහ උද්‍යාන වල නඩත්තු සහ කළමනාකරණ කටයුතු ඉහළ මට්ටමකට ගෙන ඒම.
- සමාජීය විනෝද කටයුතු පහසුකම් දෙශීය සහ විදේශීය සංචාරකයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි සංචාරක අවශ්‍යතා වලට ගැලපෙන ප්‍රමිතියෙන් යුතු ක්‍රීඩා සමාජ, නිවාඩු නිකේතන, බංගලා, සංචාරක හෝටල්, ස්ථාපිත කිරීම.


## 2. රේඛීය උද්‍යාන සංකල්පය ක්‍රියාත්මක කිරීම

ප්‍රදේශයේ පවතින වැව, ඇළ හා ඔය රක්ෂිතයන් රේඛීය උද්‍යාන ලෙස සංවර්ධනය කල යුතු අතරම එය ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය ප්‍රමාණවත් විනෝදාස්වාද කටයුතු සහ පහසුකම් සැලසීමට මෙන්ම ගංවතුර උවදුර පවතින ප්‍රදේශවල එය පාලනයට යොදා ගත හැකිය.

## 3. 2030 වන විට උෂ්ණත්වය අඩු කිරීම - ක්‍රමවේදය

- සියළුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි නිල හරිත ශ්‍රී ලංකා ජාතික ගොඩනැගිලි හරිතකරණය අනුව සිදු කිරීම.
- සියළුම කාර්යාල සහ නිවාස ඉදිකිරීමේදී වහල මත හරිත පියසි ඉදිකිරීම සහ හරිත පියසි තුල ජල විහිදුම් ක්‍රම ( Water sprinkler) භාවිතයට යොමු කිරීම.
- ගොඩනැගිලි වර්ණ ගැන්වීමේ දී ලා වර්ණ යෙදීම පිළිබඳව දැනුවත් කිරීම.
- යෝජිත සියළුම වාහන නැවතුම්හලවල් සඳහා හරිත නැවතුම් සංකල්පය හඳුන්වාදීම සහ පවතින වාහන නැවතුම්පලවල් හරිත නැවතුම්පලවල් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම
- බිම් ඇතුරුම් ක්‍රමය ජලය පොළවට උරාගන්නා ක්‍රම වේදයන්ට පමණක් සීමා කිරීම ( interlocking ) සහ ඒවා ද ලා වර්ණයන්ට පමණක් සීමාකිරීම.
- පවතින ක්‍රීඩාභූමි උද්‍යාන සහ විවෘත භූමි නඩත්තු කිරීම සහ යෝජිත විවෘත භූමි හරිත සංකල්පයන් මුලික කොට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

## සිතියම් අංක 6.25 යොජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම



# 6.6 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග

## 6.6.1 උපායමාර්ගික ව්‍යාපෘති

*වගු අංකය 6.14 ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛණය*

| ව්‍යාපෘති අංකය | ව්‍යාපෘති ප්‍රමුඛතා අගය | ව්‍යාපෘතිය | ව්‍යාපෘති කාලය |
|---|---|---|---|
| 1 | 4.2105 | බාහිර වට රවුම් මාර්ගය සංවර්ධනය කිරීම | මධ්‍ය කාලීන |
| 2 | 4.1754 | වඳුරුපිනු ඇල්ල ජලාශය ඉදිකිරීම සඳහා නල ජල යෝජනා ක්‍රමය පුළුල් කිරීම | දීර්ඝකාලීන |
| 3 | 3.8246 | පැරණි දුම්රිය ස්ථානය පිහිටි ඉඩමෙහි බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම | මධ්‍ය කාලීන |
| 4 | 3.7807 | ප්‍රාදේශීය අභ්‍යන්තර මාර්ග 15ක් පුළුල් කිරීම හා සංවර්ධනය කිරීම | මධ්‍ය කාලීන |
| 5 | 3.7456 | පොදු වාහන නැවතුම් ස්ථාන සංවර්ධනය කිරීම | කෙටිකාලීන |
| 6 | 3.7193 | මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රධාන මාර්ග පුළුල් කිරීම | මධ්‍ය කාලීන |
| 7 | 3.6754 | රජපිහිල්ල උද්‍යානය ප්‍රතිසංවර්ධනය කිරීම | කෙටිකාලීන |
| 8 | 3.6667 | මිහිඳු මාවත නගර මධ්‍යය වාණිජ කාර්යාල හා නේවාසික සංකීර්ණ සංවර්ධන ව්‍යාපෘතිය | දීර්ඝකාලීන |
| 9 | 3.6228 | පැරණි රජපිහිල්ල තානායම කාමර 50 ක හෝටලයක් ලෙස සංවර්ධනය කිරීම | මධ්‍ය කාලීන |
| 10 | 3.5702 | උසාවිය, බන්ධනාගාරය, නඩුකාර නිල නිවාස, නීතිඥ කාර්යාල සංකීර්ණය ගැට්ටුවාන යෝජිත උසාවි සංකීර්ණ භූමියෙහි ප්‍රතිස්ථාපනය කිරීම | දීර්ඝකාලීන |
| 11 | 3.5614 | නගර මධ්‍යයේ පොදු වෙළඳපල සංවර්ධනය කිරීම | මධ්‍ය කාලීන |
| 12 | 3.5614 | මාර්ග සංවර්ධන අධිකාරී අභ්‍යන්තර වටරවුම් මාර්ගය (B 0084) පුළුල් කිරීම | මධ්‍ය කාලීන |
| 13 | 3.4737 | ප්‍රවාහන ද්වාරය- ගැට්ටුවාන බහු මාධ්‍යය ප්‍රවාහන මධ්‍යස්ථානයේ සිට නගර මධ්‍යයේ ප්‍රධාන බස් නැවතුම්පල දක්වා කටුගස්තොට - පුත්තලම මාර්ගය (A010) මංතීරු 6ක මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම | මධ්‍ය කාලීන |
| 14 | 3.4649 | නිවාස සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම් (නිවාස සංවර්ධන සැලැස්ම බලන්න) | මධ්‍ය කාලීන |
| 15 | 3.4561 | පැරණි උසාවි භූමිය සාප්පු සංකීර්ණයයක් ලෙස සංවර්ධනය කිරීම | මධ්‍ය කාලීන |
| 16 | 3.4561 | පෞද්ගලික බස්රථ සඳහා රැඳවුම් ස්ථාන සංවර්ධනය කිරීම | කෙටිකාලීන |
| 17 | 3.4299 | දොරටියාව මාර්ගයේ තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | දීර්ඝකාලීන |
| 18 | 3.4211 | වෙලගෙදර ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම | දීර්ඝකාලීන |
| 19 | 3.4035 | මල්කඩුවාව තොරතුරු තාක්ෂණ ගම්මානය ඉදිකිරීම | දීර්ඝකාලීන |


| | | | |
|---|---|---|---|
| | | සඳහා ඉඩම් අත්පත් කරගැනීම සහ ඉඩම් සංවර්ධනය කිරීම | |
| 20 | 3.4035 | වර්තමාන පොල භූමියෙහි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | මධ්‍ය කාලීන |
| 21 | 3.2982 | විල්ගොඩ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ව්‍යාපෘතිය | මධ්‍ය කාලීන |
| 22 | 3.2456 | ඇවිදියහැකි පදික මංතීරු සකස් කිරීමේ ව්‍යාපෘතිය | කෙටිකාලීන |
| 23 | 3.2193 | අප ජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය අධි නාගරික කලාපය අර්ධ නාගරික කලාපය ආවරණය වන පරිදි පුලුල් කිරීම | දීර්ඝකාලීන |
| 24 | 3.2105 | විල්ගොඩ නගර සභා ඉඩමෙහි පොල ප්‍රතිස්ථාපනය කිරීම | කෙටිකාලීන |
| 25 | 3.2105 | විල්ගොඩ සොරව්ව ප්‍රතිසංවර්ධනය කිරීම | කෙටිකාලීන |
| 26 | 3.1842 | පොලීසිය හා පොලිස් නිල නිවාස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය පිහිටි ඉඩමෙහි ප්‍රතිස්ථාපනය කිරීම | මධ්‍ය කාලීන |
| 27 | 3.1842 | රෝහලට යාබද සිරිසර කුඹුරු යායෙහි ඇවිදින මංතීරු සංවර්ධනය | කෙටිකාලීන |
| 28 | 3.1842 | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය පිහිටි ඉඩමෙහි බස් නැවතුම්පල (Bus Halt) හා කුඩා උද්‍යානයක් ඉදිකිරීම | කෙටිකාලීන |
| 29 | 3.1053 | හෙරලියාවල කර්මාන්තපුරය සංවර්ධනය කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම | මධ්‍ය කාලීන |
| 30 | 3.1053 | උඩවල්පොල ක්‍රීඩා පිටිය සංවර්ධනය | මධ්‍ය කාලීන |
| 31 | 3.0877 | පවතින පාසල්වල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති (අධ්‍යාපන පහසුකම් සැලැස්ම අනුව) | මධ්‍ය කාලීන |
| 32 | 3.0702 | නගර සභාව සතු රජපිහිල්ල පෞද්ගලික බස් නැවතුම් ස්ථානයේ උපකාරක පන්ති මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | කෙටිකාලීන |
| 33 | 3.0439 | කුරුණෑගල වැව්පිලි සමාගමට අයත් බඩගමුව පිහිටි ඉඩමෙහි අක් 10ක් තරුපන්තියේ හෝටලයක් ලෙස සංවර්ධනය කිරීම | දීර්ඝකාලීන |
| 34 | 3.0175 | සාරගම වැව ආශ්‍රිතව භූමි අලංකරණ ව්‍යාපෘතිය | කෙටිකාලීන |
| 35 | 2.9912 | නයිලිය භාණ්ඩ ප්‍රවර්ධන මධස්ථානය ස්ථාපිත කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම සහ ඉඩම් සංවර්ධනය කිරීම | දීර්ඝකාලීන |
| 36 | 2.9298 | මුත්තෙට්ටුගල ගුවන් පාලම ඉදිකිරීම | මධ්‍ය කාලීන |
| 37 | 2.7982 | මාලිගාව භූමිය ආශ්‍රිතව උද්‍යාන සංවර්ධනය | මධ්‍ය කාලීන |
| 38 | 2.7456 | වැල්ලව හා මුත්තෙට්ටුගල දුම්රිය ස්ථානයෙහි භූමි අලංකරණ ව්‍යාපෘති | කෙටිකාලීන |

# ව්‍යාපෘතිය 01 විකල්ප මාර්ග සංවර්ධනය (බාහිර වටරවුම් මාර්ගය)

- ව්‍යාපෘති යෝජනාව

කොළඹ පාර, පුත්තලම් පාර, නුවර පාර ,දඹුල්ල මාර්ගය , මීගමුව මාර්ගය යන ප්‍රධාන මාර්ග නගරයට පිටතින් එකිනෙක සම්බන්ධ කරමින් බාහිර විකල්ප මාර්ගයක් සංවර්ධනය කිරීම.

- ව්‍යාපෘති සැලැස්ම



| | ආරම්භ වන සහ අවසාන වන ස්ථානය | මුළු දිග (කි.මි) | නව ඉදිකිරීම් දිග (කි.මි) | යෝජිත පළල (මීටර්) | පිරිවැය මිලියන |
|---|---|---|---|---|---|
| 1 | වදුරාගල සිට ගැට්ටුවාන ( අදියර 01) | 3.33 | 2.15 | 24 (මංතීරු 4) | 300 |
| 2 | සාරගම සිට වදුරාගල ( අදියර02 ) | 6.94 | 2.62 | 12 (මංතීරු 2) | 400 |
| 3 | මල්ලවපිටිය සිට යග්ගපිටිය ( අදියර 02 ) | 4.64 | - | 15 (මංතීරු 2) | 400 |
| 4 | විල්බාව සිට මල්ලවපිටිය ( අදියර 03 ) | 4.81 | 1.05 | 12 (මංතීරු 2) | 250 |
| 5 | යග්ගපිටිය සිට සාරගම ( අදියර 03 ) | 7.7 | - | 12 (මංතීරු 2) | 300 |

- **යාබද ඉඩම් භාවිතා**

  මිශ්‍ර සංවර්ධන (කුඹුරු හා ගෙවතු වලින් සමන්විත ප්‍රදේශ ද පවතී)

- **ව්‍යාපෘති අරමුණ**
  - නගර මධ්‍යයේ ඇතිවන වාහන තදබදය අවම කිරීම
  - අධිවේගී මාර්ග සංවර්ධනයත් සමඟ A006 හා A010 මාර්ගවල (දඹොක්ක හා ගැට්ටුවාන) අන්තර් හුවමාරු මධ්‍යස්ථාන හේතුකොට ගෙන සිදුවන වාහන තදබදය අවම කර වටරවුම් මාර්ග හරහා වාහන බෙදා හැරීම.
  - නගර මධ්‍යය පසුකර යන නගරාන්තර ගමනාගමනය පහසු කිරීම.
  - සංවර්ධනය ප්‍රසාරණය කිරීම.

- **ව්‍යාපෘති තාර්කිකත්වය**

  කුරුණෑගල නගර මධ්‍යයේදී ප්‍රධාන මාර්ග 05ක් එකිනෙක හමුවේ. ඒ අනුව දුර ගමන් සේවා බස් රථ ප්‍රවාහන , ලොරිරථ යනාදිය නගරය මගහැර යාමට විකල්ප මාර්ගයන් නොමැති වීම නිසා නගර මධ්‍යයට පැමිණීම අනවශ්‍ය වාහන ද නගර මධ්‍යයට පැමිණේ. එබැවින් නගරයේ කාර්ය බහුල අවස්ථාවලදි දැඩි වාහන තදබදයක් පවතී. එය වලක්වාලීම සඳහා මෙම ප්‍රධාන මාර්ග නගරයට බාහිරින් සම්බන්ධ කරමින් මෙම විකල්ප මාර්ගය යෝජනා කර ඇති අතර නගරය පසුකර යාමට හැකිවන පරිදි විකල්ප මාර්ග ඇති බැවින් රියදුරන් හට තදබදය අඩු මාර්ග තෝරාගත හැක. නගරය වටා පුළුල් ප්‍රවේශකත්වයක් ඇති කිරීම මගින් නගරය තුලට ඇදී එන ආයෝජනා අවස්ථාවන් වැඩි කළ හැක. නාගරික සංවර්ධනයේ පළමු පියවර මෙය වේ.

- **වර්තමාන ඉඩම් හිමිකම**

  පුද්ගලික හා රාජ්‍ය ඉඩම්

- **ව්‍යාපෘති කාලය**

  මධ්‍ය කාලීන

- **මුළු ඇස්තමේන්තුගත පිරිවැය**

  රු.මි 1650

- **මූල්‍ය ක්‍රමය**

  මාර්ග සංවර්ධන අධිකාරිය , - අධිවේගී මාර්ග ව්‍යාපෘතිය පලාත් පාලන ආයතනය

- **වර්තමාන තත්ත්වය**

  වඳුරාගල සිට ගැට්ටුවාන දක්වා මාර්ග සඳහා දැනටමත් මිනින්දෝරු සැලසුම් සකස් කර මාර්ග සංවර්ධන අධිකාරියේ ඉදිකිරිම් කටයුතු කිරීමට නියමිතය.

- **යෝජිත සැලැස්ම හා ගොඩනැගිලි සැලසුම් අවශ්‍යතා**

  මිනින්දෝරු සැලසුම්, ඉඩම් ගොඩ කිරිමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථාවේ ජලාපවහන සැලසුම්

  ව්‍යාපෘති කටයුතු ව්‍යාපෘතිය සැලැසුම් කිරිම, ඉඩම් අත්පත් කර ගැනීම , මාර්ග සංවර්ධනය කිරිම.

- **නිර්දේශිත ආයතන**

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized person ) |
|---|---|---|
| **ව්‍යාපෘතිය සැලැසුම් කිරිම, ඉඩම් අත්පත් කර ගැනිම** | මාර්ග සංවර්ධන අධිකාරිය<br>නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (වයඹ) |
| **මාර්ග සංවර්ධනය කිරිම.** | මාර්ග සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (පලාත්) |

රෙගුලාසි සහ මාර්ගෝපදේශ කුඹුරු යනාදිය ගොඩකර මාර්ග සංවර්ධනය කිරිමේදී ජලාපවහන සැලැස්මට අනුකුලව සිදුකල යුතුය.

## ව්‍යාපෘතිය 02

### වඳුරු පීනු ඇල්ල ජලාශය ඉදිකර නල ජල යෝජනා ක්‍රමය පුළුල් කිරීම.

2030 වර්ෂය සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් යෝජිත ව්‍යාපෘතියකි.

- ව්‍යාපෘති විස්තරය
  මෙම සැලැස්ම තුලින් හඳුන්වාදෙන ලද විසල් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මෙන්ම 250,000 නේවාසික ජනගහනයකට අවශ්‍ය කරන නල ජල සැපයුම ලබාදීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.


## ව්‍යාපෘතිය 03

### යෝජිත බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය

- ව්‍යාපෘති යෝජනාව
  වර්තමාන දුම්රිය ස්ථානය පිහිටි භූමිය යෝජිත බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම

- ප්‍රවේශය
  කටුගස්තොට - පුත්තලම මාර්ගය , දකුණු රවුම් පාර (ගැට්ටුවාන) , අධිවේගී මාර්ග අන්තර් හුවමාරුව

- ව්‍යාපෘති සිතියම



- **යාබද ඉඩම් භාවිත**

  මෙම ඉඩම ආසන්නයේ ගැට්ටුවාන අධිවේගී මාර්ග අන්තර් හුවමාරුව පිහිටා ඇත.දුම්රිය ස්ථානය හා තරමක් සංවර්ධනය වූ වටපිටාවක් දැකිය හැකිය.

- ව්‍යාපෘති අරමුණු
  - නගරය තුල ගමනාගමන කේන්ද්‍රය ස්ථාපිත කිරීම.
  - බහු ප්‍රවාහන මාධ්‍යය ඒකාබද්ධ කිරිම තුලින් කුරුණෑගල නගරය කාර්යක්‍ෂම ප්‍රවාහන මධ්‍යස්ථානයක් බවට පත් කිරිම.
  - වර්තමානයේ දුම්රිය ස්ථානය හා බස් නැවතුම්පොල අතර ඒකාබද්ධතාවයක් නොමැති ගැටළුව අවම කිරීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

  මාර්ග , අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග යන බහු ප්‍රවාහන මාධ්‍යය ඒකාබද්ධ කරමින් ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරිම තුලින් කාර්යක්‍ෂම හා පහසු ප්‍රවේශකත්වය ඇති කිරිමේ හැකියාව ඇති අතර ඒ තුලින් ඉහල සංසරණ ජනගහනයක් හා නේවාසික ජනගහනයක නගරය තුලට ආකර්ෂණය කරගැනීමට හැකියාව ඇත. එම ජනගහනය සඳහා නගරය තුලින් ලබාදෙන සේවාවන් පුළුල් කිරීම තුලින් නගරයේ ආර්ථිකය ඉහල නැංවිය හැකිය.

- හිමිකම පිළිබඳ විස්තර

  දුම්රිය දෙපාර්තමේන්තුව, සමුපකාර දෙපාර්තමේන්තුව, අනවසර පදිංචිකරුවන්, පුද්ගලික ඉඩම්.

- ව්‍යාපෘති කාලය - මධ්‍ය කාලීනව.

- මූල්‍ය ක්‍රමය

  නාගරික සංවර්ධන අධිකාරිය, අධිවේගි මාර්ග ව්‍යාපෘතිය, මහා මාර්ග අමාත්‍යාංශය, දුම්රිය දෙපාර්තමේන්තුව, විදේශ ණය, පුද්ගලික ආයෝජන.

- ක්‍රියාත්මක කරන ක්‍රම වේදය : රාජ්‍ය හා පෞද්ගලික හවුල (ppp)

- ව්‍යාපෘති විස්තරය

  වර්තමාන දුම්රිය ස්ථානය පිහිටි භූමිය, ඊට යාබදව ඇති සමුපකාර දෙපාර්තමේන්තුවට අයත් ඉඩම, පුද්ගලික ඉඩම සහ අනවසර පදිංචිකරුවන් සිටින ඉඩම ප්‍රසස්ථ ලෙස භාවිතා කර, බස් නැවතුම්පල , වාහන නැවතුම් ස්ථාන, වාණිජ ස්ථාන , අධිවේගී මාර්ග, බස්රථ නැවතුම් ස්ථාන ඇතුලත්ව සංවර්ධනය කිරීම. දුම්රිය නිල නිවාස, මහල් නිවාස සංකිර්ණයක් වෙත ප්‍රතිස්ථාපනය කිරිමට යෝජිතය.

- පවතින යටිතල පහසුකම් - ජලය, විදුලිය

- වර්තමාන තත්වය

  දුම්රිය ස්ථානය, ගබඩා , දුම්රිය සේවක නිල නිවාස , සමුපකාර ගබඩා හා අනවසර නිවාස පිහිටා ඇත.

- සංකල්පිත සැලැස්ම



- ව්‍යාපෘති කටයුතු

  - බස්නැවතුම්පල, පොදු වාහන නැවතුම් ස්ථාන ඉදිකිරිම
  - දුම්රිය නිල නිවාස ප්‍රතිස්ථාපනය
  - භූ අලංකරණ කටයුතු
  - එයට අනුශාංගික ඉදිකිරිම් කටයුතු (වාණීජ, බැංකු)

- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person) |
|---|---|---|
| **ඉඩම් අත්පත් කර ගැනිම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම් ) |
| **බස් නැවතුම්පල හා වාහන නැවතුම් ස්ථාන ඉදිකිරිම** | නාගරික සංවර්ධන අධිකාරිය<br>ප්‍රවාහන අමාත්‍යාංශය<br>මාර්ග සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (වයඔ)<br><br>ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය<br>අධ්‍යක්ෂ (වයඔ) |
| **දුම්රිය නිල නිවාස ඉදිකිරිම.** | දුම්රිය දෙපාර්තමේන්තුව | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ

  ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය


# ව්‍යාපෘති 04

## ප්‍රාදේශීය අභ්‍යන්තර මාර්ග පුළුල් කිරිම.

- ව්‍යාපෘති යෝජනාව

නගරයේ අභ්‍යන්තර ප්‍රදේශවල තෝරා ගත් මාර්ග 15ක් පුළුල් කර සංවර්ධනය කිරිම.

- ව්‍යාපෘති සැලැස්ම - සංවර්ධනය කිරීම සඳහා හඳුනාගත් මාර්ග




- මාර්ග ලේඛනය

| | ආරම්භය සහ අවසාන ස්ථානය | දුර (කි.මි) | යෝජිත පළල (මීටර්) | ක්‍රියාත්මක කරන ආයතනය |
|---|---|---|---|---|
| 1 | කවුඩාවත්ත හන්දියේ සිට අලකොළදෙණිය දක්වා මාර්ගය | 3.25 | 9 | පළාත්මාර්ග සංවර්ධන අධිකාරිය |
| 2 | විල්ගොඩ හන්දියේ සිට යෝජිත විකල්ප මාර්ගය දක්වා විල්ගොඩ වත්ත පාර | 1.2 නව ඉදිකිරීම 2.5 | 9 | ප්‍රාදේශීය සභාව කුරුණෑගල |
| 3 | විල්ගොඩ හන්දියේ සිට පුත්තලම් පාර දක්වා සුමංගල මාවත | .8 | 12 | කුරුණෑගල නගර සභාව |
| 4 | හෙරලියාවල පාර - 3 වන පටුමග | 1.2 | 9 | ප්‍රාදේශීය සභාව කුරුණෑගල |
| 5 | බණ්ඩාරනායක මාවත | 1 | 9 | ප්‍රාදේශීය සභාව කුරුණෑගල |
| 6 | පුබුදු මාවත | 0.7 | 12 | කුරුණෑගල නගර සභාව |

| | | | | |
|---|---|---|---|---|
| 7 | මල්කඩුවාව වටරවුම් මාර්ගය | 0.8 | 15 | කුරුණෑගල නගර සභාව |
| 8 | කන්ද උඩවත්ත පාර | 1.1 | 12 | කුරුණෑගල නගර සභාව |
| 9 | මුලික රෝහල පිහිටි ස්ථානයේ සිට ගැට්ටුවාන යෝජිත විකල්ප මාර්ගය දක්වා ජයන්තිපුර විල්බාව පාර | 1.03 (නව ඉදිකිරීම් 0.56) | 9 | කුරුණෑගල නගර සභාව / ප්‍රාදේශීය සභාව (අත්පත් කර ගැනීම් නාගරික සංවර්ධන අධිකාරිය) |
| 10 | සර්වෝදය මාවත | 0.6 | 9 | කුරුණෑගල නගර සභාව |
| 11 | සුමනදාස මාවත | 0.5 | 9 | කුරුණෑගල නගර සභාව |
| 12 | හේනමුල්ල පාර | 2.1 | 12 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| 13 | අලකොළදෙණිය | 2.6 | 9 | ප්‍රාදේශීය සභාව කුරුණෑගල |
| 14 | කුඩා ගල්ගමුව | 1.3 | 12 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| 15 | සුන්දරාපොළ පාර | 1.5 | 9 | ප්‍රාදේශීය සභාව කුරුණෑගල |
| 16 | වැව රවුම් පාර | 3.3 | 12 | මාර්ග සංවර්ධන අධිකාරිය |

- **යාබද ඉඩම් භාවිතා** : මිශ්‍ර සංවර්ධන

- **ව්‍යාපෘති අරමුණ**

  - නගරයේ අභ්‍යන්තර ප්‍රදේශ වල නේවාසික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
  - ප්‍රධාන මාර්ග දෙපස පවත්නා සංවර්ධනය අභ්‍යන්තර ප්‍රදේශවලට ව්‍යාප්ත කර නාගරික ප්‍රදේශය පුළුල් කිරීම.
  - ප්‍රධාන මාර්ග හා අභ්‍යන්තර මාර්ග අතර මනා සම්බන්ධතාවයක් ඇති කිරීම.

- **ව්‍යාපෘති තාර්කිකත්වය**

නගරයේ අභ්‍යන්තර ප්‍රදේශවල පටු මාර්ග, භෞතිකව සංවර්ධනය නොවූ මාර්ග, එකිනෙක සම්බන්ධ නොවූ මාර්ග පුළුල් කර සංවර්ධනය කිරිම තුළින් එම මාර්ග අතර ඇතිවන ගමන් වාර ගණන ඉහල දැමිය හැකිය. ඒ තුලින් මාර්ග දෙපස සිදුවන සංවර්ධනය අභ්‍යන්තර ප්‍රදේශවලට ව්‍යාප්ත කර නාගරික ප්‍රදේශය පුළුල් කිරිමේ හැකියාව ඇත. රැකියා කරන ජනතාවට නගර මධ්‍යයෙන් පරිභාහිරව නේවාසික ඉඩම් වලට මනා ප්‍රවේශකත්වයක් ඇති කිරීම තුලින් නේවාසික ජනගහනය ඉහල නැංවිය හැකිය.

- **ව්‍යාපෘති කාලය** : මධ්‍ය කාලීන

- **මූල්‍ය ක්‍රමය** : මහ නගර සභාව , ප්‍රාදේශීය සභාව
  පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

මාර්ග සංවර්ධන අධිකාරිය

- වර්තමාන ඉඩම් හිමිකම : පුද්ගලික හා රාජ්‍ය ඉඩම්

- යෝජිත සැලැස්ම සඳහා ගොඩනැගිලි සැලසුම් අවශ්‍යතා

මිනින්දෝරු සැලසුම්, ඉඩම් ගොඩකිරිමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථාවේ ජලාපවහන සැලසුම්

- ව්‍යාපෘති කටයුතු : ව්‍යාපෘතිය සැලැසුම් කිරිම, ඉඩම් අත්පත් කර ගැනීම , මාර්ග සංවර්ධනය

- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized person) |
|---|---|---|
| **ව්‍යාපෘතිය සැලැසුම් කිරීම** | මාර්ග සංවර්ධන අධිකාරිය | පළාත් අධ්‍යක්ෂ (වයඹ) |
| **ඉඩම් අත්පත් කර ගැනිම** | මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>කුරුණෑගල නගර සභාව<br>කුරුණෑගල ප්‍රාදේශීය සභාව | අධ්‍යක්ෂ (වයඹ)<br>නගරාධිපති / නාගරික කොමසාරිස්<br>සභාපති/ ලේකම් |
| **මාර්ග සංවර්ධනය කිරිම** | මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>කුරුණෑගල නගර සභාව<br>කුරුණෑගල ප්‍රාදේශීය සභාව | අධ්‍යක්ෂ (වයඹ)<br>නගරාධිපති / නාගරික කොමසාරිස්<br>සභාපති/ ලේකම් |


# ව්‍යාපෘතිය 05

## පොදු වාහන නැවතුම් ස්ථාන සංවර්ධනය කිරිම.

- ව්‍යාපෘති යෝජනාව :

  පොදු වාහන නැවතුම් හා පෞද්ගලික බස් රථ රැඳවුම් ස්ථාන සංවර්ධනය සඳහා හඳුනා ගන්නා ලද ඉඩම්

- ව්‍යාපෘති සැලැස්ම



යෝජිත රිය ගාල් සැලැස්ම (2030) - කුරුණෑගල ප්‍රා.ස.

වයඹ පළාත
නාගරික සංවර්ධන අධිකාරිය
2018

ව . ප - සැලසුම් අංශය | කුරුණෑගල සංවර්ධන සැලැස්ම ( 2018-2030 ) | සකස් කලේ : ඊ .එම් .පී .කේ . ඒකනායක

- **පෞද්ගලික රථ නැවතුම් සඳහා යෝජිත ස්ථාන**

| ස්ථානය | ඉඩමේ ප්‍රමාණය( අක්කර) | වාහන නැවතුම් සංඛ්‍යාව |
|---|---|---|
| නගර මධ්‍යය වාහන නැවතුම් සංකීර්ණය( මිහිඳු මාවත ) | 1 | 400 |
| පොදු වෙළඳ පොළ භූමිය | 1 | 100 |
| බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය ආශ්‍රිත නැවතුම් ස්ථාන | 1 | 300 |
| උඩවල්පොල | 1 | 100 |
| නුවර පාර( විනිසුරු බංගලාව) | 1 | 100 |
| කදුරුගස් හන්දිය | 0.5 | 50 |
| නාවින්න රෝහල ඉදිරිපිට | 0.5 | 50 |
| මහා රෝහල ඉදිරිපිට | 0.5 | 50 |
| පුවක්ගස් හන්දිය ප්‍රා.ලේ.කා ඉදිරිපිට (ඇත්කඳ විහාරය සතු ඉඩම) | 1 | 100 |
| චතුරශ්‍ර මාවත යෝජිත වාහන නැවතුම්පල | 0.6 | 60 |
| කොළඹ පාර මලියදේව බාලිකාව ඉදිරිපිට පුරන් වූ කුඹුර | 1 | 100 |

- අරමුණු

අධි ඝනත්ව වාණිජ සංවර්ධනයට අවශ්‍ය වාහන නැවතුම් ස්ථාන ලබාදීම තුලින් මාර්ග තදබදය අවම කිරීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

අධි ඝනත්ව වාණිජ සංවර්ධනයට අවශ්‍ය වාහන නැවතුම් ස්ථාන ලබාදීම තුලින් නගර මධ්‍යයේ මාර්ග දෙපස වාහන නවතා තැබීම නිසා ඇතිවන මාර්ග තදබදය අවම කර කාර්යක්ෂම නගරයක් බවට පත් කිරීම.

- ක්‍රියාත්මක කරන ආයතන

මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය , පෞද්ගලික ආයෝජකයින්

- හිමිකම පිළිබඳ විස්තර : රාජ්‍ය හා පුද්ගලික ඉඩම්.

- ව්‍යාපෘති කාලය : කෙටි කාලීන

- මූලාශ්‍ර ක්‍රමය : මහා භාණ්ඩාගාරය, නාගරික සංවර්ධන අධිකාරිය, මහ නගර සභාව , පුද්ගලික ආයෝජන

- ක්‍රියාත්මක කරන ක්‍රමවේදය : රාජ්‍ය හා පෞද්ගලික හවුල (ppp)

- වර්තමාන තත්වය : මිශ්‍ර සංවර්ධනයන්

- යෝජිත සැලැස්ම සඳහා ගොඩනැගිලි සැලසුම් අවශ්‍යතා

  ගොඩනැගිලි සැලසුම් ,මිනින්දෝරු සැලසුම්, ඉඩම් ගොඩකිරිමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථාවේ ජලාපවහන සැලසුම්

- ව්‍යාපෘති කටයුතු : පොදු වාහන නැවතුම් ස්ථාන ඉදිකිරිම

- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person) |
|---|---|---|
| **ඉඩම් අත්පත් කර ගැනිම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම් ) |
| **පොදු වාහන නැවතුම් ස්ථාන ඉදිකිරීම** | නාගරික සංවර්ධන අධිකාරිය<br>මහ නගර සභාව | අධ්‍යක්ෂ (ඉඩම් )<br>නගරාධිපති / නාගරික කොමසාරිස් |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ

කුඹුරු යනාදිය ගොඩකර වාහන නැවතුම් සංවර්ධනය කිරිමේදී ජලාපවහන සැලැස්මට අනුකූලව සිදුකල යුතුය.


# ව්‍යාපෘති 06

## යෝජිත ප්‍රධාන මාර්ග පුළුල් කිරිම - මාර්ග සංවර්ධන අධිකාරිය

- ව්‍යාපෘති යෝජනාව

නගරයේ වාහන තදබදය අවම කිරිම සඳහා ප්‍රධාන මාර්ග වල හඳුනාගත් ස්ථාන දක්වා මංතිරු 04ක මාර්ග ලෙස සංවර්ධනය කිරිම.

- ව්‍යාපෘති සැලැස්ම : පුළුල් කිරිම සඳහා හඳුනාගත් මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග




| | මාර්ගයේ නම | ආරම්භ සහ අවසාන ස්ථානය | පුළුල් කල යුතු දුර (කි.මී) | යෝජිත පළල (මීටර්) |
|---|---|---|---|---|
| 1 | B 247<br>කුරුණෑගල සිට මීගමුව මාර්ගය | කුරුණෑගල සිට ගෙපල්ලව දක්වා | 5.27 | 24 |
| 2 | A006 අඹේපුස්ස - කුරුණෑගල ත්‍රිකුණාමලය මාර්ගය | රෙග්ලන්ඩ් වත්ත සිට වැහැර දක්වා<br>පොල්අත්තාපිටිය සිට බඩගමුව දක්වා | 3.5<br>2.93 | 24<br>24 |
| 3 | A006 කටුගස්තොට - කුරුණෑගල පුත්තලම මාර්ගය | මල්ලවපිටිය හන්දියේ සිට කුරුණෑගල නගරය හරහා තිත්තවැල්ල දක්වා | 07 | 24 |

- ව්‍යාපෘති අරමුණ

පවතින නගර මධ්‍යය ආශ්‍රිතව වර්තමානයේ පවතින වාහන තදබදය හා අධිවේගී මාර්ගයේ බලපෑම හේතුවෙන් ඇති වන වාහන තදබදය අවම කිරීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

කුරුණෑගල නගරය ජාතික වශයෙන් මංසන්ධි නගරයක් ලෙස ක්‍රියාකරන අතර, එවැනි නගරයක මාර්ග පද්ධතිය මනා ලෙස පුළුල් වී තිබිය යුතුය. වර්තමානය වන විට මාර්ගවල නිර්මාණය කරන ලද වාහන ධාරිතාවය (Design Capacity)ඉක්මවා යාම නිසා මාර්ග වල සේවා මට්ටම ඉක්මවා යමින් පවතී (Exceed the level of service ). එබැවින් මහා මාර්ග, අවශ්‍යතාවය අනුව පුළුල් කළ යුතුය.

- ක්‍රියාත්මක කරන ආයතන - මාර්ග සංවර්ධන අධිකාරිය

- හිමිකම පිළිබඳ විස්තර - රාජ්‍ය හා පුද්ගලික ඉඩම්.

- ව්‍යාපෘති කාලය - මධ්‍ය කාලීනව

- මූල්‍ය ක්‍රමය - මාර්ග සංවර්ධන අධිකාරිය

- වර්තමාන තත්වය - මිශ්‍ර සංවර්ධනයන්

- ව්‍යාපෘති කටයුතු - හඳුනාගත් මාර්ග මංතීරු 4ක අවම මීටර් 24 පුළුල් මාර්ග ලෙස සංවර්ධනය කිරීම

- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා:Authorized person ) |
|---|---|---|
| **ඉඩම් අත්පත් කර ගැනීම** | මාර්ග සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (වයඹ) |
| **මාර්ග සංවර්ධනය කිරිම** | මාර්ග සංවර්ධන අධිකාරිය | |


# ව්‍යාපෘති 07 රජපිහිල්ල උද්‍යානය ප්‍රතිසංවර්ධනය

- ව්‍යාපෘති යෝජනාව
  වර්තමාන රජපිහිල්ල උද්‍යානය නවීන පහසුකම් සහිතව සංවර්ධනය කර නගර මධ්‍යයට විවෘත කිරීම
- ප්‍රවේශය - කුමාරතුංග මාවත, තානායම් පාර

- ව්‍යාපෘති ස්ථානය

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රික්කය ( District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | | |
| මායිම් (Boundary) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | නීතිඥ කාර්යාල සංකීර්ණ | රජපිල්ල තානායම | තරුණ බෞද්ධ සංගමය | කුමාරතුංග මාවත |

- ව්‍යාපෘති සැලැස්ම



- **ව්‍යාපෘති අරමුණ**

  - නගර මධ්‍යයේ පොදු විවේක හා විනෝද පහසුකම් සඳහා ඉඩකඩ ලබාදීම.
  - නේවාසික හා දෛනික සංසරණ ජනගහනය සඳහා කුරුණෑගල නගරය ප්‍රියජනක ස්ථානයක් බවට පත් කිරිම.
  - නගරයේ සැඟවුණු අංග, නගරයේ අනන්‍යතාවය ආරක්‍ෂා වන පරිදි නගර මධ්‍ය වෙත විවෘත කිරීම.

- **ව්‍යාපෘති තාර්කිකත්වය**

වර්තමානයේ රජපිහිල්ල උද්‍යානය භාවිත තත්වයේ නොමැත. නිසි ලෙස කළමණාකරනයක් නොමැතිව නගර මධ්‍යයේ ඉහල වටිනාකමක් ඇති භූමියක් හුදෙකලා ස්ථානයක් බවට පත් වී ඇත. මෙම ස්ථානය ඔරලෝසු කණුව, රජපිහිල්ල තානායම, දෙපස මාර්ග සමඟ ඒකාබද්ධව සංවර්ධනය කිරිම සඳහා හඳුනාගෙන ඇත. ඒ අනුව නගර මධ්‍යයේ පහසුවෙන් ලඟාවිය හැකි පොදු විවේක පහසුකම් ලබාදීම තුලින් නගරය කෙරෙහි මහජනතාවගේ ආකර්ෂණය වැඩි කරගැනීම හා යහපත් මානසික මට්ටමක් පවත්වාගත හැක.

- **ව්‍යාපෘති විස්තරය** - උද්‍යානයට අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් සහිතව ප්‍රතිසංවර්ධනය කිරිම.

- **හිමිකම පිළිබඳ විස්තර** - කුරුණෑගල මහා නගර සභාව

- **ව්‍යාපෘති කාලය** - කෙටි කාලීන

- **මූල්‍ය ක්‍රමය** - මහා භාණ්ඩාගාරය , මහ නගර සභාව.

- **වර්තමාන තත්වය** - අව භාවිතයේ පවතින උද්‍යානය

- **නිර්දේශිත ආයතන**

| කටයුතු (Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized person ) |
|---|---|---|
| උද්‍යානය නිර්මාණය කිරිම | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (වයඹ) |
| උද්‍යානය සංවර්ධනය කටයුතු | මහ නගර සභාව | නගරාධිපති / නාගරික කොමසාරිස් |

- **රෙගුලාසි සහ මාර්ගෝපදේශ** :

ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

# ව්‍යාපෘති 08

## නගර මධ්‍යය ප්‍රති සංවර්ධනය (වාණිජ, කාර්යාල හා නේවාසික සංකීර්ණ ව්‍යාපෘතිය)

- ව්‍යාපෘති යෝජනාව

දැනට නගර මධ්‍යයෙහි රජයේ කාර්යාල පිහිටි අව සංවර්ධනයෙන් යුතු ඉඩම්, වාණිජ, කාර්යාල හා නේවාසික භාවිත සහිත ගොඩනැගිලි සංකීර්ණක් ලෙස සංවර්ධනය කිරීම

- ප්‍රවේශ

පුත්තලම් පාර, මිහිදු මාවත හා කොළඹ පාරෙන් ප්‍රවේශ විය හැක

- ව්‍යාපෘති ස්ථානය

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රිකය ( District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | | |
| මායිම් (Boundary) | උතුර :(North ) | නැගෙනහිර :(East) | දකුණ (South) | බටහිර (West ) |
| | පුත්තලම් පාර | කොළඹ පාර | කනයාරාම මාවත | මිහිදු මාවත |




- යාබද ඉඩම් භාවිතයන් : කුරුණෑගල ප්‍රධාන බස්නැවතුම්පල ඉදිරිපිට පිහිටා ඇත.

- ව්‍යාපෘති වර්ගය : ආර්ථික සංවර්ධන සැලැස්ම

- ව්‍යාපෘති අරමුණ
  - වාණිජ සංවර්ධන කටයුතු සඳහා පවතින ඉල්ලුමට ඉඩ පහසුකම් සැපයීම තුලින් නගරයේ ආර්ථිකය සංවර්ධනය
  - ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ පරිපාලන සේවාවන් කේන්ද්‍රගත කිරිම තුළින් ප්‍රශස්ථ සේවාවක් ජනතාවට ලබාදීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

නගර මධ්‍යයේ ඉහල වාණිජ වටිනාකමක් සහිත භූමියක තනි මහල් රජයේ කාර්යාල, නිල නිවාස පිහිටා ඇති අතර, ගරා වැටුණු තත්ත්වයේ පවතින ගොඩනැගිලිද මේ අතර පවතී. මේතුලින් ඌන භාවිතයේ ඇති ඉඩකඩ ප්‍රශස්ථ අන්දමින් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනිමට හැකි වන අතර නගරය වෙතට සංසරණ ජනගහනය ආකර්ෂණය කරගත හැකිය. තවද නගරයේ තැනින් තැන පෞද්ගලික ස්ථානවල ව්‍යාප්තව පිහිටි කාර්යාල පරිපාලන සංකීර්ණයට ගෙන ඒම තුලින් පරිපාලන සේවා කාර්යක්‍ෂම කිරිම.

- ඉඩමේ වර්තමාන තත්වය

තනි මහල් ඌන සංවර්ධනය සහිත කාර්යාල මෙන්ම පොලිස් නිල නිවාස පිහිටා ඇති අතර, කොටසක් ගරා වැටුණු තත්ත්වයේ පවති. එමෙන්ම බන්ධනාගාරය වැනි නගර මධ්‍යයට අනවශ්‍ය භාවිත ද පවතී.

- ඉඩම් හිමිකම පිළිබඳ විස්තර

| ආයතනය | ඉඩම් ප්‍රමාණය |
|---|---|
| ශ්‍රී ලංකා පොලිසිය | පර් 434 |
| තැපැල් දෙපාර්තමේන්තුව | පර් 77 |
| බන්ධනාගාරය | පර්. 52 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | පර් 267 |
| නාගරික සංවර්ධන අධිකාරිය | පර්. 94 |
| නිවාස සංවර්ධන අධිකාරිය | පර්. 51 |

- ව්‍යාපෘති කාලය : දිර්ඝ කාලීන
- මුළු ඇස්තෙමින්තුගත පිරිවැය : රු.මි 10000
- මූල්‍ය ක්‍රමය

නාගරික සංවර්ධන අධිකාරිය , දේශීය හා විදේශීය ආයෝජකයින් සම්බන්ධ කර ගනිමින් පුද්ගලික හා රාජ්‍ය සහයෝගිතා ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කෙරේ.

- ව්‍යාපෘති විස්තරය

කුරුණෑගල නගර මධ්‍යයේ මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව හා බන්ධනාගාරයට අයත් අක්කර 07ක ඉඩම තුළ වාණිජ , කාර්යාල හා නේවාසික කටයුතු සඳහා කුළුණු වලින් සමන්විත සංවර්ධනය කිරිමට යෝජිත අතර, මෙම ව්‍යාපෘතිය පහත පරිදි අදියර කිහිපයකින් ක්‍රියාත්මක කිරිමට යෝජිතය.

- පොලිසිය හා පොලිස් නිල නිවාස කොළඹ පාරේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය පිහිටි ඉඩමේ ප්‍රතිස්ථාපනය කිරිම.
- බන්ධනාගාරය යෝජිත ගැට්ටුවාන උසාවි සංකීර්ණ ඉඩම තුළ ප්‍රතිස්ථාපනය කිරිම.
- යෝජත වාණිජ , කාර්යාල සංකිර්ණය ඉදිකිරිම.

අදියර 01 - මහල් 16කින් යුත් පරිපාලන සංකීර්ණය - මාර්ග සංවර්ධන අධිකාරිය , නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු තැනින් තැන විසිරි ඇති කාර්යාල ප්‍රතිස්ථාපනය කිරිම. (වාහන නැවතුම් 250, කාර්යාලිය ඉඩකඩ ව.මී 18000 )

අදියර 02 - මහල් 08 යුත් වාණිජ ගොඩනැගිල්ල හා වාහන නැවතුම් ස්ථාන (වාහන නැවතුම් 400, වාණිජ ඉඩකඩ ව. මී. 24200)

අදියර 03 - මහල් 20කින් යුත් හෝටල් හා කෞතුකාගාරය ඇතුළත් ගොඩනැගිල්ල. (කාමර 200, වාහන නැවතුම් 950)

- පවතින යටිතල පහසුකම් - ජලය, විදුලිය

- වර්තමාන තත්වය

මෙම ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකරන මණ්ඩල අනුමැතිය ලැබි ඇත. ඉඩම් පවරා ගැනිමේ ගැටලු පවතී.

සංකල්පීය සැලැස්ම



- **ව්‍යාපෘති කාලය** : දීර්ඝ කාලීන

- **මූල්‍ය ක්‍රමය** : මහා භාණ්ඩාගාරය , නාගරික සංවර්ධන අධිකාරිය, දේශීය හා විදේශීය ආයෝජන

- **ව්‍යාපෘති කටයුතු**

ඉඩම් පවරා ගැනීම

පලමුවන අදියර සංවර්ධනය - පරිපාලන හා නේවාසික ගොඩනැගිල්ල
දෙවන අදියර සංවර්ධනය - වාණිජ ගොඩනැගිල්ල
තුන්වන අදියර සංවර්ධනය - හෝටල් ගොඩනැගිල්ල

- **නිර්දේශිත ආයතන**

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා: (Authorized Person ) |
|---|---|---|
| **ඉඩම් පවරා ගැනීමේ කටයුතු** | නාගරික සංවර්ධන අධිකාරිය<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>ප්‍රා. ලේකම් කාර්යාලය<br>ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව<br>තැපැල් දෙපාර්තමේන්තුව<br>බන්ධනාගාරය<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>නිවාස සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම්), දිස්ත්‍රික් ලේකම්, ප්‍රා. ලේකම් |
| **ඉඩම සංවර්ධනය කිරීම** | නාගරික සංවර්ධන අධිකාරිය | පළාත් අධ්‍යක්ෂ (වයඹ ) |

- **රෙගුලාසි සහ මාර්ගෝපදේශ**

ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

# ව්‍යාපෘති 09
## රජපිහිල්ල තානායම ප්‍රතිසංවර්ධනය

- ව්‍යාපෘති යෝජනාව

රජපිහිල්ල තානායම තානායම කාමර 50 ක හෝටල් සංකීර්ණයක් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම.

- ප්‍රවේශය - තානායම් පාර

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රිකය ( District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | | |
| **මායිම් (Boundary)** | උතුර :(North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර :(West ) |
| | රජපිල්ල උද්‍යානය | රජපිල්ල උද්‍යානය | නේවාසික ඉඩම් | නුවර පාර පිරවුම් හල |

- පිහිටීම සිතියම




- යාබද ඉඩම් භාවිත

රජ පිහිල්ල උද්‍යානය, නීතිඥ කාර්යාල ගොඩනැගිල්ල, වාණිජ භාවිත සහිත මිශ්‍ර සංවර්ධන කටයුතු

- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සංවර්ධන සැලැස්ම

- ව්‍යාපෘති අරමුණ - නගරයට අත්‍යාවශ්‍ය සුඛෝපභෝගී හෝටල් පහසුකම් ලබාදීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

වර්තමාන්යේ කුරුණෑගල නගරය තුළ සංචාරකයින් සඳහා පහසුකම් සැලසිය හැකි මට්ටමේ නවාතැන් ලබාදීම, ආහාර පාන ලබා ගැනීම, සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැත. රජපිහිල්ල තානායම රජපිහිල්ල උද්‍යානයට යාබදව නිස්කලංක පරිසරයක පිහිටා ඇති අතර, පුළුල් කිරිම සඳහා ප්‍රමාණවත් ඉඩකඩද පවතී. නගර මධ්‍යයේ ස්ථාපිත වී ඇති බැවින් මනා ප්‍රවේශකත්වයක් ඇත.

- හිමිකම පිළිබඳ විස්තර - කුරුණෑගල මහ නගර සභාව

- ව්‍යාපෘති කාලය - මධ්‍ය කාලීන
- මූල්‍ය ක්‍රමය - කුරුණෑගල මහ නගර සභාව, පෞද්ගලික ආයෝජන
- ව්‍යාපෘති විස්තරය

පවතින පැරණි ගොඩනැගිලි ද සංරක්ෂණය කරමින් එයට ගැලපෙන පරිදි කාමර 50කින් පමණ සමන්විත හෝටලයක් ලෙස සංවර්ධනය කිරිම.

- ව්‍යාපෘති ඉතිහාසය - මෙම ව්‍යාපෘතිය කුරුණෑගල මහ නගර සභාව විසින් හඳුනාගත් ව්‍යාපෘතියකි.
- වර්තමාන තත්වය - පැරණි රජපිහිල්ල තානායම පවතී.
- ව්‍යාපෘති පිරිවැය - මිලියන 350

- ව්‍යාපෘති කටයුතු
    - පැරණි තානායම් ගොඩනැගිලි ආරක්ෂා කරගැනීම.
    - කාමර 50 ක හෝටලය ඉදි කිරීම.

- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයාඃ (Authorized Person ) |
|---|---|---|
| **ඉඩම් සංවර්ධනය කිරිම** | නාගරික සංවර්ධන අධිකාරිය,<br>මහ නගර සභාව<br>දේශීය හා විදේශීය ආයෝජකයින් | පළාත් අධ්‍යක්‍ෂක<br>නගරාධිපති / නාගරික කොමසාරිස් |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ

ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය

# ව්‍යාපෘති 10

## උසාවි සංකීර්ණය ඇතුලු ඊට ආනුශංගික කටයුතු රජයේ නිල නිවාස පිහිටි භූමියෙහි ප්‍රතිස්ථාපනය කිරීම

- ව්‍යාපෘති යෝජනාව

දැනට නගර මධ්‍යයේ පවතින උසාවි සංකීර්ණය සියලු පහසුකම් සහිතව සුදුසු ස්ථානයක ස්ථාපිත කිරීම.

- ව්‍යාපෘති ස්ථානය

| ස්ථානය (Location) | පළාත :Province) | වයඹ පළාත | දිස්ත්‍රික්කය (District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | | |
| මායිම් (Boundary) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | නගරසභා පාර | කුඹුරු | නගර සභා පාර | ගැට්ටුවාන රවුම් පාර |

- ප්‍රවේශ - ගැට්ටුවාන රවුම් පාර

- පිහිටීම සිතියම




- යාබද ඉඩම් භාවිතා - මිශ්‍ර සංවර්ධන (නේවාසික හා රජයේ කාර්යාල සහිත)
- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සංවර්ධන සැලැස්ම

- ව්‍යාපෘති අරමුණ

  - උසාවි සංකීර්ණය , නීතිඥ කාර්යාලය, විනිසුරු නිල නිවස, බන්ධනාගාරය යන උසාවියට ආනුශංගික ක්‍රියාකාරකම් එකම ස්ථානයක ස්ථානගත කිරිම .

  - අබලන් තත්ත්වයේ රජයේ නිල නිවාස පිහිටි අව සංවර්ධනයේ පවතින භූමිය ප්‍රශස්ථ භාවිතයට යොදා ගැනීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

වර්තමානයේ උසාවි ගොඩනැගිල්ල නගර මධ්‍යයෙහි ඒ සඳහා නුසුදුසු ස්ථානයක ස්ථාපිත වී ඇත. උසාවිය ගැට්ටුවාන ප්‍රදේශයේ ප්‍රතිස්ථාපනය කර හිස්වන ඉඩම නගරයේ ආකර්ෂණය හා සංවර්ධනය වැඩි දියුණු වන ආකාරයේ සංවර්ධන කටයුත්තක් සඳහා භාවිතයට යොදා ගැනීම කළ හැක.

- මැනුම් සැලැස්ම විස්තර

| මිනුම්දෝරු සැලැස්ම අංක(Survey Plan No. ) | මිනුම්දෝරු නිළධාරියගේ නම (Name of the Surveyor) | දිනය (Date ) | ඉඩම් ප්‍රමාණය (Land Extent) |
|---|---|---|---|
| කුරුණෑගල ප්‍රා.ලේ අංක 8/36/12 හා 199 | රජයේ මිනුම්දෝරු | | අක්කර 10 |

- ව්‍යාපෘති කාලය - දීර්ඝ කාලීන

- මූලාා ක්‍රමය - මහා භාණ්ඩාගාරය / විදේශ ණය

- ව්‍යාපෘති විස්තරය
  - උසාවි සංකීර්ණය - දිසා අධිකරණය , මහාධිකරණය , අභියාචනාධිකරණය යනාදි සියලු උසාවි ඇතුලත් මහල් 05කින් යුත් උසාවි සංකීර්ණය
  - නඩුකාර නිල නිවාස - කුරුණෑගල නගරය තුළ පිහිටි නඩුකාර නිල නිවාස 04 ප්‍රතිස්ථාපනය කිරිම.
  - නීතිඥ කාර්යාල සංකිර්ණය - කුරුණෑගල නගර සභා ඉඩමේ පිහිටි නිතිඥ කාර්යාල සංකීර්ණය ප්‍රතිස්ථාපනය කිරිම
  - රජයේ නිල නිවාස සංකිර්ණ - මහල් 10කින් යුතු නිල නිවාස 200කින් පමණ යුත් නිවාස සංකිර්ණ 02ක් ඉදිකිරිමට යෝජිත අතර, වර්තමානයේ මෙම භූමියේ පවතින නිල නිවාස සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත නිවාස 60ක් ලබාදිමට යෝජිතය.
  - බන්ධනාගාර රැඳවුම් කඳවුර - නගර මධ්‍යයේ පවතින බන්ධනාගාර රැඳවුම් කඳවුර ප්‍රතිස්ථාපනය කිරිම.

- බැංකු හා අනෙකුත් වාණිජ කටයුතු
- විවේක හා විනෝද පහසුකම්, රථගාල

- ව්‍යාපෘති වර්තමාන තත්ත්වය


මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත එකඟතාවය ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තාව යොමු කර ඇත.

- යෝජිත ඉඩමේ වර්තමාන භාවිතය

අවුරුදු 100කට වඩා පැරණි නිල නිවාස 26ක් පවතී . එක් නිවාස ඒකකයක් සඳහා පර්. 40 සිට 80 පමණ භූමිය වෙන්වී ඇත. වර්තමානයේ කාලය ඉකුත් වු නිවාස රැසක්ම භාවිතයෙන් තොරය.




- පිරිසැලසුම් සිතියම




**I**

1. මහල් 05කින් සමන්විත උසාවි සංකීර්ණය
2. පොදු රථගාලක් ඉදිකිරිම.
3. බැංකුව සහ උප තැපැල් කාර්යාලය
4. බන්ධනාගාර රැඳවුම් කඳවුර
5. පොලිස් මුරපොල
6. නීතිඥ කාර්යාල සංකීර්ණය

**II**

1. නිවාස ඒකක 200කින් යුක්ත මහල් නිවාස සංකීර්ණය (රජයේ නිල නිවාස වෙනුවට නිවාස ඒකක 60 ක් ලබාදීම සහ අනාගත ඉල්ලුමට සරිලන නිවාස ඉදිකිරීම)
2. පොදු රථගාල
3. උද්‍යානය

**III**

1. විනිසුරුවරුන්ගේ නිල නිවාස

- යෝජිත සැලැස්ම




- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා: (Authorized person ) |
|---|---|---|
| ඉඩම පවරා ගැනීමේ කටයුතු | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය | දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් අධ්‍යක්ෂ (ඉඩම්), ඉඩම් කොමසාරිස් |
| උසාවි ඇතුලු කාර්යාල ප්‍රතිස්ථාපනය | නාගරික සංවර්ධන අධිකාරිය , අධිකරණ අමාත්‍යාංශය බන්ධනාගාර දෙපාර්තමේන්තුව | පළාත් අධ්‍යක්ෂ අමාත්‍යාංශය ලේකම් |
| වාණිජ සංවර්ධනය | නාගරික සංවර්ධන අධිකාරිය | පළාත්අධ්‍යක්ෂ |
| නිවාස සංවර්ධනය | නාගරික සංවර්ධන අධිකාරිය | පළාත්අධ්‍යක්ෂ |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ

ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය

# ව්‍යාපෘති 11
## නගර මධ්‍යයේ පොදු වෙළඳපොල භූමිය සංවර්ධනය කිරීම

- ව්‍යාපෘති යෝජනාව

නගර මධ්‍යයේ පිහිටි පොදු වෙළඳපොල භූමිය වාණිජ, හෝටල් හා නේවාසික කුළුණු වලින් සමන්විත මිශ්‍ර සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම.

- ප්‍රවේශය - කුරුණෑගල - කොළඹ මාර්ගය

- ව්‍යාපෘති ස්ථානය

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රිකය (District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | | කුරුණෑගල |
| **මායිම් (Boundary)** | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | මහනුවර මාර්ගය | | | කොළඹ පාර |

- පිහිටීම සිතියම




පොදු වෙළඳපොල භූමිය

- යාබද ඉඩම් භාවිතය - වාණිජ

- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සංවර්ධන සැලැස්ම

- ව්‍යාපෘති අරමුණ

අඩු සංවර්ධනයේ පවතින පොදු වෙලඳ පොල භූමිය ප්‍රශස්ථ භාවිතයට යොදා ගැනීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

නගර මධ්‍යයේ පිහිටි ඔරලෝසු කණුව , පොදු වෙළඳපොල, රජපිහිල්ල උද්‍යානය, තානායම , නීතිඥ කාර්යාලය පිහිටි මුළු භූමිය නගරයේ අනන්‍යතාවය රැක ගනිමින් නගර මධ්‍ය වෙත විවෘත කර ප්‍රතිසංවර්ධනය කිරිම. ඒ තුලින් 2030 පුරෝකථන නේවාසික ජනගහනයට සහ වැඩිවන සංසරණ ජනගහනයට අවශ්‍ය වාණිජ අවශ්‍යතා සපුරාලීම

- ඉඩමේ භාවිත විස්තරය - අවුරුදු 100කට වඩා පැරණි පොදු වෙළඳපොල ගොඩනැගිල්ල
- හිමිකම පිළිබඳ විස්තර - මහ නගර සභාව
- ව්‍යාපෘති කාලය - මධ්‍ය කාලීන
- මූල්‍ය ක්‍රමය - මහ නගර සභාව, පෞද්ගලික ආයෝජන
- ව්‍යාපෘති විස්තරය
    - මහල් 15කින් යුතු වාණිජ ගොඩනැගිල්ල - වර්ග අඩි 24000
    - මහල් 15 කින් යුතු මහල් නිවාස සංකීර්ණය - වර්ග අඩි 60000
    - හෝටල් සංකිර්ණය ව.අ 60000
    - වෙළඳුන් 125 සඳහා ප්‍රතිස්ථාපන ගොඩනැගිල්ල.
- පවතින යටිතල පහසුකම් - ජලය , විදුලිය
- ඉතිහාසය - මෙය කුරුණෑගල මහ නගර සභාව විසින් හඳුනාගත් ව්‍යාපෘතියකි
- ව්‍යාපෘති කටයුතු - ගොඩනැගිලි ඉදිකිරිම
- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය : (Relevant Authority) | බලයලත් පුද්ගලයා:(Authorized person ) |
|---|---|---|
| **සැලසුම් සකස් කිරීම හා සංවර්ධනය කිරීම** | මහ නගර සභාව, පෞද්ගලික ආයෝජන | නගරාධිපති/ නාගරික කොමසාරිස් |


# ව්‍යාපෘති 12

## B0084 මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය සංවර්ධනය කිරීම

- ### ව්‍යාපෘති යෝජනාව

යන්තම්පලාව සිට ගැට්ටුවාන දක්වා මාර්ගය (විල්ගොඩ පාර, බෞද්ධාලෝක පාර, දකුණු රවුම් පාර, මුත්තෙට්ටුගල පාර) මීටර් 24ක් පළල මංතීරු 04ක මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම.

- ### ව්‍යාපෘති සැලැස්ම




| ආරම්භ සහ අවසාන ස්ථානය | දිග (කි.මී) | යෝජිත පළල (මීටර්) | පිරිවැය මිලියන(රුපියල් ) |
|---|---|---|---|
| යන්තම්පලාව සිට ගැට්ටුවාන දක්වා (කඳුරුගස්හන්දිය ,පුවක්ගස් හන්දිය හරහා) | 4.67 | 24 | 250 |
| ගැට්ටුවාන සිට මුත්තෙට්ටුගල | 1.88 | 24 | 50 |

- ### ව්‍යාපෘති වර්ගය - ප්‍රවාහන සැලැස්ම

- **ව්‍යාපෘති අරමුණ** - නගරයේ පවතින අධික වාහන තදබදය අවම කිරීම

- **ව්‍යාපෘති තාර්කිකත්වය**

මෙම ව්‍යාපෘතිය මගින් නගරය තුල වාහන තදබදය අවම කර නගරය තුල සංසරණ හැකියාව වර්ධනය කරයි.

- **ව්‍යාපෘති කාලය** - මධ්‍ය කාලීනව

- **මූල්‍ය ක්‍රමය** - මාර්ග සංවර්ධන අධිකාරිය

- **ව්‍යාපෘති විස්තරය**

යන්තම්පලාව සිට ගැට්ටුවාන දක්වා , ගැට්ටුවාන සිට මුත්තෙට්ටුගල දක්වා මං තීරු 04ක මීටර් 24 පුළුල් මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම.

- **ඉතිහාසය** - මෙය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යෝජිත ව්‍යාපෘතියකි.

- **අනුමත කරන ආයතන**

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| **මාර්ග සංවර්ධනය (මංතීරු 04ක් ලෙස)** | මාර්ග සංවර්ධන අධිකාරිය | පළාත් අධ්‍යක්ෂ |


# ව්‍යාපෘති 13

## ප්‍රවාහන ද්වාරය සංවර්ධනය කිරීම

- ### ව්‍යාපෘති යෝජනාව

යෝජිත ගැට්ටුවාන බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානයේ සිට ප්‍රධාන බස් නැවතුම්පල දක්වා A 010 මාර්ගය මංතීරු 06ක මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම.

- ### පිහිටීම සිතියම




- ### ව්‍යාපෘති වර්ගය - ප්‍රවාහන සැලැස්ම

- ### ව්‍යාපෘති අරමුණ

අධිවේගී මාර්ගය ක්‍රියාත්මක වීමත් සමඟ ගැට්ටුවාන හා මල්ලවපිටිය මංසන්ධිය අතර සිදුවන වාහන තදබදය අවම කිරීම.

අධිවේගී අන්තර් හුවමාරුව හා ප්‍රධාන බස් නැවතුම්පල අතර, කාර්යක්ෂම සම්බන්ධතාවයක් ඇති කරමින් මෙම බහු මාධ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා ගන්නන් හට පහසු ප්‍රවේශකත්වයක් ඇති කිරීම.

- ### ව්‍යාපෘති තාර්කිකත්වය

අධිවේගී අන්තර් හුවමාරුව හා ප්‍රධාන බස්නැවතුම්පල අතර, කි.මී 01ක පමණ දුරක් පවතී. අධිවේගී මාර්ගය තුලින් වාහන ඇතුල් කිරීම, පිට කිරීමත් සමඟ ඒ10 මාර්ගයේ දැඩි වාහන තදබදයක් ඇති වේ. ඒ සඳහා අන්තර් හුවමාරුව හා නගර මධ්‍ය අතර, කාර්යක්ෂම ගමනාගමනයක් ඇති කිරීම සඳහා එම මාර්ගය මං තීරු 06ක මාර්ගයක් ලෙස පුළුල් කිරීම අත්‍යාවශ්‍ය වේ. වර්තමාන නගරය හා ගැට්ටුවාන ආශ්‍රිතව ඇතිවන ප්‍රධානම ප්‍රවේශය වන බැවින් ඉතා විශාල සේවා මට්ටමක් මාර්ගය තුලින් ලබාදිය යුතුය.

- ව්‍යාපෘති කාලය - මධ්‍ය කාලීන
- මූල්‍ය ක්‍රමය - මාර්ග සංවර්ධන අධිකාරිය
- ව්‍යාපෘති විස්තරය

ගැට්ටුවාන බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානයේ සිට නගර මධ්‍යයේ ප්‍රධාන බස් නැවතුම්පළ දක්වා කටුගස්තොට- පුත්තලම මාර්ගය (A 010) මංතීරු 06ක මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම.

- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා: (Authorized person ) |
|---|---|---|
| **ඉඩම් අත්පත් කර ගැනීම හා මාර්ග සංවර්ධනය කිරිම** | මාර්ග සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (පලාත්) |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ :

මෙම මාර්ගය සංවර්ධනය කිරීමේදී මාර්ග දෙපස වාහන නැවතුම් සඳහා ඉඩකඩ වෙන් නොකළ යුතුය


# ව්‍යාපෘතිය 14

## නිවාස සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.

- ව්‍යාපෘති යෝජනාව

  අධි සනත්ව කලාපය තුල නේවාසික සංවර්ධනය සඳහා අවශ්‍ය කරන නිවාස ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන ඉඩම් හඳුනා ගැනීම

- ව්‍යාපෘති සැලැස්ම



| ස්ථානය | භූමියේ ප්‍රමාණය (අක්කර ) | | අවශ්‍ය නිවාස සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | ඉඩමේ අයිතිය | අඩු ආදායම් | මධ්‍ය ආදායම (පහල) | මධ්‍ය ආදායම (ඉහළ) | සුඛෝපභෝගී |
| පැල්ලන්දෙණිය ගෝනගම හන්දිය අසල නිවාස ව්‍යාපෘතිය | 03 | පුද්ගලික | | | 375 | 250 |
| දොරටියාව නිවාස ව්‍යාපෘතිය | 05 | | | | 450 | 250 |
| දඹුල්ල පාර නිවාස ව්‍යාපෘතිය | 02 | පුද්ගලික | | 90 | 90 | |
| වැව රවුම නිවාස ව්‍යාපෘතිය | 12 | රාජ්‍ය | | | 650 | 500 |
| ගැට්වුවාන නිවාස ව්‍යාපෘතිය | 05 | රාජ්‍ය | | 150 | 150 | 50 |
| සත්‍යවාදී නිවාස ව්‍යාපෘතිය | 0.5 | පුද්ගලික | | | | 200 |
| හෙරලියාවල නිවාස ව්‍යාපෘතිය | 02 | රාජ්‍ය | | 600 | | |
| හාල්පාර නිවාස ව්‍යාපෘතිය | 15 | රාජ්‍ය | | 950 | 500 | |
| විල්ගොඩ නිවාස ව්‍යාපෘතිය | 02 | රාජ්‍ය | 700 | | | |
| කවුඩාවත්ත (ඇස්වැද්දුම) නිවාස ව්‍යාපෘතිය | 04 | පුද්ගලික | | 300 | 300 | |
| වඳුරාගල නිවාස ව්‍යාපෘතිය | 02 | පුද්ගලික | | 450 | | |
| වැහැර නගරසභා නිලනිවාස භූමිය | 1.5 | රාජ්‍ය | | 200 | | |
| නගර සභා ඉඩම ( සුසාන භූමිය අසල) | 0.5 | රාජ්‍ය | | 50 | | |
| මලියදේව පිරිමි විදුහල ඉදිරිපිට | 0.5 | රාජ්‍ය | | | 30 | |
| එකතුව | **55.75** | | **700** | **2790** | **2545** | **1300** |

- වැහැර සුසාන භූමි ව්‍යාපෘති විස්තරය

නිවාස ව්‍යාපෘති සඳහා සුදුසු ඉඩම් හඳුනාගෙන ඇති අතර, එම ඉඩම් අත්පත් කරගෙන සංවර්ධනය කර පෞද්ගලික ආයෝජකයින් වෙත නිවාස ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.

- අරමුණු - වසර 2030 දී නිවාස අවශ්‍යතාවය සඳහා මහල් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- ## ව්‍යාපෘති තාර්කිකත්වය

මෙම සැලැස්ම තුලින් 2030 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන කටයුතු සමග ඉහල නේවාසික ජනගහනයක් බලාපොරොත්තු වේ. දැනට නගරය අවට තිරස් නේවාසික සංවර්ධය සඳහා ඉඩම් නොමැති හෙයින්, සිරස් සංවර්ධනය තුලින් විශාල නේවාසික ජනගහනයක් ආකර්ෂණය කරගැනීම මෙහි අරමුණ වේ.

- ## අයිතිය - පෞද්ගලික, වැවිලි සමාගම්

- ## නිර්දේශිත ආයතනය

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| **ඉඩම් අත්පත් කරගැනීමේ හා පවරාගැනීමේ කටයුතු** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br><br>නාගරික සංවර්ධන අධිකරිය<br>නිවාස සංවර්ධන අධිකාරිය | දිස්ත්‍රික් ලේකම් , ප්‍රාදේශීය ලේකම්<br>පළාත් අධ්‍යක්‍ෂ |
| **ඉඩම් සංවර්ධනය හා නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම** | පුද්ගලික ආයෝජකයින්<br>නා. ස .අධි<br>නි. ස. අධි | පළාත් අධ්‍යක්‍ෂ |

- ## රෙගුලාසි සහ මාර්ගෝපදේශ :

ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය

# ව්‍යාපෘති 15

## පැරණි උසාවි සංකීර්ණය සාප්පු සංකීර්ණයක් ලෙස සංවර්ධනය කිරීම.

- ව්‍යාපෘති යෝජනාව

උසාවි සංකීර්ණය, නීතිඥ කාර්යාල ගොඩනැගිල්ල, නගර මධ්‍යයෙන් පිටත ප්‍රතිස්ථාපනය කර උසාවි සංකීර්ණ ගොඩනැගිල්ල වාණිජ සංවර්ධනය සඳහා යෙදවීම.


- ව්‍යාපෘති ස්ථානය (Project Location)

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රිකය ( District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DSDivision) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | | |
| මායිම් (Boundary) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | කොළඹ පාර | සූරතිස්ස මාවත | කටුගස්තොට,කුරුණෑගල,පුත්තලම මාර්ගය | කොළඹ පාර |

- ප්‍රවේශ මාර්ගය

කටුගස්තොට - පුත්තලම මාර්ගය සහ අශෝපුස්ස - ත්‍රිකුණාමලය මාර්ගය , සූරතිස්ස මාවත

- පිහිටීම සිතියම




- යාබද ඉඩම් භාවිත

මෙම ඉඩම නගර මධ්‍යයේ කුරුණෑගල බස් නැවතුම්පල , පොදු වෙළඳපොල , රජයේ කාර්යාල වලට මායිම් ව අධි ඝනත්ව වාණිජ සංවර්ධන ප්‍රදේශයක පිහිටා ඇත.

- **ව්‍යාපෘති වර්ගය** - ආර්ථික සංවර්ධන සැලැස්ම

- **ව්‍යාපෘති අරමුණු**

  - පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත පැරණි ගොඩනැගිල්ලක් වන උසාවි ගොඩනැගිල්ල ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යමින් නාගරික කටයුතු සඳහා යොදා ගැනීම.
  - ඇතුගලෙහි දර්ශනය නගර මධ්‍යයට ලැබෙන පරිදි එම පරිශ්‍රය සංවර්ධනය කිරීම.
  - නගරයේ පවතින තදබදය අවම මකර නාගරික විවේක හා විනෝද කටයුතු සඳහා පහසුකම් සැපයීම

- **ව්‍යාපෘති තාර්කිකත්වය**

නගරයේ අනන්‍යතාවය වන ඇතුගලෙහි දර්ශනය නගර මධ්‍යයට ලබා ගත හැකිවන පරිදි උසාවි පරිශ්‍රය ප්‍රශස්ථ භාවිතයට යොදා ගනිමින් (තනි මහල් සංරක්ෂිත ගොඩනැගිලි ආරක්ෂා කර ගැනීම)තනි මහල් සාප්පු සංකීර්ණයක් ලෙස සංවර්ධනය කිරීම.

- **මූල්‍ය ක්‍රමය** - නාගරික සංවර්ධන අධිකාරිය, පෞද්ගලික ආයෝජන

- **ව්‍යාපෘති විස්තරය**

සාප්පු සංකීර්ණය , වාහන නැවතුම් ස්ථාන, නාගරික උද්‍යාන ඇතුළත් දෛනික සංසරණ ජනතාවට සුව පහසු විවේක පහසුකම් සහිත ප්‍රදේශයක් බවට පත් කිරීම.

- **පවතින ගොඩනැගිලි වල තත්ත්වය**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේදී පැරණි උසාවි ගොඩනැගිල්ල සංරක්ෂිත ගොඩනැගිල්ලක් ලෙස ගැසට් කර ඇත.

- **ඉඩමේ වර්තමාන තත්වය**

මෙම ගොඩනැගිල්ලෙහි මහේස්ත්‍රාත් අධිකරණය, දිසා අධිකරණය, කම්කරු විනිශ්චය අධිකරණය, මහාධිකරණය යන අධිකරණ 04 ක්‍රියාත්මක වේ. මීට අමතරව නීතිඥ කාර්යාල ගොඩනැගිල්ල, පර්. 25ක පමණ ධර්මපාල උද්‍යානය පිහිටා ඇත.



- සැලසුම් අවශ්‍යතා

  - පවතින සංරක්ෂිත ගොඩනැගිල්ලෙහි ඓතිහාසික වටිනාකම ආරක්ෂා කර ගනිමින් ප්‍රති සංවර්ධනය කර වාහන නැවතුම් ස්ථාන, උද්‍යාන වැනි පහසුකම් සමඟ සංසරණ ජනගහනයේ ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කර ගැනීම සඳහා පිරිසැලසුම් සිතියමක් සකස් කර ගැනීම.
  - පුරාවිද්‍යාත්මක දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය ලබා ගැනීම.

- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized Person ) |
|---|---|---|
| ඉඩම් පවරා ගැනීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>අධිකරණ අමාත්‍යාංශය<br>නාගරික සංවර්ධන අධිකාරිය | අමාත්‍යාංශ ලේකම්,<br>දිස්ත්‍රික් ලේකම් , ප්‍රාදේශීය ලේකම්<br>පළාත් අධ්‍යක්ෂ |
| ඉඩම සංවර්ධනය | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (වයඹ) |

- මාර්ගෝපදේශ: (Guidelines)

  - පුරාවිද්‍යාත්මක ගොඩනැගිල්ලෙහි ඓතිහාසික වටිනාකම ආරක්ෂා කර ගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය සහිතව ප්‍රතිසංවර්ධනය කළ යුතුය.
  - ඇතුගලෙහි දර්ශනය නගර මධ්‍යයට ලැබෙන පරිදි පරිශ්‍රය සංවර්ධනය කළ යුතුය.
  - මායිම් තාප්ප ඉදි නොකළ යුතුය.


# ව්‍යාපෘති 16

## පෞද්ගලික බස්රථ සඳහා රැඳවුම් ස්ථාන සංවර්ධනය කිරීම.

- ව්‍යාපෘති යෝජනාව

නගරය තුලට දිනපතා පැමිණෙන පුද්ගලික බස් රථ සඳහා රැඳවුම් ස්ථාන ලබාදීම .

- ව්‍යාපෘති සැලසුම




| ස්ථානය | ඉඩමේප්‍රමාණය( අක්කර) |
|---|---|
| දකුණු ඩිපෝවට අයත් ඉඩම | 2 |
| යන්තම්පලාව ඉඩම | 1 |

- ව්‍යාපෘති විස්තරය

පෞද්ගලික බස් රථ නැවතුම් ස්ථාන ලෙස මෙම ස්ථාන සංවර්ධනය කිරීම.

- අරමුණු

වර්තමානයේද ගැටළුවක් ව පවතින තම ගමන් වාරය පැමිණෙන තුරු තැනින් තැන රැදී සිටින පෞද්ගලික බස් රථ සඳහා රැඳවුම් ස්ථාන ලබාදීම.

- ක්‍රියාත්මක කරන ආයතන

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය, මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය

- ව්‍යාපෘති කාලය - කෙටි කාලීන
- මූල්‍ය ක්‍රමය - නාගරික සංවර්ධන අධිකාරිය, මහ නගර සභාව, මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය, පෞද්ගලික ආයෝජන,
- ව්‍යාපෘති කටයුතු
  - ඉඩම් අත්පත් කර ගැනීම
  - බස් රථ නැවතුම් ස්ථාන සකස් කිරීම
- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized Person ) |
|---|---|---|
| **ඉඩම් අත්පත් කරගැනීම හා සංවර්ධනය කිරිම** | නාගරික සංවර්ධන අධිකාරිය,<br>මහ නගර සභාව<br>ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය<br>මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය | පළාත් අධ්‍යක්ෂක<br>නගරාධිපති |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ
  - ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය.
  - කුඹුරු යනාදිය ගොඩකර මාර්ග සංවර්ධනය කිරීමේදී ජලාපවහන සැලැස්මට අනුකූලව සිදුකල යුතුය.

# ව්‍යාපෘතිය 17

## දොරටියාව මාර්ගයේ යෝජිත තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම

- ව්‍යාපෘතිය

ගැට්ටුවාන සංවර්ධන මධ්‍යස්ථානය ආශ්‍රිතව මල්ලවපිටිය තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම.

- ව්‍යාපෘති යෝජනාව

මල්ලවපිටිය ප්‍රදේශයෙන් අක්කර 13ක ඉඩමක් අත්පත් කර ඉඩම සංවර්ධනය කර ආයෝජකයින් වෙත ලබාදීම.

- ව්‍යාපෘති ස්ථානය




- ප්‍රවේශය - මල්ලවපිටිය- කටුපිටිය පාර (දොරටියාව පාර )

- යාබද ඉඩම් භාවිත - ගෙවතු , පොල්වතු යනාදි භාවිත.

- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සංවර්ධන සැලැස්ම

- ව්‍යාපෘති අරමුණ - නවෝත්පාදන සඳහා අවස්ථාව සලසා දීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

කලාපය තුළ ඉහල අධ්‍යාපනික සුදුසුකම් සහිත ජනගහනයක් සිටින බැවින් තාක්ෂණික හා පර්යේෂණ තුලින් නවෝත්පාදන තුලින් නගරයෙහි හා ජාතික ආර්ථික වර්ධනයට දායකවීමට පහසුකම් සැලසිය හැකිය

- වර්තමාන ඉඩම් හිමිකම - පුද්ගලික
- ව්‍යාපෘති කාලය - දීර්ඝ කාලීන
- මූල්‍ය ක්‍රමය - නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදල්

  - පෞද්ගලික අයෝජන

- ව්‍යාපෘති විස්තරය

ඉඩම් පවරාගෙන අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් සපයා ඉඩම් සංවර්ධනය කර විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල, වෘත්තිය පුහුණු ආයතන සඳහා ආයෝජකයින් වෙත බදුදීම.

- වර්තමාන තත්වය - හිස් ඉඩම

- ව්‍යාපෘති කටයුතු

  - ඉඩම් අත්පත් කරගැනීම
  - තාක්ෂණික පර්යේෂණ ස්ථාන ,කාර්මික විද්‍යාල , ආපන ශාලා හා පොදු ක්‍රීඩා පිටි, වාහන නැවතුම් ස්ථාන, නේවාසික පහසුකම් ඇති කිරීම හා භූමි අලංකරණ කටයුතු සිදු කිරීම

- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| **ඉඩම් පවරා ගැනිම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම් ) |
| **ඉඩම් සංවර්ධනය කිරිම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ව්‍යාපෘති) |
| **ඉඩම් ආයෝජකයින් වෙත බදුදීම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම්) |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ :

  - ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය.
  - කුඹුරු හෝ පහත් බිම් යනාදිය ගොඩකර මාර්ග සංවර්ධනය කිරීමේදී ජලාපවහන සැලැස්මට අනුකූලව සිදුකල යුතුය.

# ව්‍යාපෘති 18
## වෙලගෙදර ක්‍රීඩාංගනය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය

- ව්‍යාපෘති යෝජනාව

වෙලගෙදර ක්‍රීඩාංගනය ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් වශයෙන් සංවර්ධනය කිරීම

- ව්‍යාපෘති ස්ථානය (Project Location)

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රිකය : District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | කුරුණෑගලප්‍රාදේශීය ලේකම් | | |
| මායිම් (Boundary) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | කෘෂිකර්ම අමාත්‍යාංශයට ප්‍රවේශ මාර්ගය | නගර සභාව | බාලදක්ෂ මාවත | දඹුල්ල මාර්ගය |
| ප්‍රවේශ (Access) | අඹේපුස්ස - ත්‍රිකුණාමලය මාර්ගය හා බාල දක්ෂ මාවතෙන් ප්‍රවේශ විය හැක | | | |

- පිහිටීම සිතියම




- යාබද ඉඩම් භාවිතා

රජයේ කාර්යාල හා ව්‍යාපාර සහිත මිශ්‍ර සංවර්ධන ප්‍රදේශයකි. මෙම ඉඩමට යාබදව නගර සභා ක්‍රීඩාපිටිය වන මාලිගාපිටිය ද පිහිටා ඇත.

- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සැලැස්ම

- ව්‍යාපෘති දර්ශනය - ආර්ථික/සමාජ /භෞතික අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය

- ව්‍යාපෘති අරමුණ

දැනට පවතින වෙළගෙදර ක්‍රීඩාංගනය ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් වශයෙන් සංවර්ධනය කිරීම

- ව්‍යාපෘති තාර්කිකත්වය

මෙම ක්‍රීඩාංගනය ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් වශයෙන් නවීකරණය කිරීම තුළින් නගරයේ ආර්ථික ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම හා එයට සමගාමීව ක්‍රිඩකයන් සඳහා අවශ්‍ය හෝටල් පහසුකම් යනාදිය සංවර්ධනය තුලින් ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවන අතර සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කල හැක.

- ව්‍යාපෘති කාලය - දීර්ඝ කාලීන

- මූල්‍ය ක්‍රමය - ක්‍රීඩා අමාත්‍යාංශය , කුරුණෑගල මහා නගර සභාව

- ව්‍යාපෘති විස්තරය

අවශ්‍ය සියලුම අංග සහිතව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම.

  - ක්‍රීඩාගාරය ඉදිකිරිම.
  - ක්‍රිඩාංගනය සංවර්ධනය කිරීම.
  - ක්‍රීඩාගාරය හා අදාළ අනෙකුත් පහසුකම් සංවර්ධනය කිරීම

- ව්‍යාපෘති ඉතිහාසය

මෙම ව්‍යාපෘතිය ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේදී ව්‍යාපෘති සැලසුම් සකස් කර තිබුණි

- වර්තමාන ඉඩම් තත්වය

ක්‍රිකට් ක්‍රීඩාංගනය , ගෘහස්ත ක්‍රීඩාංගන , පිහිනුම් තටාක, බැඩ්මින්ටන් , ටෙනිස් වැනි ක්‍රීඩාංගන මෙහි පිහිටා ඇත.

- සංකල්පීය සැකැස්ම






- නිර්දේශිත ආයතන

| කටයුතු (Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized person ) |
|---|---|---|
| **ක්‍රීඩාගාරය ඉදිකිරීම** | ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් |
| **අනෙකුත් පහසුකම් සංවර්ධනය** | ක්‍රිකට් සංගමය | ක්‍රිකට් සංගම් |

# ව්‍යාපෘති 19
## තොරතුරු තාක්ෂණික ගම්මානය මල්කඩුවාව


- **ව්‍යාපෘති යෝජනාව**

  මල්කඩුවාව ප්‍රදේශයේ අක්කර 25ක් පමණ අත්පත් කරගෙන තොරතුරු තාක්ෂණ ගම්මානයක් ස්ථාපිත කිරිම සඳහා ආයෝජකයින් වෙත ඉඩම් ලබාදිම.

- **ව්‍යාපෘති ස්ථානය (Project Location)**

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රිකය ( District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | | |
| මායිම් (Boundary ) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | | | | |
| ප්‍රවේශ (Access) | මල්කඩුවාව ගම මැද පාර | | | |

- **පිහිටීම සිතියම**




- **යාබඳ ඉඩම් භාවිතා** - නේවාසික
- **ව්‍යාපෘති වර්ගය** - ආර්ථික සංවර්ධන සැලස්ම
- **ව්‍යාපෘති දර්ශනය** - උසස් අධ්‍යාපන පහසුකම් සංවර්ධනය

- **ව්‍යාපෘති අරමුණ**

  - කලාපයේ ඉහල පරිගණක සාක්ෂරතා මට්ටම, ඉහල අධ්‍යාපන මට්ටම හා රැකියා වියුක්තිය සලකා රැකියා අවස්ථාවන් සහ තෘතියික අධ්‍යාපනය සඳහා අවස්ථාවන් ලබාදීම.
  - ඉහල ප්‍රවේශකත්වය පදනම් කරගෙන ලංකාවේ උතුරු කලාපයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය බවට පත් කිරීම තුලින් කොළඹ නගරය වෙත සිදුවන බුද්ධි ගලනය වලක්වාගෙන නාගරික ආර්ථිකය ශක්තිමත් කිරිම.

- **ව්‍යාපෘති තාර්කිකත්වය**

ක්‍රියාත්මක අධිවේගී මාර්ගයත් සමඟ කොළඹ සිට කුරුණෑගල නගරයට පැයක් වැනි කාලයක් තුල ලඟාවීමේ හැකියාව පවතී. කුරුණෑගල නගරය වෙත පවතින තෘතීයික අධ්‍යාපන සඳහා පවතින ඉල්ලුම, පෝෂක ප්‍රදේශ ජනතාවගේ ඉහල අධ්‍යාපන මට්ටම යනාදිය මත තොරතුරු තාක්ෂණයට අදාල අධ්‍යාපනය, රැකියා සඳහා ඉහල ඉල්ලුමක් පවතී. කොළඹට සාපේක්ෂව අඩු ඉඩම් මිල, අපරව්‍යුහ පහසුකම් ලබා ගැනීමේ හැකියාව, ශ්‍රම බහුලකම යනාදිය මත වෘත්තිකයන් සහ ආයෝජකයින් මෙම ක්ෂේත්‍රය වෙත ආකර්ශණය කර ගැනීමේ හැකියාව පවතී.

මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීමෙන් පසු තොරතුරු තාක්ෂණයට අදාල අනෙකුත් වාණිජ, සේවා, නවාතැන්, හෝටල්, වාහන නැතුම් ස්ථාන, විවේක හා විනෝද පහසුකම් සේවා ස්ථාන ගතකොට එම ප්‍රදේශය ආර්ථික වර්ධන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය තුළින් බලාපොරොත්තු වේ.

- **ව්‍යාපෘති කාලය** - දීර්ඝ කාලීන

- **මූල්‍ය ක්‍රමය** - නාගරික සංවර්ධන අධිකාරිය /පෞද්ගලික ආයෝජන

- **ක්‍රියාත්මක කරන ආකාරය**

ඉඩම් අත්පත් කර සංවර්ධනය කිරීමෙන් පසු ආයෝජකයින් වෙත විශ්ව විද්‍යාල, තොරතුරු තාක්ෂණයට අදාල කාර්යාල හා එයට ආනුශාංගික කටයුතු වන වාණිජ සේවා, නවාතැන්පලවල්, වාහන නැවතුම් ස්ථාන, විවේක හා විනෝද පහසුකම් සඳහා ඉඩම් ලබාදීම
ආයෝජකයින් වෙත බදු සහන , ණය ගෙවීම් සඳහා සහන කාල සීමාවක් ලබාදීම සහ දිරි ගැන්වී ම.

ඉඩම් ලබාදීම හා ඉදිකිරිම් අනුමැතීන් වෘත්තිකයින්ගෙන් සමන්විත කමිටුවක් මඟින් කඩිනමින් ලබාදීමට පියවර ගැනිම.

- **වර්තමාන ඉඩම් භාවිතය**

කුඹුරු යායකට සම්බන්ධ නොවූ හුදකලා කුඹුරු ලෙස පවතී.

- නිර්දේශිත ආයතන

| කටයුතු (Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized Person ) |
|---|---|---|
| **ඉඩම් පවරා ගැනීම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම්) |
| **ඉඩම් සංවර්ධනය කිරීම** | නාගරික සංවර්ධන අධිකාරිය<br>ගොවිජන සේවා දෙපාර්තමේන්තුව<br>ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථාව | අධ්‍යක්ෂ (පලාත්)<br>ගොවිජන කොමසාරිස්,<br>අධ්‍යක්ෂ (ඉඩම්) |
| **ඉඩම් බදුදීම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම්) |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ

ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය. කුඹුරු පහත් බිම් යනාදිය ගොඩකර සංවර්ධනය කිරිමේදී ජලාපවහන සැලැස්මට අනුකූලව සිදුකල යුතුය.

# ව්‍යාපෘති 20
## පොළ භූමියෙහි යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

- ව්‍යාපෘති යෝජනාව

විල්ගොඩ නගර සභා ඉඩමෙහි සතිපොල ප්‍රතිස්ථාපනය කර වර්තමාන පොල භූමිය මිශ්‍ර සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම.

- ව්‍යාපෘති ස්ථානය

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රික්කය ( District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division)කුරුණෑගල | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | කුරුණෑගල | කුරුණෑගල |

- ප්‍රවේශ - කඳුරුගස් හන්දිය ගැට්ටුවාන දක්වා දකුණු රවුම් පාර

- පිහිටීම සිතියම



- යාබද ඉඩම් භාවිත

මිශ්‍ර සංවර්ධන (වාණිජ , පෞද්ගලික රෝහල්, නේවාසික කටයුතු යනාදිය)

- ව්‍යාපෘති අරමුණ

ඉහල වාණිජ වටිනාකමක් සහිත වර්තමාන පොල භූමිය සිනමා ශාලා , ආපන ශාලා සහිත වෙළඳ සංකීර්ණයක් ලෙස සංවර්ධනය කිරිම තුලින් එම ඉඩම ප්‍රශස්ථ භාවිතයට යොදා ගැනීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

වර්තමාන පොල සතියකට දින 02ක් පමණ පැවැත්වෙන බැවින්, ඉහල වාණිජ වටිනාකමක් සහිත අක්කර 04ක පමණ වූ අව භාවිත තත්ත්වයේ ඉඩම උපරිම ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව ඇත. මෙම ඉඩම ගැට්ටුවාන අන්තර් හුවමාරුවට ආසන්නයේ පිහිටා ඇත. බැවින් මෙම යෝජිත සංවර්ධනය සඳහා ඉහල ක්‍රියාකාරී ස්වභාවයක් දැකිය හැක.

- හිමිකම පිළිබඳ විස්තර - කුරුණෑගල මහ නගර සභාව
- වර්තමාන තත්ත්වය - පොල ගොඩනැගිල්ල පිහිටා ඇත
- ඉඩම් ප්‍රමාණය - අක්කර 04
- ව්‍යාපෘති කාලය - මධ්‍ය කාලීන
- මූල්‍ය ක්‍රමය - මහ නගර සභාව / පෞද්ගලික ආයෝජන

- ව්‍යාපෘති විස්තරය

මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එක්ව ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස සිනමා ශාලා ආපන ශාලා වාහන නැවතුම් ස්ථාන, උද්‍යාන සහිත සුපිරි වෙළඳ සංකීර්ණයක් සංවර්ධනය කිරීම.

- සංකල්පීය සැලැස්මක්



- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized Person ) |
|---|---|---|
| **ඉඩම් සංවර්ධනය කිරීම** | නාගරික සංවර්ධන අධිකාරිය<br>මහ නගර සභාව | අධ්‍යක්ෂ (පලාත්)<br>නගරාධිපති /නාගරික කොමසාරිස් |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ

ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය. කුඹුරු යනාදිය ගොඩකර මාර්ග සංවර්ධනය කිරීමේදී ජලාපවහන සැලැස්මට අනුකූලව සිදුකල යුතුය.

# ව්‍යාපෘති 21
## අඩු ආදායම්ලාභී නිවාස සංවර්ධන ව්‍යාපෘතිය - විල්ගොඩ

- ### ව්‍යාපෘති යෝජනාව

මෙම ව්‍යාපෘතිය තුළින් කුරුණෑගල නගරයේ ඉහල ඉඩම් වටිනාකමක් සහිත ඉඩම්වල පදිංචි අඩුආදායම් ලාභීන් සඳහා නිවාස පහසුකම් සැපයීම හා එම ඉඩම් ප්‍රශස්ත අන්දමින් සංවර්ධන කටයුතු සඳහා යොදවාගැනීම.

- ### ව්‍යාපෘති ස්ථානය (Project Location)

| ස්ථානය (Location) | පළාත :Province) | වයඹ පළාත | දිස්ත්‍රික්කය ( District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රාගලේ. කොට්ඨාශය (DS Division) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | | |
| මායිම් (Boundary) | උතුර :(North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | නගර සභා පාර | නගර සභා පාර | වාන් ඇළ මාර්ගය | මා.සං.අ මාර්ගය |
| ප්‍රවේශ (Access) | විල්ගොඩ රවුම් පාර (බි 0084) | | | |

- ### පිහිටීම සිතියම



- **ව්‍යාපෘති අංශය** - ආර්ථික/ සමාජ භෞතික පහසුකම් සංවර්ධනය

- **ව්‍යාපෘති අරමුණ**

නගරාසන්න පදිංචි අඩු ආදයම්ලාභී හා අඩුපහසුකම් සහිත නිවාස හිමියන් වෙත නිවාස පහසුකම් සැපයීම හා ඔවුන්ගේ ජීවන තත්වය නැංවීම.

- **ව්‍යාපෘති තාර්කිකත්වය**

නගරයේ ඉහල වටිනාකමක් සහිත ඉඩම් සංවර්ධනය කටයුතුසදහා යොදාගත හැකිවීම හා නාගරික අලංකරණය.අඩු ආදායම් නිවාස වල පදිංචිකරුවන්ගේ ජිවින තත්ත්වය ඉහළ නැංවිම.

- **ව්‍යාපෘති කාලය** : මධ්‍ය කාලීනව

- **මූල්‍ය ක්‍රමය** : කුරුණෑගල මහ නගර සභාව, පෞද්ගලික අයෝජන

- **ව්‍යාපෘති විස්තරය**

  - ඒකක 500කින් සමන්විත නිවාස සංකිර්ණ 02ක් ඉදිකර නගරයේ අඩු ආදායම් ලාභීන් හට නිවාස ලබාදීම.
  - දකුණු රවුම් පාරේ පිහිටි වර්තමාන පොල මෙම ඉඩමෙහි ප්‍රතිස්ථාපනය
  - ඉතිරි ඉඩම් ප්‍රමාණය වාණිජ සංවර්ධනය සඳහා පෞද්ගලික ආයෝජකයින් වෙත ලබාදීම.
  - කුරුණෑගල මහා නගර සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය එක්ව ඒකාබද්ද ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ.

- **ව්‍යාපෘති ඉතිහාසය**

මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරියේ, නාගරික පුනර්ජිවන ව්‍යාපෘතිය (කොළඹ) යටතේ 2015 වර්ෂයට පෙර ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණි. මහල් 15 කින් යුතු ගොඩනැගිලි සංකිර්ණ 02 ක් ලෙස සැලසුම් කර තිබුණි. වර්තමානය වන විට ව්‍යාපෘතිය ඇන හිට ඇත.

- වර්තමාන තත්වය

නගර සභා සනීපාරක්ෂක කම්කරුවන් පදිංචිව සිටී. මුලිකව නිවාස ඉදිකර ඇති අතර, අද වන විට නිවාස 270 දක්වා වැඩි වී ඇත.




- යෝජිත සැලැස්ම හා ගොඩනැගිලි සැලසුම් අවශ්‍යතා

නව පිරිසැලැසුම් සිතියම සකස් කිරීම, ගොඩනැගිලි සැලසුම් සකස් කිරිම.

- නිර්දේශිත ආයතන

(Approval Agencies )

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized person ) |
|---|---|---|
| **ව්‍යාපෘතිය සැලසුම් කිරීම<br><br>නිවාස සංකිර්ණය ඉදිකිරිම** | මහ නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | නගරාධිපති / නාගරික කොමසාරිස්<br>අධ්‍යක්ෂ (වයඹ ) |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ

ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය.කුඹුරු පහත් බිම් යනාදිය ගොඩකර මාර්ග සංවර්ධනය කිරිමේදී ජලාපවහන සැලැස්මට අනුකූලව සිදුකල යුතුය

# ව්‍යාපෘති 22

## ඇවිදිය හැකි මංතීරු සකස් කිරිම.

- ව්‍යාපෘති විස්තරය

හඳුනාගත් පහත සඳහන් මාර්ග වල ගස් සිටුවා , අත් වැටවල් ඉදිකර පහසුවෙන් පා ගමනින් යාහැකි ලෙස මාර්ග දෙපස සකස් කිරීම.

- අභ්‍යන්තර වටරවුම් මාර්ගය - බී0084 මාර්ගය
- යන්තම්පලාව සිට මල්ලවපිටිය දක්වා ඒ010 මාර්ගය
- වැහැර සිට මුත්තෙට්ටුගල දක්වා - ඒ006 මාර්ගය
- මිහිඳු මාවත
- රජපිහිල්ල පාර
- සුරතිස්ස මාවත
- වත්හිමි මාවත
- කච්චේරි පාර
- ඩයස් වංගුවේ සිට පුත්තලම් හන්දිය - බී247 මාර්ගය

- අරමුණු

01. සංසරණ ජනගහනයට හා නේවාසික ජනගහනයට නගරය සුවදායි ස්ථානයක් බවට පත්කිරීම. (පයින් ඇවිද යා හැකි මං තීරු සහිත )

02. නගර මධ්‍යයේ උෂ්ණත්වය හා වායු දූෂණය අවම කිරිම.

- අයිතිය — මාර්ග සංවර්ධන අධිකාරිය, මහ නගර සභාව

- ක්‍රියාත්මක කරන ආයතන

මාර්ග සංවර්ධන අධිකාරිය, මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය

- ව්‍යාපෘති කාලය - කෙටි කාලීන

## ව්‍යාපෘති 23

### අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය - අධි නාගරික කලාපය , අර්ධ නාගරික කලාපය ආවරණය වන පරිදි පුළුල් කිරීම.

විසල් කුරුණෑගල සනීපාරක්ෂක ව්‍යාපෘතිය පුලුල් කිරීම තුලින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කල යුතු ව්‍යාපෘතියකි.

## ව්‍යාපෘති 24

### වර්තමාන පොල විල්ගොඩ නගර සභා ඉඩමෙහි ප්‍රතිස්ථාපනය කිරිම.

- ව්‍යාපෘති යෝජනාව

  පොල විල්ගොඩ පිහිටි නගර සභා ඉඩමෙහි ප්‍රතිස්ථාපනය කර පොල භූමිය මිශ්‍ර සංවර්ධන කටයුතු සඳහා ලබාදීම.

- ව්‍යාපෘති ස්ථානය




- ප්‍රවේශය - විල්ගොඩ මාර්ගය (පුවක් ගස් හන්දිය සිට යන්තම්පලාව මාර්ගය)

- **යාබද ඉඩම් භාවිතා**

මිශ්‍ර සංවර්ධනය නගර සභා කම්කරු අඩු පහසුකම් නිවාස පිහිටා ඇත. එමෙන්ම ඇළට මායිම්ව පිහිටා ඇත.

- **ව්‍යාපෘති වර්ගය** - ආර්ථික සංවර්ධන සැලැස්ම
- **ව්‍යාපෘති අංශය** - ප්‍රතිස්ථාපනය
- **ව්‍යාපෘති අරමුණ**

අව භාවිත මට්ටමේ පවතින විල්ගොඩ නගර සභා ඉඩමෙහි උපරිම ප්‍රයෝජනය ගැනීම.

- **ව්‍යාපෘති තාර්කිකත්වය**

ඉහල වාණිජමය වටිනාකමක් සහිත වර්තමාන පොල සහිත ඉඩම සිනමා ශාලා, ආපන ශාලා ඇතුළු වෙළඳ සංකීර්ණයක් ලෙස සංවර්ධනය කිරීම මඟින් ප්‍රශස්ථ භාවිතයට යොද ගැනිමට හැකිවන අතර. පොල ප්‍රතිස්ථාපනය වන ස්ථානයද නගරය ආසන්නයේ බැවින් ක්‍රියා කාරී වේ.

(පොල සතියකට දින 02ක් පමණ පැවැත්වෙන නිසා ඉහල වාණිජ වටිනාකමක් සහිත ඉඩම සතියකට දින 05ක් පමණ භාවිතයේ නොමැත.)

- **හිමිකම පිළිබඳ විස්තර** - කුරුණෑගල මහ නගර සභාව
- **ව්‍යාපෘති කාලය** - කෙටි කාලීන
- **මූල්‍ය ක්‍රමය** - මහ නගර සභාව
- **ව්‍යාපෘති විස්තරය**

කුරුණෑගල මහා නගර සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය එක්ව ඒකාබද්ද ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ඉඩමෙහි නගර සභා කම්කරු නිවාස පිහිටා ඇති අතර, එහි මහල් නේවාසික ගොඩනැගිලි ඉදිකර අඩු ආදායම් ලාභි නිවාස 500ක් ලබාදීමට නියමිතය. ඉතිරිවන අක්කර 02ක් පමණ වූ භූමියෙහි පොල සඳහා අවශ්‍ය ගොඩනැගිලි , වාහන නැවතුම් ස්ථාන ඇතුලත්ව පොල ඉදිකිරීමට යෝජිත වේ.

- ඉඩමේ වර්තමාන තත්වය

අඩු ආදායම් නිවාස (නගර සභා සෞඛ්‍ය කම්කරුවන්ගේ) පිහිටා ඇත.

- සංකල්පිත සිතියම්



- නිර්දේශිත ආයතන

(Approval Agencies )

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized person ) |
|---|---|---|
| **පොල ප්‍රතිස්ථාපනය** | මහ නගර සභාව නාගරික සංවර්ධන අධිකාරිය | නගරාධිපති / නාගරික කොමසාරිස් අධ්‍යක්ෂ (වයඹ) |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ

ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

## ව්‍යාපෘති 25
## විල්ගොඩ සොරොව්ව ප්‍රතිසංවර්ධනය කිරීම.

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කල යුතු ව්‍යාපෘතියකි.

## ව්‍යාපෘති 26
## පොලිසිය හා පොලිස් නිල නිවාස ප්‍රතිස්ථාපනය

- ව්‍යාපෘති යෝජනාව

නගර මධ්‍යයේ පොලිස් මුරපොලක් පමණක් ස්ථාපනය කර පොලිසිය හා පොලිස් නිල නිවාස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය පිහිටි ඉඩමේ ප්‍රතිස්ථාපනය කිරීම.

- ව්‍යාපෘති ස්ථානය (Project Location)

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රිකය ( District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division)කුරුණෑගල | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | කුරුණෑගල | කුරුණෑගල |
| **මායිම් (Boundary)** | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | කොළඹ පාර | කොළඹ පාර | මුහන්දිරම් වීරතුංග මාවත | නිවාස |
| **ප්‍රවේශ (Access)** | කොළඹ පාර | | | |

- පිහිටීමේ සිතියම




- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සංවර්ධන සැලැස්ම

- ව්‍යාපෘති අරමුණ

  - දැනට පවතින පොලිසිය හා පැරණි පොලිස් නිල නිවාස ප්‍රතිස්ථාපනය තුළින් නගර මධ්‍යය වාණිජ වටිනාකමකින් යුක්ත ඉඩම ප්‍රශස්ථ මට්ටමේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනිම.

  - අවම සංවර්ධන තත්ත්වයේ පවතින ජ්‍යොෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය පිහිටි අක්කර 09ක් පමණ වූ ඉඩම ප්‍රශස්ථ ලෙස සංවර්ධනය සඳහා යොදා ගැනීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

වර්තමාන පොලිස් ස්ථානය පිහිටා ඇති ඉඩමෙහි කුඩා පොලිස් ඒකකයක් පමණක් ස්ථාපිත කරමින් පොලිසිය ජ්‍යොෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය හා නිල සුනඛ අංශය , කොට්ඨාශ අපරාධ විමර්ශණ අංශය, විශේෂ අපරාධ විමර්ශන අංශයටම සම්බන්ධ කරමින් පොලිසිය හා අනුබද්ධිත කටයුතු ඒකාබද්ධ කිරිම තුළින් ජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබාදීම.

- වර්තමාන ඉඩම් හිමිකම - රජයේ

- ව්‍යාපෘති කාලය - මධ්‍ය කාලීන

- ## මූල්‍ය ක්‍රමය

මධ්‍යම රජය, පොලිස් දෙපාර්තමේන්තුව, ආරක්ෂක අමාත්‍යාංශය

- ## ව්‍යාපෘති විස්තරය

පොලිස් අධිකාරි කාර්යාලය පිහිටි ඉඩමෙහි පොලිසිය හා පොලිස් නිල නිවාස සංකීර්ණය ප්‍රති ස්ථාපනය කර අදාල ඉඩමෙහි සංවර්ධනය විධිමත් කිරීම.

- ## වර්තමාන ඉඩම් භාවිතය

මෙම ඉඩමෙහි දෙමහල් පොලිස් අධිකාරි කාර්යාල ගොඩනැගිල්ලට අමතරව තැනින් තැන විසිරුණු තනිමහල් කුඩා කාර්යාල ගොඩනැගිලි පිහිටා ඇත.

- ## පවත්නා තත්ත්වය

පොලිස් අධිකාරි කාර්යාලය (මහල් 02 ව.අ 5000ක් පමණ )
නිල සුනඛ අංශය
කොට්ඨාශ අපරාධ විමර්ශන අංශය
විශේෂ අපරාධ විමර්ශන අංශය
කොට්ඨාශ බුද්ධි අංශය
සන්නිවේදන මධ්‍යස්ථානය
ක්ෂේත්‍ර පරිසර ඒකකය

- ## නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයාඃ (Authorized person ) |
|---|---|---|
| **පොලිසිය හා නිල නිවාස ප්‍රතිස්ථාපනය** | පොලිස් දෙපාර්තමේන්තුව , ආරක්ෂක අමාත්‍යාංශය | ලේකම් , ආරක්ෂක අමාත්‍යාංශය |

- ## රෙගුලාසි සහ මාර්ගෝපදේශ

ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

# ව්‍යාපෘති 27
## භූමි අලංකරණ ව්‍යාපෘතිය

- ව්‍යාපෘති යෝජනාව

**රෝහලට යාබද සිරිසර කුඹුරු යායෙහි ඇවිදින මං තීරු සංවර්ධනය හා භූ ඇල දෙපස භූ දර්ශන තලයන්.**

- ව්‍යාපෘති ස්ථානය (Project Location)

- පිහිටීම සිතියම




- යාබද ඉඩම් භාවිත : - වාණිජ සංවර්ධනය , කුරුණෑගල ශික්ෂණ රෝහලට යාබදව පිහිටා ඇත.
- ව්‍යාපෘති වර්ගය - භූදර්ශන කලමණාකරන සැලැස්ම
- ව්‍යාපෘති අංශ - භූ දර්ශන/ සමාජ / භෞතික අපරව්‍යූහ පහසුකම් සංවර්ධනය

- **ව්‍යාපෘති අරමුණ**

  - නාගරික ජනතාවට ව්‍යායාම කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
  - පොදු වාහන නැවතුම් ස්ථාන ලබාදීම.
  - දර්ශණය විමේ සැලැස්ම ක්‍රියාත්මක කිරිම.

- **ව්‍යාපෘති තාර්කිකත්වය**

රෝහල අවට ප්‍රදේශයේ වාහන නැවතුම් හා ව්‍යායාම කටයුතු සඳහා පහසුකම් නොමැති බැවින්, පහසුකම් ලබාදිමේ හැකියාව ඇත, වගා කල හැකි කුඹුරු ඉඩමක් බැවින් වගාවන් සහිතව නාගරික කටයුතු සඳහා යොදා ගැනීමට හැක. ඇතුගල දර්ශණය විමේ සැලැස්ම ක්‍රියාත්මක කිරිමේ හැකියාව පවති.

- **ව්‍යාපෘති කාලය** - කෙටි කාලීන

- **මූල්‍ය ක්‍රමය** - මහ නගර සභාව/ නාගරික සංවර්ධන අධිකාරිය/ මහා භාණ්ඩාගාරය

- **ව්‍යාපෘති විස්තරය**


කුඹුරු වටා ඇවිදින මංතිරු සකස් කිරිම, ප්‍රධාන මාර්ගයට යාබදව ගොඩනැගිලි සීමාවෙන් පිටත අඩි 90ක පළලින් යුතු භූමිය ගොඩකර වාහන නැවතුම් සඳහා යොදා ගැනිම, කුඹුරු කාබණික වගාවන් සහිත ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරිම.

- **ව්‍යාපෘති ඉතිහාසය**

මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී පමණ නාගරික සංවර්ධන අධිකාරිය හඳුනාගත් ව්‍යාපෘතියක් වන අතර, සැලසුම් සකස් කර ඇත. ඇවිදීමේ මං තීරු සකස් කිරිම, ආරම්භ කර තිබුණද දැනට ව්‍යාපෘතිය නැවති ඇත.

- වර්තමාන තත්වය

කුඹුරු ඉඩමෙහි කොටසක් දැනටමත් ගොඩකර ඇත.




පවත්නා තත්ත්ව පිරිසැලසුම් සිතියම

- නිර්දේශිත ආයතන

| කටයුතු (Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| **ඉඩම් අත්පත් කර ගැනීම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම්) |
| **ඉඩම ගොඩකර සංවර්ධනය කිරිම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (පලාත්) |
| **ඇවිදින මං තීරු සකස් කිරීම** | නාගරික සංවර්ධන අධිකාරිය | |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ

කුඹුරු යනාදිය ගොඩකර මාර්ග සංවර්ධනය කිරීමේදී ජලාපවහන සැලැස්මට අනුකූලව සිදුකල යුතුය.

# ව්‍යාපෘති 28

## ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය පිහිටි ඉඩම සංවර්ධනය කිරීම

- ව්‍යාපෘති යෝජනාව

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය පිහිටි ඉඩම වාණිජ සංවර්ධනයක් සහිතව කුඩා උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම.

- ව්‍යාපෘති ස්ථානය

- ප්‍රවේශ (Access) - කුරුණෑගල - දඹුල්ල මාර්ගය

- පිහිටීම සිතියම




- යාබද ඉඩම් භාවිතා - වාණිජ

- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සංවර්ධන සැලැස්ම

- ව්‍යාපෘති අංශය - භූ දර්ශන / ආර්ථික

- ව්‍යාපෘති අරමුණ

  - දඹුල්ල මාර්ගයේ සිට නගරයේ පිවිසුම වශයෙන් මෙම ස්ථානය නගරයට අලංකාරයක් ලැබෙන පරිදි උද්‍යානයක් ලෙස සකස් කිරීම.
  - පුරා විද්‍යාත්මක ගොඩනැගිලි සංරක්ෂණය කරමින් වාණිජ සංවර්ධනය සඳහා යොදා ගැනීම.
  - දඹුල්ල මාර්ගයේ බස් රථ නැවතුම් ස්ථානයක් නොමැති අතර, එම අවශ්‍යතාවය සපුරාලීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

වර්තමානයේ ලොරි රථ යනාදිය නවතා මෙම ස්ථානය අවිධිමත් තත්ත්වයේ පවතින අතර, මෙම ත්‍රිකෝණාකාර ඉඩමෙහි විශාල සංවර්ධනයක් සඳහාද ඉඩකඩ නොමැත. ඒ අනුව දඹුල්ල මාර්ගයේ බස් නැවතුම්පලත් සමඟ කුඩා උද්‍යානයක් ලෙස නගර පිවිසුම සකස් කිරීම යෝග්‍ය වේ. සංරක්ෂිත ගොඩනැගිලි ආරක්ෂා කරගනිමින් වාණිජ සංවර්ධනය සඳහා යොදාගත හැක.

- ව්‍යාපෘති කාලය - කෙටි කාලීන
- මූලාා ක්‍රමය - කුරුණෑගල මහ නගර සභාව
- ව්‍යාපෘති විස්තරය - දඹුල්ල මාර්ගයේ බස්රථ සඳහා කුඩා බස්නැවතුම්පලක් ඉදිකිරීම
  - අසුන් ගැනීම සඳහා බංකු යනාදිය ඉදිකිරීම.
  - ගස් වවා උද්‍යානයක් ලෙස සකස් කිරීම.

- වර්තමාන තත්වය - වාහන නැවතුමක් ලෙස පවතී.

  තනි මහල් කාර්යාල ගොඩනැගිල්ලක් පවතී.

- සංකල්පිත සැකසුම්



- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| **පැරණි ගොඩනැගිලි සංරක්ෂණය කර සුදුසු භාවිතයට යොදා ගැනීම** | කුරුණෑගල මහ නගර සභාව | නගරාධිපති/නාගරික කොමසාරිස් |
| **අසුන් ගැනීමට සුදුසු ස්ථාන සකස් කිරීම හා භූමිය සකස් කිරිම.** | කුරුණෑගල මහ නගර සභාව | නගරාධිපති/ නාගරික කොමසාරිස් |
| **ගස් වවා උද්‍යානය සකස් කිරීම.** | කුරුණෑගල මහ නගර සභාව | නගරාධිපති/ නාගරික කොමසාරිස් |

# ව්‍යාපෘතිය 29


## හෙරලියාවල කර්මාන්තපුරය පුළුල්කිරිම.

- ව්‍යාපෘති යෝජනාව

හෙරලියාවල කර්මාන්තපුරයට යාබද ඉඩම අත්පත් කරගෙන කර්මාන්තපුරය පුළුල්කිරිම.

- ප්‍රවේශ (Access) - මල්කඩුවාව - අලකොලදෙණිය මාර්ගය

- පිහිටීම සිතියම




- යාබද ඉඩම් භාවිතා - මෙම ඉඩමට යාබදව කර්මාන්තපුරය පිහිටා ඇත.

- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සංවර්ධන සැලැස්ම

- ව්‍යාපෘති අංශය - ආර්ථික/ භෞතික අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය

- ව්‍යාපෘති අරමුණ
  - හෙරලියාවල කර්මාන්තපුරය සඳහා පවතින ඉඩම් ඉල්ලුම සපුරාලීම.
  - රැකියා වියුක්තිකයන් සඳහා රැකියා අවස්ථා බිහිකිරිම.
  - කාර්මික රැකියා නියුක්තිය ඉහල නංවාලමින් ආර්ථිකය විවිධාංගිකරණයට ලක් කිරිම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

හෙරලියාවල කර්මාන්තපුරය යෝජිත මංතීරු 02කින් යුතු බාහිර විකල්ප මාර්ගයට ආසන්නයේ පිහිටා ඇති අතර යෝජිත අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන වන ගැට්ටුවාන හා දංබොක්ක ආසන්නයේ පිහිටා ඇති බැවින්, අමුද්‍රව්‍ය ආනයනය කිරීම . නිෂ්පාදන අපනයන කිරීම යනාදීය කාර්යක්ෂමව සිදුකර ගැනිමේ හැකියාව ඇත. එමෙන්ම කොළඹට හා තදාසන්න ප්‍රදේශයන්ට සාපේක්ෂව අඩු මුදලට කුරුණෑගල ප්‍රදේශයෙන් ඉඩම් ලබා ගත හැකි නිසා අයෝජකයින්ගේ ආකර්ෂණය කුරුණෑගල නගරයට ලබා ගැනිමේ හැකියාව පවති.

- වර්තමාන ඉඩම් හිමිකම - පුද්ගලික
- ව්‍යාපෘති කාලය - මධ්‍ය කාලීන
- මූල්‍ය ක්‍රමය - වයඹ පළාත් සභාව
- ව්‍යාපෘති විස්තරය
  - කර්මාන්ත ශාලා සඳහා අවශ්‍ය අපරව්‍යූහ පහසුකම් සහිතව ඉඩම් අත්පත් කර ගැනීම.
  - ඉඩම් සහන ක්‍රමයට ආයෝජකයින්ට ලබාදිම.
  - බදු සහන, ණය ගෙවීම සඳහා සහන කාල සිමාවක් හා දිරි ගැන්විම.
- නිර්දේශිත ආයතන

| කටයුතු(Activiy) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| **ඉඩම් පවරා ගැනිම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම්) |
| **ඉඩම් සංවර්ධනය** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (වයඹ) |
| **ඉඩම් බදුදීම** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම්) |

රෙගුලාසි සහ මාර්ගෝපදේශ

- කුඹුරු යනාදිය ගොඩකර මාර්ග සංවර්ධනය කිරිමේදී ජලාපවහන සැලැස්මට අනුකූලව සිදුකල යුතුය.
- ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

# ව්‍යාපෘති 30

## උඩවල්පොල ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරිම

- ව්‍යාපෘති යෝජනාව - උඩවල්පොල පුරන්වූ කුඹුර ක්‍රීඩාපිටියක් ලෙස සංවර්ධනය කිරිම.
- ව්‍යාපෘති ස්ථානය (Project Location)
- ප්‍රවේශ (Access) - දකුණු රවුම් පාර
- පිහිටීම සිතියම




- යාබද ඉඩම් භාවිත

රජයේ කාර්යාල, නේවාසික , කුඹුරු යනාදිය සහිත මිශ්‍ර සංවර්ධන කටයුතු(මෙම ඉඩමට ඉදිරිපසින් යෝජිත විකල්ප මාර්ගය වැටී ඇත.)

### ව්‍යාපෘති සාධාරණීකරණය

- ව්‍යාපෘති වර්ගය - විවෘත භූමි සැලැස්ම
- ව්‍යාපෘති දර්ශනය - සමාජ අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය
- ව්‍යාපෘති අරමුණ

කුරුණෑගල නගරය සඳහා අත්‍යාවශ්‍ය පොදු ක්‍රීඩා පිටියක අවශ්‍යතාවය සපුරාලීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

නගර සභාව සතු මාලිගාපිටිය ක්‍රිඩාංගනය ජාතික මට්ටමේ මළල ක්‍රිඩා සඳහා ක්‍රිඩාපිටියක් ලෙස සංවර්ධනය කිරිමට යෝජිත බැවින් පොදු මහජනතාවට ක්‍රිඩා කිරිම , උත්සව පැවැත්වීම සඳහා පොදු ස්ථානයක් අවශ්‍යය. ඒ සඳහා මෙම ක්‍රිඩා පිටිය යෝජනා කර ඇත.

ව්‍යාපෘති විස්තරය

- ව්‍යාපෘතිකාලය - මධ්‍ය කාලීන
- මූල්‍ය ක්‍රමය
  මහ නගර සභාව කුරුණෑගල , නාගරික සංවර්ධන අධිකාරිය, මහා භාණ්ඩාගාරය
- ව්‍යාපෘති විස්තරය

  අත්හරින ලද කුඹුරු ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ජලාපවහන සැලැස්මට අනුව ගොඩකර අවශ්‍ය ක්‍රිඩාගාරයක් සහිතව ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කිරිම.

- වර්තමාන තත්වය - අත් හරින ලද මුඩු කුඹුරු ඉඩම්
- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනිම | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (වයඹ පළාත්) |
| ඉඩම් සංවර්ධනය කිරිම | මහ නගර සභාව | නාගරික කොමසාරිස් |
| | | |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ
  - කුඹුරු පහත් බිම් යනාදිය ගොඩකර මාර්ග සංවර්ධනය කිරිමේදී ජලාපවහන සැලැස්මට අනුකූලව සිදුකල යුතුය.
  - ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

## ව්‍යාපෘති 31

### පවතින පාසල්වල භෞතික පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති


අධ්‍යාපන පහසුකම් සංවර්ධන සැලැස්ම තුලින් හඳුනාගත් පාසල් සඳහා ගොඩනැගිලි යනාදි භෞතික පහසුකම් සංවර්ධනය කිරිම . අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කල යුතු ව්‍යාපෘතියකි.

## ව්‍යාපෘති 32

### යෝජිත රජපිහිල්ල උපකාරක පංති මධ්‍යස්ථානය

ව්‍යාපෘති යෝජනාව දැනට මහා නගර සභාව සතු මහනුවර කුරුණෑගල මාර්ගයෙන් ප්‍රවේශය ලබාගත හැකි පෞද්ගිලක බස් රථ නැවතුමක් ලෙස පවතින ඉඩමෙහි උපකාරක පංති මහල් ගොඩනැගිල්ලක් සංවර්ධනය කිරීම.

- ව්‍යාපෘති ස්ථානය
- ප්‍රවේශ (Access) - කුරුණෑගල මහ නුවර මාර්ගය හා රජපහිල්ල මාර්ගය
- පිහිටීම සිතියම



- යාබද ඉඩම් භාවිත - මිශ්‍ර සංවර්ධන
- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සංවර්ධන සැලැස්ම

- ව්‍යාපෘති අරමුණ

  - නගරයේ පෝෂක ප්‍රදේශයේ සිසුන්ට ඉහල ගුණාත්මක තත්ත්වයේ උපකාරක පංති පහසුකම් සැපයීම.
  - නගරයේ සහ පෝෂක ප්‍රදේශයේ සිටින සිසුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීම.
  - උපකාරක පංති ශාලා බදුදීම මඟින් ආදායම උපයා ගැනීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

කුරුණෑගල මහනුවර මාර්ගය ආශ්‍රිතව උපකාරක පංති වැඩි වශයෙන් ව්‍යාප්තව පවතින අතර, සිසුන් සඳහා අත්‍යාවශ්‍ය අපරව්‍යූහ පහසුකම් නොමැතිව එම ස්ථාන සංවර්ධනය වී ඇති බව නිරික්ෂණය වේ. කැකිරාව, දඹුල්ල, අනුරාධපුරය වැනි දුර පළාත් වලින් උපකාරක පංති සඳහා පැමිණෙන සිසුන්ට බස් නැවතුම්පලේ සිට පයින් යා හැකි දුරකින් අපරව්‍යූහ පහසුකම් සහිතව මෙම ස්ථානයෙහි උපකාරක පංති මධ්‍යස්ථානයක් ඉදිකිරිම මඟින් භූමිය ප්‍රශස්ථ භාවිතයට යොදා ගත හැක. දැනට මෙම ස්ථානයේ නවතා තබන පෞද්ගලික බස් සඳහා බස් නැවතුම් ස්ථානයක් යෝජනා කර ඇත.

- ව්‍යාපෘති විස්තරය
- ව්‍යාපෘතිකාලය - කෙටි කාලීන
- මූල්‍ය ක්‍රමය - කුරුණෑගල මහ නගර සභාව, පෞද්ගලික ආයෝජන
- ව්‍යාපෘති විස්තරය

ප්‍රමාණවත් වාහන නැවතුම් සනීපාරක්‍ෂක පහසුකම් සහිතව උපකාරක පංති සඳහා මහල් ගොඩනැගිලි ඉදිකර බදුදීම.

- වර්තමාන ඉඩම් තත්වය - පෞද්ගලික බස් රථ නැවතුම් ස්ථානය
- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person |
|---|---|---|
| **ව්‍යාපෘතිය සැලසුම් කිරීම , ගොඩනැගිලි ඉදිකිරිම** | මහ නගර සභාව | නගරාධිපති / නාගරික කොමසාරිස් |

.

# ව්‍යාපෘති 33

## තරු පංතියේ හෝටලය සංවර්ධනය කිරිම. (බඩගමුව)

- ව්‍යාපෘති යෝජනාව

බඩගමුව රක්ෂිතය ආසන්නයේ කුරුණෑගල වැව්ලි සමාගමකට අයත් පොල් ඉඩමෙන් අක්කර 10 පමණ හෝටල් සංවර්ධන සඳහා යොදා ගැනීම.

- ව්‍යාපෘති ස්ථානය

- ප්‍රවේශ (Access)

පිහිටීම සිතියම




- යාබද ඉඩම් භාවිතා

බඩගමුව රක්ෂිතයට මායිම්ව විශාල පොල් ඉඩම් ආශ්‍රිතව මෙම ඉඩම පිහිටා ඇත.

- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සංවර්ධන සැලැස්ම

- ව්‍යාපෘති දර්ශනය - භෞතික අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය

- ව්‍යාපෘති අරමුණ

නගරයට අත්‍යාවශ්‍ය සුඛෝපභෝගී හෝටල් හා නවාතැන් පහසුකම් ලබාදීම

- වයාපෘති තාර්කිකත්වය

වෙළගෙදර ක්‍රීඩාංගනය ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිඩාංගනයක් ලෙස සංවර්ධනය කිරිමට යෝජිත අතර, ක්‍රීඩකයින් සඳහා එයට ආසන්නයේ හෝටල් හා නවාතැන් පහසුකම් ලබාදිය යුතුය. ඒ සඳහා බඩගමුව රක්ෂිතය ආසන්නයේ නිස්කලංක ප්‍රදේශයක මෙම ව්‍යාපෘතියට සුදුසු ඉඩම හඳුනාගෙන ඇත. කුරුණෑගල නගරයෙහි තරු පන්තියේ හෝටල් පහසුකම් නොමැති බැවින්, එම ඉල්ලුමට සරිලන සැපයුම ලබාදීම සඳහා මෙම ව්‍යාපෘතිය වැදගත් වේ. ගලලලල

- ව්‍යාපෘති කාලය දීර්ඝ කාලීන

- මූල්‍ය ක්‍රමය නාගරික සංවර්ධන අධිකාරිය අරමුදල්, විදේශ ආයෝජන

කුරුණෑගල වැවිලි සමාගමට අයත් ඉඩමෙන් අක්කර 10ක් පමණ අත්පත් කරගෙන පොල් ගස් යනාදිය අවම වශයෙන් ඉවත් කර බඩගමුව රක්ෂිතය හා ගැලපෙන පරිදි කාමර 50කින් යුත් සුඛෝපභෝගි හෝටල් සංකීර්ණයක් ඉදිකිරිම සඳහා ආයෝජකයින් වෙත ලබාදීම.

- වර්තමාන තත්වය - පොල් ඉඩම

- සංකල්පිත සැලැස්ම.



- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| **ඉඩම් අත්පත් කර ගැනීම** | නාගරික සංවර්ධන අධිකාරිය | පළාත් අධ්‍යක්ෂ |
| **ගොඩනැගිලි ඉදිකිරිම** | පෞද්ගලික ආයෝජන | |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ

  - ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය

# ව්‍යාපෘති 34

## සාරගම වැව ආශ්‍රිතව භූමි අලංකරණ ව්‍යාපෘතිය

- ව්‍යාපෘති යෝජනාව - සාරගම වැව ආශ්‍රිතව භූ දර්ශනය කර ජනතාවට විවේක හා විනෝද පහසුකම් ලබාදීම.

- ව්‍යාපෘති ස්ථානය (Project Location)

- පිහිටීම සිතියම




- යාබද ඉඩම් භාවිතා

තිත්තවැල්ල ප්‍රදේශයේ පුත්තලම, කුරුණෑගල ප්‍රධාන මාර්ගය ආශ්‍රිතව පිහිට ඇත.

- ව්‍යාපෘති අංශය - භූ දර්ශන/ සමාජ / භෞතික

- ව්‍යාපෘති අරමුණ

නාගරික ජනතාවට ව්‍යායාම කටයුතු හා විවේකය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම පොදු වාහන නැවතුම් ස්ථාන ලබාදීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

නගර මධ්‍යයට තරමක් පරිභාහිරව මහා මාර්ගයක් අසල පිහිටා ඇති ජලාශයක් බැවින්. නගරයට ඇදී එන සහ නගරයේ සිටින ජනතාවට විවේක සහ විනෝද පහසුකම් සැපයිය හැකි සුදුසුම ස්ථානයක් වීම.

- වාාපෘති කාලය - කෙටි කාලීන

- මූලා ක්‍රමය - පළාත් පාලන ආයතනය


- වර්තමාන තත්වය

මාර්ගය හා වැව ආශ්‍රිතව ඇති පදික මං තීරු සකසා ඇති නමුත් අවභාවිතයේ පවතී.

- වාාපෘති විස්තරය

  - වැව වටා ඇවිදින මංතිරු සකස් කිරිම,
  - විවේක ගැනීම සදහා බංකු සවිකිරිම
  - ළමා උද්‍යානය සකස් කිරීම
  - වාායාම ප්‍රදේශ සකස් කිරීම.

- පවත්නා තත්ත්ව පිරිසැලසුම් සිතියම




- අනුමත කරන ආයතන

(Approval Agencies )

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| **සැලසුම් සකස් කිරීම හා භූ දර්ශනය** | නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රාදේශීය සභාව | සභාපති ( ප්‍රා. ස) පළාත් අධ්‍යක්ෂ |
| | | |

# ව්‍යාපෘතිය 35

## නයිලිය ප්‍රදේශයේ භාණ්ඩ ප්‍රවර්ධන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම.

- ව්‍යාපෘති යෝජනාව


අධිවේගී මාර්ග අන්තර් හුවමාරුව ආසන්නයේ ඉඩම් අත්පත් කරගෙන භාණ්ඩ ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම.

- ව්‍යාපෘති ස්ථානය

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රික්කය ( District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division)කුරුණෑගල | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | | |
| මායිම් (Boundary) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | | | | |

- ප්‍රවේශ (Access) - යෝජිත විකල්ප මාර්ගය/ හේනමුල්ල මාර්ගය

- පිහිටීම සිතියම



- යාබද ඉඩම් භාවිතා

ගෙවතු , පොල්වතු යනාදි ප්‍රදේශයකි. මෙම ඉඩම අධිවේගී මාර්ගයේ සිට මීටර් 200 ක පමණ දුරින් පිහිටා ඇත.

- ව්‍යාපෘති වර්ගය - ආර්ථික සංවර්ධන සැලැස්ම
- ව්‍යාපෘති දර්ශනය - ආර්ථික, සමාජ පහසුකම් සංවර්ධනය

- ව්‍යාපෘති අරමුණ

  - ගඩොල් , උළු , සිමෙන්ති වැනි ගොඩනැඟිලි අමුද්‍රව්‍ය බහුල පෝෂක ප්‍රදේශයක කුරුණෑගල නගරය පිහිටීමත් වර්තමානයේ පවතින වාහන හා අමතර කොටස් අලෙවියේදී ශ්‍රී ලංකාව තුළ හිමි කරගෙන ඇති ස්ථානයත් සමඟ අධිවේගී මාර්ගය සහ දුම්රිය මාර්ගය දිර්ඝ කිරිමේ ව්‍යාපෘතිය ප්‍රයෝජනයට ගනිමින් ලංකාව පුරා භාණ්ඩ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම.

  - අධිවේගී මාර්ගය, දුම්රිය මාර්ගය, මහා මාර්ග තුලින් කුරුණෑගල නගරය හිමිකරගෙන තිබෙන කාර්යක්‍ෂම ප්‍රවේශ පහසුකම් නාගරික ආර්ථිකයට යොදා ගැනීම.

  - රැකියා අවස්ථාවන් බිහි කිරීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

  - අධිවේගී මාර්ගය, දුම්රිය මාර්ගය හා මහා මාර්ග හරහා ලංකාව පුරා භාණ්ඩ බෙදා හැරිමේ හැකියාව පවතින හෙයින් අධිවේගී මාර්ගයේ ගැට්ටුවාන හා දම්බොක්ක අන්තර් හුවමාරු මධ්‍යස්ථානවලට සහ නයිලිය දුම්රිය ස්ථානය ආසන්නයේ නයිලිය ප්‍රදේශයේ භාණ්ඩ බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය තුළින් බලාපොරොත්තු වේ.

  - කුරුණෑගල නගරය තුල ගබඩා පහසුකම් සඳහා පවතින වර්තමාන ඉල්ලුමත් සමඟ අවිධිමත් ආකාරයට අනෙකුත් භාවිතයන්ට ගැටලුවක් ලෙස විසිරි පවතින ගබඩා විධිමත් පරිදි සංවර්ධනය කිරිම.

  - වර්තමානයේ දී උඩුමීය ප්‍රදේශයේ රේගු දෙපාර්තමේන්තුවේද ආයකත්වය සහිතව ගබඩා සංකීර්ණයක් පවත්වාගෙන යන අතර එම සේවාව පුළුල් කිරීමේ හැකියාව

- වයාපෘතිකාලය - දීර්ඝ කාලීන

- මූල්‍ය ක්‍රමය - නාගරික සංවර්ධන අධිකාරියඅරමුදල්
  - පෞද්ගලික අයෝජන

භාණ්ඩ ගබඩා කිරීම, භාණ්ඩ ඇසිරිමේ හා, කන්ටේනර් අංගන වැනි කටයුතු සඳහා අක්කර 50ක පමණ ඉඩම අත්පත් කරගෙන සංවර්ධනය කර ආයෝජකයින් වෙත ලබාදීම.

මේ සඳහා අක්කර 50ක පමණ විශාලත්වයකින් යුතු භූමියක් හඳුන්වා දී ඇති අතර මෙම ව්‍යාපෘතිය තුළින් රැකියා අවස්ථාවන් විශාල ප්‍රමාණයක්ද උත්පාදනය කිරිමට අවස්ථාව උදාවේ.

- සංකල්පීය සැකසුම්



- යෝජිත සැලැස්ම හා ගොඩනැගිලි සැලසුම් අවශ්‍යතා

මිනින්දෝරු සැලැස්ම හා පිරිසැලසුම් සිතියම

- නිර්දේශිත ආයතන

| කටයුතු (Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized person ) |
|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීම | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (ඉඩම්) |
| ඉඩම් සංවර්ධනය කිරිම | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යක්ෂ (වයඹ පළාත) |
| ඉඩම් බදුදීම | නාගරික සංවර්ධන අධිකාරිය | |
| | | |

- රෙගුලාසි සහ මාර්ගෝපදේශ


ගොඩනැගිලි ඉදි කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුය

# ව්‍යාපෘතිය 36

## මුත්තෙට්ටුගල ගුවන් පාලම ඉදිකිරිම.

- ව්‍යාපෘතියේ පිහිටීම

- යෝජිත ගුවන් පාලම - මුත්තෙට්ටුගල දුම්රිය හන්දිය




- ව්‍යාපෘතියේ අරමුණ

දඹුල්ල මාර්ගය තුල ඇතිවිය හැකි වාහන තදබදය අවම කර ගැනීම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

දුම්රිය මාර්ගය , අඹේපුස්ස ත්‍රිකුණාමලය මාර්ගය!006*හරහා මුත්තෙට්ටුගල ප්‍රදේශයේදී ගමන් කිරීම නිසා දිනකට මෙම දුම්රිය හරස් මාර්ගය හැටවරක් පමණ වැසීමට සිදුවීම මත මෙම මාර්ගයේ සුමට ප්‍රවාහනය සඳහා බාධාවක් වී ඇත. එමෙන්ම අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරුව සංවර්ධනයත් සමඟ ගැට්ටුවාන මුත්තෙට්ටුගල ප්‍රදේශයේ සංවර්ධන නැම්යාව ඉහළ යනු ලබයි. තවද මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යයනයන් මඟින් 2020 වර්ෂය වන විට මෙම මාර්ගයේ වාහන ධාරිතාවය ඉහළ ගොස් උග්‍ර වාහන තදබදයක් ඇති වන බව පැහැදිලිවී ඇත. ඒ අනුව එම ගැටළුව විසඳීම සඳහා මුත්තේට්ටුගල දුම්රිය හරස් මාර්ගය හරහා ගුවන් පාලම ඉදිකිරීමට යෝජිතය.

- **ප්‍රතිලාභීන්**

නාගරික ජනතාව හා සංසරණ ජනතාව

- **ප්‍රතිලාභ**

දඹුල්ල මාර්ගය වෙත දුම්රිය මාර්ගයෙන් සිදුවන අවහිරතාවය මඟ හැරවීම, ප්‍රවාහන කාලය හා ප්‍රවාහන වියදම අවම කිරීම.

- **ක්‍රියාත්මක කරන ආයතනය**

මර්ග සංවර්ධන අධිකාරිය, අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

- **මූල්‍ය ක්‍රමය** - මාර්ග සංවර්ධන අධිකාරිය

- **ක්‍රියාත්මක කරන කාලය** - මධ්‍ය කාලීන

- **නිර්දේශිත ආයතන**

| කටයුතු (Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා (Authorized person ) |
|---|---|---|
| **ව්‍යාපෘතිය සැලැසුම් කිරිම, ඉඩම් අත්පත් කර ගැනිම** | මාර්ග සංවර්ධන අධිකාරිය | පළාත් අධ්‍යක්ෂ (වයඹ) |
| **ගුවන් පාලම සංවර්ධනය කිරීම .** | මධ්‍යම අධිවේගී වියාපෘතිය, මාර්ග සංවර්ධන අධිකාරිය | |
| | | |

# ව්‍යාපෘති 37

## මාලිගාව පිහිටි ඇතුගල ආශ්‍රිත ප්‍රදේශය උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරිම.

ව්‍යාපෘති යෝජනාව මෙම ව්‍යාපෘතිය තුළින් කුරුණෑගල නගරයේ රාජධානි සමයට අයත් පෞරාණික වටිනාකමකින් යුක්ත නටඹුන් හා ගොඩනැගිලි සංචාරකයින් ආකර්ෂණය කරගන්නා පරිදි ප්‍රතිසංස්කරණය කර උද්‍යානයක් ලෙස මහජනතාවට විවෘත කිරිම

- ව්‍යාපෘති ස්ථානය

| ස්ථානය (Location) | පළාත (Province) | වයඹ පළාත | දිස්ත්‍රික්කය (District ) | කුරුණෑගල |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය (DS Division) කුරුණෑගල | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් | | |
| මායිම් (Boundary) | උතුර (North ) | නැගෙනහිර (East) | දකුණ (South) | බටහිර (West ) |
| | වෙළගෙදර ක්‍රීඩාංගනය /කෘෂිකර්ම අමාත්‍යාංශ ගොඩනැගිල්ල | ඇතුගල | පළාත් සභා සංකීර්ණය | නගර සභාව හා පළාත් සභා සංකීර්ණය |
| ප්‍රවේශ (Access) | දඹුලු පාර හා කච්චේරි පාරේන් ප්‍රවේශ විය හැක. | | | |

- යාබද ඉඩම් භාවිතා - කාර්යාල හා රජයේ භාවිත
- ව්‍යාපෘති සාධාරණීකරණය

  - ව්‍යාපෘතිවර්ගය - භූදර්ශන කලමණාකරන සැලැස්ම
  - ව්‍යාපෘති දර්ශනය - සමාජ/ පරිසර අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය

- ව්‍යාපෘති අරමුණ

කුරුණෑගල නගරයට අයත් පෞරාණික වටිනාකමකින් යුක්ත ගොඩනැගිලි හා පුරා වස්තූන්ගේ පෞරාණිකත්වය ආරක්ෂාවන අයුරින් හා ආර්ථික ප්‍රතිලාභ ලැබෙන අයුරින් සංවර්ධනය කිරීම

- ## ව්‍යාපෘති තාර්කිකත්වය

වර්තමානය වන විට කුරුණෑගල රාජධානියට අයත් නටබුන් සුළු ප්‍රමාණයක් පැවතියද එම පරිශ්‍රයේ පෞරාණික ගොඩනැගිල්ලක් වන ආණ්ඩුකාර කාර්යාලයද පිහිටා ඇත. එමෙන්ම මෙම භූමිය ඇතුගලට මායිම්ව පිහිටි ලඳු කැලෑ සහිත ප්‍රදේශයකි. එබැවින් ඇතුගලට හා කුරුණෑගල වැවට ප්‍රවේශකත්වය ලබාගත හැකි පරිදි මෙම ප්‍රදේශය මහජනතාවට විවෘත කර උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරිමේ හැකියාව පවතී.

- ## ව්‍යාපෘතිකාලය - මධ්‍යා කාලීන

- ## මූල්‍ය ක්‍රමය - පළාත් සභාව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය.

- ## ව්‍යාපෘති විස්තරය

මෙම ව්‍යාපෘතිය තුළින් පෞරාණික වටිනාකමකින් යුක්ත නටඹුන් හා ගොඩනැගිලි එහි පවතින පුරාවිද්‍යාත්මක වටිනාකම ආරක්ෂා වන අයුරින් ප්‍රතිසංස්කරණය කොට ජනතාවට ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වේ. එයට සමගාමීව අවට භූදර්ශනය කිරීම විවේක ගැනීම සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. දැනට මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍යය සැලසුම් සකස්කර ඇති අතර මේ සඳහා පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසර ලබාගෙන ඇත. මෙම උද්‍යානයෙන් ඇතුගලට හා කුරුණෑගල වැවට ප්‍රවේශකත්වය ලබාගත හැකි පරිදි සැලැස්ම සකස් කර ඇත.

- ## ව්‍යාපෘති ඉතිහාසය

2014 වර්ශයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගන්නා ලද ව්‍යාපෘතියක් වන අතර, පැරණි පවුරේ සංරක්ෂණ කටයුතු 50% අවසන් කර ඇත. සවිස්තරාත්මක සැලසුම් හා ඇස්තමේන්තු පලාත් සභාව වෙත ලබා දී ඇත.

- ## වර්තමාන ඉඩම් තත්වය

කුරුණෑගල රාජධානියට අයත් නටඹුන් සුළු ප්‍රමාණයක් ඇත. ආණ්ඩු කාර්යාලය ඇතුලු කාර්යාල ගොඩනැගිලි පිහිටා ඇත.






- පිරිසැලසුම් සිතියම




- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorizd person ) |
|---|---|---|
| **පැරණි නාගරික ආරක්ෂිත පවුර, නටඹුන් ප්‍රති නිර්මාණය කිරිම.** | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ ජනරාල් , පුරාවිද්‍යා දෙ.මෙ |
| **උද්‍යානය නිර්මාණය** | නාගරික සංවර්ධන අධිකාරිය | අධ්‍යාක්ෂ (පලාත) |
| | පළාත් සභාව | ප්‍රධාන ලේකම් |
| | | |


# ව්‍යාපෘති 38

## වැල්ලව හා මුත්තෙට්ටුගල දුම්රිය ස්ථානයෙහි භූමි අලංකරණ ව්‍යාපෘතිය

- ව්‍යාපෘති යෝජනාව

වැල්ලව හා මුත්තෙට්ටුගල දුම්රිය ස්ථාන භූමි අලංකරණ සැලැස්මට අනුව ගස් වවා සංවර්ධනය කිරිම.

- පිහිටීම සිතියම




- ව්‍යාපෘති දර්ශනය - අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය

- ව්‍යාපෘති අරමුණ

  - වැල්ලව , මුත්තෙට්ටුගල දුම්රිය ස්ථාන අලංකරණය කිරිම තුළින් නගරය අලංකාර කිරිම.
  - දුම්රිය ස්ථාන භාවිතා කරන්නන් සඳහා සුවදායි ස්ථානයක් බවට පත් කිරිම.

- ව්‍යාපෘති තාර්කිකත්වය

දුම්රිය ස්ථානය වටා ගස් වවා අලංකාර කිරිම තුලින් සුවදායි පරිසරයක් ඇති කිරිමේ හැකියාව ඇත. මෙම දුම්රිය ස්ථානය දෛනිකව විශාල ජනගහනයක් භාවිතා කරන අතර, දුම්රිය පැමිණෙන තුරු සැලකිය යුතු වේලාවක් මෙම ස්ථාන වල රැඳීසිටිමට සිදුවේ. එමෙන්ම මෙම ස්ථාන ප්‍රධාන මාර්ගයට යාබඳව පවතින නිසා මාර්ගය තුල ගමන්කරන්නන්ට අලංකාර දර්ශණයක් වනු ඇත.

- ව්‍යාපෘති විස්තරය

- ව්‍යාපෘති කාලය - කෙටි කාලීන

- මූල්‍ය ක්‍රමය - දුම්රිය දෙපාර්තමේන්තුව

- ව්‍යාපෘති විස්තරය

දුම්රියක් පැමිණෙන තුරු දුම්රිය ස්ථානයේ රැඳි සිටින්නන් සඳහා වාඩි වී සිටීමට අවශ්‍ය ස්ථාන, කුඩා වෙළඳ කුටි යනාදිය ඉදිකර අවට ගස් වවා දුම්රිය ස්ථානය අලංකාර කිරීම.

- ව්‍යාපෘති ඉතිහාසය

වැල්ලව දුම්රිය ස්ථානය අලංකරණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා වෙත දැනටමත් ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කර ඇත.

- වර්තමාන තත්වය


ප්‍රමාණවත් අපර ව්‍යුහ පහසුකම් නොමැතිව දුම්රිය ස්ථාන පිහිටා ඇත.

- යෝජිත සැලැස්ම හා ගොඩනැගිලි සැලසුම් අවශ්‍යතා

වැල්ලව දුම්රිය ස්ථානයේ යෝජිත සැලැස්ම



- වැල්ලව දුම්රිය ස්ථානයේ භූදර්ශන සැලැස්ම




- නිර්දේශිත ආයතන

| කටයුතු(Activity) | අදාල අධිකාරිය (Relevant Authority) | බලයලත් පුද්ගලයා(Authorized person ) |
|---|---|---|
| **වෙළඳ කුටි , වාඩිවීමට බංකු යනාදිය ඉදිකිරීම** | ප්‍රවාහන අමාත්‍යාංශය | දුම්රිය ස්ථානාධිපති |
| **ගස් වවා අලංකාර කිරීම** | ප්‍රවාහන අමාත්‍යාංශය | දුම්රිය ස්ථානාධිපති |

## 6.2.2. වගකිව යුතු ආයතන රාමුව

*වගු අංකය 6.25 ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛණය*

| | සැලසුම් | උප සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | අදාල ආයතනය | ක්‍රියාත්මක කිරීමේ එක් එක් ආයතනය සතු වගකීම් |
|---|---|---|---|---|
| 1 | ජනාවාස සංවර්ධන සැලැස්ම (නිවාස සංවර්ධන සැලැස්ම) | නිවාස සංවර්ධන ව්‍යාපෘති<br>• මහල් නිවාස සංකීර්ණ (ගැටවුවාන, වැව රවුම, සත්‍යවාදී ඉඩම) | නාගරික සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, පෞද්ගලික ආයෝජකයෝ | 1. ඉඩම් පවරා ගැනීම හා ඉඩම් නිදහස් කිරීම<br>2. ප්‍රතිපාදන ලබාගැනීම<br>3. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම |
| | | • විල්ගොඩ අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිය | මහා නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • හාල් පාර නිවාස ව්‍යාපෘතිය - නිවාස සංවර්ධන අධිකාරිය | නිවාස සංවර්ධන අධිකාරිය | ඉඩම සංවර්ධනය කිරීම හා නිවාස සඳහා ඉඩම් ලබාදීම |
| | | නිවාස ව්‍යාපෘති (ගෝනගම, කවුඩාවත්ත, වඳුරාගල,දොරටියාව,හෙරලියාවල, දඹුල්ල පාර) | නාගරික සංවර්ධන අධිකාරිය, පෞද්ගලික ආයෝජකයන් | ඉඩම් අත්පත් කර ගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |

| | සැලසුම් | උප සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | අදාල ආයතනය | ක්‍රියාත්මක කිරීමේ එක් එක් ආයතනය සතු වගකීම් |
|---|---|---|---|---|
| 2 | අධ්‍යාපන පහසුකම් සංවර්ධන සැලැස්ම | රත්ගල්ල ජාතික පාසල ඉදිකිරීම | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි ඇතුලු අනෙකුත් පහසුකම් ලබාදීම |
| | | ගොඩනැගිලි ඉදිකර පවතින පහසුකම් වැඩි දියුණු කිරීම - (මතව තිරගම මධ්‍ය මහා විද්‍යාලය, මහින්ද විද්‍යාලය ගැටවුවාන, උඩබද්දලව සුදර්ශන විද්‍යාලය,, විශ්ව ලෝක විද්‍යාලය, ඇතුගල්පුර කුමර විද්‍යාලය, වැල්ලව මහා විද්‍යාලය, බෝයගනේ මහා විද්‍යාලය,) | අධ්‍යාපන දෙපාර්තමේන්තුව ක්‍රීඩා අමාත්‍යාංශය | ගොඩනැගිලි ඇතුලු අනෙකුත් පහසුකම් ලබාදීම ක්‍රීඩාංගන ඇතුලු අනෙකුත් පහසුකම් ලබාදීම |

| | සැලසුම් | උප සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | අදාල ආයතනය | ක්‍රියාත්මක කිරීමේ එක් එක් ආයතනය සතු වගකීම් |
|---|---|---|---|---|
| 3 | සෞඛ්‍ය පහසුකම් සංවර්ධන සැලැස්ම | • කුරුණෑගල ශික්ෂණ රෝහල ප්‍රතිසංවර්ධනය කිරීම | සෞඛ්‍ය අමාත්‍යාංශය, කුරුණෑගල ශික්ෂණ රෝහල | රෝහල සඳහා ප්‍රධාන භූමි සැලැස්ම සකස් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. |
| | | • මතව හා වැල්ලව රෝහල් වල භෞතික පහසුකම් සංවර්ධනය කිරීම | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | ගොඩනැගිලි ඇතුලු පහසුකම් ලබාදීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම |
| | | • මාස්පොත හා කිරිවවුල ප්‍රදේශයේ ග්‍රාමීය රෝහල් ස්ථාපනය කිරීම | සෞඛ්‍ය අමාත්‍යාංශය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම, ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. |
| | | • මාස්පොතහා මල්ලවපිටිය පවතින සායනික මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම | සෞඛ්‍ය අමාත්‍යාංශය | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. |

| | සැලසුම් | උප සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | අදාල ආයතනය | ක්‍රියාත්මක කිරීමේ එක් එක් ආයතනය සතු වගකීම් |
|---|---|---|---|---|
| 4 | ප්‍රවාහන සැලැස්ම | • බාහිර වටරවුම මාර්ගය සංවර්ධනය කිරීම | මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය සභාව නාගරික සංවර්ධන අධිකාරිය | ඉඩම් අත්පත් කර ගැනීම, ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. |
| | | • මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග පුළුල් කිරීම | මාර්ග සංවර්ධන අධිකාරිය | ඉඩම් අත්පත් කර ගැනීම, ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. |
| | | • ප්‍රාදේශීය අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීම | කුරුණෑගල මහා නගර සභාව, ප්‍රාදේශීය සභාව,පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, | ඉඩම් අත්පත් කර ගැනීම, ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. |
| | | • බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානය | මාර්ග සංවර්ධන අධිකාරිය, දුම්රිය දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ප්‍රවාහන අමාත්‍යංශය | ඉඩම් නිදහස් කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම,සැලසුම් සකස් කිරීම, ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • ප්‍රවාහන ද්වාරය - බහු මාධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථානයේ සිට නගර මධ්‍ය දක්වා A 10 මාර්ගය මන්තීරු 6ක් ලෙස සංවර්ධනය කිරීම | මාර්ග සංවර්ධන අධිකාරිය, | ඉඩම් අත්පත් කර ගැනීම, ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • යෝජිත ගුවන් පාලම(මුත්තෙට්ටුගල) | මාර්ග සංවර්ධන අධිකාරිය, | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • පොදු වාහන නැවතුම් ස්ථාන සංවර්ධනය<br><br>සග පෞද්ගලික බස් රථ නැවතුම් ස්ථාන (දකුණු ඩිපෝ ඉඩම , යන්තම්පලාව ඉඩම) | ලංකා ගමනා ගමන මණ්ඩලය, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, මහ නගර සභාව, මහා භාණ්ඩාගාරය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම හා පෞද්ගලික ආයෝජන තුලින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. |
| | | • නගර මධ්‍ය යේ පොදු වාහන නැවතුම් ස්ථාන 9ක් ස්ථාපිත කිරීම. | කුරුණෑගල මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය | ඉඩම් අත්පත් කර ගැනීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. |

| | සැලසුම් | උප සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | අදාල ආයතනය | ක්‍රියාත්මක කිරීමේ එක් එක් ආයතනය සතු වගකීම් |
|---|---|---|---|---|
| 5 | ජල සැපයුම් සැලැස්ම | • වඳුරුපීනු ඇල්ල ජලාශය ඉදිකිරීම හා ජල සැපයුම ලබාදීම | ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • බරන්දන රුස්කුරු ජලාශය ඉදිකර විසල් කුරුණෑගල ජල සැපයුම් පද්ධතියේ ධාරිතාවය ඉහල නැංවීම. | ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ඉඩම් අත්පත් කර ගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| 6 | ජලාපවාහන සැලැස්ම | • ප්‍රධාන ජලාපවාහන සැලැස්ම සකස් කිරීම | ඉඩම් ගොඩකිරීමේ සංවර්ධනය කිරීමේ සංස්ථාව<br><br>මහ නගර සභාව, ප්‍රාදේශීය සභාව, නාගරික සංවර්ධන අධිකාරිය | සැලැස්ම සකස් කිරීම<br><br>සැලැස්ම ක්‍රියාත්මක කිරීම |
| | | • විල්ගොඩ සොරොව්ව සකස් කිරීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • වාන් ඇල හා හු ඇල එකිනෙකට සම්බන්ධවන විල්ගොඩ ප්‍රදේශයේදී විධිමත්ව ඇල සංවර්ධනය කිරීම | මහ නගර සභාව | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| 7 | අප ජලය බැහැර කිරීමේ සැලැස්ම | • අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය | ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | කලාප 1 හා 2 ආවරණය වන පරිදි අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය පුළුල් කිරීම සඳහා ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. |

| | සැලසුම් | උප සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | අදාල ආයතනය | ක්‍රියාත්මක කිරීමේ එක් එක් ආයතනය සතු වගකීම් |
|---|---|---|---|---|
| 8 | ආර්ථික සංවර්ධන සැලැස්ම | 1. නගර මධ්‍ය ප්‍රතිසංවර්ධනය කිරීම<br>• මිහිදු මාවත නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය, පෞද්ගලික අයෝජන, නිවාස සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, තැපැල් දෙපාර්තමේන්තුව | ඉඩම් නිදහස් කිරීම, ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • උසාවිය. බන්ධනාගාරය, ගැටුව්වාන භූමියෙහි ප්‍රතිස්ථාපනය කිරීම | මහා භාණ්ඩාගාරය, අධිකරණ අමාත්‍යාංශය,ආරක්ෂක අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය | ඉඩම් පවරා ගැනීම, ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. |
| | | • පැරණි උසාවි භූමිය සාප්පු සංකීර්ණයක් ලෙස සංවර්ධනය කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය, අධිකරණ අමාත්‍යාංශය, | ඉඩම පවරාගැනීම ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. |
| | | • පැරණි පොදු වෙළඳපොල භූමිය වාණිජ කුලුණු සහිතව සංවර්ධනය කිරීම | මහා නගර සභාව, පෞද්ගලික අයෝජන | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. |
| | | • සතිපොල භූමිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියට යොදාගැනීම | මහා නගර සභාව, පෞද්ගලික අයෝජන | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • සතිපොල විල්ගොඩ අඩු ආදායම් නිවාස පිහිටි ඉඩමෙහි ප්‍රතිස්ථාපනය කිරීම | මහා නගර සභාව, පෞද්ගලික අයෝජන | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • වෙලගෙදර ජාත්‍යන්තර ක්‍රීඩාංගන ප්‍රතිසංවර්ධනය කිරීම | ක්‍රීඩා අමාත්‍යාංශය, ක්‍රිකට් මණ්ඩලය, මහා නගර සභාව | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • පැරණි රජපිහිල්ල තානායම කාමර 50කින් යුත් හෝටලයක් ලෙස සංවර්ධනය කිරීම | මහා නගර සභාව, පෞද්ගලික අයෝජන | ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • බඩගමුව රක්ෂිතය ආසන්නයේ කාමර 50කින් යුත් සුඛෝපබෝගී හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම | සංචාරක මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය, පෞද්ගලික අයෝජනය | ඉඩම් අත්පත් කර ගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | | 2. භාණ්ඩ ප්‍රවර්ධන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම - නයිලිය | නාගරික සංවර්ධන අධිකාරිය පෞද්ගලික ආයෝජන | ඉඩම් අත්පත් කර ගැනීම, අපරව්‍යුහ පහසුකම් සපයා ඉඩම් සංවර්ධනය කිරීම හා ඉඩම් පෞද්ගලික ආයෝජකයින් වෙත බදු දීම |
| | | 3. හෙරලියාවල කර්මානත් පුරය පුළුල් කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය, වයඹ පළාත් සභාව | ඉඩම් අත්පත් කර ගැනීම අපරව්‍යුහ පහසුකම් සපයා ඉඩම් සංවර්ධනය කිරීම හා ඉඩම් පෞද්ගලික ආයෝජකයින් වෙත ලබාදීම |
| | | 4 තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම - මල්කඩුවාව | නාගරික සංවර්ධන අධිකාරිය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, පෞද්ගලික අයෝජන හා අදාල අනෙකුත් අමාත්‍යංශ | ඉඩම් අත්පත් කර ගැනීම, අපරව්‍යුහ පහසුකම් සපයා ඉඩම් සංවර්ධනය කිරීම හා ඉඩම් පෞද්ගලික ආයෝජකයින් වෙත ලබාදීම |
| | | 5. යෝජිත තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම - දොරටියාව | නාගරික සංවර්ධන අධිකාරිය , පෞද්ගලික අයෝජන | ඉඩම් අත්පත් කර ගැනීම අපරව්‍යුහ පහසුකම් සපයා ඉඩම් සංවර්ධනය කිරීම හා ඉඩම් පෞද්ගලික ආයෝජකයින් වෙත බදුදීම |
| | | 6. රජපිහිල්ල උපකාරක පන්ති මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම | නගර සභාව ,පෞද්ගලික අයෝජන | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |


| | සැලසුම් | උප සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | අදාල ආයතනය | ක්‍රියාත්මක කිරීමේ එක් එක් ආයතනය සතු වගකීම් |
|---|---|---|---|---|
| 9 | භූ දර්ශන කළමනාකරණ සැලැස්ම | • රජපිහිල්ල උද්‍යානය ප්‍රති සංවර්ධනය කිරීම | මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය | සැලසුම් සකස් කිරීම, ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • මාලිගාව භූමිය ආශ්‍රිතව උද්‍යානය සංවර්ධනය කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, | සැලසුම් සකස් කිරීම, ප්‍රතිපාදන ලබාගැනීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • සාරගම වැව ආශ්‍රිතව භූමි අලංකරණ ව්‍යාපෘතිය | පළාත් සභාව, ප්‍රාදේශීය සභාව, | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • කුරුණෑගල රෝහලට යාබදව සිරිසර කුඹුරු යායෙහි ඇවිදින මංතීරු සංවර්ධනය කිරීම | ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව , නාගරික සංවර්ධන අධිකාරිය, මහා නගර සභාව | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • වැල්ලව හා මුත්තෙට්ටුගල දුම්රිය ස්ථානයේ භූමි අලංකරණ ව්‍යාපෘතිය | දුම්රිය දෙපාර්තමේන්තුව | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම |
| | | • ඇවිදිය හැකි පදිංක මංතීරු සකස්කිරීමේ ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය සභාව, මහ නගර සභාව | |
| 10 | පොදු එලිමහන් විනෝද කටයුතු සැලැස්ම | උඩවල්පොල ක්‍රීඩාංගනය ඉදිකිරීම | මහ නගර සභාව නාගරික සංවර්ධන අධිකාරිය,<br><br>ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව,<br><br>ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | ඉඩම් අත්පත් කර ගැනීම, ගොඩකිරීම හා සංවර්ධනය කිරීම<br><br>ජලාපවාහන සැලැස්ම සකස් කිරීම<br><br>නිර්දේශය ලබාගැනීම |

# ඇමුණුම්

## 1.2 සැලසුම් කණ්ඩායම


| | | |
|---|---|---|
| ඩී.එම්.බී රණතුංග මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) |
| සංවර්ධන සැලසුම් අංශය | - | ලලිත් විජයරත්න මහතා -අධ්‍යක්ෂ(සංවර්ධන සැලසුම්) |
| | - | එම්.එම්.ටී. ශවීන් සිල්වා මහතා |
| පර්යේෂණ හා සංවර්ධන අංශය | - | ජනක් රණවීර මහතා (අධ්‍යක්ෂ) |
| | | නිෂාමණී අබේරත්න මිය |
| | | (සැලසුම් නිලධාරි) |
| | | සත්‍යා ජීවන්ති (සහකාර සැලසුම්) |
| | | උදිත ජයම්පත් (සහකාර සැලසුම්) |
| | | මොහොමඩ් රිස්වාන් |
| භූගෝලීය හා තොරතුරු පද්ධති අංශය | - | සේනානි සෝමසේකර මිය - අධ්‍යක්ෂ (GIS), |
| | - | උපාලි සෝමසිරි මහතා - සහකාර අධ්‍යක්ෂ |
| භූදර්ශන අංශය | - | පත්මා විජේසිංහ මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ) |
| | - | ජානක ජයසිංහ මයා (ස.පා.සැ.නි) |
| | - | ගයාන් සමරකෝන් මයා (ස.පා.සැ.නි) |
| | - | ජී.ඩී. දයානි මිය (පරිසර සැ.නි) |
| | - | පසන් ප්‍රනාන්දු මයා (භූදර්ශන ශෘ.ශි) |
| | - | තිලිණි වීරක්කොඩි මිය (ස.පා.සැ.නි) |

සිතියම්අංක1.2 - ශ්‍රී ලංකාවේ වත්මන් මාර්ග පද්ධතිය





*මූලාශ්‍රය මාර්ග සංවර්ධන අධිකාරිය - සැලසුම් අංශය*

**සිතියම්අංක1.3 - කලාපිකරණ සැලැස්ම - මහ නගර සභාව කුරුණෑගල 2015**





*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකරිය - වයඹ පළාත් කාර්යාලය*

**සිතියම්අංක2.2 - සැලසුම් බල ප්‍රදේශයේ ජන ඝනත්වය - 2017**





*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - වයඹ පළාත් කාර්යාලය*

සිතියම්අංක 2.3 - කුරුණෑගල නගරය වටා ඇති පෝෂක ප්‍රදේශය





*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකරිය - වයඹ පළාත් කාර්යාලය - 2001*


**සිතියම්අංක2.4 - ඉඩම් පරිහරණ රටාව - 2017 (කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය )**




**සිතියම්අංක2.5 - ඉඩම් පරිහරණ රටාව - කුරුණෑගල නාගරික සැලසුම් බල ප්‍රදේශය**



සිතියම් අංක 2.6 - සංවර්ධන සම්පිණ්ඩන විග්‍රහය කුරුණෑගල බල ප්‍රදේශය



**සිතියම් අංක 2.7 - වත්මන් මලාපවහන පද්ධතිය මගින් ආවරණය වන ප්‍රදේශය**




**සිතියම් අංක 2.8 - ඝණ අප ද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම වේදය කුරුණෑගල - 2017**




**මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - වයඹ පළාත් කාර්යාලය**

**සිතියම්අංක 3.1- ගෙබිම් අනුපාතය කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය 2015-2018**




Allowed Minimum FAR - 1
Allowed Maximum FAR - 5.5

Average FAR in Current Context - 0.2636

**කුරුණෑගල නගර සංවර්ධන සැලැස්ම 2006 – 2015**

*වගු අංක 1.1 කුරුණෑගල නගරය හරහා වැටී ඇති මාර්ග පද්ධතිය*

| මාර්ග අංකය | මාර්ගයේ නම | දුර ( කි.මී ) |
|---|---|---|
| **A 06 + A 01** | කුරුණෑගල - කොළඹ | 93 |
| **A10** | කුරුණෑගල - පුත්තලම | 87 |
| **A10** | කුරුණෑගල- නුවර (කටුගස්තොට හරහා) | 36 |
| **A10+A28** | කුරුණෑගල - අනුරාධපුර | 121 |
| **A11+A19** | කුරුණෑගල - කෑගල්ල | 32 |
| **A11** | කුරුණෑගල - ත්‍රිකුණාමලය | 164 |
| **B249** | කුරුණෑගල - මීගමුව | 71 |

*වගු අංක 2.2ආංශික සේවා නියුක්තිය 2011 - 2016*

| | 2011 | | 2016 | |
|---|---|---|---|---|
| රාජ්‍ය අංශය | 12984 | 16.7% | 17151 | 19% |
| පෞද්ගලික අංශය | 20205 | 16% | 30536 | 35% |
| කාර්මික | 10132 | 13% | 10185 | 11% |
| කෘෂි කාර්මික | 12790 | 16.4% | 11135 | 12.5% |
| විදේශ රැකියා | 4095 | 5.27% | 4587 | 5% |
| කුලී වැඩ | 17695 | 22.7% | 15196 | 17% |
| එකතුව | 77,790 | 100% | 88790 | 100% |

මූලාශ්‍රය-ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කුරුණෑගල , මාස්පොත ,මල්ලවපිටිය 2016

*වගු අංක 2.3 සේවා සඳහා සංසරණ ජනගහනය පැමිණීම*

*සතියේ දිනවල උපකාරක පංති සඳහා සතියේ දිනවල සිසුන් පැමිණීම - 2017*

| පන්ති වර්ගය | පන්ති සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| පාසල් සිසුන් සඳහා උපකාරක | 30 | 20,600 |
| භාෂා | 11 | 1,500 |
| ඩිප්ලෝමා | 03 | 890 |
| නැටුම් | 04 | 600 |
| පරිගණක | 06 | 850 |
| තොරතුරු තාක්ෂණය | 08 | 280 |
| බාහිර උපාධි | 04 | 1,700 |
| එකතුව | | 24,720 |

මූලාශ්‍රය : වයඹ මානව සම්පත් කළමනාකරණ අධිකාරිය

*විදේශ රැකියා ආයතන සඳහා පැමිණෙන පාරිභෝගිකයන් සංඛ්‍යාව - 2016*

| | | |
|---|---|---|
| විදේශ රැකියා ආයතන සංඛ්‍යාව | - | 178 |
| දිනකට සේවා අවශ්‍යතා සඳහා පැමිණෙන සංඛ්‍යාව | - | 4,000 |
| වාර්ෂිකව විදේශ රැකියා ලබාදෙන සංඛ්‍යාව (මාසිකව 1500 පමණ) | - | 16,315 |

මූලාශ්‍රය : විදේශ සේවා නියුක්ති කාර්යාංශය - කුරුණෑගල

*වගු අංකය 2.5 විසල් කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතියේ ධාරිතාවය*

| **ව්‍යාපෘති කාලය** | **2014-2017** |
|---|---|
| ප්‍රතිලාභී නිවාස/ ආයතන | 6500 |
| ප්‍රතිලාභී ජනගහනය | 106000 |
| ග්‍රාම නිලධාරි වසම් (සම්පූර්ණ) | 17 |
| ග්‍රාම නිලධාරි වසම් (කොටස්) | 27 |
| දෛනික ධාරිතාවය | 14000ඝ$^{3}$ |

මූලාශ්‍රය : ජල සම්පාදන මණ්ඩලය කුරුණෑගල

*වගු අංකය 2.6 විසල් කුරුණෑගල මලාපවහන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ධාරිතාවය*

| **ව්‍යාපෘති කාලය** | **2014-2017** |
|---|---|
| ප්‍රතිලාභී නිවාස/ ආයතන | 4500 |
| ප්‍රතිලාභී ජනගහනය | 43000 |
| ග්‍රාම නිලධාරි වසම් (සම්පූර්ණ) | 11 |
| ග්‍රාම නිලධාරි වසම් (කොටස්) | 02 |
| දෛනික ධාරිතාවය | 4500m$^{3}$ |
| ආයෝජන මුදල | රු.මි 13248 |

මූලාශ්‍රය : *මලාපවහන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය*

*වගු අංකය 6.13 කුරුණෑගල නාගරික බල ප්‍රදේශයේ 2018 – 2030 වසර සඳහා සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් සැලැස්ම.*

| අනු අංකය | වර්ගය | වර්තමාන භාවිතය | ප්‍රමාණය (හෙක්ටයාර්) | යෝජිත භාවිතය | ග්‍රාම නිළධාරී කොට්ඨාශය |
|---|---|---|---|---|---|
| **01** | **යෝජිත ඉතා කුඩා උද්‍යාන Proposed Pocket Park (PPP)** | | | | |
| | PPP 01 | වෙළඳ | 0.07 | ඉතා කුඩා උද්‍යාන | කුරුණෑගල නගරය මධ්‍යම |
| **02** | **යෝජිත ප්‍රජා උද්‍යාන Proposed Community Park (PCP)** | | | | |
| | PCP 01 | වනාන්තර | 4.5 | ප්‍රජා උද්‍යාන | කුරුණෑගල කඩවීදිය, ගැට්ටුවාන |
| **03** | **යෝජිත වන උද්‍යාන Proposed Forest Park (PFP)** | | | | |
| | PFP 01 | වනාන්තර (බඩගමුව) | 231.88 | වන උද්‍යාන | |
| | PFP 02 | වනාන්තර (කුඹල්පොළ) | 53.95 | වන උද්‍යාන | |
| | PFP 03 | වනාන්තර (හවෙනියවත්ත) | 59.2 | වන උද්‍යාන | |
| | PFP 04 | වනාන්තර (සුන්දරාපොළ) | 70.08 | වන උද්‍යාන | |
| | **එකතුව** | | **415.11** | | |
| **03** | **යෝජිත රේඛීය උද්‍යාන Proposed Linear Park (PLiP)** | | | | |
| | PLiP 01 (ඇළ රක්ෂිතය -5m) | | 0.7 | රේඛීය උද්‍යාන | |
| | PLiP 02 ( ඇළ රක්ෂිතය -5m) | | 2.2 | රේඛීය උද්‍යාන | |
| | PLiP 03 ( ඇළ රක්ෂිතය -5m) | | 6.18 | රේඛීය උද්‍යාන | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | PLiP 04 ( ඇළ රක්ෂිතය -5m) | | 0.68 | රේඛීය උද්‍යාන | |
| | PLiP 05 (වෙන්නරු වැව රක්ෂිතය-30m) | | 18.63 | රේඛීය උද්‍යාන | |
| | **එකතුව** | | **28.39** | | |
| | **මුළු එකතුව** | | **448.07** | | |